207 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 207 - இல. 11
**Volume 207 - No. 11**

2012 මාර්තු 30වන සිකුරාදා
2012 மார்ச் 30, வெள்ளிக்கிழமை
**Friday, 30th March, 2012**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
වරප්‍රසාද : අධිකරණයේදී පාර්ලිමේන්තු වරප්‍රසාද ලත් සන්නිවේදන භාවිත කිරීම

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයට පෙනී සිටීම සඳහා වන වයස් සීමාව වැඩි කිරීම

**නොපැමිණීමේ අවසරය:**
ගරු මහින්ද සමරසිංහ මහතා

**මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ආශ්‍රිතව පැන නැඟී ඇති අර්බුදය:**
උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**මුදල් පනත් කෙටුම්පත:**
දෙවන සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**කල්තැබීමේ යෝජනාව:**
වෛකල්පික වෛද්‍ය ක්‍රමය සඳහා නීතිමය පිළිගැනීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
சிறப்புரிமை: பாராளுமன்ற சிறப்புரிமைசார் தகவலை நீதிமன்றத்தில் பயன்படுத்தல்

**தனி அறிவித்தல் மூல வினா:**
இலங்கை கணக்காளர் சேவைக்கு ஆட்சேர்ப்புக்கான திறந்த போட்டிப் பரீட்சையின் வயதெல்லையை அதிகரித்தல்

**வராதிருக்க அனுமதி:**
மாண்புமிகு மஹிந்த சமரசிங்க

**மாலபே தனியார் மருத்துவக் கல்லூரி சார்ந்ததாக எழுந்துள்ள நெருக்கடி:**
உயர்கல்வி அமைச்சரினது கூற்று

**சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**துறைமுக, விமான நிலைய அபிவிருத்தி அறவீடு (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**பொருளாதார சேவை விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**நிதிச் சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
மாற்று வைத்திய முறைக்குச் சட்ட அந்தஸ்து

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Privilege : Use of privileged communications of Parliament in Court

QUESTION BY PRIVATE NOTICE:
Extension of Age Limit for Open Competitive Examination for Recruitment to Sri Lanka Accountants' Service

LEAVE OF ABSENCE:
Hon. Mahinda Samarasinghe

CRISIS IN MALABE PRIVATE MEDICAL COLLEGE:
Statement by Minister of Higher Education

VALUE ADDED TAX (AMENDMENT) BILL:
Read a Second, and the Third Time, and passed as amended

INLAND REVENUE (AMENDMENT) BILL:
Read a Second, and the Third Time, and passed as amended

NATION BUILDING TAX (AMENDMENT) BILL:
Read a Second, and the Third Time, and passed as amended

PORTS AND AIRPORTS DEVELOPMENT LEVY (AMENDMENT) BILL:
Read a Second, and the Third Time, and passed as amended

ECONOMIC SERVICE CHARGE (AMENDMENT) BILL:
Read a Second, and the Third Time, and passed as amended

FINANCE BILL:
Read a Second, and the Third Time, and passed as amended

ADJOURNMENT MOTION:
Legal Recognition to Alternative Systems of Treatment

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2012 මාර්තු 30වන සිකුරාදා***
*2012 மார்ச் 30, வெள்ளிக்கிழமை*
*Friday, 30th March, 2012*

***පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 9.30 a.m., MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### වරප්‍රසාද: අධිකරණයේදී පාර්ලිමේන්තු වරප්‍රසාද ලත් සන්නිවේදන භාවිත කිරීම
### சிறப்புரிமை : பாராளுமன்ற சிறப்புரிமைசார் தகவலை நீதிமன்றத்தில் பயன்படுத்தல்
### PRIVILEGE : USE OF PRIVILEGED COMMUNICATIONS OF PARLIAMENT IN COURT

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

විපක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩ වී ඇති බවට 2012 මාර්තු මස 09 වැනි දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

2010 වර්ෂය සඳහා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයේ වාර්ෂික වාර්තාව.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කෘෂිකර්ම කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 ඔක්තෝබර් මස 11 වැනි දිනයෙන් අවසන් වන කාලච්ඡේදය සඳහා ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2006 සහ 2007 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2007 වර්ෂය සඳහා ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ (ඉක්ටාඩ්) වාර්ෂික වාර්තාව

මෙම වාර්තා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2008 වර්ෂය සඳහා පොල් පර්යේෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

මෙම වාර්තාව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2008 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2009 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් ප්‍රවාහන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2008 සහ 2009 වර්ෂ සඳහා නුගේගොඩ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2003, 2004 සහ 2005 වර්ෂ සඳහා ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තා.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු කථානායකතුමනි, ගොවිජන සේවා හා වනජීවී කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම 2010 වර්ෂය සඳහා සීමාසහිත ලංකා පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් ගොවිජන සේවා හා වනජීවී කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය - පැමිණ නැත.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මම මහරගම, පිළියන්දල පාර, අංක 177/3 යන ලිපිනයෙහි පදිංචි එච්.ජී.එච්.එම්. විජයවර්ධන මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා - පැමිණ නැත.

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා - පැමිණ නැත.

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා - පැමිණ නැත.

ගරු නවින් දිසානායක මහතා - පැමිණ නැත.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා- පැමිණ නැත.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හත පිළිගන්වමි.

(1) බටහිර ඕස්ට්‍රේලියාව, නොරෑන්ඩා 6062, අංක 20 නිවෙල් වේ යන ලිපිනයෙහි පදිංචි ජේ.එස්.ඒ. ජෙයරත්නම් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) නුගේගොඩ, පරණ කොට්ටාව පාර, අංක 196/ඒ යන ලිපිනයෙහි පදිංචි බී.එච්.සී. මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) ඇහැලියගොඩ, මාහිංගොඩ, සණස බැංකුව අසල යන ලිපිනයෙහි පදිංචි ඒ.ජී. පාලිත කුලරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) කොළඹ, මාලිගාවත්ත, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙහි සේවයේ නියුතු වයි.අයි. ධනවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) ඇහැලියගොඩ, බදුවත්ත, අංක 7 බී යන ලිපිනයෙහි පදිංචි එම්.බී.ඒ. ජබ්බාර් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) පරකඩුව, නාමල්දෙනිය, අංක 5/16හි පදිංචි එස්.එම්. රෝහිණී උදයකාන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(7) මඩල - ඇල්ලගාවා, අංක 26 යන ලිපිනයෙහි පදිංචි ටී.එච්. ඉන්ද්‍රාණි ජයසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - පැමිණ නැත.

ගරු නිර්මල කොතලාවල මහතා - පැමිණ නැත.

ගරු ලලිත් දිසානායක මහතා - පැමිණ නැත.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා - පැමිණ නැත.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Hon. Speaker, I present a petition received from Mr. W.M.S.B. Weerasekara of Beligaslanda, Okandapola, Polgahawela.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
# தனி அறிவித்தல் மூல வினா
# QUESTION BY PRIVATE NOTICE

## ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයට පෙනී සිටීම සඳහා වන වයස් සීමාව වැඩි කිරීම
## இலங்கை கணக்காளர் சேவைக்கு ஆட்சேர்ப்புக்கான திறந்த போட்டிப் பரீட்சையின் வயதெல்லையை அதிகரித்தல்
## EXTENSION OF AGE LIMIT FOR OPEN COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO SRI LANKA ACCOUNTANTS' SERVICE

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23 (2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයට අයදුම් පත් කැඳවීමත් සමඟ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කළ තරුණ තරුණියන් දහස් ගණනකට මුහුණ දීමට සිදු වී ඇති අර්බුදකාරී තත්ත්වය පිළිබඳව ගරු සභාවේ අවධානය යොමු කරවමි.

පසු ගිය 2012.03.23 දිනැති ගැසට් පත්‍රයේ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයට අදාළව සුදුසුකම් ප්‍රකාශයට පත් කොට තිබෙනවා. ඒ අනුව මෙම විභාගයට පෙනී සිටිය හැක්කේ 2012.03.23 දිනට වයස අවුරුදු 28ට වඩා අඩු, අදාළ සුදුසුකම් සහිත තරුණ තරුණියන්ට පමණයි. එහෙත් මෙම විභාගය මීට පෙර ගැසට් කර ඇත්තේ 2006.08.11 වැනි දිනදීය. එනම් මීට වසර 6කට පමණ කාලයකට පෙරදීයි. වසර හයකට පසුව තමයි නැවත මේ ගණකාධිකාරි සේවයට බඳවා ගැනීම සඳහා ගැසට් කර තිබෙන්නේ.

ශ්‍රී ලංකාවේ සරසවියෙන් පිට වන උපාධිධාරියකුගේ සාමාන්‍ය වයස අවුරුදු 25 - 26 අතර වෙනවා. ඒ අනුව විභාගයට අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ 2006, 2007, 2008, 2009 වර්ෂවල සරසවියෙන් බැහැර වූ උපාධිධාරීන්ට හා ඒ හා සමාන වෙනත් සුදුසුකම් සම්පූර්ණ කළ තරුණ තරුණියන්ට විභාගයට පෙනී සිටීමට ඇති අවස්ථාව අහිමි වී තිබෙනවා. එසේ වී ඇත්තේ වසර හයකට ආසන්න කාලයක් මෙම විභාගය නොපවත්වා තිබීම හේතුවෙන් ඔවුන්ගේ වත්මන් වයස අවුරුදු 28 ඉක්මවා ගොස් ඇති නිසායි.

මෙම විභාගයේ කොන්දේසියක් වන්නේ, එක් අයකුට දෙවතාවකට වඩා මෙම විභාගයට පෙනී සිටීමට නොහැකි වීමයි. එහෙත් පෙර සඳහන් කළ තරුණ තරුණියන්ට තම ජීවිත කාලයේම එකම වතාවක් හෝ මෙකී විභාගයට පෙනී සිටීමට ඇති අවස්ථාව අහිමි වී තිබෙනවා. විභාගය නොපැවැත්වීම වැනි ඔවුන්ට පාලනය කළ නොහැකි හේතුවක් මත තම ජීවිත කාලයේ එකම වරක් හෝ රජයේ ගණකාධිකාරි වෘත්තියට පිවිසීමට ඇති අවස්ථාව අහිමි වී යාම බරපතළ අසාධාරණයක්. මෙම අසාධාරණයට ලක් වූ සංඛ්‍යාව 10,000 ඉක්මවා ඇති බව පැවැසෙනවා.

ශ්‍රී ලංකා පරිපාලන තරග විභාග ව්‍යවස්ථාව මඟින් පෙනී සිටිය හැකි උපරිම වයස අවුරුදු 28 දක්වා අඩු කිරීමට කටයුතු කර පැවැතිය ද එම සංශෝධනයට පෙර හා පසුව ආසන්න කාලවලදී විභාග පවත්වා තිබූ අතර පසුව පවත්වන ලද ආසන්නතම අවස්ථා දෙක සඳහා උපරිම වයස අවුරුදු 30 දක්වා ඉහළ නංවා තිබුණි. ඒ අනුව මෙම ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණිය සඳහා වන විභාගය වසර හයකින් නොපවත්වා ඇති බැවින් මෙවර විභාගය සඳහා එම උපරිම වයස් සීමාව අවුරුදු 32 දක්වාවත් ඉහළ නැංවිය යුතු යයි මා යෝජනා කරනවා, ගරු කථානායකතුමනි.

මේ පිළිබඳව නඟනු ලබන පහත ප්‍රශ්න අරභයා වන පිළිතුරු ගරු අමාත්‍යවරයා මෙම ගරු සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා

01. විභාගයට පෙනී සිටිය හැකි උපරිම වයස අවුරුදු 28 සීමාව දක්වා අඩු කිරීම අසාධාරණයක් බව පිළිගන්නවාද?

02. පැවැති උපරිම වයස් සීමාව අඩු කිරීමට හේතු කවරේද?

03. අසාධාරණයට පත්වූවන් ගැන සලකා බලා උපරිම වයස අවුරුදු 32 දක්වා වැඩි කිරීමට කටයුතු කරනවාද?

ස්තුතියි ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation )

ගරු කථානායකතුමනි, අප හිතවත් ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු මෙසේය.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

01. අංක 1670/33 හා 2010.09.10වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ විවෘත තරග විභාගයට බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 28ක් වශයෙන් නියම කර ඇත.ඒ අනුව අංක 1751 හා 2012.03.23 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ බඳවා ගැනීමේ නිවේදනයේ උපරිම වයස් සීමාව අවුරුදු 28 වශයෙන් සඳහන් කර ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ දීප ව්‍යාප්ත සේවා වන ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා සැලසුම් සේවය ඇතුළු සමාන්තර සේවා සඳහා බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 28ක් ලෙස නියම කර ඇත.

02. අප රජය විසින් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ස්ථාපිත කර ඇති ඵලදායි හා නිදහස් අධ්‍යාපන පරිසරය තුළ වර්තමානයේ වයස අවුරුදු 23 පමණ වන විට උපාධිධාරි අපේක්ෂකයන් තම උපාධිය සම්පූර්ණ කර විශ්වවිද්‍යාලවලින් පිටව යන බැවින් තරුණ මානව සම්පත රාජ්‍ය කළමනාකරණ ක්‍රියාවලියට ඵලදායි ලෙස අන්තර්ග්‍රහණය කරනු පිණිස ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයට බඳවා ගැනීමේ වයස් සීමාව අවුරුදු 28 ලෙස තීරණය කර තිබුණි.

ගරු කථානායකතුමනි, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා මෙම ප්‍රශ්නය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මොහොත වන විටත්, මේ පිළිබඳව සාධාරණ හා යුක්තිසහගත දෘෂ්ටි කෝණයකින් රජයේ විශේෂ අවධානය යොමු කොට අප රටේ උගත්, බුද්ධිමත් උපාධිධාරින් හට රාජ්‍ය සේවයට පිවිසීමේ වැඩි අවස්ථාව උදා කර දෙමින් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව වයස අවුරුදු 30 දක්වා වැඩි කිරීමට රජය විසින් තීරණය කර ඇති බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි. ඒ පිළිබඳ ගැසට් නිවේදනය අප්‍රේල් මස පළමුවන හා දෙවන සතිය තුළ ප්‍රසිද්ධ කිරීමට නියමිතයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මම සඳහන් කරන්න කැමතියි, අපට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතියත් මේ සඳහා ලබා ගන්න පුළුවන් බව.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා කිව්වාට ගැසට් පත්‍රය-

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අප්‍රේල් මාසයේ පළමුවන දෙවන සතිය ඇතුළත ගැසට් එකේ පළ වෙනවා නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ප්‍රශ්නයක් නැහැ. එහෙම නම් හොඳයි.

## නොපැමිණීමේ අවසරය : ගරු මහින්ද සමරසිංහ මහතා
## வராதிருக்க அனுமதி: மாண்புமிகு மஹிந்த சமரசிங்க
## LEAVE OF ABSENCE : HON. MAHINDA SAMARASINGHE

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன )
(The Hon. Dinesh Gunawardena )
ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66 (ඊ) ව්‍යවස්ථාව යටතේ, කළුතර මැතිවරණ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද සමරසිංහ මහතාට 2012 ජනවාරි 21 වන දින සිට මාස තුනක් තුළ පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතුය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## මාලබේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ආශ්‍රිතව පැන නැඟී ඇති අර්බුදය: උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## மாலபே தனியார் மருத்துவக் கல்லூரி சார்ந்ததாக எழுந்துள்ள நெருக்கடி : உயர் கல்வி அமைச்சரினது கூற்று
## CRISIS IN MALABE PRIVATE MEDICAL COLLEGE : STATEMENT BY MINISTER OF HIGHER EDUCATION

**ගරු එස්. බී. දිසානායක මහතා (උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - உயர் கல்வி அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Higher Education)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නයට මම අද පිළිතුරු දෙන්නට බලාපොරොත්තු වෙනවා. එතුමා ඒ ප්‍රශ්නය ඇසුවේ එක්කෝ නොදැනීමෙන්. එහෙම නැත්නම් තවත් අයෙකුගේ වැරදි තොරතුරු මතයි. එය විශාල පරිකල්පන සහ අසත්‍ය තොරතුරුවලින් පිරී පවතිනවා. කෙසේ නමුත් ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයෙන් මතු කර ඇති කරුණුවලට මුලින්ම පිළිතුරු දී පරිකල්පන හා අසත්‍ය කරුණුවලට දෙවනුව පිළිතුරු දීමට බලාපොරොත්තු වෙනවා.

1. විශ්වවිද්‍යාල පනතේ 25ඒ වගන්තියේ දැක්වෙන විධිවිධානවලට අනුව උසස් අධ්‍යාපන අමාත්‍යවරයා සතු බලතල ප්‍රකාර උපාධි පිරිනැමීමේ ආයතනයක් ලෙස යම් අධ්‍යාපන ආයතනයක් පිළිගත හැක. එසේ කිරීමට ප්‍රථම ඒ පිළිබඳ වාර්තාවක් අදාළ නිසි බලධාරියා වෙතින් ලබා ගත යුතු අතර, ඉන් අනතුරුව එම නියෝගය අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. අධ්‍යාපන ආයතනයක් සමාගම් පනත යටතේ පිහිටුවීමට නීතිමය බාධාවක් නැත.

2. වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී උපාධිය පිරිනැමීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය පතා, South Asian Institute of Technology and

Medicine (Pvt.) Limited - SAITM - ආයතනය විසින් 2008 සැප්තැම්බර් මස 30 වෙනි දින - මා අමාත්‍ය ධුරය භාර ගැනීමට කලින්- මුල්ම අයදුම් පත්‍රය ඉදිරිපත් කරන ලදී.

3. මේ සම්බන්ධයෙන්, වෛද්‍යවරු ද, වෛද්‍ය මහාචාර්යවරු ද ඇතුළු ප්‍රවීණයන්ගෙන් සමන්විත කණ්ඩායමක් 2010 නොවැම්බර් මස 19 වෙනි දින South Asian Institute of Technology and Medicine (Pvt.) Limited ආයතනය වෙත ගොස් අමාත්‍යවරයා වෙත කරන ලද නිර්දේශ සලකා බැලීමෙන් අනතුරුව, අදාළ අයදුම් පත සලකා බැලීම පිණිස උප කමිටුවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලදී.

4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුදැනුම පරිදි South Asian Institute of Technology and Medicine (Pvt.) Limited ආයතනය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද නව උපදෙස් වලට - revised guidelinesවලට- අනුව 2011.01.25 විසින් නැවත සකස් කරන ලද අයදුම් පත ඉදිරිපත් කරන ලදී.

   මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික හා ප්‍රතීතණය පිළිබඳ කවුන්සලයේ - Quality Assurance and Accreditation Council - අධ්‍යක්ෂවරයාගේ මූලික ඇගයීම් වාර්තාව 2011.01.31 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

5. ආයතනික ව්‍යුහය සහ අධ්‍යයන වැඩ සටහන් පිළිබඳ නිරීක්ෂණ ලබා ගැනීම පිණිස පත් කරන ලද ප්‍රවීණයන්ගෙන් සමන්විත කමිටු දෙකක් විසින් 2011 පෙබරවාරි මස 22 දින සිට 25 දින දක්වා කාල පරාසය තුළදී අදාළ නිරීක්ෂණ චාරිකා සිදු කරන ලදී.

6. ආයතනික ව්‍යුහය පිළිබඳ නිරීක්ෂණ ලබා ගැනීම පිණිස පත් කරන ලද කමිටුව විසින් අදාළ චාරිකාවේදී සොයා ගන්නා ලද අඩු පාඩු සම්පූර්ණ කර ගැනීම පිණිස මාස හයක කාලයක් ලබා දීමට නිර්දේශ කර තාවකාලික පිළිගැනීමක් ලබා දෙන ලදී. ඒ බව 2011 මාර්තු 18 වන දින දාතමින් අමාත්‍යවරයා වෙත දන්වා යවන ලදී. එම තාවකාලික පිළිගැනීමක් ලබා දෙන ලද්දේ සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමකට එළැඹීමට අවශ්‍ය බැවිනි.

7. වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී අධ්‍යයන වැඩ සටහන් පිළිබඳ සොයා බැලීම පිණිස පත් කරන ලද කමිටුව විසින් අධ්‍යයන වැඩ සටහන්වල අන්තර්ගතය හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අධ්‍යයන පර්යේෂණ කුසලතා පිළිබඳව සොයා බලා අදාළ වාර්තාව 2011 ජූලි මස 01 දින ඉදිරිපත් කරන ලදී.

8. ඉහත සඳහන් කමිටුව විසින් කරන ලද සමස්ත නිරීක්ෂණ හා නිර්දේශ සලකා බැලීම පිණිස එකී නිරීක්ෂණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

9. එකී නිර්දේශවල සඳහන් කාල පරිච්ඡේදය තුළ අදාළ අඩු පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා අවකාශ සලසා දෙමින්, 2011 ජූලි මස 07 දින පැවැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව South Asian Institute of Technology and Medicine (Pvt.) Limited - SAITM - ආයතනය වෙත වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී උපාධිය පිරිනැමීම සඳහා මා වෙත නිර්දේශ කරන ලදී.

විශ්වවිද්‍යාල පනතේ 25ඒ වගන්තියේ ප්‍රකාරව මේ සම්බන්ධයෙන් අදාළ ගැසට් නිවේදනයෙහි සඳහන් කොන්දේසි සපුරා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම සඳහා කාලපරිච්ඡේදයන්ද සඳහන් කරමින් උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වන මා විසින් 2011 අගෝස්තු 30 වන දින අංක 1721/19 දරන ගැසට් පත්‍රයෙන් South Asian Institute of Technology and Medicine (Pvt.) Limited - SAITM - ආයතනයට වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය පිරිනැමීම සඳහා එම නියෝගය අත්සන් තැබූ දිනය වන 2011 අගෝස්තු මස 29 වැනි දින සිට අවසර දෙන ලදී. දැනට 2011 අගෝස්තු මස 30 වන දින අංක 1721/19 දරන ගැසට් පත්‍රයේ විධිවිධානයන්ට අනුව අදාළ කොන්දේසි සපුරාලීම සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පත් කොට ඇති කමිටුව විසින් සිදු කරමින් පවතී.

ගරු කථානායකතුමනි, අනුර කුමාර දිසානායක ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශනයේ තිබුණු කාරණා කිහිපයකටත් මා උත්තර දෙන්න බලාපොරොත්තු වෙනවා. SAITM ආයතනය සමාගම් පනත යටතේ ලියා පදිංචි වූ ආයතනයක් බව ප්‍රකාශ කරමින් එය වරදක් ලෙස එතුමා මතු කොට පෙන්වූවා. ගරු මන්ත්‍රීතුමා මෙය වරදක් ලෙස දකී. නැත්නම් වංචාවක් ලෙස දකී. එහෙත් එය එසේ නොවේ. ලංකාවේ දැනට ආරම්භ කර ඇති රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල ආයතන 29 ආරම්භ කර ඇත්තේ සමාගම් පනත යටතේ ලියා පදිංචි වූ ආයතන ලෙසයි. එහි කිසිදු වරදක් නැත. මේ යටතේ මහා බ්‍රිතාන්‍යයේ, ඇමෙරිකා එක්සත් ජනපදයේ, රුසියාවේ, ජපානයේ, ඉන්දියාවේ හා සිංගප්පූරුවේ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන දැනට අප රටේ ඩිප්ලෝමා උපාධි, පශ්චාත් උපාධි පිරිනමන ආයතන ආරම්භ කර ඇත. මේවායින් වැඩි ආයතන ගණනක් ඉතා උසස් හා ගුණාත්මක මට්ටමේ සිය අධ්‍යාපන කටයුතු කර ගෙන යන අතර ඇතැම් ඒවා සතුටු දායක නැත. ළමයින්ගෙන් ලක්ෂ ගණනක් මුදල් අය කර ගෙන ඔවුන් රවටා දමා ඇති ආයතන ද මේ අතර තිබේ. ඒ නිසා මේ සියලු ආයතන කිසියම් නියාමනයකට, අධීක්ෂණයකට ලක් කිරීම සඳහා අපි කටයුතු කර ගෙන යනවා. SAITM ආයතනයට රුසියාවේ නිෂ්නි නොව්ගොරොද් රාජ්‍ය වෛද්‍ය ඇකඩමියේ අනුබද්ධ ආයතනයක් ලෙස පෙනී සිටිය නොහැකි වූ බව ගරු මන්ත්‍රීතුමා කියා තිබෙනවා. ඒක සම්පූර්ණයෙන් අසත්‍යයක්.

රුසියාවේ නිෂ්නි නොව්ගොරොද් රාජ්‍ය වෛද්‍ය ඇකඩමියේ අනුබද්ධ ආයතනයක් ලෙස මෙම SAITM ආයතනය ලියා පදිංචි වෙලා තිබෙනවා. ඒ අනුව SAITM ආයතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යයන කටයුතු ක්‍රමවත්ව පවත්වා ගෙන යාම පිළිබඳවත් එම විශ්වවිද්‍යාලයේ ආචාර්ය මහාචාර්යවරුන්ගේ ඉගැන්වීම් කටයුතුවලට සහභාගි වීම පිළිබඳවත් රුසියානු රාජ්‍ය වෛද්‍ය ඇකඩමියේ දායකත්වය සිදු වෙමින් පවතී. [බාධා කිරීමක්] මම කියලා ඉවර වෙනකල් පොඩ්ඩක් ඉන්න. එසේම මෙම සිසුන්ට අවසාන වසර හෝ වසර දෙකක් රුසියාවේ අදාළ විශ්වවිද්‍යාලයට ගොස් ඉගෙනීමට ද හැකිය. ගරු කථානායකතුමනි, පසු ගිය දා නිෂ්නි නොව්ගොරොද් විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා ඇතුළු මහාචාර්යවරු කණ්ඩායමක් නිරීක්ෂණ චාරිකාවක් සඳහා ලංකාවට පැමිණි අතර මාද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයන්ද හමු විය.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා SAITM ආයතනයේ ගාස්තු ගැන සඳහන් කළා. ලෝකයේ වෙනත් රටවල වෛද්‍ය විද්‍යා උපාධිය හදාරන ශිෂ්‍යයෝ ගෙවන ගාස්තු පිළිබඳව එතුමාට අවබෝධයක් නැති බව තමයි ඒකෙන් ප්‍රදර්ශනය වෙන්නේ. ඒ ගැනත් මම කියන්න කැමැතියි. ඒ තොරතුරු, ලෝකයේ වෛද්‍ය උපාධිවලට අය කරන මුදල් පිළිබඳව මන්ත්‍රීතුමාට කිසිදු අවබෝධයක් නැති බව ප්‍රදර්ශනය කරයි. ඒ නිසා එතුමාගේත් ගරු සභාවේත් දැන ගැනීම සඳහා ඒ පිළිබඳව තොරතුරු බිඳක් ඉදිරිපත් කිරීමට මම කැමැතියි.

ඉන්දියාවේ වෛද්‍ය උපාධියක් ලබා ගැනීම සඳහා ගාස්තු වශයෙන් රුපියල් ලක්ෂ 150ත්, 250ත් අතර මුදලක් ගෙවිය යුතුය.

[ගරු එස්. බී. දිසානායක මහතා]

මීට අමතරව ජනප්‍රිය ඉන්දියානු වෛද්‍ය විද්‍යාලවලට ඇතුළත් වීමේදී ලියාපදිංචි ගාස්තුව වශයෙන් ඉන්දියානු රුපියල් ලක්ෂ 25ක්, එනම් අපේ මුදලින් රුපියල් ලක්ෂ 65ක් පමණ ලියා පදිංචි ගාස්තු වශයෙන් ගෙවීමට සිදු වේ. උදාහරණයක් ලෙස ළඟම තිබෙන වෙන්නායි - රාමචන්ද්‍රන් වෛද්‍ය විද්‍යාලයට විදේශ ශිෂ්‍යයෙක් ඇතුළත් කර ගැනීමේදී ඉන්දියානු රුපියල් ලක්ෂ 25ක්, ලංකාවේ සල්ලිවලින් රුපියල් ලක්ෂ 65ක් ලියා පදිංචි ගාස්තු වශයෙන් අය කරනවා. ඒ tuition fees නොවෙයි. මහා බ්‍රිතාන්‍යයේ වෛද්‍ය ශිෂ්‍යයෙකුගෙන් වසර 5කට අධ්‍යාපන ගාස්තු වශයෙන් ලක්ෂ 250ත්, 400ත් අතර මුදලක් අය කරනවා.

ඕස්ට්‍රේලියාවේ වෛද්‍ය උපාධියක් ලබා ගැනීම සඳහා ලක්ෂ 200ත්, 350ත් අතර මුදලක් ගෙවීමට සිදු වේ. ඇමෙරිකා එක්සත් ජනපදයේ වෛද්‍ය ශිෂ්‍යයකුට වසර පහකට අපේ රටේ මුදලින් ලක්ෂ 400ත්, 500ත් අතර ගණනක් ගෙවීමට සිදු වේ. ඒ රටේ වෛද්‍ය ශිෂ්‍යයෙකුට අවුරුදු භාගයකට -semester එකකට- ඇමෙරිකානු ඩොලර් 35,000ත්, 40,000ත් අතර ගණනක් ගෙවන්න වෙනවා. මාලඹේ SAITM ආයතනය අවුරුදු පහකට අය කරන මුදල ලක්ෂ 65කි. පාකිස්තානය, බංග්ලාදේශය, නේපාලය වැනි රටවල ලක්ෂ 35ට, 40ට වෛද්‍ය උපාධිය ලබා දෙන ආයතන තිබෙනවා. හැබැයි ඒ ආයතන තිබුණාට ඒවායේ විශාල ප්‍රශ්න තිබෙනවා. අපට පසු ගිය කාලයේ පොලිසියට දන්වා ඒ සමහර නියෝජිතයෝ රිමාන්ඩ් කරන්න සිද්ධ වුණා, ඒ ආයතනවල තත්ත්වය ඉතාම පහළ මට්ටමක තිබෙන නිසා. ගරු කථානායකතුමනි, SAITM ආයතනයේ පහසුකම් පිළිබඳවත් ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න කරලා තිබෙනවා. ඒකේ තිබෙන තොරතුරුත් සම්පූර්ණයෙන් අසත්‍යයි. SAITM ආයතනය ලංකා බැංකුවෙන් ණය මුදලක් ලබා ගෙන ඇත්තේ බැංකුවත් සමඟ ඇති කර ගත් ගනු දෙනුවකින්. ඒකට අපේ කිසිම සම්බන්ධයක් නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා ගැසට් එකේ-

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ඉඳ ගන්න. මම ඒකට උත්තර දෙන්නම්. ගැසට් නිවේදනයේ ඒක ආවේ කොහොමද කියලා මම කියන්නම්.

ඒ අය අපට කිව්වා, "අපි අසවල් දවසට කලින් ආරෝග්‍ය ශාලාවක් හදනවා, ශික්ෂණ රෝහලක් හදනවා" කියලා. අපි කිව්වා, "සල්ලි පෙන්වන්න" කියලා. එතකොට සල්ලිවල අඩුවක් තිබුණා. අඩුව තිබුණාම ඒ අය අපට පෙන්නුවා, "මෙන්න බැංකුවෙන් මිලියන 200ක් ගන්න එකඟ වෙලා තිබෙනවා" කියලා. ඒක තමයි ගැසට් එකට දැම්මේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මිලියන 600ක්-

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
නැහැ, මිලියන 200ක්. මිලියන 400ක් ඒ අය අතේ තිබුණා. මිලියන 200ක් තමයි බැංකුවෙන් ගන්න තිබුණේ. ඒකයි ගැසට් එකට ගියේ. දැනට ශ්‍රී ලංකාවේ නවීනතම හා විශාලතම ශික්ෂණ රෝහල ඇඳන් 1,000ක් සහිතව මාලඹේ SAITM ආයතනය ළඟ ඉදි වෙනවා. ඒක තව මාස තුනකින් විවෘත කරනවා. SAITM ආයතනයේ දැනට ජ්‍යෙෂ්ඨ වෛද්‍ය මහාචාර්යවරු 18ක් ඉන්නවා. මේ අය අතර රුසියානු මහාචාර්යවරු තුන් දෙනකු සිටින අතර, ඉතිරි සියලු දෙනා කොළඹ, පේරාදෙණිය, ජයවර්ධනපුර, කැලණිය හා රුහුණු විශ්වවිද්‍යාලවලින් විශ්‍රාම ගිය හා සප්ත වාර්ෂික නිවාඩු - sabbatical leave - ගිය අයයි. මෙම විශ්වවිද්‍යාලවල සේවය කරන තවත් මහාචාර්යවරු පිරිසක් රජයේ විශ්වවිද්‍යාලවල වැඩ කරන ගමන් මාලඹේ SAITM ආයතනයේ වැඩ කරනවා.

කොළඹ විශ්වවිද්‍යාලයේ වැඩ කරන ඇතැම් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, මහාචාර්යවරු visiting lecturersලා හැටියට අද මාලඹේ වැඩ කරනවා. ඔක්කොම 21 දෙනෙක් ඉන්නවා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, අප විසින් අපේ විශ්වවිද්‍යාල ජාත්‍යන්තර වශයෙන් ඉහළට ගෙන යාම පිළිබඳ කාරණය ඔබතුමා උපහාසයට ලක් කරලා තිබුණා. Website එක බලන්න කියලා ඔබතුමාට මම කියනවා. ඒ ගැනත් මම කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, 2011 world rank එකට අනුව කොළඹ විශ්වවිද්‍යාලය ලබා ගෙන තිබුණේ 2,220 වැනි ස්ථානයයි. අද ඒක තිබෙන්නේ 1,447 වැනි ස්ථානයේයි. 773ක් උඩට ඇවිල්ලා තිබෙනවා. පොඩි ගණනක් නොවෙයි. අතිගරු ජනාධිපතිතුමා මේවා වෙනුවෙන් අයවැය ලේඛනයෙන් රුපියල් බිලියන 3ක් වෙන් කළා. රුපියල් මිලියන 600ක් දුන්නා. මේවා කරන ලෙස බල කළා. ඒ අනුව 773ක් උඩ ඇවිල්ලා තිබෙනවා. පේරාදෙණිය විශ්වවිද්‍යාලය තිබුණේ 2,240 වැනි ස්ථානයේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ කවදාද?

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
2011 අවුරුද්දේ. අවුරුද්දක ප්‍රගතියයි මම මේ කියන්නේ. අපි සල්ලි වෙන් කරලා දීලා අවුරුද්දයි. 2012 වන විට පේරාදෙණිය විශ්වවිද්‍යාලය තිබුණේ 1,909 වැනි ස්ථානයේ. 331ක් ඉහළට ඇවිල්ලා තිබෙනවා. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තිබුණේ 6,382 වැනි ස්ථානයේ. අද 3,078 වැනි ස්ථානයට ඇවිල්ලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව බලන විට 3,304කින් ඉහළට ඇවිල්ලා තිබෙනවා. කැලණිය විශ්වවිද්‍යාලය සිටියේ 6,594 වැනි ස්ථානයේ. අද ඉන්නේ 4,434 වැනි ස්ථානයේ. ඒ අනුව 2,160කින් ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. රුහුණු විශ්වවිද්‍යාලය සිටියේ 3,514 වැනි ස්ථානයේ. ඒක පොඩ්ඩක් පහළට ගිහිල්ලා තිබෙනවා. ඒකටත් හේතු තිබෙනවා. ඒකට හේතුව, ගරු මන්ත්‍රීතුමා හිටපු ශිෂ්‍ය සංවිධානය. ලංකා විවෘත විශ්වවිද්‍යාලය හිටපු ස්ථානයත් 976කින් ඉහළට ඇවිල්ලා තිබෙනවා. යාපනය විශ්වවිද්‍යාලයත් 1,466කින් ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. මේ අවුරුද්දක් තුළ. රජරට විශ්වවිද්‍යාලය 2,855කින් ඉහළට ඇවිල්ලා තිබෙනවා.

මේවා websitesවල තිබෙනවා. නැගෙනහිර විශ්වවිද්‍යාලය 1,088කින් ඉහළට ඇවිත් තිබෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා අය වැයේ ප්‍රකාශ කළ පරිදි, මුදල් වෙන් කළ පරිදි අපේ විශ්වවිද්‍යාල අද ජාත්‍යන්තර තලයේ වේගයෙන් ඉහළට එමින් ඉන්නවා. අද කොළඹ විශ්වවිද්‍යාලය ආසියාවේ 8වැනි තැනට ඇවිත් තිබෙනවා. බොහොම ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 6 දක්වා පනත් කෙටුම්පත් දෙවැනි වර කියවීම, ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා.

## එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත
## சேர்பெறுமதி வரி (திருத்தம்) சட்டமூலம்
## VALUE ADDED TAX (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ. භා. 9.58]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

අද දින අප ඉතාම වැදගත් පනත් හයක් විවාදයට ලක් කරනවා. තමුන්නාන්සේලාට මතක ඇති, පසු ගිය සතියේ අප මුදල් අමාත්‍යාංශයේ Consultative Committee එකේදි සාකච්ඡා කරලා ඉන් පසුව තමයි අද මේ පනත් කෙටුම්පත් හය මේ ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙන්නේ. මේ කටයුතු දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මොකද, පසු ගිය අය වැය යෝජනා තුළ මේවා සියල්ලම අන්තර්ගතයි. ඒවා ක්‍රියාත්මක කිරීමේදී යම් කිසි කාල පරිච්ඡේදයක් තුළ මේ ගරු සභාවේ අනුමැතිය ලබා ගන්නට ඕනෑ. ඒ සඳහා අද අප ඒ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, මේ පනත් සංශෝධන හය තුළ විවිධ විෂයන් පිළිබඳ, විවිධ ක්ෂේත්‍ර පිළිබඳ පසු ගිය අය වැය යෝජනා තුළින් රජය ලබා දී ඇති සහන විස්තර වෙනවා.

සහන ලේඛනයක් තිබෙනවා. ඒක හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

මොකද, එහි සහන විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා එකින් එක මම සඳහන් කරන්නේ නැහැ. අපේ ප්‍රතිපත්තිය මොකක්ද; ඒ පසු පස ඇති දර්ශනය මොකක්ද කියා පැහැදිලි කිරීම වැදගත් කියා මම හිතනවා.

ඊට ප්‍රථමයෙන් අපේ රටේ අපනයන සහ ආනයන තත්ත්වය බලමු. 2010 වර්ෂය බලන්න. export has been increased by 17.3 per cent from 2009 to 2010. අපේ අපනයන සියයට 17.3කින් වර්ධනය වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Are you referring to exports?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Yes, exports. I am coming to that. Do not rush. I have enough time.- [*Interruption.*] The trouble is, the Hon. Member is always in a hurry and because of that he gets slipped up. I will come to all that. අපනයන සියයට 17.3ට වැඩි වෙලා තිබෙන්නේ කොහොමද? Industrial exports, 70.9 per cent; Agricultural exports, 28.7 per cent. ඔබතුමා අහපු අනෙක් පැත්ත ගැන බලමු; මේ රටට ආනයනය කරපු දේවල් බලමු. ආනයන සියයට 34.4ක වර්ධනයක් සිදු වෙලා තිබෙනවා. දළ වශයෙන් ගත්තොත් තුන් ගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. ආනයන වැඩි වෙලා තිබෙන්නේ කොහොමද? Intermediate goods, 55.3 per cent. ඉන්ධන සහ සැලකිය යුතු ප්‍රමාණයක් consumer goods, 27.2 per cent. මේ චිත්‍රය දෙස බැලුවාම එක පැත්තකින් අපේ අපනයන වර්ධනය වෙලා තිබෙනවා. නමුත් අපනයන වර්ධනය වාගේම මේ රටට තුන් ගුණයකින් ආනයනය කර තිබෙනවා. ඒක මේ රටට එක්තරා විධියක ප්‍රශ්නයක් හැටියට මුහුණ පාන්න සිදු වී තිබෙනවා. ගෙවීම් ශේෂයේ එක්තරා අසමතුලිතතාවක් තිබෙනවා. විදේශ විනිමය වශයෙන් එන මුදල් ප්‍රමාණය දෙස බැලුවාම ඒ වාගේ තුන් ගුණයක් පිටතට යන බව පෙනෙනවා.

ඒ තුළ එක්තරා විධියකින් මේ ප්‍රශ්නය දිහා කල්පනාකාරීව බලා ඒක කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවක් තියෙනවා. ඒ සඳහා අප කටයුතු කරලා තියෙනවා. මම තමුන්නාන්සේලාට ඒක තේරුම් කරලා දෙන්නම්.

ඉස්සෙල්ලාම අපි කියන්න ඕනෑ, අවුරුදු තිහක යුද්ධයක් අවසානයේදී නැඟී ගෙන ආපු අපේක්ෂාවන් - "Went up Demand"- සහ අවශ්‍යතාවන් සැලකිය යුතු ප්‍රමාණයක් තිබෙන බව. යුද්ධයක් ඉවර වුණාට පස්සේ මිනිසුන්ට එක්තරා විධියකින් සහනදායී දේවල් ලබා ගන්න ආශාවක් තියෙනවා. විශේෂයෙන් අප වාහන අංශය ගත්තොත් තමුන්නාන්සේලා විශ්වාස කරන්න, ලංකාවේ හැම විනාඩි දහයකටම මෝටර් සයිකල් එකක් විකිණෙනවාය කියන එක. ත්‍රී විලර් විකිණෙනවා. මහ ජනතාවට එක කාලයක් තුළ එක්තරා විධියකින් යම් කිසි සහනයක් අප ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම අප පිළිගන්න ඕනෑ, තෙල් මිල වැඩි වීම තුළිනුත් මේ ගෙවුම් ශේෂය කෙරෙහි එක්තරා පීඩනයක් ඇති වනවාය කියන කාරණය. මොකද, තෙල් මිල වැඩි වෙන්න, වැඩි වෙන්න අප මේ රටට ආනයනය කරන දේවල්වල මිල වැඩි වෙනවා. කෙසේ නමුත් මේ ප්‍රශ්නයට විවිධ විසඳුම් සොයන අතර, අප සියලු දෙනාටම පිළි ගන්න පුළුවන් අපේ රටේ නිෂ්පාදනය වැඩි කරලා පිට රටට යවන්න ඕනෑය කියන එක. ඒ export sector එක, නිෂ්පාදන sector එක අප ප්‍රතිපත්තියක් හැටියට වැඩිදියුණු කරන්න ඕනෑ. දැන් මේ export sector එක දිහා බලපුවාම අපටත් පිළිගන්න වනවා, විවිධ ක්‍රමවලින් විශේෂයෙන් අපේ සංචාරක ව්‍යාපාරය තුළිනුත්, මේ රටට විදේශ රටවල්වලින් එවන මුදල් තුළිනුත් අපට එක්තරා විධියක සහනදායී කලාපයක් - comfort zone එකක් - අපේ ආර්ථිකයේ ඇති කර ගන්න පුළුවන් කියන එක. ඒක හොඳ comfort zone එකක්. නමුත් ගැඹුරට සාකච්ඡා කරලා බලන කොට අපට පිළි ගන්න වනවා, මේ comfort zone එකේ විතරක් හැම දාම ඉන්න බැහැ කියන කාරණය. ඊට වඩා ශක්තිමත් අපනයන ක්‍රමයක්, තවත් විධියකින් කියනවා නම් merchandised economy එකක් අප හදන්න ඕනෑ.

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

මේ රටේ නිෂ්පාදිත භාණ්ඩ පිට රට යවන්න ඕනෑ. විශේෂයෙන්ම අපි ගත්තොත් අපේ තේ කර්මාන්තය, රබර් කර්මාන්තය, නව තාක්ෂණ කර්මාන්ත, jem and jewellery, garments වැනි දේවල්වල නිෂ්පාදනය වැඩි කරලා පිට රටට යවලා විදේශ විනිමය හම්බ කරන්න පුළුවන්. ඒ වාගේම, IT අංශයෙන්ද අපට විදේශ විනිමය හම්බ කරන්න පුළුවන්. එතකොට දෙපැත්තක් බලන්න වෙනවා. අපේ සංචාරක සහ සේවා ක්ෂේත්‍රයෙන් අපට ලැබෙන ආදායම වැඩි කර ගනිමින් අපේ ආර්ථිකයේ සහන කලාපයක් - comfort zone එකක් - ඇති කරනවා වාගේම merchandise නැත්නම් manufacturing sector එක අප වැඩි කරන්න ඕනෑ.

මේ උපකල්පනය තුළ, මේ strategy එක තුළ තමයි මේ යෝජනා අද තමුන්නාන්සේලාට අපි ඉදිරිපත් කරන්නේ. මේ සියල්ලක්ම සහන. මේ සෑම සහනයක්ම දෙන්නේ අපි තෝරා ගත්ත ක්ෂේත්‍රවල ඉක්මන් වර්ධනයක් ඇති කරලා, ඒ තුළින් මේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රය, විශේෂයෙන් merchandise section එක වැඩි කරලා පිට රටවලට යවලා, තිබෙන ස්ථාවර ආදායම් මාර්ග වැඩි කරලා මේ රටේ ආර්ථිකය සමබර කරන්නයි. එතකොට මේ balance of payment ප්‍රශ්නයටත් සමහර විට කෙටි කාලීනව නොවුණත් මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන පිළිතුරු අපට ලැබෙනවා. [බාධා කිරීමක්] ඔව්, හිටපු ඇමතිතුමනි, do you want to ask something?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමාගෙන් අවසරද, මට ප්‍රශ්නයක් අහන්න?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔව්, ඔව්. අහන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සහන දෙන එක ප්‍රශ්නයක් නැහැ ගරු ඇමතිතුමනි. නමුත් මෙතැන වෙලා තිබෙන්නේ මොකක්ද? තමුන්නාන්සේලා ඒ පනත් සම්පූර්ණයෙන්ම අයින් කරලා. සහන දෙන එක වෙනම වැඩක්. මේ පනතින් රේගු ආඥාපනත සම්පූර්ණයෙන්ම ඉවත් කරලා. විනිමය පාලනය සම්පූර්ණයෙන්ම අයින් කරලා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
These are amendments.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No, no, they are not amendments.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Of course, they are amendments.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Import and Export -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
කරුණාකරලා - I will give you the details.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ පනත් බලපෑම සම්පූර්ණයෙන්ම අයින් කර ගෙන.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඔබතුමා ඉඳගන්න. දැන් මම තේරුම් කරලා දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Minsiter, you referred to "Comfort Zone". "Comfort Zone" for one or two or is it for the country at large? Just tell us what this "Comfort Zone" is.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
Wait, I am coming to that.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Because we are not in any comfort zone at the moment. We are in deep trouble.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
You are not in any comfort zone. Definitely you have no comfort zone, now you are on a hard rock. My dear Friend, we do not have to exchange words. I am going to give you hard facts and figures. So listen!

දැන් ඉස්සර වෙලාම බලන්න, අපි මොනවාට ද එහෙම කරලා තිබෙන්නේ කියලා. Value- added සම්බන්ධයෙන් අදාළ අපේ පනත තිබෙනවා. අපි ඒ පනතට යම් යම් සංශෝධන ගෙනෙනවා. සමහර -

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
You are not giving any relief.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
You are wrong, listen to me.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
රේගු ආඥාපනතට-

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ආනයන අපනයන, විනිමය පාලන-

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, නැහැ. මෙන්න මේක බලන්න, අඩු කිරීමක් ද කියලා. කරුණාකරලා බලන්න.

"Concessionary Income Tax Rates - Reduction of income tax rates on profits and income from research and development to a maximum rate of 16 per cent for a person". So that remains but we have reduced the rate. - [*Interruption.*]

The Hon. Leader of the Opposition raised this. So, leet me explain. Today we are discussing six Bills. Regarding the Finance Bill, there are so many things: we have simplified the charges payable on registration of vehicles; increase of luxury, semi-luxury and dual-purpose motor vehicle taxes; exemption of the application of levy on rooms of Five-Star Hotels for airline crew. So, this does not entail a total elimination of the Finance Act. We are bringing in amendments.

For certain cases like this which we explained at the Consultative Committee, we are giving that discretion under that Act. Earlier every time we had to give a concession, we had to come here and ask for a total amendment. So, let me come to this.

කොයි විධියට ද මේ සහන දෙන්නේ කියලා අපි කියන්නම්. දැන් බලන්න tax exemptions. Value Added Tax එකෙන් - [බාධා කිරීමක්] ඔව්, ඔව් කියන්න. Value Added Tax එකෙන්, තමුන්නාන්සේලාත් එකඟ වන මෙන්න මේ ක්ෂේත්‍රවලට අපි සහනයක් දීලා තිබෙනවා. ඒවා මොනවාද? "Importation of machines and equipment required for the improvement of film theatres with digital technology; machinery for the manufacture of pharmaceuticals, machinery for the manufacture of biomass briquettes and palletes; manufacture of such products - greenhouses, polytunnels, and materials like that; supply of power generation machinery and equipment; importation of fabrics for the use of domestic consumption subject to an all- inclusive tax of Rs.75 at importation".

So, these are all considered decisions, where in some sectors, certainly we give tax exemptions. Of course, we give tax exemptions. Even under the BOI Act, we give tax exemptions. - [*Interruption.*]. You must understand the philosophy behind this. That is in selected sectors in what are called our thrust areas. I am very sorry, we are using language like, "thrust areas", "comfort zones" and all that. I hope you will understand. So, whatever that maybe, in selected areas, we are going to give concessions. What is wrong with that? We have to compete with many other countries which are giving concessions like that.

For example, after this I am going for a discussion with the Vietnamese trade delegation. We are going to discuss what concessions we can give them and what concessions they can give us. This is a more complex world. Long years in the Opposition have dulled your minds. You are not aware of what is happening all over the world. If you can tell us that these are not important areas for such tax exemptions, then I can understand, but you have no criticisms on that.

තමුන්නාන්සේලා කියනවාද, digital technology එක සහිත චිත්‍රපටි ශාලා හදන එක නරකයි කියලා? තමුන්නාන්සේලා එහෙම කියනවාද? ඒ වාගේම මේ රටේ pharmaceutical industry එකක් හදන්න සහන දෙන එක නරකයි කියලා කියනවාද? දුප්පත් මිනිසුන්ට අවශ්‍ය වාහනවලට සහන දෙනවාය කියන එක නරකයි කියනවාද? තමුන්නාන්සේලාගේ යාළුවෝ වටිනා ලොකු වාහන ගෙනෙනකොට, ඒවාට වැඩියෙන් බදු දමනවායි කියන එක නරකද? [බාධා කිරීමක්] නැහැ, නැහැ. [බාධා කිරීමක්] ඔව්, වාහන ගෙනෙන්න ඉඩ දෙනවා. ඒවාට බදු පනවන්න ඕනෑ. අපි ඕනෑ තරම් බදු පනවලා තිබෙනවා. තමුන්නාන්සේලා දැන් මේවාට විරුද්ධ වුණොත්, ඒ කියන්නේ තමුන්නාන්සේලා වටිනා ලොකු වාහනවලට බදු දමන එකට විරුද්ධයි කියන එකයි. ඒ නිසා- [බාධා කිරීමක්] බලන්න, බලන්න. අපි හුඟාක් දේවල්වලට - [බාධා කිරීමක්] මේ ලේඛන එහෙම තමුන්නාන්සේලාට දෙනවා. ඒ හැම එකෙන්ම අපි ආර්ථික ක්‍රියාවලියක් අනුව තෝරා ගත් ක්ෂේත්‍රවලට -[බාධා කිරීමක්] මේ සහනය සාමාන්‍ය සහනයක් නොවෙයි. මේ තෝරා ගත් සංවර්ධන කර්මාන්ත ක්ෂේත්‍රවලට දෙන සහනයක්. කජු ඇටයි, කොස් ඇටයි මාරු කර ගන්න එපා. තමුන්නාන්සේලාට සිදු වෙලා තිබෙන්නේ ඒකයි. ඒ නිසා කරුණාකරලා මේ හැම දෙයකම වැරැදි සොයන්න යන්න එපා. මේක අපේ ප්‍රතිපත්තිය. මේ රටේ දේශීය වශයෙන් නිෂ්පාදනයන් කරන්නට පුළුවන් කොම්පැනිවලට සහන දීලා, ඒවා දියුණු කරලා, පිට රටට විකුණන තත්ත්වයක් මේ රටේ ඇති කරන්නට ඕනෑ.

අපේ වෙළෙඳ ශේෂය, අපේ වෙළෙඳ ශේෂයේ තිබෙන පරතරය අනිවාර්යයෙන් අඩු කරන්නට ඕනෑ. අපි දැන් ඒ සඳහා තීන්දු ගොඩාක් ගෙන තිබෙනවා. එක පැත්තකින් මේ රටට භාණ්ඩ ගෙන්වන ප්‍රමාණය -ආනයනය කරන ප්‍රමාණය- දරා ගන්න බැරි තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. ඒ සඳහා විනිමය අනුපාතය, ණය අනුපාතය, ඒ වාගේම බැංකුවලට කොච්චර ණය දිය යුතුද කියන ඒ උපදෙස් අනුව ඒ තුළ අපි සමතුලිතතාවක් ඇති කරන්නට බලාපොරොත්තු වනවා. ඒ නිසා මේ සෑම එකකින්ම අපි බලාපොරොත්තු වන්නේ තෝරා ගත් strategic මඟින්, නැත්නම් අතිශයින්ම වටිනා ක්ෂේත්‍රවලට යම් යම් සහන දීලා, මේ රටේ එම කර්මාන්ත වැඩි කිරීමටයි.

ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලාත් දන්නවා, strategic investment law සම්බන්ධව අපි අලුතින් පනත් කෙටුම්පතක් ගෙනැල්ලා තිබෙන බව. එයින් මේ රටේ ආර්ථිකයට අවශ්‍ය වන ක්ෂේත්‍රවලට, විශාල මුදලක් ආයෝජනය කරන ක්ෂේත්‍රවලට නොයෙක් විධියේ සහන ලබා දෙනවා.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

අද ඉතාම තරගකාරි තත්ත්වයක් තිබෙන්නේ. තමුන්නාන්සේලා දන්නවා, ලෝක අවපාතය තුළ ඉල්ලුම ඇති කරන භාණ්ඩ නිෂ්පාදනය කරන ඇමෙරිකාව වැනි බටහිර රටවල ඉල්ලුම පහත බැස්සාය කියලා. එම රටවල නිෂ්පාදනවල ඉල්ලුම පහත බහින කොට අපේ රටවල නිෂ්පාදනවලට තිබෙන ඉල්ලුමත් පහත බහිනවා; මිල පහත බහිනවා. නමුත් අලුත්ම ආර්ථික ප්‍රවෘත්ති දිහා බලන කොට තමුන්නාන්සේලාට පෙනෙනවා, දැන් ඒ රටේත් එක්තරා වර්ධනයක් තිබෙනවාය කියලා. පසු ගිය වතාවේ "The Economist" සඟරාව පැහැදිලිව ප්‍රකාශ කරනවා, විශේෂයෙන් ඇමෙරිකාවේ අර පහළට වැටී ගෙන ආපු තත්ත්වය, රැකියා අහිමි වී ගෙන ආපු තත්ත්වය දැන් සමනය වෙමින්, mini-recovery එකක් තිබෙනවාය කියලා. ඒකට green shoots of recovery කියලා කියනවා. ඒක කොහොම වෙයිද කියා අපි දන්නේ නැහැ. ඒ ගැන ස්ථිර වශයෙන් කාටවත් කියන්න බැහැ. නමුත් පොඩි අවස්ථාවක් තිබෙනවා. ඒ තුළ තමයි අපේ නිපැයුම්වලට තවත් වෙළෙඳ පොළක් හදා ගන්න පුළුවන් වන්නේ. මා විශේෂයෙන්ම තමුන්නාන්සේලාට කියන්න ඕනෑ, අද තිබෙන Sri Lanka EXPO 2012 ප්‍රදර්ශනය ගිහින් බලන්න කියලා. ඒ ප්‍රදර්ශනය බලන්න ආපු සියලු දෙනාම කියන්නේ, "අපට පුදුමයි, ලංකාවේ මෙච්චර නිෂ්පාදනය තිබෙනවා"යි කියලායි. තමුන්නාන්සේලා ගිහින් බලන්න. ඒ ගොල්ලන් එක්ක සාකච්ඡා කරලා බලන්න. ඊයේ කවුද කථා කළේ? ඇමෙරිකාවේ -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විමල් වීරවංශත් -

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
තමුන්නාන්සේලාගේ හොඳ යාළුවෝ. [බාධා කිරීමක්] මා එකක් කියන්න ඕනෑ, තමුන්නාන්සේ කියපු නිසා. එහෙම නැත්නම් සාමාන්‍යයෙන් මා එහෙම කියන්නේ නැහැ. දැන් තමුන්නාන්සේලාගේ පක්ෂයට කොහෙන්ද "ඇහින්දාස්ලා" ටිකක් ගෙනැවිත් තිබෙනවා. දැන් මනමේන්ද්‍ර කියලා කෙනෙක් ඉන්නවා. ඔහු විතරයි ඒ පක්ෂයේ ඉන්නේ. නායකයෙක් කියලා ඔහුට කථා පවත්වන්න ඉඩ දෙනවා. තමුන්නාන්සේලාගේ නියෝජ්‍ය නායකතුමාට කථාවක් දෙන්නේ නැහැ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාගේ පක්ෂයේ කොච්චර ඇහින්දාස්ලා - නායකතුමායි, ඇහින්දාස්ලා හතර, පස් දෙනකුයි කථා කරනවා.- [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විමල් වීරවංශත් "ඇහින්දාස්" කෙනෙක්ද?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
දැන් දෙපැත්තේම පොඩි පොඩි සන්ධාන තිබෙනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)
ඔබතුමාව -[බාධා කිරීමක්] ඔබතුමා අපිත් එක්ක ඔහොම කථා කළා, අනික් අය යන කල්. ඉතින් ඔබතුමාත් ඒ job එක කළේ. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඇත්ත කියන කොට බොහොම අමාරුයි. ඔහොම කියලා හෝ ඔබතුමා පොඩි කථාවක් ඉල්ලා ගන්නකෝ. එතුමාටත් ඊළඟ වතාවේ කථාවක් ලැබෙයි. නමුත් මා ඒක කියන්නේ කාටවත් අපහාස කරන්න නොවෙයි. අද පක්ෂවල සන්ධාන තිබෙනවා. ඒ ඒ නායකයින්ගේ විවිධ අදහස් තිබෙන්න පුළුවන්. ඒවා මේ තරම් වැදගත් විවාදයකට ගෙනෙන්න වුවමනාවක් නැහැ.

මම තමුන්නාන්සේලාට කියන්නේ, අපේ ආර්ථික ප්‍රතිපත්තිය ගැනයි. එහි වැදගත් අංශයක් තමයි මේ රට, පිට රටට යවන්න පුළුවන් භාණ්ඩ නිෂ්පාදනය කරන රටක් බවට පත් කිරීම. ඒක හදිසි අවශ්‍යතාවක්. ඒ අදහස ඇතිව තමයි පසු ගිය අය වැයෙන් ගරු ජනාධිපතිතුමා මේ යෝජනා ගෙනාවේ, with sweeping changes. විශාල සහන දුන්නා. තමුන්නාන්සේලා දන්නේ නැති වුණාට මේ රටත් එක්ක වෙළෙඳාම් කරන්න කැමැති අය අද 3,500ක් ලංකාවට ඇවිල්ලා ඉන්නවා සාකච්ඡා කරන්න. අද කොළඹ හෝටලයක කාමරයක් ගන්නට බැහැ. ඒ වාගේ වැඩ කෙරී ගෙන යනවා. කරුණාකරලා ගිහිල්ලා බලන්න දැන් BMICH එකේ මොනවාද වෙන්නේ, මොනවාද සාකච්ඡා කරන්නේ කියලා. හැම දෙයටම කුඩුකේඩුකම්. ආරක්ෂාව ගත්තොත් කුඩුකේඩුකම්. සංවර්ධනය ගත්තොත් කුඩුකේඩුකම්. ජාත්‍යන්තර කටයුතු බැලුවොත් කුඩුකේඩුකම්. ඒ විධියට ඉදිරියට යන්න බැහැ. ඊර්ෂ්‍යාව මත දේශපාලනය කරන්න බැහැ. ඊර්ෂ්‍යාව මත පක්ෂයක් ගෙනියන්නත් බැහැ. ඊර්ෂ්‍යාව තුරන් කරන්න. මම විරුද්ධ පක්ෂයට ඉතාම ආදරයෙන් කියන්නේ, බුදුරජාණන් වහන්සේගේ අදහස් පිළිපදින්න; "නහී වේරේන වේරානි" - වෛරයෙන් වෛරය නොසංසිඳේ- ඒවා හිතට ගන්න; හොඳ ආර්ථික ප්‍රතිපත්ති ගෙනෙන කොට වෛර කරන්න එපා කියලායි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒවා ජාත්‍යන්තර ප්‍රජාවට කියන්න. අපිට නොවෙයි.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
ඒක අපි බලා ගන්නම් කෝ. තමුන්නාන්සේලා පොඩි පොඩි කුත්තු ගැහුවාට අපේ ගමන අපි යනවා. සිංහල හොඳ කවියක් තිබෙනවා, "ඔවා දෙනු පරහට - තමා සම්මතයේ පිහිටා සිට" කියලා. තමුන්නාන්සේලාගේ කැපිලි කෙටිලි, බෙලි කැපිලි තිබෙන කොට අනුන්ට බණ කියන්න එපා. ඉස්සර වෙලා ඔබතුමන්ලාගේ ප්‍රශ්නය විසඳා ගන්න. තේරුණාද? අනෙක් මිනිසුන්ගේ වැරදි හොයන්න එපා, තමන්ගේ ඇඟේ පුළුවන් තරම් කටු ඇණගෙන තියෙනකොට. හොඳ වාද විවාදයක් කරන්න ඕනෑ නම් හොඳ වාද විවාදයක් කරමු. එක එක්කෙනා විවේචනය කරන්න ඕනෑ නම් තමුන්නාන්සේලාට ගහන්න ඕනෑ තරම් දේවල් අපිට තිබෙනවා. එහෙම නොවෙයි.

අපි කියන්නේ, අපේ ආර්ථික ප්‍රතිපත්තිය මේකයි; ඒ අනුව අපි නීති රාමුව සකස් කරනවා; ඒ තුළින් දියුණු වන රටක් වශයෙන්, විශේෂයෙන් යුද්ධයක් කර අවසානයට පැමිණි රටක් වශයෙන් වෙළෙඳ ශේෂයේ තිබෙන ප්‍රශ්න විසඳන්න අපි කටයුතු කර ගෙන යනවා කියලායි. අපි ඒවාට ප්‍රතිපත්තිමය තීන්දු ගන්නවා. කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන ආයෝජන තුළින් ඒවා දියුණු කරන්න වෙනවා. ඒ නිසා මේ සංශෝධන පනත් කෙටුම්පත්වලට තමුන්නාන්සේලා සහයෝගය ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**** සභාමේසය මත තබන ලද ලේඛනය***
** சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
** Document tabled:*

## රජයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රයෝජනය සඳහා වූ සටහනකි

පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් 06 මගින් ඉදිරිපත් කරනු ලබන ප්‍රධාන සංශෝධන පහත සඳහන් පරිදි වේ.

**i. එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත**

(අ) එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් කිරීම්

- ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් සිනමාශාලා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ, ඖෂධ නිෂ්පාදකයින් විසින් ඖෂධ නිෂ්පාදනය සඳහා භාවිතා කරන යන්ත්‍රෝපකරණ, දේශීයව සම්පීඩනය කර කුට්ටි කළ ගල් අඟුරු නිෂ්පාදනය සඳහා ආනයනය කරන යන්ත්‍රෝපකරණ, හරිතාගාර ඉදිකිරීම සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය ආනයනය කිරීම.

- බලශක්ති නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, දේශීයව එකතු කළ අගය සහිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට හැකි වන පරිදි සංචාරක හෝටල් සහ ගුවන් සේවා සඳහා දේශීය අමු ද්‍රව්‍ය භාවිතා කරමින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ, ටින් කළ මාළු, ටර්බයින්, හඳුනාගත් රාජ්‍ය ආයතන විසින් ආනයනය කරනු ලබන භාණ්ඩ වෙනුවට ආදේශ කළ හැකි දේශීයව නිෂ්පාදිත භාණ්ඩ සැපයීම, මැටි ආශ්‍රිත නිෂ්පාදන, පර්යේෂණ සහ සංවර්ධන සේවා, වාණිජ දෙපාර්තමේන්තුව විසින් සපයන සේවා හා චිත්‍ර නිර්මාණ සැපයීම.

- ලොරි, ට්‍රක්රථ හා බස්රථ (අවුරුදු පහට වඩා පැරණි නොවන), ක්‍රීඩා උපකරණ, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ, සුවඳ විලවුන්, ඉරූ දූව, කුකුල් මස් නිෂ්පාදනය සඳහා අවශ්‍ය උපකරණ, උදලු හා මුල්ලු, අව් කණ්ණාඩි සහ නිර්මාණ කණ්ණාඩි, ඇස් කණ්ණාඩි දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, අලෝක සංවේදී අර්ධ සන්නායක උපකරණ ආනයනය හෝ සැපයීම.

- ආනයනයේ දී කිලෝග්‍රෑමට රු. 75 ක බද්දට යටත් කරන ලද දේශීය වෙළෙඳපොලේ පරිභෝජනය සඳහා ආනයනය කරන රෙදි.

- රෙදිපිළි හා ඇඟලුම්වල ගුණාත්මකබව වැඩි දියුණු කිරීම සඳහා වන සේවා

- දේශීයව නිෂ්පාදිත පාම් ඔයිල් සැපයීම 2012.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි (මෙම යෝජනාව අයවැය යෝජනාවල ඇතුළත් නොවීය).

(ආ) යෙදවුම් බදු සීමා කිරීම් ලිහිල් කිරීම

(ඇ) සිමෙන්ති, ඖෂධ, රෙදිපිළි හා කිරිපිටි ආනයනය ප්‍රතිස්ථාපන සඳහා වන බදු විරාම සහිත විශාල පරිමාණයේ ආයෝජන ව්‍යාපෘති සඳහා එම ව්‍යාපෘති ආරම්භ කරන කාල පරිච්ඡේදය තුළ ආනයනය කරනු ලබන පිරියත, යන්ත්‍රෝපකරණ හෝ උපකරණ එකතු කළ අගය මත බදු ගෙවීමෙන් විලම්භනය කිරීම.

**ii. ආදායම් බදු (සංශෝධන) පනත් කෙටුම්පත**

(අ). ආයෝජන දිරි ගැන්වීම සඳහා පහත සඳහන් ව්‍යවසායන් සඳහා අනෙකුත් සහනයන් ද සමඟ පහත සඳහන් සහන ලබා දීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට බලය ලබා දීම.

- කෘෂිකර්මය, කෘෂි සැකසුම්, සත්ව පාලනය, මාලු ඇල්ලීම, මාලු සකස් කිරීම, තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර/දැනුම් ක්‍රියාදාමයන් බාහිරින් ලබා ගැනීම, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, රූපලාවන්‍ය කටයුතු, ශීත කාමර සහ ගබඩා, සංචාරක කර්මාන්තය, ක්‍රීඩා හා ශරීර සුවතා මධ්‍යස්ථාන, කලා කටයුතු ඇතුළු නිර්මාණශීලී කටයුතුවල නිරතවන නව ව්‍යවසායන් සඳහා බදු විරාමයන් ව්‍යාප්ත කිරීම.

- නව ව්‍යවසායන් සඳහා ආයෝජනය රු. මිලියන 50 නම් අවුරුදු 3 ක් හා රු. මිලියන 50 ට වැඩි නම් අවුරුදු 7 දක්වා පමණක් පැවති බදු විරාම කාල සීමාව, ආයෝජන සීමාව රු. මිලියන 25 සිට 100 දක්වා වසර 4 ක්, රු. මිලියන 100 සිට 200 දක්වා වසර 5 ක්, රු. මිලියන 200 සිට 500 දක්වා වසර 6 ක්, රු. මිලියන 500 සිට 700 දක්වා වසර 7 ක්, රු. මිලියන 700 සිට 1,000 දක්වා වසර 8 ක් රු. මිලියන 1,000 සිට 1,500 දක්වා වසර 9 ක් රු. මිලියන 1,500 සිට 2,500 දක්වා වසර 10 ක් රු. මිලියන 2,500 වැඩි නම් වසර 12 ක් දක්වා වන පරිදි බදු විරාම කාලය පුළුල් කිරීම.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

- පවතින ව්‍යාපාර පුළුල් කිරීම සඳහා බදු සහන ලෙස අවම වශයෙන් රු. මිලියන 50 ක් 2015 මාර්තු 31 ට පෙර ආයෝජනය කරන්නේ නම් ආයෝජනය කළ වර්ෂයේ සිට වර්ෂ 4 ක කාලයක් තුළ ආයෝජන මුදලින් සියයට 25 ක උපරිමයකට යටත්ව තක්සේරු වන ආදායමෙන් අඩු කිරීමට සුදුසුකම් ලබන ගෙවීමක් ලෙස සැලකීම.

- ආනයන ප්‍රතිස්ථාපන ව්‍යාවසාය දිරිගැන්වීමට බදු සහන ලෙස සිමෙන්ති (ආයෝජන සීමාව ඇ.ඩො. මිලියන 50), ඖෂධ (ආයෝජන සීමාව ඇ.ඩො. මිලියන 10), රෙදි පිළි (ආයෝජන සීමාව ඇ.ඩො. මිලියන 5), කිරිපිටි (ආයෝජන සීමාව ඇ.ඩො. මිලියන 30) යන ක්ෂේත්‍රවල නව ව්‍යාවසායන් සඳහා වසර 5 ක බදු විරාමයක් හා ඉන් පසුව සියයට 12 ක සහනදායී බදු අනුපාතයක් ද එම ක්ෂේත්‍රවල පවතින ව්‍යාවසාය පුළුල් කිරීම සඳහා ඉහත සඳහන් සුදුසුකම් ලබන ගෙවීම් සහනයන් සහිත වසර 5 ක සියයට 12 ක සහනදායී බදු අනුපාතයක් ලබා දීම.

(ආ). අනෙකුත් ආදායම් බදු නිදහස් කිරීම්

- ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ හා ළමා ආරක්ෂණ අධිකාරියේ ලාභාංශ හා පොලී ආදායම් නොවන ලාභ.

- බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන රාජ්‍ය භාග.

- ඒකක භාර හෝ අන්‍යෝන්‍ය අරමුදලක ඒකක නිදහස් කර ගැනීමෙන් ලැබෙන ලාභ සහ ආදායම්

- ශ්‍රී ලංකාවේ පුද්ගලයෙකුට හෝ හවුල් ව්‍යාපාරයකට දෙනු ලබන විදේශ ණයක් මත උපචිත වන පොලී

- ක්‍රීඩාංගන, ක්‍රීඩාගාර හෝ ක්‍රීඩා සංකීර්ණ පරිපාලනයෙන් ලැබෙන ලාභ හා ආදායම්

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන ක්‍රීඩා පුහුණුකරුවකුගේ සේවය සඳහා ලබන ආදායම්

(ඇ). සහනදායී ආදායම් බදු අනුපාත

- පර්යේෂණ හා වැඩි දියුණු කිරීම් කටයුතු සඳහා ආදායම් බදු අනුපාතය, සමාගමක් නොවන පුද්ගලයෙකු සම්බන්ධයෙන් සියයට 16 ක උපරිමයකටත්, සමාගමක් සම්බන්ධයෙන් සියයට 24 ටත් අඩු කිරීම.

- සංවර්ධන බැංකු කටයුතු සඳහා අලුතින් පිහිට වූ වාණිජ බැංකු ශාඛාවක ලාභ සහ ආදායම් බදු අනුපාතය සියයට 20 කට අඩු කිරීම.

- ශ්‍රී ලාංකික වෙළෙඳ නාමයකින් අගය වැඩි කිරීමක් සහිතව පිරිසිදු ශ්‍රී ලංකා තේ අපනයනය කිරීම සඳහා බද්ධ ව්‍යාපාරයක නිරතවන නිෂ්පාදකයෙකු විසින්

- සෞඛ්‍ය සේවා සහ දේශීය අත් යන්ත්‍ර රෙදි නිෂ්පාදනයෙන් ලබන ලාභ සහ ආදායම් සඳහා බදු අනුපාතය සියයට 12 ක උපරිමයක් දක්වා අඩු කිරීම.

(ඈ). ප්‍රාග්ධන වියදම් සහ ගමන් වියදම් ආදායම් බදු ගෙවීමට යටත් වන ආදායමෙන් අඩු කිරීමට ඉඩ දීම

- බලශක්ති පාවිච්චිය කාර්යක්ෂම කිරීම සඳහා තාක්ෂණයෙන් ඉහළ ඕනෑම පිරියත, යන්ත්‍ර හෝ උපකරණ මිල දී ගැනීමේ පිරිවැය මත සියයට 50 ක් බැගින් අඩු කිරීමට ඉඩ දීම.

- මෝස්තර සංවර්ධනය, නිෂ්පාදන සංවර්ධනය සහ නව නිෂ්පාදිත සොයා ගැනීම යන සේවාවන්ම පමණක් සපයන සමාගම් එම සේවා සැපයීම සම්බන්ධයෙන් දේශීයව හෝ විදේශීයව දරන ගමන් වියදම් සම්පූර්ණයෙන් අඩු කිරීමට ඉඩ දීම.

- ක්‍රීඩාංගන, ක්‍රීඩා මණ්ඩප හෝ ක්‍රීඩා සංකීර්ණ නඩත්තුව හෝ පරිපාලනය කිරීම වෙනුවෙන් යම් තැනැත්තෙකු විසින් දරනු ලබන සම්පූර්ණ වියදම සීමාවක් රහිතව අඩු කිරීමට ඉඩ දීම.

- පර්යේෂණ හා වැඩිදියුණු කිරීම් වියදම් එම කාර්යය පර්යේෂණ කටයුතු සඳහා පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයකින් කර ගනු ලබන්නේ නම් වියදම් තුන් ගුණයකින් අඩුකිරීමට ඉඩ දීම.

(ඈ). ලැබිය හැකි පිරිවැටුම මිලියන 500 නොඉක්මවන නව කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාරිකයින්ගේ වාණිජ කටයුතු ඇරඹීමට පෙර තක්සේරු වර්ෂයේ දරනු ලබන වියදම් වාණිජ කටයුතු ආරම්භ කළ වර්ෂයේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කිරීමට ඉඩ දීම.

(ඉ). දුෂ්කර ගම්මානයන්හි සිදු කරන ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සඳහා දරන ලද වියදම් පුද්ගලයෙකු සම්බන්ධයෙන් රු. මිලියනයක උපරිමයකට හා සමාගමක් සම්බන්ධයෙන් රු. මිලියන 10 ක උපරිම සීමාවකට යටත්ව ආදායම් බදු නිදහස සඳහා සුදුසුකම් ලබන ගෙවීම් ලෙස සැලකීම.

(ඊ). නිල ලැයිස්තුගත සමාගමක් සමාගම් සමූහයක සාමාජිකයෙක් වන විට විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවය එම නිල ලැයිස්තුගත සමාගමේ සියලු සාමාජික සමාගම් සහ ආශ්‍රිත සමාගම් සඳහා ද ව්‍යාප්ත කිරීම.

**iii. ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධිත) පනත් කෙටුම්පත**

(අ) ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීමෙන් නිදහස් කිරීම්

- ආනයනය කිරීම:
  අභ්‍යාවකාශ හෝ නැව්, කෘතිම පාද, කිහිලිකරු, රෝද පුටු, ශ්‍රවණ ආබාධ සහ දෘශ්‍ය ආබාධ සඳහා භාවිතා කරනු ලබන උපකරණ, සකස් නොකළ දුව කඳන්, රෙදි පිළි කර්මාන්තයට අවශ්‍ය නූල්, දේශීයව වෙළෙඳපොලේ පරිභෝජනය සඳහා අවශ්‍ය රෙදි
- තොග සහ සිල්ලරට විකිණීම
  මුද්‍රිත පොත්, අපනයනකරුවන් සඳහා අවශ්‍ය භාණ්ඩ, එකතු කරන්නන් විසින් සපයන නැවුම් කිරි, අමු තේ දළු, කුරුඳු සහ රබර් සහ පිරිවුම්හලක විකුණන පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල්.
- දේශීය නිෂ්පාදනය කළ මැටි උළු කැට සහ මැටි ආශ්‍රිත නිෂ්පාදන එම නිෂ්පාදකයා විසින් විකිණීම
- චිත්‍ර නිර්මාණකරුවෙකු විසින් තම චිත්‍ර විකිණීම

**iv. වරාය හා ගුවන් තොටුපොල සංවර්ධන බදු (සංශෝධිත) පනත් කෙටුම්පත**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 17 (අ) හෝ 20 වගන්තිය යටතේ බදු ගෙවීමෙන් නිදහස ලැබීමට සුදුසුකම් ලබන ආයතනයක් විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග එළඹ ඇති ගිවිසුමක සඳහන් කාර්යන් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ ආනයනය කරනු ලබන පිරිවිත හා යන්ත්‍රෝපකරණ සඳහා ගෙවිය යුතු වරාය හා ගුවන් තොටුපොල සංවර්ධන බද්ද ගෙවීම බැංකු ඇපකරයක් ඉදිරිපත් කිරීමට යටත්ව විලම්භනය කිරීම.

**v. ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත් කෙටුම්පත**

(අ) ආර්ථික සේවා ගාස්තු ගෙවීමෙන් නිදහස් කිරීම

ලාභ ආදායම් බද්දට යටත්වන ඕනෑම ව්‍යාපාරයක පිරිවැටුම සහ දේශීයව නිෂ්පාදනය කළ මැටි උළු කැට හා මැටි ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදකයා විසින් සැපයීම.

(ආ) ආර්ථික සේවා ගාස්තු බදු බැඳියාවෙන් නිදහස් සීමාව කාර්තුවකට රු. මිලියන 25 සිට 50 දක්වා වැඩි කිරීම

**vi. මුදල් (සංශෝධිත) පනත් කෙටුම්පත**

(අ) පහත සඳහන් කේන්ද්‍රස්ථාන සේවා සඳහා රේගු ආඥා පනත, ආනයන අපනයන පාලන පනත සහ විනිමය පාලන යටතේ වන රෙගුලාසිවලට යටත් වීමෙන් නිදහස් කිරීම.

- ඇගළුම් ආශ්‍රිත ආනයනයන්, සරල සකස් කිරීම සහ ප්‍රති අපනයනය සම්බන්ධයෙන් වන අන්තරාල වෙළෙඳාම
- ඇගළුම් රෙදි පිළි සම්පාදනය හෝ නිෂ්පාදනය එක් රටක සිදු වී, ශ්‍රී ලංකාවේ නාවික ක්‍රියාකාරකම්වලට ගෙන ඒමක් නොමැතිව තවත් රටකට අපනයන කෙරෙන ඇගළුම්, රෙදි පිළි ප්‍රති නැව්ගත කිරීමේ ව්‍යාපාර
- කලාපීය ඇගළුම් නිෂ්පාදකයින්ට පෙර නිමි සේවා සැපයීම
- මුදල් පරිපාලනය සැපයීම් ක්‍රියාවලිය හා බිල් කිරීම කටයුතු සඳහා ශ්‍රී ලංකාවේ මූලස්ථාන ස්ථාපනය කිරීම සඳහා ප්‍රධාන ගැණුම්කරුවන්ට ප්‍රවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවේ, විවිධ රටවල් සංගෘහිත කිරීම වැනි කාර්ය සංවිධානය ප්‍රවර්ධනය කිරීම

(ආ) මෝටර් වාහන අලුතින් ලියාපදිංචි කිරීමේ දී ගෙවිය යුතු ගාස්තු සරළ කිරීම සඳහා ඒ සඳහා අදාළ [illegible] මෝටර් වාහන අලුතින් ලියාපදිංචි කිරීමේ ගාස්තු සමග ඒකාබද්ධ කිරීම. ඒ අනුව යතුරු පැදි, ත්‍රී වීලර්, මෝටර් ට්‍රයිසිකල් වෑන්, මෝටර් කාර්, ප්‍රයිම මූවර්, ෆෝක් ලිෆ්ට් සහ ද්විත්ව කාර්ය වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු පමණක් වැඩි කිරීම සහ අත් ට්‍රැක්ටර්, බස්, ලොරි, ට්‍රැක්ටර් ට්‍රේලර්ස්, ට්‍රැක්ටර්ස්, ඉඩම් වාහන, ලොරි ට්‍රේලර්, අවමංගල රථ, ගිලන් රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු වැඩි නොකිරීම.

(ඇ) සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී හා ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්ද වැඩි කිරීම.

(ඈ) තරු පහේ හෝටල් කාමර බද්ද ගෙවීම ගුවන් සේවා කාර්ය මණ්ඩලය සඳහා අදාළ නොකිරීම.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

[පූ. භා. 10.20]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, වැදගත් සංශෝධන පනත් කෙටුම්පත් හයක් දෙවන වර කියැවීම සඳහා මේ ගරු සභාවට ඉදිරිපත් කරලා, අපේ එක්සත් ජාතික පක්ෂයට සහ අනෙකුත් විරුද්ධ පක්ෂවල අදහස් යොමු කරන්න මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වනවා.

හිටපු මුදල් ඇමතිතුමනි, ඔබතුමා වියට්නාම් දූත පිරිස එක්ක සාකච්ඡාවට යන්න ඉස්සෙල්ලා ටික වෙලාවක් මෙතැන ඉන්න. අපි කියන එක අහගන්න. [බාධා කිරීම්] You are competing with the same things. ඔබතුමා දන්න ටිකත් අරගෙන අපට තිබෙන ටිකත් නැති කරයි.

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා පනත් කෙටුම්පත් හයක් දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කළා. නමුත් ඒ පනත් කෙටුම්පත් හයෙන් ලංකාවට ලැබෙන වාසිදායක තත්ත්වය මොකක්ද කියන එක පෙන්නුවේ නැහැ. We are definitely an island of poverty in an ocean of prosperity. You did not say as to how you are going to take us out from this and make Sri Lanka a prosperous country. මේක තමයි තිබෙන ප්‍රශ්නය.

ගරු කථානායකතුමනි, මම කථාව පටන් ගන්නේ ඔබතුමාගේ රජ කියමනකින්. මා අගය කරනවා, ඔබතුමා අප වෙනුවෙන් පාර්ලිමේන්තුවෙන් පිටතදීත් කථා කර තිබීම ගැන. ඔබතුමා කියලා තිබෙනවා, "මට ලැබෙන වැටුප ජීවත් වන්න මදි. ඉතින් රජයේ සේවකයන් ගැන මොනවා කථා කරන්නද?" කියා. ස්තුතියි ගරු කථානායකතුමනි, ඔබතුමාගේ ඒ අවංක ප්‍රකාශයට. ඒ විතරක් නොවෙයි, ඔබතුමා එක වරක් කිව්වා, "මේ විධායක බලතල එක පුද්ගලයෙකුට තිබෙන එක අනවශ්‍යයි" කියලා. ඒ ප්‍රකාශයත් අපි අගය කරනවා. ඔබතුමා ඔය පුටුවේ ඉන්න කාලයේ පුළුවන් නම් මේ විධායක බලතල අයින් කරලා, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නැවත ඇති කරන්න කටයුතු කරන්න. ප්‍රායෝගිකව කටයුතු කරන්න ඕනෑ කොහොමද කියන එක මේ ආණ්ඩුවට පෙන්වා දීමෙන් ඔබතුමා අපේ වරප්‍රසාදත් ආරක්ෂා කර තිබෙනවාය කියන එක මතක් කරන්න කැමතියි. ඒ ගැන ඔබතුමාට බොහොම ස්තුතියි ගරු කථානායකතුමනි. එහෙම තමයි, කථානායකතුමෙකු කටයුතු කරන්න අවශ්‍ය වන්නේ.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු කථානායකතුමනි, එක කාරණයක් තිබෙනවා කියන්න. අද අපි කථා කරන්නේ වැදගත් පනත් කෙටුම්පත් කීපයක් ගැන. විශේෂයෙන්ම එක පනත් කෙටුම්පතක් ගැන හුඟක් කරුණු පැහැදිලි කරන්න ඕනෑ. නමුත් දැන් මේ අවස්ථාවේදී ඒකට ඇමතිවරයෙක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කෝ, කවුද මුදල් ඇමති?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

දැන් මේ මන්ත්‍රීතුමා කියන දේ අහගන්න කෙනෙක් නැහැනේ. ඉතින් කොහොමද පිළිතුරු දෙන්නේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මම රීති ප්‍රශ්නයක් මතු කරනවා. ඇමතිවරයා පනත් කෙටුම්පත් ඉදිරිපත් කරලා මෙතැනින් යන්න හදනවා. එතුමා යනවා. මේක සාධාරණද? [බාධා කිරීම්] මට එතුමාගෙන් අහන්න ප්‍රශ්න කීපයක් තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

මම හිතන හැටියට එතුමා පිටත ඉඳගෙන අහගෙන ඉන්නවා. එතුමා අහගෙන ඉන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කොහේද අහගෙන ඉන්නේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

අපට උත්තර දෙන්න එතුමා මෙතැන ඉන්න ඕනෑ. මේක බලවත් අසාධාරණයක්. මේ පාර්ලිමේන්තුවට නින්දාවක්, පනත් කෙටුම්පත් ඉදිරිපත් කරලා මෙහෙම යන එක.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අපි බලමු තමුන්නාන්සේලා ඉදිරිපත් කරන තර්කවලට පිළිතුරු දෙයිද කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කොයි වෙලාවේද කථානායකතුමනි පිළිතුරු දෙන්නේ? දැන් විපක්ෂය වෙනුවෙන් මම හඬ නගන්න යනවා. කරුණාකර ඒවාට පිළිතුරු දෙන්න කියන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

විවාදය අවසානයේ ගරු ගීතාංජන ගුණවර්ධන-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අන්න හරි, ගරු කථානායකතුමනි. මෙතුමන්ලා හොඳින්ම දන්නවා, විවාදය අවසානයේදී ඇමතිතුමාට පිළිතුරු දෙන්න අයිතිය තිබෙන බව. ගරු ඇමතිතුමා මේවාට සවන් දෙනවා. එතුමාට කාමරයක් තිබෙනවා; එතුමාගේ නිලධාරින් ඉන්නවා. [බාධා කිරීමක්] මෙතුමන්ලා අද අලුත්ම තර්කයක් ගෙනෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එහෙම නම් ඇමතිවරු හැටහුටහමාරක් තියා ගන්නේ මොකටද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මොකක්ද point of Order එක දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, there is no Quorum. ආණ්ඩුවේ පනත් කෙටුම්පත් හයක් ඉදිරිපත් කර තිබෙන දවසක් වෙලාත් මේ පාර්ලිමේන්තුවේ Quorum එකක් නැහැ. Quorum එක නැතුව කොහොමද පාර්ලිමේන්තුවේ කටයුතු කරගෙන යන්නේ. ඇමතිවරයාත් නැහැ; Quorum එකත් නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න, Quorum එක තිබෙනවාද කියලා ගණන් කරලා බලනතුරු.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ගණපූරණයක් තිබුණෙන්-***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*பிறகு, கூட்ட நடப்பெண் இருந்ததனால் -*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*
*Later, a Quorum being present-*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, විවාදය ආරම්භ කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, අපි ඉන්න නිසායි Quorum එක තිබෙන්නේ. අපි ගියා නම් Quorum එක නැහැ. බලන්න අපි ඔබතුමන්ලාට උදව් කරන විධිය. [බාධා කිරීමක්] අපි ද නැවැත්වූවේ? ඔබතුමන්ලා නේ මැර කණ්ඩායමක් දමලා ගැහුවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විවාදය කර ගෙන යන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී මා නැවත ඔබතුමාට මතක් කරන්නේ මේ පනත් කෙටුම්පත් හය ගෙනෙන්නේ රටේ ඵලදායිතාව වැඩි කරලා, රටේ නිෂ්පාදනයේ තරගකාරිත්වයක් ඇති කරලා පුංචි ලංකාවට ලෝකයත් එක්ක තරග කරන්න පුළුවන් වාතාවරණයක් ඇති කරන්නයි. එහෙම තමයි එදා මුදල් ඇමතිවරයා වශයෙන් ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා ප්‍රකාශ කරමින් මෙවා ඉදිරිපත් කළේ. ඒවා කොතරම් වැදගත් වුණත්, ඔබතුමාට විශේෂ සාකච්ඡාවක් කැඳවන්න සිද්ධ වුණා, මාර්තු 30 වැනිදාට ඉස්සෙල්ලා මේවා පාර්ලිමේන්තුවේදී සම්මත කරගන්න ඕනෑ කියලා දැනුම් දෙන්න. එතරම් වැදගත්කමක් තමයි අද මේ ආණ්ඩුව මුදල් ඇමතිතුමාගේ ප්‍රකාශවලට ලබා දීලා තිබෙන්නේ. අන්තිම පැයේදී තමයි අද මේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා තිබෙන්නේ. මෙහෙමද රටක් ඉදිරියට ගෙන යන්නේ? කථානායකතුමාත් එදා බොහොම ඕනෑකමින් මතක් කළා, මීට වඩා විධිමත්ව මේ කටයුතු ඉදිරියට කරගෙන යන්න ඕනෑ කියලා. අපි ඒක අගය කරනවා. ඒ වාගේම තරගකාරි තත්ත්වයක් ඇති කිරීම සඳහා මොනවාද ඉදිරිපත් කරලා තිබෙන යෝජනා? Economic Service Charge (Amendment) Bill එක මෙතැන තිබෙනවා. The amendment seeks various service charges as set out in Schedule II in this Bill. ඊ ළඟට, Nation Building Tax (Amendment) Bill එක තිබෙනවා. Amendment seeks to exempt the items set in Clause 3 and 4 of the Bill. ඒ දෙක, තුන ගැන ප්‍රශ්නයක් නැහැ. With regard to the Value Added Tax (Amendment) Bill, the amendment expands the suspension of tax to registered persons who supply more than 50 per cent of the total supply of goods or services.

ඒ කියන්නේ මේක, ලොකු අය තව ලොකු කරන වැඩක්. සාමාන්‍යයෙන් සියයට 74ක් වාගේ පිරිසක් තමයි සුළු සහ මධ්‍ය ව්‍යාපාරිකයන් වශයෙන් මේ රටේ සිටින්නේ. වාසුදේව නානායක්කාර ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුව මේ අය ගැන කථා කරන්නේ නැහැ. ඔබතුමා එදා මේ අය වෙනුවෙන් සටන් කළා. මා හිතන හැටියට අදත් ඔබතුමා නිහඬව සටන් කරනවා; තනියම සටන් කරනවා. නමුත් මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් අපි අහන්නේ මේවා ලොක්කන් තවත් ලොකු කරන්න යන වැඩ පිළිවෙළක්ද කියලායි. ශ්‍රම බල ශක්තියෙන් සියයට 85කට රක්ෂා සපයා දෙන, සියයට 74ක් වන ඒ අංශයට මේකෙන් ලැබෙන සෙත මොකක්ද?

ඒ වාගේම තමයි, it will assign special rates for fabrics and apparels. මේවායින් සියයට 88ක් අපි අපනයනය කරන්නේ ඇමෙරිකාවට සහ යුරෝපයට. ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලයේ ඉන්න විමල් වීරවංශ කියනවා අපි ඇමෙරිකාවේ බඩු වර්ජනය කරන්න ඕනෑ කියලා. තර්ජනය කරලා වර්ජනය කරන්න ඕනෑ කියනවා. අපි එහේ භාණ්ඩ වර්ජනය කළාම ඇමෙරිකාව නිකම් බලා ගෙන ඉන්නවාද? ඒ අය කිව්වොත් අපට ලංකාවේ බඩුත් ඕනෑ නැහැ කියලා? මේ ඇමති මණ්ඩලයේ ඉන්න පුද්ගලයෝ ඒවා දන්නවාද? අපි සියයට 29.8ක් ඇමෙරිකාවට අපනයනය කරන විට ඇමෙරිකාවෙන් ලංකාවට ආනයනය කරන්නේ සියයට .012යි. ඒ වාගේම තමයි යුරෝපයත්. ඇමතිවරු මේ වාගේ බොළඳ තර්ක ඉදිරිපත් කරන විට, ඔබතුමන්ලාගේම කැබිනට් මණ්ඩලයෙන් මෙවැනි වරප්‍රසාද දෙන්න කියලා මේ පනත් සංශෝධනය කරනවා. කාටද මේ වරප්‍රසාද දෙන්න හදන්නේ? වම් අත දන්නේ නැහැ දකුණු අත මොනවාද කරන්නේ කියලා.

දැන් කියයි ඉන්දියාව අපට විරුද්ධව ඡන්දය දුන්න නිසා බජාජ් ගේන්න එපා, අශෝක් ලේලන්ඩ් ගේන්න එපා කියලා. අපිට දැන ගන්න අවශ්‍යයි මේ වාගේ දේවල් කියලා රටේ ආර්ථිකය එක්ක සෙල්ලම් කරනවාද කියන එක. එක්කෙනෙක් දෙන්නෙක් "L" boards දාගෙන ගිහින් හැප්පුනාට කමක් නැහැ; ඒ අය නැති වුණාට කමක් නැහැ; කැබිනට් මණ්ඩලය නැති වුණාට කමක් නැහැ. නමුත් රටේ ආර්ථිකය නැති කිරීම අපි තරයේම ප්‍රතික්ෂේප කරනවා.

ජනතාව ඔබතුමන්ලාට තාවකාලිකව රට බාර දීලා තිබෙනවා. මේ රට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවකට බාර දීලා

[ගරු රවි කරුණානායක මහතා]

තිබුණු හැම අවස්ථාවකදීම රටේ ආර්ථිකය බින්දුවට වට්ටලා තමයි නැවත එක්සත් ජාතික පක්ෂයට භාර දෙන්නේ, රට හදපල්ලා කියලා. ඒක 1956 දී වුණා; 1970 දී වුණා; 2001 දී වුණා. ඒ හැම අවස්ථාවේදීම රට හැදුවේ කවුද? හැදුවේ එක්සත් ජාතික පක්ෂයයි. මේ තිබෙන ආර්ථිකය ගැන කථා කරන විට, ජාතික ආර්ථිකය ගැන කථා කරන විට අපටත් ඒක හදන අවශ්‍යතාව තිබෙනවා. මේ රටේ ආර්ථිකය හදන්න තිබෙන්නේ අපට. රටේ ආර්ථිකය කඩලා, වට්ටලායි අපට දෙන්නේ. ඒක කඩලා දාලා අපට දෙන්න එපා.

ගරු ඇමතිතුමා, you say that you are giving special rates for fabrics and apparels. මේවා කොහේ යවන්නද? ලංකාවෙන් කියුබාවට යවන්නද? ලංකාවෙන් උතුරු කොරියාවට යවන්නද? නැත්නම් කොළඹින් මැද මුලනට යවන්නද? මේවා තමයි අපිට දැන ගන්න ඕනෑ වන්නේ.

There are certain good things. ගරු කථානායකතුමනි, මේ ඉදිරිපත් කරලා තිබෙන කරුණු ඔක්කොම නරකයි කියලා විපක්ෂය හැටියට අපි කියන්නේ නැහැ. අපි ඒ වාගේ කුහක විපක්ෂයක් නොවෙයි. අපි කියන්නේ මේකයි. රජය සමස්තයක් වශයෙන්, මධ්‍යස්ථ වශයෙන් මේ දේවල් සම්බන්ධව කටයුතු කරන්නේ ඉදිරි දැක්මක් සහිතව නොවෙයි. Then, we will take up the Finance Bill. You are bringing amendments levies charged by Five Star Hotels. මේවා හොඳයි. It is very good. Why have you not done this before? When we told this, you said, "මොකටද මේවා සුද්දන්ට දෙන්නේ." කියලා. අපේ ජාතික ආර්ථිකය ආරක්ෂා කරන්න ඕනෑය කියපු අය දැන් ජාතික ආර්ථිකය කුඩුපට්ටම් කරලා තිබෙනවා.

මේවාට දෙනවාද? අද සාමාන්‍ය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෙකුට ණයක් ගන්න ඕනෑ නම්, ඒ ණය ගන්න වන්නේ කීයක පොලියකටද? සියයට 20යි; 22යි; 23යි. එහෙම පොලියකට මේ අයට ණය දීලා මොකටද? කාටද මේක හදන්නේ? ඔබතුමන්ලාගේ වචනවලින් කියනවා නම්, blue-chip කොම්පැනිවලට, සුද්දන්ගේ කොම්පැනිවලටද? ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් අදහසක් මේ අය වැයෙන් ඉදිරිපත් වුණේ නැහැ. ඒක තමයි අපි මාස හතරක් පෙන්වලා දීලා තිබුණේ. මේක රටේ ආර්ථිකයට වාගේම සමස්ත අහිංසක ජනතාවටයි බලපාන්නේ. අන්තිමට ඔබතුමන්ලා වග කියන්න අවශ්‍ය වන්නේ ජනතාවටයි.

දැන් මොකක්ද රටේ තිබෙන තත්ත්වය? ඔබතුමන්ලා විකුණන එකම දේ තමයි ජිනීවා. දැන් මේ අයට වෙන නමක් නැහැ, ජිනීවා හැර. ඇයි එහෙම කරන්නේ? පෙට්‍රල් මිල රුපියල් 13කින් වැඩි කළා; ඩීසල් මිල රුපියල් 35කින්, 40කින් වැඩි කළා; භූමිතෙල් මිල රුපියල් 50කින් වැඩි කළා. විදුලි බිල ඊයේ ආවා. ඒක දැක්කාම electric shock එකක් වැදුණා වගේ වුණා. මොකද, සියයට 40කින් වැඩි කරලා. මේවා කරන කොට ඔන්න පත්තරේ තිබෙනවා, ගිනි පෙට්ටි මිලත් රුපියල් 5කින් වැඩි කරලා කියලා. එහෙම ගිනි පෙට්ටිවල මිල වැඩි කරන්න ඕනෑය කියලා කියන්න ඕනෑද?

ගරු කථානායකතුමනි, ඉතින් ඒ ඔක්කෝම වසන් කරන්න තමයි ජිනීවා ගැන කථා කරන්නේ. ශ්‍රී ලංකා කොඩිය බදා ගෙන, ජාතිකත්වය තුළින් "ජිනීවා, ජිනීවා, ජිනීවා" කියනවා. ජිනීවා ගැන කියන කොට මම බොහොම සතුටුයි, අපේ විදේශ කටයුතු ඇමති - Minister of External Affairs - ජී.එල්. පීරිස් මැතිතුමා මෙතැන ඉන්න එක ගැන. දැන් මහින්ද සමරසිංහට මාස තුනක නිවාඩුවක් දීලා තිබෙනවා. මොකටද දන්නේ නැහැ. මොකද, ඒ ඡන්ද ඔක්කෝම ලබා ගත්ත නිසා ද දන්නේ නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

It is from January.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒක දෙන්නේ නැතුව හිටියා නම් වැඩිය හොඳයි නේ. වැඩ බලපු විදේශ කටයුතු ඇමතිට -ඩිව් ගුණසේකර ඇමතිතුමාට- වැඩේ දුන්නා නම් ඒකත් කරලා දානවා නේ. ඉතින් මේ සම්බන්ධයෙනුයි අපි කථා කරන්නේ. Your Cabinet does not act in unison. Your left hand does not know what the right hand is doing. The Hon. Wimal Weerawansa does not know what the Minister of Finance is doing. The Minister of External Affairs does not know what the Hon. Mahinda Samarasinghe is doing. This Finance Bill terminates the Withholding Tax on the Registration of Motor Vehicles. ඔන්න ඕවා හොඳ ඒවායි. But, what is more important is this: How does Part IV of the Finance Bill exempt certain enterprises from the provisions of Customs Ordinance, Exchange Control Ordinance and Import and Export (Control) Act, if such activities are carried on?

Hon. Vasudeva Nanayakkara, the Inland Revenue Act, No. 4 of 1963, the Customs Ordinance (Chapter 235), the Exchange Control Act (Chapter 423), the Companies Ordinance (Chapter 145), the Merchant Shipping Act, No. 52 of 1971, the Finance Act, No. 65 of 1961 and the Air Navigation Act (Chapter 365) are all encompassed in Schedule B of Section 17 of Greater Colombo Economic Commission Law, No. 4 of 1978.

අද ඇත්ත තත්ත්වය මේකයි. මේක සිදු වන්නේ මුදල් අමාත්‍යාංශයයි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයයි අතර තිබෙන සට්ටනය නිසා නේ. පී.බී. ජයසුන්දර මැතිතුමා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ BOI එකට මේ වාගේ වරප්‍රසාද දෙන්න කැමති නැහැ.

මේක ධම්මික පෙරේරායි, පී.බී.ජයසුන්දරයි අතර තිබෙන ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. ආර්ථික සංවර්ධන ඇමතිතුමා වැඩක් කර ගෙන යනවා කියලා පෙනෙනවා. මේක, ඒකට අකුල් හෙලන්න කරන වැඩ කටයුත්තක්ද දන්නේ නැහැයි කියන කාරණයත් අපි මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා. එක අමාත්‍යාංශයකින් අරන් අනෙක් අමාත්‍යාංශයට දාන්න හදන්නේ ඇයි? ඒ වාගේම දැන් බලන්න, BOI එකේ- [*Interruption.*] I am trying to come to that point. Exemptions that you are going to grant are being taken from one Ministry and put on to the other Ministry. The Ministry of Economic Development has the powers. I am just going to read out what the Minister has said about the BOI incentives: "Significantly, when you sign an agreement with the BOI, the specific incentives granted to an eligible company may include tax holidays or preferential tax rates, exemption from customs duty and foreign exchange controls". What you are trying to do is to arrogate powers from the Ministry of Economic Development and bring that under the powers and the controls of the Finance Ministry. There is no necessity of doing so

unless you want to redefine the actual running of the Ministry of Economic Development. So, that is what we are questioning at this particular moment.

Then, you go even further. You specify it under the Section 17 of the Greater Colombo Economic Commission Law. Tell me what you are going to give them more than what they have at the moment. The only perfidious act that seems to be taking place is taking it away from the Ministry of Economic Development. Is that the purpose of amending this particular Bill? Why is there a sense of urgency? It already exists in the line ministry which controls and markets. Now, what you are trying to do is, to make the BOI which is under the Ministry of Economic Development subservient to the Ministry of Finance in order to get the approval. Hon. Vasudeva Nanayakkara, imagine you are the relevant Minister. You have to go to the Finance Ministry to get approval for something under your own ministry. This is why it goes even further. You can amend certain things completely but complete eradication of those basically leads to a lot of problems. Where is this country heading to?

Look at what that they are going to give. This leads to complete exemption of taxes like port levies, customs duties, free port and everything. Now, they are going to bestow this right on the Sri Lanka Ports Authority and the Finance Ministry.

Six or seven months ago, there was a statement uttered that a nudist colony was going to be formed in Kalutara. Nobody objected to that; nobody rejected the claim that we made in Parliament. Now, imagine if the Sri Lanka Ports Authority says, "Okay, you can have a nudist colony in Waskaduwa, Kalutara, a gambling den and a casino", on the same basis, there would be prostitution also. Who is going to correct this type of things?

Then, the next issue is with the arms and ammunitions trade. Under entrepot trade, there are five trades which have been prohibited. One is arms and ammunitions trading; one is narcotics trading.

මේ ආණ්ඩුව මතට තිතක් තබන ආණ්ඩුවක්. දැන් ඒක සම්පූර්ණයෙන් අයින් කරන්න හදනවා. මොකටද? හම්බන්තොට වරාය ආරම්භ කරලා මාස 16ක් ගිහිල්ලාත් අද වන විට නැව් හයයි, හතයි නේ ගිහිල්ලා තිබෙන්නේ. වරාය අධිකාරියේ සභාපති හම්බන්තොට වරායේ ගලක් නැහැයි කිව්වාට ගලක් තිබුණා. ඒකට රුපියල් කෝටි 4,500ක් වියදම් කළා. එක පාරටම නැඟිටලා කියනවා, "ඔව්, මේ පැත්තට බදු රහිතව ඕනෑම දෙයක් ගේන්න පුළුවන්" කියලා. එතකොට මොනවාද ගේන්නේ? ගංජා විකුණන්නද? අරක්කු ගෙනැල්ලා විකුණන්නද? එහෙම නම් මොකටද, මේවා කරන්නේ? Why are you giving a *carte blanche*? Bring a separate Act to Parliament; come before Parliament and say, "Yes, this company needs to get this particular thing." ඇයි, මම එහෙම අහන්නේ? ඔබතුමන්ලා පසු ගිය පෙබරවාරි මාසයේ 12 වැනිදා භූමි තෙල් මිල සියයට 50කින් වැඩි කළා. එහෙම වැඩි කරලා ලැබෙන ආදායම රුපියල් මිලියන 6,800යි. එක පැත්තකින් ඒ ආදායම ලබා ගන්න හදන කොට, ෂැන්ග්‍රි-ලා හෝටලයට අක්කර 5ක් දෙන්න ඔබතුමන්ලාගේ කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරනවා. පිට රට කොම්පැනියකින් සියයට 100ක බද්දක් වශයෙන් රුපියල් කෝටි 1,100ක් ලබා ගන්න තිබුණ අයිතිය නැති කරනවා. ෂැන්ග්‍රි-ලා හෝටලය ඒක ගෙව්වා නම් අහිංසක මිනිස්සු පාවිච්චි කරන භූමි තෙල්වල මිල වැඩි කරන්න අවශ්‍යතාවක් නැහැ. භූමි තෙල්වල මිල වැඩි කිරීමේ ආදායම වශයෙන් රුපියල් කෝටි 675යි ලැබෙන්නේ. නමුත්, ෂැන්ග්‍රි-ලා හෝටලයෙන් බදු වශයෙන් රුපියල් කෝටි 1,100ක් ලබා ගත්තා නම්, භූමි තෙල්වලින් ලැබෙන ආදායම වාගේ දෙගුණයක් ලබා ගන්න අවස්ථාව තිබුණා.

ඒකෙන් බූමි තෙල් මිල අඩු කරන්න හැකියාවක් තිබුණා. නමුත්, ඒක නැති කරලා තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ෂැංග්‍රි-ලා කොම්පැනියෙන් ගෙවන්න තිබෙන මුදල් ගෙවීමට-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේම ආණ්ඩුව යූඑන්පී එකට හිනා වෙලා කිව්වා, සුද්දන්ට රට විකුණුවාය, ඒ නිසා බද්දක් ගෙනාවාය, සියයට සියයක් දමන්න ඕනෑය කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
විකුණනවා කියන්නේ ආදායමක්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඉස්සෙල්ලා විකුණනවාය කියන එකටත් විරුද්ධයිනේ. අපි හිතමුකෝ ඒක විකුණුවා කියලා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඇයි, ඒකෙන් ආදායමක් ආවේ නැහැ කියන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආදායමක් ආවා; ඒ ඉඩම ගත්තා. නමුත් ඒකට සියයට සියයක බද්දක් ගෙවන්න ඕනෑ. ඒ බද්ද තමයි කෝටි 1,100 කියන්නේ. දැන් මේ කෝටි 1,100 ගෙනාවා නම් අර බූමි තෙල් මිල වැඩි කරන්න අවශ්‍ය නැහැ. ඒකෙන් කෝටි 675ක් වාගේ දෙගුණයක් ලබා ගන්න තිබුණා. ඒක සුද්දාට දීලා තිබෙනවා, බදු විරාමයක් වශයෙන්. ඉතින් මේ වාගේ තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ වැඩ කටයුතු. වම් අත දන්නේ නැහැ, දකුණු අත මොකක්ද කරන්නේ කියන එක. ඊට පස්සේ කියනවා, එක්සත් ජාතික පක්ෂය ධනපති පක්ෂයක්, අරකද, මේකද කියලා. මේ රටේ ජාතිකත්වය නමින් හැම බිම් අඟලක්ම තුට්ටු දෙකට විකුණපු එකම පක්ෂය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. [බාධා කිරීමක්]

**ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)
(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු සී.බී. රත්නායක ඇමතිතුමනි, ඔබතුමා නැඟිට්ටේ මොනවා හරි කියන්න නොවෙයි නේද?

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake )
නැහැ, නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් බලන්න, මේ අහිංසක ගරු ඇමතිතුමාට සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා සියයට 25කින්, 35කින්, 40කින් ඩීසල් මිල වැඩි කළාම එතුමා ගිරේට හසු වුණු පුවක් ගෙඩිය වාගේ සියයට 25ක ප්‍රවාහන ගාස්තු වැඩි කරන්න වුණා. ඒක කළේ නැත්නම් බස් රථ ධාවනය කරන්නේ නැහැ. ඉතින් මොනවා කරන්නද? ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් වැඩක් තිබෙනවාද? "වැඩි කරපු හැටියේ වැඩි කරපල්ලා" කියලා ඕක භාර දුන්නා නම් සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාටම කිසි ප්‍රශ්නයක් නැහැනේ.

දැන් බලන්න, අපේ ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියනවා රුපියල් 2,500කින් ජීවත් වෙන්න පුළුවන් කියලා. මොන වාගේ සැප ලෝකයකට ද ගෙන යන්න හදන්නේ? අනේ! ඔබතුමන්ලා ලක්ෂයක් ගන්නවා ජීවත් වෙන්න බැහැයි කියලා. මේ අපේ අහිංසක ගරු කථානායකතුමා කියනවා එතුමාගේ පඩියෙනුත් ජීවත් වෙන්න බැහැයි කියලා. ඒ ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියනවා, රුපියල් 2,500කින් ජීවත් වෙන්න පුළුවන් කියලා. ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමනි, රුපියල් 2,500කින් ජීවත් වෙන්න පුළුවන්ද කියලා ඔබතුමා කියන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නොමැරී ජීවත් වෙන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් ඔබතුමන්ලාගේ ආණ්ඩුව ජනතාව නොමරා මරන ආණ්ඩුවක් වශයෙන්- [බාධා කිරීමක්] ඒ නිසා මා මේ අවස්ථාවේදී කියනවා, මේ සම්බන්ධයෙන් අපි විවාදයකට ලෑස්තියි කියලා. මොකද, එතුමාත් කියලා තිබෙනවා විවාදයකට ලෑස්තියි කියලා. අනිවාර්යයෙන්ම ඒ ගරු ඇමතිතුමා මේ රටේ ජීවත් වෙන්නේ නැති ඇමතිවරයකු වාගෙයි කටයුතු කරන්නේ. හිටපු වෙළෙඳ ඇමති වශයෙන් මම එතුමාගෙන් අහනවා, රුපියල් 2,500කින් ජීවත් වෙන්නේ කොහොමද කියලා කරුණාකර කියන්න කියලා. මම බොහොම සරල දෙයක් ගන්නම්. කෙනකු එක වේලකට පාන් බාගය බැගින් දවසේ වේල් තුන කාලා හිටියා නම් දවසකට පාන්වලටම රුපියල් 85ක් විතර යනවා නේද? මේක දවස් 30න් වැඩි කළාම රුපියල් 2,500ක් නේද? අපේ හිටපු වෙළෙඳ ඇමතිතුමා, ඒ වාගේම දැනට අධ්‍යාපන ඇමතිතුමා කියන ආකාරයට පාන්වලින් ජීවත් වෙන්න පුළුවන්ද? ඉතින් එතුමා ඔය වාගේ රජ කතා කියන කොට මේ රටේ සියයට පහණක් දරුවන් විභාග fail වුණාය කියන එක ගැන තව මොනවා කියන්නද? ඒ සම්බන්ධයෙන් අපි විවාදයකට සූදානම් බව මා කියා සිටිනවා. දැන් අපි අහනවා මොකටද මේ බදු දමන්නේ කියලා. මේ බදු දමන්නේ ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කිව්වා වාගේ ජීවත් වෙන්න පුළුවන් රුපියල් 2,500 තව වැඩි කරන්න නේද?

එක පැත්තකින් එහෙම දීලා ආදායම් ලබා ගන්න පුළුවන්. අනෙක් පැත්තෙන් විමල් වීරවංශ ඇමතිතුමා කියන්නේ මොනවාද? එක්ස්පෝ ප්‍රදර්ශනයක් තිබෙනවා කියලා සරත් අමුණුගම ඇමතිතුමා මෙතැන බොහොම වර්ණනා කළා. බොහොම හොඳයි. මමත් ඒ පැත්තේ ටිකක් සංචාරය කරලා බැලුවා. එතැනට එන කට්ටිය බලන්න. එතැන ඔළු තිබුණාට බලන්න, සියයට 5ක්වත් ආයෝජනය කරන්න ඒ අයගේ "පර්ස්" එකේ සල්ලි තිබෙනවාද? මොනවද මේ කියන්නේ? මෙච්චර ලොකුවට තියෙනවා කිව්වාට බැහැ, ඔබතුමන්ලා ඒවා target කරන්න ඕනෑ.

දැන් බලන්න, හම්බන්තොට වරායක් තිබෙනවා. අහිංසක තරුණ තරුණියන්ට රැකීරක්ෂා ලැබෙනවා කියලා ඔබතුමා බොහොම සන්තෝෂයෙන් ඉන්නවා නේද? කී දෙනකුට රැකියා ලැබුණාද කියලා මම මේ ගරු සභාවේදී ප්‍රශ්නයක් ඇහුවා. රක්ෂා දුන්නා කියලා කිව්වේ නැහැ. එහෙම නම් මේ වරායවල් ඇති කරන්නේ මොකටද? ඒ වරාය හදන්න රුපියල් මිලියන 5,600ක් යනවා. ඩොලරයේ මිල රුපියල් 135ට ගියාම, ඒ මුදල රුපියල් මිලියන 6,100ක් වනවා. ඒ රුපියල් මිලියන 6,100 වියදම ගෙවන්න තිබෙන්නේ කොළඹ වරායෙන්.

Now, I have asked a specific question. Please tell us what is this blind *carte blanche* exemptions that you are giving? Has it been arrogated from the Ministry of Economic Development and taken on by the Ministry of Finance and Planning, and where does this trickle down? Is it for a nudist colony? Is it for money laundering?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
To whom have *carte blanche* exceptions been given?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
That is what we are asking.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
There is nothing specific.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes, there is nothing specific. You are giving the exemptions to a particular person, the Chairman of the Sri Lanka Ports Authority -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார
(The Hon. Vasudeva Nanayakkara)
Who can grant that?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
He can grant it. If it comes under the SEMA, which I think -

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
There is no particular -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
That is right. Now, I must say that I salute the SEMA Bill. We might have differences but certainly that has specific advantages that can go after blue-chip companies, flag-chip companies et cetera to make a comfort zone like the Hon. (Dr.) Sarath Amunugama said; all those are good. This also should have been in the same way. You can time-target or you can bring in more stringent laws to the existing laws. Today, you are basically trying to give the Sri Lanka Customs a regulation which is under the BOI. For 30 years, you ran the BOI because you need it; Sri Lanka is not the only girl on the beach.

There are many countries that welcome investment. Remember, Myanmar is the greatest threat that we have now because it is an ASEAN country; it is within ASEAN. It is not like Sri Lanka, which one of our former Presidents tried to bring Sri Lanka into ASEAN when we are not located in that area. But here, Myanmar is there. They will be a direct threat to us. So, we have got to ensure that we relocate, reposition ourselves to compete and take on Myanmar. Now, the Hon. (Dr.) Sarath Amunugama was happy to go and see the Minister of Trade of Vietnam rather than listen to the Opposition today, giving constructive criticism like what you are doing and be able to contribute to the well-being of the Debate that is on today.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
All that will be conveyed.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
All that will be conveyed but nothing will be done because you have a such a bad brief. How can we defend this? All what we should do is to ensure that we also contribute constructively.Our key speakers today are the Hon. Kabir Hashim, the Hon. (Dr.) Harsha De Silva, the Hon. Ranil Wickremasinghe, the Leader of the Opposition, the Hon. Lakshman Kiriella, and the Hon. John Amaratunga. We all came here today though we have many other things to do because we want to show how important the finance of this country is.

මේ රට හදන්න පුළුවන් එකම පක්ෂය එක්සත් ජාතික පක්ෂය කියන එක ගරු කථානායකතුමාත් දන්නවා කියලා මම හිතනවා. මොකද, රටේ ආර්ථිකය කඩා වැටුණු හැම අවස්ථාවකදීම - වැඩිදුර යන්න ඕනෑ නැහැ. 2001 චන්ද්‍රිකා කුමාරතුංගලා ආර්ථික වර්ධන වේගය ඍණ කරලා දුන්නාම -

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ. பி. ரத்நாயக்க )
(The Hon. C.B. Rathnayake)
හිටපු වෙළෙඳ ඇමතිවරයා වශයෙන්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනේ නැහැ, අපි ටයිකෝට් ඇන්දත් ආරිය සිංහල ඇඳුම ඇන්දත්, අපි කොළඹ හිටියාට ගමේ තිබෙන ප්‍රශ්න ඔක්කොම දන්නා පුද්ගලයන් වශයෙන් මේ කියන්නේ.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මම කියන්නේ ඔබතුමා හිටපු වෙළෙඳ ඇමතිවරයා වශයෙන්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්. හිටපු වෙළෙඳ ඇමති වශයෙන් තමයි වැඩියෙන්ම දන්නේ. ඒක නිසා තමයි, මම ජොන්ස්ටන් ඇමතිතුමා එක්ක මේ වාගේ විවාද කරන්නේ නැත්තේ. මම දන්නවා ඒ වැඩය කොයි තරම් අමාරුද කියලා. මොකද, එතුමාගේ වැඩේ නොවෙයි ඔය කරන්නේ. චින්තනයේ වැඩේ තමයි ජොනී ඇමතිතුමාගෙන් කරන්නේ. විමල් වීරවංශ ඇමතිතුමා කිව්වේ එතුමාට ඕනෑ එකද? චින්තනය, විමල්ගේ ලෙවල් එකෙන් කිව්වේ. මේ රුපියල් 2,500කින් එක්කෙනකුට මාසයක් ජීවත් වන්න පුළුවන් කියන්නේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට කියන්න ඕනෑ එකක් නොවෙයි. චින්තනයට බන්දුල තුළින් කියන එකක්. ප්‍රවාහන ගාස්තු වැඩි කළාම සී.බී. රත්නායක ඇමතිතුමාට කියන්න ඕනෑ එක නොවෙයි එතුමා කියන්නේ. චින්තනයේ වැඩේ සීබී තුළින් කියන එකයි. දැන් වාසුදේව නානායක්කාර ඇමතිතුමාට මොනවාද වෙලා තිබෙන්නේ? මම මේ අවස්ථාවේ දී අහනවා, එතුමාට පුළුවන් ද මේ මානව අයිතිවාසිකම් -

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ඔබතුමා කියන්නේ එක්සත් ජාතික පක්ෂයේ වැඩ. සජිත් මන්ත්‍රීතුමා කියන්නේ එක්සත් ජාතික පක්ෂයේ-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. එහෙම කිසි දෙයක් නැහැ. එක්සත් ජාතික පක්ෂයේ ස්ථාවරය අපේ නායකතුමාත්, කෘත්‍යාධිකාරී මණ්ඩලයත් බොහොම ඍජුව කියලා තිබෙනවා. වෙනත් අය කියන ඒවා මෙතැනට අදාළ නැහැ. මෙතැන ප්‍රශ්න ඇති කරන්න ඕනෑ නැහැ. අපේ පක්ෂයේ ප්‍රශ්න අපි බොහොම එකමුතුව විසඳා ගන්නවා. දේශපාලන ප්‍රශ්න ඇතුළේ තිබේවි. ඉදිරියට යන කොට ඒවා පෙනේවි. අර වතුර බැහැලා ගිහිල්ලා කොහේ හරි තැනක settle

[ගරු රවි කරුණානායක මහතා]

වෙනවා නේද? අන්න ඒ වාගේ හරි තැන්වලට ඒවා ගිහිල්ලා හිර වේවි. ගරු සී.බී. රත්නායක ඇමතිතුමනි, ඔබතුමා බය වෙන්න එපා. ඒවා හරි තැන්වල රැඳෙනවා.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
පොලිතීන්වල හිර වුණොත්?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. ඒ පොලිතීන්වල හිර වන්නේ ඒ වාගේ ඒවා. ගරු කථානායකතුමා නියෝජනය කරන දිස්ත්‍රික්ක වාගේ ඒවායේ තමයි හිර වන්නේ. එහෙම වන්න එපා, නේද ගරු කථානායකතුමනි? මම බොහොම අගය කරනවා, එතුමා අප වෙනුවෙන් කථා කරන එක. අප එය අගය කරනවා. අන්න එහෙම තමයි කථානායකතුමෙක් ඉන්න ඕනෑ. අප බොහොම විවෘතව එතුමාට සම්පූර්ණ සහයෝගය දෙන්නේ ඒ නිසායි. සමහර වෙලාවට අප වුට්ටක් එහේ මෙහේ යනවා. නමුත් අප ඒ level එකට දමනවා. අපේ ගරු කථානායකතුමාත් හරි level එකට දමලා කර ගෙන යනවා. ඔන්න, අපේ ගරු ෆවුසි ඇමතිතුමා ගරු සභාවට එනවා. එතුමා හොඳට වැඩ කරන්න පුළුවන් කෙනෙක්. නමුත් එතුමා පැත්තකට දමලා, සම්පූර්ණයෙන්ම අනාථ කර දමලා තිබෙනවා නේ. ඉතින් මේ සම්බන්ධයෙන් අප අහන්නේ මේකයි.

Hon. Vasudeva Nanayakkara, tell us - [*Interruption.*] I have given seven points on the same score.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Are they on the *carte blanche*?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes, on the *carte blanche*. As I told you, you are basically giving the right to a person like the Chairman of the Sri Lanka Ports Authority. So, this specific one also should be laid down in a thing like SEMA, as a specific Act. Then, you can say "Yes, pick on this one. We have a fantastic company there". Now, we do not fault Shangri-La for coming; we salute them for coming. But, what we say is that the way it was done, is wrong. Why should they be exempted from 11 billion when the innocent people are paying for bread, kerosene oil and even a box of matches that went up by Rs. 5? That is why we fought. Remember, we are not an Opposition that opposes everything. We are the ones who help the Government most. It is easy to say what you are saying. Ensure that you implement the recommendations of the LLRC. These are your Government's proposals. These are not America's proposals. So, on that score, you are bringing Bills into Parliament which are surfeit - some areas are arrogating powers to another Ministry. This is what is redundant; this is what is superfluous; this is what is unwanted; this is waste of time because you do not know what you are basically trying to achieve.

Now, you are talking of a US Dollar one billion trade deficit. Now, let me also touch on the subject of BOI. One of the main things is, I must say, the Minister has appointed a good Chairman who is looking after the work. He is a very competent person even though he is a bureaucrat. In that section, there are four people. They are good people but they do not have powers to market. Former people like Mr. A.M.C. Kulasekara, Mr. Tuli Cooray, had the knowledge to convince and get a foreigner come in to the country and invest. That is not there anymore. Today your junior officers are being sent overseas. How can they go on roadshows and do these type of things? Then on the one side, you basically try to lure foreign investment and on other, your Government basically did not allow the Foreign Minister of Sweden to come. They closed down the Embassy. Then, you basically fought the European Union and lost the Labour GSP. You did not allow the Canadian Opposition Leader to come. But, you had a team that came here; look at the impact that they have created on the country.

What they said was that there is no law and order in this country. They basically said that internationally, you are not obliged to follow certain things. But, they faulted you all for not doing basic things that are in the Constitution. This was stated by the three Canadian MPs who came to the country recently. Likewise, you basically told an untruth to India. The External Affairs Minister of India, S.M. Krishna says that you all said "Thirteen Plus". You had to waste 20 minutes in Geneva answering his call and ensuring that you put the record straight as to what he discussed with the President, on which you were stony silent when he was here. You basically had to go to Geneva to answer what was there, and because of that, India today has turned against us - not as I guess - certainly they will be there with us. Unfortunately, you all marketed yourself very poorly in Geneva. The Hon. Mahinda Samarasinghe goes and tells one thing, "Yes we are going to implement LLRC". But, you are basically telling the rest of the world, "No, we are not bound by that" and today the answers are there. Unfortunately, this may be out of context, but you are pushing foreign investments away from this country. That is why you told us to come today - which is not a Parliament day - to ensure that we support and give our constructive criticism to you all in order to ensure that these Bills are passed. When you are doing that, the very foreign investors who are coming to this country are not going to come here just for the sake of coming to Sri Lanka. They are coming to make money; they are coming to see whether there is an environment conducive to them; they are trying to see whether there are laws that are coherent, consistent and implemented to the letter. You do not have law and order that existed earlier because the Seventeenth Amendment has been taken off. These are matters that were discussed in Geneva. So, you are wasting time bringing in legislation -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමනි, මෙතුමාට කථා කරන්න තව කාලය දෙනවාද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එතුමාට තව විනාඩි දෙකක් දෙන්න ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විනාඩි දෙකක්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Please give me five minutes, Sir.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විනාඩි පහක්?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට තව විනාඩි පහක් දෙන්න ගරු කථානායකතුමනි.

ඒ සම්බන්ධයෙන් අප මේ අවස්ථාවේදී මතක් කරනවා. කරුණාකර මේ පනත් සම්බන්ධයෙන් වාගේම අපට අවශ්‍යයි මේවාත් දැන ගන්න.

බලන්න, මේ වාගේ දේවල් දිහා. අද කේපී රජ ගෙදර ඉන්නවා. එයාගේ මුදල් රුපියල් බිලියන 19ක් -කෝටි 1,900ක්- තිබෙනවා, නැව් 21ක් තිබෙනවා කියලා මේ රජයේ ඇමතිවරුයි කිව්වේ. අද නැව් 19ක් තියා බෝට්ටුවක්වත් හොයලා නැහැ. ඒකෙන් සත පහක් ඇවිල්ලා නැහැ. එක පාරට මේ සල්ලි money launderingවලට යෙදුවොත්, කල්පිටියට ගිහිල්ලා ඕනෑ එකක් කරන්න කියලා මේ හාදයා මේ සල්ලි ගෙනාවොත් මොනවාද කරන්න පුළුවන් වන්නේ? යම් රටවල් මේ වාගේ ත්‍රස්තවාදයේ යෙදුණු කට්ටියගේ සල්ලි පාවිච්චි කරනවා ඒ ප්‍රශ්නවලට යොමු වුණු කට්ටියට උදවු කරන්න. දැන් මේ බිලියන 19 -කෝටි 1,900- ආවා නම් ඒවා මේ අයට උදවු කරන්න පාවිච්චි කරන්න තිබුණා. ඒ සම්බන්ධයෙන් අප ඉල්ලන්නේ කරුණාකරලා අපට මේවාට උත්තර දෙන්න කියලායි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ අවස්ථාවේදී මෙන්න මේ කාරණයත් අප පෙන්වන්න අවශ්‍යයි. බලන්න තිබෙන වෙනස. ඊයේ නගර සභාවක ඡන්දයක් තිබ්බා. නගර සභාවේ ඒ ඡන්දයෙන් බොහොම වැදගත් දෙයක් ඉස්මතු වුණා. ඊයේ කොළඹ නගර සභාවේ කුණු සම්බන්ධයෙන් කථා වුණා. මේ ආණ්ඩුව තාවකාලිකව පාලනය ගෙනිච්ච කාලාන්තරය තුළ ඒ පරිපාටිය තුළින් යම් ටෙන්ඩර් එකක් එක ආයතනයකට ලැබුණා. ඒක හෙළිදරවු කරපු අසාද් සාලි කියනවා, මිල්ටන් ලියනගේ කියන හිටපු විපක්ෂ නායකතුමා මිලියන 22ක පගාවක් ගත්තා කියලා යම් ටෙන්ඩර් එකක් කල් දමන්න. එතුමා කියනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්න අය ගැන. මිල්ටන් ලියනගේ කියලා තිබුණා ලු මිලියන 22ක් හොයලා ගෙනැල්ලා ඒකෙන් හිටපු නගරාධිපති ඉම්තියාස්ට - ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු නගරාධිපතිට- මිලියන දෙකක් දුන්නා, එයා මිලියන දෙකක් ගත්තා කියලා. එදා "දේශකීර්ති", "දේශමාන්‍ය", "දේශ අභිමාන" කියන ඔක්කොම පට්ටම් අරගෙන, අද දේශ අපකීර්තියට ලක් වෙලා ඉන්න ඩොක්ටර් ජයන්ත අද ඉන්දුනීසියාවේ තානාපති කාර්යාලයට ගිහිල්ලා ඉන්නේ.එතුමා මිලියන 2ක් ගත්තා කියලා කියනවා. වාසුදේව නානායක්කාර හැර අනෙක් හැම මන්ත්‍රීවරයාම ගත්තා කියලා කියනවා.

තවදුරටත් කියනවා, "ජනාධිපති විමර්ශන ඒකකයක් තිබෙනවා, කරුණාකර මා කියන ප්‍රකාශය විමර්ශනයට ලක් කරන්න" කියලා. බලන්න තිබෙන වෙනස. මේ ආණ්ඩුවේ හැම කොනකම හැම පුද්ගලයාම කොමිස් ගහනකොට එක්සත් ජාතික පක්ෂය බොහොම සෘජුව ඊයේ අභියෝග කර තිබුණා අරක කරන්න එපා, මේක කරන්න එපා, මේක කල් දමන්න කියා. මොකක්ද අපි කර තිබුණේ? පිරිසිදුව ඉදිරිපත් කළා. මුදල් කොමිසම කිව්වා ගෙනෙන්න එපා කියලා. අනුමැතියට ගෙනෙනවා කිව්වා කවුන්සිල් එකට. මන්ත්‍රීවරු බහුතරය තුළින් Technical Evaluation Committee එක අනුමත කරන්න තිබෙන දේ අපේ නගරාධිපති මුසම්මිල්ගේ කාර්යාලයේදී අනුමත කරන්න පුළුවන්, නීත්‍යානුකූලව ශත පහක් වියදම් කරන්නේ නැතුව. මේක තමයි වෙනස. ඒ සම්බන්ධව මේ ආණ්ඩුවෙන් අපි අහනවා. අසාද් සාලි මැතිතුමා බොහොම සෘජුව කියනවා, එදා හිටපු මිල්ටන් ලියනගේ සම්බන්ධව. අපේ ෆවුසි ඇමතිතුමා බොහොම හොඳට දන්නවා. මේ වාගේ පුද්ගලයෙක් මෙහෙම කියනකොට මිල්ටන් ලියනගේ කියන ප්‍රකාශය තමයි වැදගත් වන්නේ. එතුමා කියනවා, "මම කැෆ්රි හෝටලයට ඇවිත් මේ ආයතන තුළින් මිලියන 22ක් අරගෙන මෙන්න මෙහෙම තමයි කල් ගන්න දුන්නේ, මේක විමර්ශනයට ලක් කරන්නයි තිබෙන්නේ" කියා.

එක්සත් ජාතික පක්ෂය කොළඹ නගර සභාව තුළ අපි බොහොම පිරිසිදු පාලනයක් ඇති කර තිබෙන්නේ කොහොමද? හඳානි ජයවර්ධන කියා Special Commissioner කෙනෙක් ඉන්නවා. එතුමියට විරුද්ධව සුප්‍රීම් උසාවියේ case දෙකක් තිබෙනවා. මොනවාද කර තිබෙන්නේ? බෝඩ් ලෑලි දමන්න එපාය කියා තිබෙනවා. ඒක නොතකා බෝඩ් ලෑලිවලට ලක්ෂ ගණන් අරගෙන ශත පහක් කොළඹ නගර සභාවට ලැබෙන්නේ නැති විධියට කටයුතු කර තිබෙන නිසා උසාවි ගිය case තිබෙනවා. ඒවා හොයලා නැහැ. අද නගරාධිපති එන්න කිව්වාම එතුමිය එන්නේ නැහැ. පාලනය කරන පක්ෂයටත්, විපක්ෂයටත් සියලු දෙනාටම එන්න කිව්වත් එන්නේ නැහැ. ඒ බව ෆවුසි ඇමතිතුමා දන්නවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මිනිත්තුවකින් අවසාන කරන්නම්. ඒ වාගේම මට වෙලාව නැති නිසා, හඳානි ජයවර්ධන මහත්මිය විසින් ආයතන හයකට ලිපියක් යවනවා ලක්ෂ 60ක් ගෙවන්න කියලා. කොළඹ නගර සභාවේ කිසිම අවසරයක් නැතුව කෙළින්ම කොම්පැනියට ලියලා සල්ලි ගෙනෙන්න කියනවා. සල්ලි ගෙනෙන්න එවන්නේ යුද හමුදාවේ පුද්ගලයන්. මාසයකට මෙච්චර ගෙවන්න ඕනෑ; මේක කෙළින්ම මෙන්න මේ ආයතනයට දෙන්න ඕනෑ කියනවා. එම ලිපිය මා **සභාගත*** කරනවා. එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

***** *කථාව අවසානයේ පළ කර ඇත.*
* *உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
* *Produced at end of speech.*

[ගරු රවි කරුණානායක මහතා]

අපට අවශ්‍ය වන්නේ පිරිසිදු පාලනයක්. අපට අවශ්‍ය වන්නේ මේ රට සංවර්ධනය කරන්න පුළුවන් මාර්ගයක්. ඒ වාගේම තරගකාරී තත්ත්වයක් ඇති කරන්න පුළුවන් ජාලයක්. ඒ සඳහා තිබෙන පනත් අනිවාර්යයෙන්ම ගෙනෙන්න ඕනෑ. නමුත් ඒ පනත් ටික තුළින් රටේ තරගකාරී තත්ත්වයක් ඇති කරන්න මිසක් සුද්දන්ගෙන් සොයලා බලා කටයුතු කරන - අර වැඩ කරන්නේ නැති වරායකට ගිහින් බදු දෙන්න- ජාලයක් නොවෙයි අපි ඇති කරන්න හදන්නේ. එක්සත් ජාතික පක්ෂය මේ වාගේ ප්‍රශ්න දහයක් ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් අහලා තිබෙනවා. දැන් මෙම ගරු සභාව තුළ ඇමති නැහැ. නියෝජ්‍ය ඇමති නැහැ. වැඩ බලන ඇමති නැහැ. ඇමතිවරු හැටහුටහමාරකින් පස් දෙනයි දැන් සභාව තුළ ඉන්නේ. කරුණාකර අවසන් වන කොට කියන්න ලංකාවේ ජීවත් වන ජනතාවට කොහොමද මේකෙන් සෙතක් වන්නේ කියන එක.

අද ජීවත් වන්න බැරි ජීවන වියදමට මේ වලදායීතාවය තුළින් උත්තරයක් සපයන්නේ කොහොමද කියන එක පෙන්වලා අපේ තර්ක බිඳ දමන්න හැකියාවක් ඇති වන්නේ නැහැ. මෙතැන තිබෙන්නේ ඒක නොවෙයි කියා අපි දන්නවා. රටේ ආර්ථිකය ආරක්ෂා කරන්නේ කොයි මාර්ගයෙන්ද කියන එක පෙන්වා දීම ඔබතුමාගේ යුතුකමක් වග කීමක් කියන එක මතක් කරනවා. අපි හොඳ දේවලට සම්පූර්ණ සහයෝගය දෙනවා.

***සභාමේසය මත තබන ලද ලියවිලි:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள் :*
*Documents tabled:*

නාගරික කොමසාරිස්
ජේ. එම්. භද්‍රානි ජයවර්ධන
மாநகர ஆணையாளர்
ஜே. எம். பத்ராணி ஜயவர்தன
MUN 'IPAL COMMISSIONER
J. M. ˌadrani Jayawardane

කොළඹ මහා නගර සභාව
නගර ශාලාව, කොළඹ 07.
கொழும்பு மாநகர சபை
நகர மண்டபம், கொழும்பு 07.
Colombo Municipal Council,
Town Hall - Colombo 07.

දුරකථනය / தொலைபேசி / Telephone — කාර්යාලය / காரியாலயம் / Office: 2695121, 2678425 — ෆැක්ස් / பக்ஸ் / Fax: 2694640

ඊ-මේල් / மின்னஞ்சல் / E.Mail : bjaya_cmclk@hotmail.com

මගේ අංකය / எனது இல / My No.: නාකො/පාලන/01/2012
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2012.02. 01

<u>ගාලු මුහු... ට කොල්ලුපිටිය වට රවුම දක්වා වූ මාර්ගයේ මැද වේදිකාවේ</u>
<u>මල් සහිත පෝච්චි තබා අලංකාර කිරීම වෙනුවෙන්</u>
<u>මූල්‍ය අනුග්‍රාහකත්වය ලබා ගැනීම</u>

උක්ත කරුණ සම්බන්ධව 2012 ජනවාරි මස 23 දින 14.00 පැයට කොළඹ මහා නගර සභාවේ දී යුධ හමුද නිලධාරීන් සමඟ පැවැත් වූ සාකච්ඡාව හා බැඳේ.

01. ඉහතින් සඳහන් කර ඇති මාර්ගය අරලිය ගහ මන්දිරය එනම්, ජනාධිපති මන්දිරය ඉදිරිපිට ඇති ගාලු පාර වන අතර, මෙම මාර්ගය විශේෂයෙන්ම විදේශීය රාජ්‍ය නායකයින් නිතර ගමන් ගන්නා මාර්ගයක් බැවින් කටුනායක ගුවන් තොටු පළට පිවිසෙන මාර්ගයේ අලංකාර කර ඇති ආකාරයට සකස් කිරීමට ගරු ආරක්ෂක ලේකම් තුමාගේ සංකල්පයකට අනුව, එතුමාගේ උපදෙස් පරිදි මේ සඳහා අලංකාර කිරීමේ ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කිරීමට සැළසුම් කර ඇති බැවින්, එම මාර්ගයේ මැද වේදිකාවේ දැනට ඇති යකඩ වැට වල් සහ තැනින් තැන තබා ඇති මල් පෝච්චි ඉවත් කර බෝගන්විලා මල් සහිත මල් පෝච්චි තබා අලංකාර කිරීම සඳහා පොඩි මල් පෝච්චි 03ක් ඇතුළත තැබිය හැකි ලොකු මල් පෝච්චි තැබීමට කටයුතු සූදනම් කරමින් පවතී. ඒ සඳහා යුධ හමුදව විසින් අප වෙත ලබා දුන් මූල්‍ය ඇස්තමේන්තුව මේ සමඟ අමුණා ඉදිරිපත් කරමි.

/ 02

කුණුකසළ ස්ථානවල කැළි කසළ දැමීම වරදකි / குப்பைகள் போடுவது குற்றம் / Littering is an offence

**02**

02. මෙම මල් පෝච්චියේ පිටත උඩ කොටසේ අගල් 3 1/2 ක් පළල, අඩි 2ක් දිග දැන්වීමක් පමණක් ප්‍රදර්ශණය කර ගත හැකි අතර, හුදෙක්ම මෙම ප්‍රමාණයන් ගැන සළකා බලා ඇත්තේ ජනාධිපති මන්දිරය ඉදිරිපිට ලොකු ප්‍රමාණයන්ගේ දැන්වීම් ප්‍රදර්ශණය කිරීම තහනම් කර ඇති නිසා බවද කාරුණිකව දන්වා සිටින අතර, මෙම දැන්වීම එම ප්‍රමාණයන්ට අනුව ඔබ වෙතින් නිර්මාණය කරන වෙළඳ දැන්වීමක් හෝ ආයතනයේ නම සවි කර ගැනීමට අවස්ථාව ලබා දිය හැක.

03. කරුණු එසේ හෙයින් මේ සඳහා වැය වන මුදලෙන් ඔබ ආයතනය වෙතින් එම සම්පූර්ණ මුදලම යොදා මෙම කාර්ය කිරීමට හැකියාව තිබේ නම් එසේ කර දීමටත්, නැතහොත් මුළු මුදලෙන් ඔබ වෙනුවෙන් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය සහ මාසික නඩත්තුව වෙනුවෙන් වැය කිරීමට සිදු වන මුදලද යුධ හමුදාව තෝරා ගත් ආධාර වශයෙන් ලබා දීමට ඔබගේ එකඟතාවය ලබා දෙන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

හදානි ජයවර්ධන
නාගරික කොමසාරිස්
කොළඹ මහා නගර සභාව.
ජේ. එම්. හදානි ජයවර්ධන
නාගරික කොමසාරිස්
කොළඹ මහා නගර සභාව

පිටපත්:
(1) ගරු ආරක්ෂක ලේකම්තුමා, - දැ. ගැ. පි.
ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

(2) බ්‍රිගේඩියර් දිසානායක මහතා - ඔබගේ සහභාගිත්වයෙන් පැවැත් වූ සාකච්ඡාව හා බැඳේ.

ඇ. <u>මේ අනුව එක් ආයතනයකට හිමි වන මුදල පහත සඳහන් පරිදි වේ.</u>

| අනු අංකය | ආයතනයේ නම | අනුග්‍රාහකත්වය ලබාදීමට නියමිත මුළු මුදල රු: | එයින් ලොකු මල් පෝච්චි සඳහා ගෙවිය යුතු මුදල රු: (පැරමවුන්ට් කන්ස්ට්‍රක්ෂන් වෙත) | 25 % ක අත්තිකාරම් මුදල රු: | අත්තිකාරම් ගෙවූ පසු ගෙවීමට ඇති ඉතිරි මුදල රු: | මල් සහිත මල් පෝච්චි සඳහා ගෙවිය යුතු මුදල රු: (කටාන නර්සරි වෙත ) | 25 % ක අත්තිකාරම් මුදල රු: | අත්තිකාරම් ගෙවූ පසු ගෙවීමට ඇති ඉතිරි මුදල රු: |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | ගෝල්ෆේස් හොටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1105000.00 | 830000.00 | 207500.00 | 622500.00 | 275000.00 | 68750.00 | 206250.00 |
| 02 | ඒෂියන් හොටෙලින් ඇන්ඩ් ප්‍රොපටීස් ලිමිටඩ් | 1105000.00 | 830000.00 | 207500.00 | 622500.00 | 275000.00 | 68750.00 | 206250.00 |
| 03 | යුනියන් බැන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ් | 1105000.00 | 830000.00 | 207500.00 | 622500.00 | 275000.00 | 68750.00 | 206250.00 |
| 04 | සෙලින්කෝ රක්ෂණ සමාගම | 1105000.00 | 830000.00 | 207500.00 | 622500.00 | 275000.00 | 68750.00 | 206250.00 |
| 05 | ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් | 1115000.00 | 840000.00 | 210000.00 | 630000.00 | 275000.00 | 68750.00 | 206250.00 |
| 06 | සෙලාන් බැංකුව | 1115000.00 | 840000.00 | 210000.00 | 630000.00 | 275000.00 | 68750.00 | 206250.00 |
| මුළු ගණන | | 6650000.00 | 5000000.00 | 1250000.00 | 3750000.00 | 1650000.00 | 412500.00 | 1237500.00 |

සැ.යු. ඡේද අංක 01 හි "ඇ" කොටසේ සඳහන් නඩත්තු කිරීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල වන රු: 297000.00 ආයතන 06 ට සමසේ බෙදීමෙන් ලැබෙන මුදල වන රු: 49500.00 ක මුදල මාසිකව අබාන්ස් ආයතනයට ගෙවීම සඳහා අනුග්‍රාහක ආයතන වෙතින් ලබා ගැනීමට කටයුතු කර ඇත.

[පූ. භා. 10.57 ]

**ගරු (මහාචාර්ය) ජී.එල්.පීරිස් මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ. எல். பீரிஸ் - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) G.L. Peiris - Minister of External Affairs)

ගරු කථානායකතුමනි, අපේ මිත්‍ර ගරු රවි කරුණානායක මැතිතුමා, ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව එතුමාගේ කථාවේදී අදහස් කිහිපයක් ප්‍රකාශ කළා. ජිනීවා නගරයේදී සම්මත කරන ලද යෝජනාව පිළිබඳව අද අපේ රටේ ලොකු උනන්දුවක් උද්යෝගයක් තිබෙනවා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා සඳහන් කළා, මේ පිළිබඳ ආවේගශීලී හැඟීම් උත්සන්න කිරීමට රජය උත්සාහයක් දරනවා කියා. ඒක නොවෙයි නියම තත්ත්වය. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ මේ පිළිබඳ යථාර්ථය රටට ඉදිරිපත් කිරීමයි. මේ පිළිබඳ දීර්ඝ විවාදයක් පැවැත්වීමට රජය හා විපක්ෂය එකඟ වෙලා තිබෙනවා. ඒ සඳහා දින නියම කර තිබෙනවා. එන සතියේ අඟහරුවාදා සහ බදාදා ඒ කියන්නේ අප්‍රේල් 3 සහ 4 දෙදින තුළ ඒ විවාදය පැවැත්වෙනවා. ඒ අවස්ථාවේදී රජය වෙනුවෙන් විස්තර සහිතව කරුණු ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වනවා.

අද ඉතාමත් කෙටියෙන් මා ඒ පිළිබඳ මූලික කරුණු කිහිපයක් මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට අදහස් කරනවා. පසු ගිය දවස් කීපය තුළ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මේ පිළිබඳ මාධ්‍ය ප්‍රකාශන කීපයක් නිකුත් කර තිබුණා. මම ඒවා කියෙව්වා. ඒවාට සම්බන්ධ අදහස් හා එතුමාගේ තර්කවලට ලුහුඬු පිළිතුරු කීපයකුත් මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. ප්‍රථමයෙන්ම - [බාධා කිරීම්] පැහැදිලිව, පැහැදිලිව. [බාධා කිරීම්] නැහැ, නැහැ. විදේශ ඇමතිවරයා විදේශ ප්‍රතිපත්තිය හැටියට ප්‍රකාශ කරන්නේ රජයේ ප්‍රතිපත්තියයි.

ගරු කථානායකතුමනි, මා ඉතාමත් සතුටුයි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මෙහි සිටීම ගැන. අපි මුලින්ම යම් කිසි පැහැදිලි තීරණයක් ගත්තා. ඒ තීරණය තමයි, කිසිම හේතුවක් නිසා අපි මේ යෝජනාවට අවනත වෙන්නේ නැහැ, අපි කැමැත්ත ප්‍රකාශ කරන්නේ නැහැ කියන එක. ඒ තීරණය ගැනීමට පැහැදිලි පදනමක් තිබුණා. නොයෙක් නොයෙක් අවස්ථාවලදී ඇමෙරිකානු එක්සත් ජනපදය, ඉන්දියාව වාගේ රටවල් කීපයක් අපෙන් ඇහුවා, මේ යෝජනාවේ වචන වෙනස් කරලා, යම් යම් ආකාරයක සංශෝධන කරලා ඉදිරිපත් කරනවා නම් ශ්‍රී ලංකාව ඒක පිළි ගන්නවාද, ඒකට කැමැති වෙනවාද කියලා. අප මුල සිට අග දක්වා අඛණ්ඩව නොසැලී සිටිය ස්ථාවරය තමයි, අපි ඒකට එකඟ වෙන්නේ නැහැ කියන එක. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ඒ තර්කය අගය කරයි කියලා මම අවංකව විශ්වාස කරනවා. ඒ මොකද, මේ දෙක අතර ලොකු වෙනසක් තියෙනවා. ඒ කියන්නේ අවසානයේදී ඡන්ද මේ පැත්තට කීයක් ලැබුණත් අර පැත්තට කීයක් ලැබුණත්, මේකට අපි කිසිසේත් සම්බන්ධ නැහැ; මේකට අපි අවනත වන්නේ නැහැ කියන ස්ථාවරයේ අප දිගටම ඉන්නවා නම් ඒ තුළින් අපේ රටට විශාල රැකවරණයක්, ආරක්ෂාවක් ලැබෙනවා. අනික් අතට අපි සම්මුතියක්, එකඟත්වයක් පදනම් කර ගෙන මේක ඉදිරිපත් කරලා හැමෝම පිළි ගන්න තත්ත්වයකට ආවා නම් ඒ තුළින් දීර්ඝ කාලීනව අපේ රටට බෙහෙවින් අහිතකර අනුෂංග රාශියක් අනිවාර්යයෙන් උද්ගත වනවා. ඒ නිසා තමයි අප ඒ ස්ථාවරයේ පැහැදිලිව සිටියේ. ඒ ස්ථාවරය ගැනීමට තවත් වැදගත් සාධකයක් බලපෑවා. ඒ තමයි මානව හිමිකම් මණ්ඩලයේ සංයුතිය හා ඒක ක්‍රියා කරන ආකාරය.

අපි දන්නවා, මානව හිමිකම් මණ්ඩලයට ඉස්සෙල්ලා පැවතිච්ච ආයතනය තමයි මානව හිමිකම් කොමිෂන් එක. ඒක අහෝසි කළා. ඒ කියන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලය - United Nations General Assembly එක- කොමිෂන් එක ගැන සෑහීමට පත් වෙලා නැතුව ඒකේ යම් යම් දෝෂ තියෙනවාය කියලා කිව්වා. ඒ නිසා ඒක ඉවත් කරලා ඒ වෙනුවට ආදේශ කළා - ඒ වෙනුවට පිහිටෙව්වා- මේ මණ්ඩලය. එසේ කිරීමට ප්‍රධාන හේතුව තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ පැහැදිලි මතයක් තිබුණා, ඒ කොමිෂන් එක දේශපාලනීකරණය වෙලා තියෙනවාය කියලා. ඒ කියන්නේ යම් ප්‍රශ්නයක් ඉස්මතු වුණාම මේ පැත්තේ තර්කවලට, ඒ පැත්තේ තර්කවලට සවන් දීලා අවසානයේ සාධාරණ නිගමනයකට පැමිණෙනවා නොවෙයි, දේශපාලන හේතු නිසා තීරණ ගැනීමේ යම් කිසි ප්‍රවණතාවක් පැහැදිලිව කොමිෂන් සභාව තුළ දෘශ්‍යමාන වුණා කියන හේතුව ඉදිරිපත් කරමින් තමයි ඒ වෙනස එදා කරන්න යෙදුණේ.

අද මොකක්ද තත්ත්වය? අද තත්ත්වය මේකයි. මේ ගරු සභාව දන්නවා, මානව හිමිකම් මණ්ඩලයේ සාමාජිකත්වය ලැබූ රටවල් 47ක් තියෙනවාය කියලා. රටවල් 47ක් ඒකට අයත් වනවා. මේ රටවල් 47න් රටවල් 11ක් යුරෝපීය සංගමයට අයත් වන රටවල්. දැන් ඒ රටවල්වල විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ තීරණ ගන්නේ ඒ එක් එක් අගනුවර නොවෙයි. ලන්ඩන්, පැරිස්, බර්ලින්, රෝම් අගනුවරවලට තීරණ ගන්න බැහැ. "ලිස්බන් ගිවිසුම" අනුව ඒ පිළිබඳ කාර්ය භාරය බ්‍රසල්ස් නගරයට -යුරෝපීය සංගමයට- පැවරිලා තියෙනවා. මම තමුන්නාන්සේලාට අවංකව කියනවා, මේක පක්ෂ දේශපාලනයට සම්බන්ධ දෙයක් නොවෙයි කියලා. ඒ විධියට නොවෙයි මම මේ ගැන හිතන්නේ. එම නිසා තමුන්නාන්සේලාට මම කියනවා, මේක ආණ්ඩු පක්ෂයේවත්, විරුද්ධ පක්ෂයේවත් ප්‍රශ්නයක් නොවෙයි කියලා. මේක ජාතික ප්‍රශ්නයක්. ඒ නිසා ඉතාමත් විනිවිද ලෙස, විවෘත ලෙස මම මේ අවස්ථාවේදී අදහස් ප්‍රකාශ කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමාගේ අවසරය ඇතුව මම මේ කාරණය තමුන්නාන්සේලාට කියනවා. අපි සමඟ පෞද්ගලිකව සාකච්ඡා කරපු ඒ යුරෝපීය රටවල නියෝජිතයන් කිහිප දෙනෙක් මට කිව්වා, -මගේ කැබිනට් සහෝදරයනුත් ඒ අවස්ථාවේදී සිටියා.- "අපි විශ්වාස කරනවා, මේ යෝජනාව කාලෝචිත නැහැ කියලා. මෙය දැන් ගෙනෙන්න ඕනෑ යෝජනාවක් නොවෙයි. ඒකයි අපේ පෞද්ගලික මතය වුණේ. ඒත් අපේ මතය කුමක් වුවත් අවසානයේදී ඡන්දය දීම සම්බන්ධයෙන් වෙන වෙනම තීරණ ගැනීමට අපට අභිමතයක් නැහැ. ඒ සම්බන්ධයෙන් එකම තැනකට ඇවිල්ලා සාමූහික ස්ථාවරයකට පැමිණෙන්න අපට අනිවාර්යයෙන් සිදු වනවා." කියලා. එක රටක නියෝජිතයෙක් මට කිව්ව දෙයක්. ඒ රටේ නම සඳහන් කිරීම වැරදියි. මොකද, අපි ජිනීවා නගරයේදී සියලුම කණ්ඩායම්වල නායකයන් කැඳවා ඒ අයව ඇමතුවා. මම ඒ අයව අමතලා ඒ අයට අවස්ථාව ලබා දුන්නා, ඕනෑම ප්‍රශ්නයක් ඇසීමට. පැයක් විතර ප්‍රශ්න ඇහුවා; පිළිතුරු දුන්නා. ඉතාමත් විවෘත සාකච්ඡාවක්. අවසානයේදී, එක්තරා යුරෝපීය රටක නියෝජිතයා, -ඒ රට නියෝජනය කරන තානාපතිවරයා- ඇවිල්ලා මට කිව්වා, "ඔබතුමාට පෙනෙන්න ඇති, මම මොකුත් කිව්වේ නැහැ, ඒ සාකච්ඡාවේදී-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! මේ අවස්ථාවේදී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු උදිත් ලොකු බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)

ගරු කථානායකතුමනි, "ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියමින් සිටි අන්දමට ජිනීවා නගරයේ පැවැති ඒ සාකච්ඡාව අවසානයේදී ඒ යුරෝපීය රට නියෝජනය කරන තානාපතිතුමා මට කිව්වා, "ඔබතුමාට පෙනෙන්න ඇති, ඒ සාකච්ඡාව වෙන කොට මම කිසිවක් කිව්වේ නැහැ. මම නිශ්ශබ්දව සිටියා. ඒකට හේතුව, මගේ හෘදය සාක්ෂිය අනුව මේ යෝජනාවට පක්ෂව තර්ක ඉදිරිපත් කිරීමට මට හැකියාවක් තිබුණේ නැහැ. එම නිසා තමයි මම නිශ්ශබ්දව සිටියේ. හැබැයි, ඡන්දය දෙන අවස්ථාවේදී මට සිදු වනවා, මගේ අගනුවරින් ලැබෙන නියෝගවලට අනුව කටයුතු කිරීමට" කියලා. එතකොට මොකක්ද මේ තත්ත්වය? මේ රටවල් 47න් රටවල්11ක්, සාකච්ඡාව ආරම්භ වන්න ඉස්සර වෙලා, තර්ක ඉදිරිපත් කරන්න ඉස්සර වෙලා ඒ ගොල්ලන්ගේ තීරණවලට එළඹිලා අවසානයි. ඒ මතය වෙනස් කළාට වැඩක් නැහැ. වෙනස් කළාට ඒ තුළින් ප්‍රායෝගික ප්‍රතිඵලයක් ජනිත වන්නේ නැහැ. ඒ නිසා තමයි අපේ හෘදය සාක්ෂියට අනුකූලව අපි පැහැදිලිව කියන්නේ, එය දේශපාලනීකරණය වෙච්ච මණ්ඩලයක්; සාධාරණත්වය ඉෂ්ට කිරීම සඳහා ස්ථාපිත කරනු ලැබූ මණ්ඩලයක් නොවෙයි කියලා.

මම විතරක් නොවෙයි මේක කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇමෙරිකා එක්සත් ජනපදයේ පාර්ලිමේන්තුවේ කමිටු තිබෙනවා. සාමාන්‍යයෙන් ඒවා අපේ කමිටුවලට වඩා හුඟක් ප්‍රබලයි. ඒ ගොල්ලන්ගේ ව්‍යවස්ථානුකූල තත්ත්වය අපේ තත්ත්වයට වඩා සැහෙන්න වෙනස්.

කොංග්‍රස් මණ්ඩලයේ විදේශ ප්‍රතිපත්තිය මෙහෙයවන මණ්ඩලයේ මූලාසනය දරන මැතිනිය ඉතාමත් ප්‍රබල චරිතයක්. එතුමිය කියනවා, -මම නොවෙයි- "අද UN Human Rights Council එක rogues' gallery එකක්" - "ඒක හොර ගුලක්"- කියලා. ඒක ඉතාමත් තදබල වචනයක්. ඒ වචනය පාවිච්චි කරන්නේ සාමාන්‍ය මන්ත්‍රීවරයෙක් නොවෙයි. ඇමෙරිකානු එක්සත් ජනපදයේ ව්‍යවස්ථා මණ්ඩලයේ, - Congress එකේ- විදේශ ප්‍රතිපත්තිය භාර කමිටුවේ සභාපතිනිය. ඒ විතරක් නොවෙයි, එතුමිය කියනවා, එතුමිය ඇමෙරිකානු එක්සත් ජනපද රජයෙන් ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවායි කියලා මේකෙන් ඉවත් වන්න කියලා. "මේකෙන් වැඩක් නැහැ, ඉවත් වන්න" කියලා එතුමිය කියනවා. ඉවත් වෙලා මොකක්ද කරන්න කියන්නේ? විකල්ප විශ්වාසනීය මණ්ඩලයක් ස්ථාපිත කිරීමට උත්සාහ කරන්න කියලා කියනවා. එතුමියගේ වචනවලින් කියනවා නම් "A credible, alternative forum". මේ මගේ වචන නොවෙයි, එතුමියගේ වචන. ඉතින් ඒකයි ඇත්ත තත්ත්වය. රජය විවේචනය කරනවා. දේශපාලනයේදී විවේචනය ස්වාභාවිකයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

එතුමිය කියනවා, මේකට පාදක කර ගත් කරුණු අනුව මේ මේ හේතු නිසා කියලා?

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ඔව්. ඒකට යම් කිසි පසුබිමක් තිබුණා. ඒ පසුබිම තමයි ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාව පිළිබඳ මේ යෝජනාව සම්මත වුණේ මාර්තු 22වන බ්‍රහස්පතින්දා දවල් 11.50ට. එදා ඊට පැය හතර හමාරකට විතර පස්සේ ඒ වාගේ යෝජනාවක් සම්මත වුණා, ඊශ්‍රායලයට විරුද්ධව.

ඊශ්‍රායලයේ විදේශ ඇමතිවරයා වෙනුවෙන් ප්‍රකාශනයක් නිකුත් කළා. මොකක්ද කිව්වේ? එහිදී මේ මණ්ඩලය පිළිබඳව තදබල වචන තුනක් පාවිච්චි කළා. ඒ වචන තුන ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා නම්, "hypocritical, politicized, one-sided" යන්නයි. Hypocritical කියන්නේ හිතේ එක දෙයක් තබා ගෙන තව දෙයක් ලෝකයට ප්‍රකාශ කිරීමයි. One-sided කියන්නේ ඒක පාර්ශ්විකයි කියන එකයි. අර ඉස්සෙල්ලා Commission එකට විරුද්ධව තිබුණු විවේචනය, Commission එක අස් කරලා කවුන්සලය දමන්න හේතු වූ සාධකයක්. මේක දේශපාලනීකරණය - politicized - වෙලා තිබෙනවාය කියලා කිව්වා. ඊට වඩා හුඟක් දුර ගියා, ඊශ්‍රායලය. ඊශ්‍රායලය ඊට වඩා දුර යමින් ප්‍රකාශ කළා, "අපි මානව හිමිකම් මණ්ඩලය සමඟ තිබෙන සියලුම ගනුදෙනු අත් හිටුවනවා"යි කියලා. ඒක බොහොම දැඩි තීරණයක්.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය දරන රටක් එහෙම දෙයක් ප්‍රකාශ කරනවා නම් ඒක බොහොම බැරෑරුම් දෙයක්. ඒ ගොල්ලෝ කිව්වා, "We are suspending all working relations." කියලා. "Working relations" කියන එකෙන් ඒ ගොල්ලෝ අදහස් කරන්නේ මොකක්ද කියන එක ඊශ්‍රායල් රජය පහදා දුන්නා. "සාකච්ඡා නැහැ. මානව හිමිකම් මණ්ඩලයේ කිසිම නිලධාරියකුට ඊශ්‍රායලයට එන්න දෙන්නේ නැහැ. කිසිම ලියවිල්ලක් ඉදිරිපත් කරන්නේ නැහැ. සියලුම සංවාද මෙතැනින් අවසානයි." කියලා ඊශ්‍රායල් රජය ප්‍රකාශ කළා. ගරු මන්ත්‍රීතුමා මගෙන් අහපු ප්‍රශ්නයට පිළිතුර මේකයි. ඒ පසු බිම තුළ තමයි ඇමෙරිකානු එක්සත් ජනපදයේ -ආණ්ඩු පක්ෂයේ නොවෙයි රිපබ්ලිකන් පක්ෂයේ- ඒ ප්‍රබල චරිතය ඒ ප්‍රකාශය කළේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

මට මේ තර්ක වැඩිදුරට ඉදිරිපත් කිරීමට කාලය නැහැ. හැබැයි ඒක අවශ්‍යත් නැහැ. මොකද, ලබන සතියේ අපි ඒ පිළිබඳව සම්පූර්ණයෙන් සාකච්ඡා කරන නිසා. මා මේ අවස්ථාවේදී කෙටියෙන් ප්‍රකාශ කරන්නම්. දවස් දෙකකට ඉස්සෙල්ලා නවදිල්ලියේ රුසියානු තානාපතිතුමා කිව්වා, මේ යෝජනාව සම්මත කර ගැනීමෙන් මානව හිමිකම් මණ්ඩලය ඒ අයටම කළේ ලොකු අගෞරවයක් කියලා. ශ්‍රී ලංකාවට නොවෙයි. අපේ යෝජනාව ගැනයි එතුමා කථා කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා තව විනාඩි 5ක් විතර කාලය ගන්නවා. රජයේ වේලාවෙන් ඒ විනාඩි 5 අඩු කරන්න පුළුවන්. රුසියානු තානාපතිතුමා පැහැදිලිව කිව්වා, රුසියානු ආණ්ඩුවේ ස්ථාවරය. රුසියානු රජය මට ආරාධනා කරලා තිබෙනවා, ඒ රජය හම්බ වෙන්න මැයි මාසයේ හෝ ජූනි මාසයේ විතර නිල සංචාරයක් සඳහා මොස්කව්වලට එන්නය කියලා. ඒ රජයට ඇතුළුව අපට සහයෝගය දුන් සියලුම ආණ්ඩුවලට මා ඉතාමත් උණුසුම් ලෙස ස්තුති කළා. රුසියාව පැහැදිලිව ප්‍රකාශ කරනවා, -සියලුම විදේශීය ප්‍රවෘත්ති පත්‍රවල ඒකට ලොකු

[ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා]

ප්‍රමුඛත්වයක් ලැබුණා- "ශ්‍රී ලංකාවට විරුද්ධව මේ යෝජනාව සම්මත කළේ වෙන කිසිම දෙයක් නිසා නොවෙයි, පැහැදිලිව දේශපාලන හේතු පදනම් කර ගෙනයි" කියලා. ඒ තත්ත්වය තුළ අපට අවනත වන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. අපි එහෙම කළා නම්, ඒක අපේ රටට කරන ද්‍රෝහිකමක්. එතකොට ඡන්දයක් පවත්වන්නේ නැහැ. බොහොම ලේසියෙන් ඇඟ බේරා ගෙන ගෙදර එන්න පුළුවන්. හැබැයි ඒකෙන් අපේ රටට, අපේ ජනතාවට කිසිම සෙතක් සැලසෙන්නේ නැහැ. එම නිසා තමයි, අපේ රජය වග කීමෙන් යුක්තව ඒ තීරණය අරගෙන අඛණ්ඩව ඒ ස්ථාවරයේ සිටියේ, මොනවා වුණත් අපේ රට පාවා දෙන්නේ නැහැ, අපේ එකඟත්වය කිසි සේත් මේකට ලැබෙන්නේ නැහැයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසානයේ අපේ ස්ථාවරය මේකයි. ඉතාමත් සරල ස්ථාවරයක්. මේ නිසා කිසිම දෙයක් වෙනස් වන්නේ නැහැ. අපි යම් කිසි ක්‍රියාදාමයක් ආරම්භ කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ ඒ විධියටම ඉදිරියට ගෙන යනවා. මේ නිසා අපි කාටවත් යටත් වන්නේ නැහැ. විදේශීය බලවේගයකට අපේ රටට මැදිහත් වීමට අපි කිසි සේත් අවකාශ සපයා දෙන්නේ නැහැ. මේ රටේ ප්‍රතිපත්තිය තීරණය කරන්නේ ජනතා වරමක් ලබා ගත් රජයක්. එතකොට මේවා ව්‍යාකූල සංකීර්ණ ප්‍රශ්න. මේවාට ඉතිහාසයක් තිබෙනවා; පසු බිමක් තිබෙනවා. අපට ආවේණික වූ සංස්කෘතියක් තිබෙනවා. එම නිසා ජිනීවා නගරයට ඒවා භාර දෙන්න අපි කිසි සේත් සූදානම් නැහැ. එම නිසා අපේ රටේ ජනතාවගේ සිතුම් පැතුම් ආශ්‍රිතව ඒ අයගේ අභිලාෂ ඉටු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ අපි තීරණ ගන්නවා. කොච්චර ඉක්මනට කරනවාද, මොනවාද ඉස්සෙල්ලා කරන්නේ, මොනවාද ප්‍රමුඛතා, ඊට පස්සේ කරන්නේ මොනවාද කියන මේ සියල්ලක් පිළිබඳව දුර දිග බලා තීරණ ගැනීමේ හැකියාව, වගකීම නිරන්තරයෙන් රජය තුළ තබා ගනිමින් මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න අපි අදහස් කරනවා.

That will be total continuity. 47 දෙනෙකුගෙන්, 23 දෙනෙක් මේ යෝජනාව සම්මත කරනවාට කැමැති වුණේ නැහැ. ඒ ඡන්දය දීමෙන් වැළකී සිටි රටවල් කීපයක් ප්‍රකාශන නකුත් කළා. එම ප්‍රකාශනවලින් මොකක්ද කිව්වේ? මේ යෝජනාවට සහයෝගය දෙන්නට බැරි හේතු මෙන්න මේ මේවායි කියලා ඒගොල්ලන් ඉතාමත් සරල ලෙස පෙන්වා දුන්නා. ඒ කියන්නේ 47 දෙනාගෙන් 23 දෙනෙක් මේ යෝජනාවට කැමැති වුණේ නැහැ. 24 දෙනායි කැමැති වුණේ. ඒ 24 දෙනාගෙන් 11 දෙනෙක්ම කියනවා, "අපි bloc එකක් හැටියට ඡන්දය දෙනවා. අපිට හෘද සාක්ෂියට එකඟව නම් ඡන්දය දෙන්න බැහැ. මේ ගැන ස්වාධීනව හිතන්න අපට පුළුවන්කමක් නැහැ. අපිට අත උස්සන්න කියපුවාම අපි අත උස්සනවා" කියලා. ක්‍රිකට් මැච් එකක් පටන් ගත්තාම එක පැත්තක runs 100යි; අනෙක් පැත්තේ බිංදුවයි. ඒක සාධාරණ දෙයක්ද? පිළිගන්න පුළුවන් දෙයක්ද? ඒ නිසා තමයි රුසියානු තානාපතිතුමා නව දිල්ලියේ ඉඳලා කියන්නේ, "මේක අපි හෙළා දැකිය යුතු දෙයක්. මෙහෙම තීරණ ගන්නා පර්ෂදයකට මොකක්ද ලැබිය යුතු ගෞරවය? කිසිම ගෞරවයක් නැහැ, ලැබිය යුත්තේ පිළිකුලක්" කියලා. ඒක තමයි ඉතාම ප්‍රබල භාෂාවෙන් ඇමෙරිකාවේ කොංග්‍රස් මණ්ඩලයේ අර මම සඳහන් කරපු ඉතාම ප්‍රබල නිලධාරියාත් ප්‍රකාශ කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අදහස් ගරු සභාවට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන රජය වෙනුවෙන් ඔබතුමාට මගේ කෘතඥතාව පිරිනමන අතර, මෙම කරුණු වඩාත් විස්තර සහිතව ලබන සතියේ ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වනවා.

[පූ. භා. 11.15]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මෙම පනත් කෙටුම්පත් ඉදිරිපත් කරමින් සරත් අමුණුගම ඇමතිතුමා කිව්වා, මේ පනත් කෙටුම්පත් ගෙනෙන්නේ අපේ අපනයන වැඩි කර ගන්නටයි කියලා. ඒ නිසා මේවාට අපේ සහයෝගය අවශ්‍යයි කිව්වා. මා මේ අවස්ථාවේදී අහන්න කැමැතියි, මේ අපනයන සම්බන්ධයෙන් සමස්තයක් වශයෙන් රජයේ ප්‍රතිපත්තිය කුමක්ද කියලා. අපේ රටේ අපනයනවලින් සියයට 65ක් යන්නේ යුරෝපා රටවලටයි. චීනය අපෙන් කිසිම දෙයක් ගන්නේ නැහැ. ඉරානය අපෙන් තේ ටිකක් ගන්නවා. රුසියාවත් තේ ටිකක් ගන්නවා. අපේ අපනයනවලින් සියයට 65ක් යන්නේ යුරෝපයටයි, ඇමෙරිකාවටයි. නමුත් රජයේ අද ප්‍රතිපත්තිය මොකක්ද? අද ආණ්ඩුව සම්පූර්ණයෙන්ම යුරෝපයටයි, ඇමෙරිකාවටයි විරුද්ධව සන්නද්ධ වනවා. ඔබතුමා කියලා තිබුණා යුරෝපා රටවල සමහර තානාපති කාර්යාල වසා දමනවා කියලා.

**ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

මේ නිසා නොවෙයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

කොහොම හරි ඔබතුමා කියලා තිබුණා නේ. ඉතින් මේකෙන් දෙන පණිවුඩය මොකක්ද? ඔබතුමා විදේශ ඇමති හැටියට කියනවා නම්, අපි යුරෝපයේ තානාපති කාර්යාල වහනවා කියලා, ඒකෙන් මොකක්ද දෙන පණිවුඩය? අපේ රටේ අපනයනවලින් සියයට 65ක් යන්නේ යුරෝපයටයි, ඇමෙරිකාවටයි. අපි කවුරුත් මේ රටට ආදරෙයි. අපිටත් ඕනෑ, රට ගොඩ ගන්නයි. දැන් මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? හරි හෝ වැරැදි වේවා ඔබතුමාත් පිළිගන්නවා ඇති, අපේ රට දැන් වළක ඉන්නේ කියලා. තමුන්නාන්සේලා දැන් මොනවාද කරන්නේ? ඒ වළ තවත් හාරනවා. වළ තවත් හාරනකොට අපි තවත් යටට යනවා. කිසිම කෙනෙක් අපේ රට ඒ වළෙන් ගොඩ ගන්න උත්සාහ කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආණ්ඩු පක්ෂයයි, විපක්ෂයයි එකතු වෙලා වළේ වැටිලා තිබෙන රට ගොඩගන්න මාර්ගයක් හොයන්න ඕනෑ. ආණ්ඩුවේ ඇමතිවරු මොකක්ද කරන්නේ? විවිධ ප්‍රකාශ කර කර ඒ වළ තවත් හාරනවා. එතකොට අපි තවත් ඒ වළේ ගිලෙනවා. ඒක හරිද? අපි රජයට උදවු කරන්න සූදානම්. මේ කාරණය පාවිච්චි කරලා ආණ්ඩු බලය ලබා ගන්න අපිට වුවමනා නැහැ. අපි ඔක්කොම එකතු වෙලා, කොහොමද මේ වළෙන් ගොඩ එන්නේ කියන එක හොයන්න ඕනෑ.

ඔබතුමාට මා ගරු කරනවා ඇමතිතුමනි. ඔබතුමා මුලදී කිව්වා, එක්සත් ජාතීන්ගේ සංගමයේ මහ ලේකම් අපේ රට ගැන හොයන්න කමිටුවක් පත් කරන්නේ නැහැ කියලා. නමුත් මොකක්ද වුණේ? කමිටුවක් පත් කළා, දරුස්මාන් වාර්තාවෙන් පසුව. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ පාර්ලිමේන්තුවේදීම කිව්වා, කිසිම දවසක එක්සත් ජාතීන්ගේ සංවිධානය අපේ රටට විරුද්ධව කමිටුවක් පත් කරන්නේ නැහැ කියලා. නමුත් ඒ කමිටුවත් පත් කළා. ඊට පස්සේ ඔබතුමා කිව්වා, කවදාවත් අපේ රටට විරුද්ධව යෝජනාවක් ගෙනෙන්නේ නැහැ කියලා. නමුත් අපේ රටට විරුද්ධව යෝජනාවක් ගෙනාවා. ඊට පස්සේ ඔබතුමා කිව්වා, ඒ යෝජනාව සම්මත වන්නේ නැහැ කියලා. නමුත් ඒ යෝජනාව සම්මත වුණා.

අනෙක් එක, අපි මේ රටේ අභිමානය ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අභිමානය මොකක්ද? දේශානුරාගය මොකක්ද? අපේ රටට විරුද්ධව යෝජනාවක් ගෙනෙනවා කියලා රොබට් බ්ලේක් කිව්වේ ඇමෙරිකාවේදී නොවෙයි, අපේ රටට ඇවිල්ලා අපේ රටේදී. ගරු ෆවුසි ඇමතිතුමනි, රොබට් බ්ලේක් අපේ රටට ඇවිල්ලා පුවත් පත් සාකච්ඡාවක් තියලා අපේ රටේදී තමයි කිව්වේ ශ්‍රී ලංකාවට විරුද්ධව යෝජනාවක් ගෙනෙනවා කියලා. මොකක්ද එතකොට අපේ අභිමානය? කියන්න බලන්න. අපිට ලජ්ජයි. විපක්ෂයේ හිටියත් ඇත්තෙන්ම ඒක අහගෙන ඉන්න කොට මට ලජ්ජා හිතුණා. ඒ නිසා දැන්වත් අපි මේ වචන හුවමාරුව නවත්වමු. අපේ රට දැන් වළක ඉන්නේ. ගරු ඇමතිතුමාට ඒක නැහැ කියන්න පුළුවන්.

2009 දී අපට විරුද්ධව යෝජනාවක් ගෙනාපු වෙලාවේ අපි ඡන්ද 17කින් දිනුවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඡන්ද 17කින් දිනුවා. නමුත් මේ සැරේ අපි ඡන්ද 8කින් පැරදුණා. මේ අවුරුදු ගණන තුළ රටවල් 25ක් අපට නැති වෙලා තිබෙනවා. දැන් ඔබතුමා මොනවා කිව්වත් ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමනි, මම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා අපට ඡන්දය දුන්නු රටවල් කරපු කථා කියවන්න කියලා. අන්න ඒකයි වැදගත්. අපට ඡන්දය දුන්නු රටවල් කරපු කථාවල මොනවාද තිබෙන්නේ? අපට ඡන්දය දීපු රටවල් කියන්නේ, "අපි ශ්‍රී ලංකාවට ඡන්දය දෙන්නේ, උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ තිබෙන වැදගත් යෝජනා ක්‍රියාත්මක කරයි කියලා අපට විශ්වාසයක් තිබෙන නිසාය" කියලා. අන්න ඒ පොරොන්දුව මත තමයි ඔවුන් අපට පක්ෂව ඡන්දය දුන්නේ. තමුන්නාන්සේලා ඒ ටික කෙරුවේ නැත්නම් ඒ රටවල් ටිකත් ඊ ළඟ සැරේ අපිට නැති වෙයි. අන්න ඒක මතක තියා ගන්න. හැම දාම බොරු කරලා වැඩක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2009 දී අපට විරුද්ධව ගෙනාපු යෝජනාව අපි දිනුවේ ඇයි? තමුන්නාන්සේලා පොරොන්දුවක් දුන්නා. 2009 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේදී ආණ්ඩුව කිව්වා, "අපිට කල් දෙන්න, යුද්ධය අවසන් වෙච්ච විගස අපි දේශපාලන විසඳුමක් ගෙනෙනවා. මේ රටේ යහ පාලනයක් ඇති කරනවා" කියලා. ඒ පොරොන්දුව දුන්නු නිසා තමයි ආණ්ඩුවට අවුරුදු තුනක් කල් දුන්නේ. යුද්ධය අවසන් වීම කවුරුත් ප්‍රශංසා කෙරුවා.

ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමනි, දැන් ඔබතුමා කියනවා අවුරුද්දකින් සම්බාධක එන්නේ නැහැ කියලා. ඔබතුමාම කියන විධියට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමෙන් අපි හිතන විධියට වැඩ වෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත. බලවත් රටවල් යමක් හරි හෝ වැරදි හෝ ඒක කරනවා. අන්න ඒකට විකල්පයක් හොයන්න ඕනෑ. ඇත්තෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ස්ථාවරයේ යුක්තිසහගතභාවයක් තිබෙන්න ඕනෑ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට ගියාම රටේ ස්ථාවරයේ යුක්තිසහගතභාවය ඔප්පු කරන්න ඕනෑ. අපේ ස්ථාවරයේ යුක්තිසහගතභාවය ඔප්පු කෙරුවොත් අපට සහයෝගය ලැබෙනවා. නමුත් අපට ඒක කරන්න බැරි වුණා. දැන් බලන්න, කියුබාව. කියුබාව පසු ගිය අවුරුද්දේ ඇමෙරිකාවට විරුද්ධව යෝජනාවක් ගෙනාවා. මොකද, කියුබාවට විරුද්ධව සම්බාධක තිබෙන නිසා. ඇමෙරිකාවෙන් ඒ රටට ආර්ථික සම්බාධක තිබෙනවා. මොකක්ද ප්‍රතිඵලය? ඇමෙරිකාවට පක්ෂව රටවල් දෙකයි ඡන්දය දුන්නේ. කියුබාවට පක්ෂව රටවල් 190ක් ඡන්දය දුන්නා. ඒ කොහොමද? කොහොමද රටවල් 190ක් කියුබාවත් එක්ක ඡන්දය දුන්නේ? ඇමෙරිකාව බලවත් රටක්. ඒ රටවල් එක්ක ගනුදෙනු කරනවා. නමුත් ඒවා නොවෙයි හේතු වුණේ. කියුබාවේ ස්ථාවරය යුක්තිසහගත වුණා. අපේ රටට අන්න ඒ යුක්තිසහගතභාවය ඔප්පු කරන්න බැරි වුණා.

අද මේ විවාදය වැදගත් වන්නේ, අපි බටහිර රටවල් එක්ක ගනුදෙනු කරන නිසා. ඇයි බටහිර රටවල් එක්ක අපි විරසක වෙලා සිටින්නේ? ඒක හොයන්න ඕනෑ. අපේ තානාපති කාර්යාල තිබෙන සමහර රටවල් අපට විරුද්ධව ඡන්දය දීලා තිබෙනවා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අයගෙන් අහන්න ඕනෑ ඇයි අපට විරුද්ධව ඡන්දය දුන්නේ කියලා. එහෙම නැතිව, ඒ රටවල තානාපති කාර්යාල වහන එක නොවෙයි විසඳුම. ඒක සිල්ලර විසඳුමක්. ඒ අයට කථා කරලා අහන්න ඕනෑ අපිට වැරදුණේ කොහොමද කියලා. ඒකයි මම කියන්නේ. තමුන්නාන්සේලා කොච්චර කිව්වත් මේක ආණ්ඩුවේ ප්‍රශ්නයක්.

ආණ්ඩුව තමයි රට අපකීර්තියට පත් කරන්නේ. මම මේ සම්බන්ධව මීට වඩා කථා කරන්නේ නැහැ. දවස් දෙකක විවාදයක් තිබෙනවා, ලබන සතියේ. නමුත් මේ ප්‍රශ්නය මතු වුණු නිසායි, ඔබතුමාට මේ කාරණය මතක් කරන්නට සිද්ධ වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද දෙවන වර කියවීම සඳහා පනත් කෙටුම්පත් හයක් ඉදිරිපත් කර තිබෙනවා. ගරු සරත් අමුණුගම ඇමතිතුමා ගැන මම කනගාටු වෙනවා. එතුමා පනත් කෙටුම්පත් ඉදිරිපත් කරමින් කථා කර යන්න ගියා. අඩු ගණනේ පැහැදිලි කිරීම් කරන්නවත් මේ ගරු සභාවේ ඉන්නේ නැහැ. දැන් මේ අය තමයි බුද්ධිමතුන් හැටියට ප්‍රදර්ශනය වෙන්නේ. එතුමාට අද මේ ගරු සභාවේ ඉන්න තිබුණා. මේ පනත් කෙටුම්පත්වලින් ලබා දෙන්නේ බදු සහන නොවෙයි. සමහර පනත් කෙටුම්පත්වලින් කෙරෙන්නේ සම්පූර්ණයෙන්ම බදු ඉවත් කිරීමක්.

අද දෙවන වර කියවීම සඳහා ඉදිරිපත් කර තිබෙන මුදල් පනත් කෙටුම්පත දෙස බැලුවාම, සමහර ව්‍යාපාරවලට රේගු ආඥාපනත සම්පූර්ණයෙන්ම අහෝසි කරලා. They have been exempted from the application of provisions of the Customs Ordinance. විනිමය පාලනයක් සමහර ආයතනවලට නැහැ. There is no exchange control for them. සමහර ආයතන, ව්‍යාපාර වෙනුවෙන් අපනයන සහ ආනයන බදු සම්පූර්ණයෙන්ම අහෝසි කරලා. Import and export control එකක් නැහැ. එය ඉතාමත් පැහැදිලියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ අපේ රටේ බදු අය කරන මාර්ග ඉවත් කළාම එතැන මොකක් ද වෙන්නේ? ඊට පස්සේ මෙතැන විශාල කළු කඩයක් වෙනවා. කළු සල්ලි සුදු කරන ව්‍යාපාරයක ආරම්භය තමයි මෙය. ඒ වාගේම කුඩු ජාවාරම්වල තිප්පොළවල් වෙනවා, මේ ආයතන. මොකද මේ ආයතන ගැන කිසිම සොයා බැලීමක් නැහැ. රේගු ආඥාපනත නැත්නම්, ආනයන හා අපනයන බදු නැත්නම්, විනිමය පාලනය නැත්නම් මොකක් ද වෙන්නේ? ඒක විවෘතයි. ඕනෑම වැඩකට විවෘතයි. එම නිසා මා ඔබතුමාට කියන්නට කැමතියි, නීති සම්මත කළාට රටක් දියුණු වන්නේ නැහැ කියලා. ඕනෑම රටක නීතිය ක්‍රියාත්මක වෙනවාය කියා ඔප්පු කරන්නට ඕනෑ.

අද මේ පාර්ලිමේන්තුවට කොපමණ පනත් කෙටුම්පත් ගෙනාවත් නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් ආයෝජකයෝ අපේ රටට එන්නේ නැහැ. ඒක හොඳට මතක තියා ගන්නට ඕනෑ. අප මේක අවුරුදු පහක් තිස්සේ ආණ්ඩුවට කිව්වා. ආණ්ඩුව මේක ඇහුවේ නැහැ. මේ රටේ නීතිය ක්‍රියාත්මක වෙනවාය කියා පෙන්නුවොත් තමයි ආයෝජකයෝ අපේ රටට එන්නේ. අද මේ රටේ පැහැර ගැනීම්, කප්පම් ගැනීම්, අතුරුදහන් වීම් සිද්ධ වෙනවා. මොන ව්‍යාපාරිකයා ද මෙහාට එන්නේ?

මහින්ද චින්තයෙන් කිව්වා, හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම කර්මාන්තශාලාවක් ඇරලා පන්සියයකට රැකියා දෙනවාය කියලා. කොහේද තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්න. ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ තිබෙනවා ද? පන්සියයකට රැකියා දෙන කර්මාන්තශාලාවක් හැම

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම දෙනවාය කිව්වාට, එහෙම දේවල් නැහැ. අපේ මහනුවරත් නැහැ. එම නිසා නීති අවශ්‍යයි.

අද අප විදේශ රටවලට ගියාට අපේ රට ගැන තිබෙන ප්‍රතිරූපය ගැන අමුතුවෙන් කථා කරන්න ඕනෑ නැහැ. අපට ලජ්ජයි. අනෙක් කාරණය, මේ බදු සහන දී තිබෙන්නේ කාටද? මේ රටේ සාමාන්‍ය ජනතාවගේ අත්‍යවශ්‍ය භාණ්ඩවලට දවසින් දවස බදු අය කරනවා. ඉන්ධන, හාල්, සීනි, පිටි, කිරිපිටි, භූමිතෙල් යන මේ සෑම දෙයකටම දවසින් දවස බදු වැඩි කරනවා. ඒ කියන්නේ, ඒ භාණ්ඩවල වටිනාකමෙන් සියයට හැටක් හැත්තෑවක් බදු. එතකොට රටේ සාමාන්‍ය ජනතාවට බදු සහන දෙන්නේ නැද්ද? ජනතාව ජීවත් වන්නේ කොහොමද? මේ බදු සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබෙන්නේ සාමාන්‍ය ජනතාවගේ හිතසුව පිණිස නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කළුකඩකාරයින්ට හොර තිත්පොළවල් අරින්නට තමයි මේ ආණ්ඩුව අනුබල දෙන්නේ. ඉන්ධනවලට අධික බදු තිබෙනවා, ඒවා ඉවත් කරන්නය කියා අප ආණ්ඩුවට කිව්වා. ආණ්ඩුව ඒවා කළේ නැහැ. අත්‍යවශ්‍ය භාණ්ඩවල බදු සියයට පණහක් හැටක් තිබෙනවාය කිව්වා. විදුලිය ගාස්තු වැඩි වුණායින් පස්සේ ඊයේ පළමු වන විදුලි බිල ආවා. වැඩි කළායින් පස්සේ පළමු වන විදුලි බිල අවේ පසු ගිය සතියේ.

මගේ ගෙදර විදුලි බිල ගැනත් උනන්දුවෙන් හිටියා. මම ගණන් හදා බැලුවා. මගේ බිල කීයද කියා මට කියන්න බැහැ. නමුත් සියයට 50කින් බිල වැඩි වෙලාය කියා මට කියන්න පුළුවන්. සියයට 50කින් වැඩි වෙලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගණන කියන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
That is private information. සියයට 50කින් බිල වැඩි වෙලා. අපට ආණ්ඩුව මොකක්ද කිව්වේ? සියයට 3කින්, 4කින් බිල වැඩි වෙයි කියා තමයි අපේ ඇමතිතුමා කිව්වේ.

මම දන්නේ නැහැ, අපේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කිව්වා, රුපියල් 7500කින්, දරුවො තුන් දෙනෙක් එක්ක මාසයක් ජීවත් වෙන්න පුළුවන්ය කියලා. ඇත්ත වශයෙන්ම මට නම් හිතා ගන්නවත් බැහැ. සරත් අමුණුගම ඇමතිතුමා තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. මම හිතන්නේ කවුරු හරි එතුමාට කියන්න ඇති, මේ ගැන කථා කරන්නය කියලා. මේ පනතින් කළු කඩකාරයින්ට තමයි සෙතක් ලබා දී තිබෙන්නේ. ඒ මිසක් මේ රටේ සාමාන්‍ය ජනතාවට නොවෙයි. ඒ බව පැහැදිලිවම පෙනෙන්න තිබෙනවා.

පසු ගිය අවුරුදු ගණනාව තුළ කොහේද කර්මාන්තශාලා ඇරලා තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය අවුරුදු පහළොවටම අපේ මහනුවර දිස්ත්‍රික්කයේ නම් එක කර්මාන්තශාලාවක්වත් ඇරලා නැහැ. තිබුණු ඒවා වැහුවා. Garment factories 15ක්, 20ක් වැහුවා. පල්ලෙකැලේ නිදහස් වෙළෙඳ කලාපයේ එක්තරා වකවානුවක "ටැන්ඩම් ලංකා" කියලා කර්මාන්තශාලාවක් තිබුණා. ඒකේ 4,000ක් වැඩ කළා. අද ඒක වසා දමා තිබෙනවා. ඒක නිසා අපි රජයට කියනවා, ව්‍යාපාරික ප්‍රජාවට සහන දෙනවා වාගේම මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ජීවන බර අඩු කරන්න බදු සහන දීලා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කරලා ජනතාවට ජීවත් වෙන්න පුළුවන් මාර්ගයක් සකස් කරන්නය කියා මම ඉල්ලීමක් කරනවා. ස්තුතියි.

[පූ. භා. 11.31]

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)
(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම පිළිබඳවත් සාකච්ඡා වන මේ අවස්ථාවේදී අපි එක පැත්තකින් කනගාටු වෙනවා, එක්සත් ජාතික පක්ෂය මෙහි තිබෙන හරවත්භාවය පැත්තකට දමලා, ඒ පිළිබඳව නිවැරදි අර්ථ විග්‍රහයක් නොකර කථා කිරීම පිළිබඳව. මොකද, මේක 2012 අය වැය යෝජනාවේ සඳහන් කාරණා පිළිබඳව තිබෙන සටහනක්. මෙහි විශේෂයෙන් දේශීය සිනමා කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් සිනමා ශාලා වැඩිදියුණු කිරීමට අවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම, දේශීය ඖෂධ නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා ඖෂධ නිෂ්පාදකයන්ට අවශ්‍ය නවීන යන්ත්‍රෝපකරණ ආනයනය කිරීම, කාබනික අපද්‍රව්‍ය භාවිතා කර දේශීය සම්පීඩනය කළ කුට්ටි ගල් අතුරා නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ආනයනය කිරීම, දේශීය කෘෂිකර්මාන්තයට අදාළ හරිතාගාරවලට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම, බල ශක්ති නිෂ්පාදනයට පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ දේශීයව නිෂ්පාදනය කිරීම, දේශීය එකතු කළ අගය සහිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට හැකි වන පරිදි සංචාරක හෝටල්, ගුවන් සේවා අවශ්‍ය ප්‍රමිතිකරණය අනුව දේශීය ද්‍රව්‍ය භාවිත කර නිෂ්පාදනය කිරීම, දේශීය නිෂ්පාදන දිරිමත් කිරීම සඳහා ටින් මාළු සැපයීම, දේශීය භාණ්ඩ නිෂ්පාදනය සඳහා හඳුනා ගත් රාජ්‍ය ආයතන ආදී වශයෙන් යෝජනා විශාල ප්‍රමාණයක් මෙහි තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා ඒවා පිළිබඳව කථා නොකර ඒවා සැලකිල්ලට ගන්නේවත් නැතිව ක්‍රියා කිරීම පිළිබඳවයි අපට මේ ප්‍රශ්නය තිබෙන්නේ.

ඇත්ත වශයෙන්ම මේ දිනවල අපට පෙනෙනවා විපක්ෂය ශ්‍රී ලංකාව විධියට හිතන්නේ නැතුව පක්ෂයක් විධියට, පක්ෂයකට බලයට පත් වෙන්න පුළුවන් ක්‍රමෝපක්‍රම මොනවාද කියා කල්පනා කරමින් කටයුතු කරන බව. විශේෂයෙන් අද උතුරේ තිබෙන තත්ත්වය පිළිබඳව උතුරට යන ඕනෑම කෙනෙකුට පැහැදිලි වෙනවා. ඊයේ පෙරේදා අපි දැක්කා, විපක්ෂ නායකතුමා උතුරට ගිහිල්ලා ප්‍රභාකරන්ගේ නටබුන් මත ඉඳලා ලංකාවට නොවෙයි ලෝකයට කථා කරලා තිබුණා, උතුරේ මොකක්වත් වෙලා නැහැ කියලා. ඇත්ත වශයෙන්ම එතුමා ගිය කාපට් පාරවත් මතක නැද්ද මම දන්නේ නැහැ. මම ඊයේ පෙරේදා -මේ මාසයේ 19 වැනිදා- ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, සංස්කෘතික නිලධාරින් යාපනයේ කච්චේරියට කැඳෙව්වා. ඒකට අපි යාපනය දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ව කැඳවූවා. එහිදී කලාකරු ආධාර ඇතුළු විශාල ආධාර ප්‍රමාණයක් දුන්නා. එහිදී යාපනයේ දිසාපතිතුමිය, ඉමෙල්ඩා සුකුමාර් මහත්මිය දමිළ භාෂාවෙන් කළ කථාවේ කොටසක් සිංහල භාෂාවෙන් කියන්නට මම කැමැතියි.

"පෙර සිටම සංස්කෘතික අතින් ඉහළ ස්ථානයක පැවති යාපනයේ සංස්කෘතිය පසු ගිය කාල වකවානුව තුළ යුද්ධය නිසා දියුණු කර ගැනීමට හැකියාව ලැබුණේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා යුද්ධය නිමා කිරීමත් සමඟ අද යාපනයට සාමය උදා වී ඇත. ඒ අවස්ථාවේ මහින්ද චින්තනය, උතුරු වසන්තය යන වැඩ සටහන් යටතේ යාපනය තුළ පවත්නා දමිළ ප්‍රදේශ දියුණු කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා කෝටි ගණනක විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර දී ඇත. ඒ අතර මාර්ග සංවර්ධනය, දුම්රිය මාර්ග නිර්මාණය කිරීම, නගර නිර්මාණය කිරීම, නිවාස යෝජනා ක්‍රම, ධීවර කර්මාන්තය, ජල ව්‍යාපෘති, විදුලි යෝජනා ක්‍රම රැසක් ඇතුළත්ව ඇත."

මේ වන විට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් ලබා දෙන ආධාර ගැනත් එතුමිය මේ විධියට කියලා තිබෙනවා.

"ප්‍රථම වරට යාපනයේ සිටින අභ හිඟකම් ඇති කලාකරුවන්ගේ දූ පුතුන්ට ආධාර ක්‍රම, කලායතනවල ලියා පදිංචි කිරීම, පාසල් පුස්තකාල සඳහා පොත් ලබා දීම සිදු කළා. ඒ වාගේම යාපනයේ හින්දු විද්‍යාලයේ කලාකරුවන්ගේ චිත්‍ර, මූර්ති ප්‍රදර්ශනයක් ආරම්භ කළා."

ඒ වාගේ කාරණා රාශියක් එතුමියගේ කථාවේදී ප්‍රකාශ කළා. එතුමිය දේශපාලනඥයෙන් නොවෙයි. රාජ්‍ය නිලධාරියෙක් විධියට අවංකව යාපනය ප්‍රදේශයට, යාපනය දිස්ත්‍රික්කයට ලබා දුන්න දේවල් ගැන කිව්වා. ප්‍රාදේශීය ලේකම්වරු සියල්ලම ඉදිරිපිටයි එතුමිය මේ ප්‍රකාශය කළේ. ඒකෙන් පැහැදිලි වෙනවා විපක්ෂ නායකතුමා කළ ප්‍රකාශයත්, යාපනයේ දිසාපතිතුමිය කළ ප්‍රකාශයත් අතර කොපමණ වෙනසක් තිබෙනවාද කියලා. ඒ නිසා අපට, ප්‍රදේශයේ ජනතාවට, රාජ්‍ය නිලධාරීන්ට දැනෙනවා මේ වෙනස. අද උතුරු වසන්තය යටතේ, නැඟෙනහිර උදානය යටතේ අති විශාල සම්පත් ප්‍රමාණයක් උතුරට ලබා දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මාර්ග ක්ෂේත්‍රය ගත්තොත් අද පාලම් විශාල ප්‍රමාණයක්, පාරවල් විශාල ප්‍රමාණයක්, තාක්ෂණික මධ්‍යස්ථාන විශාල ප්‍රමාණයක් නිර්මාණය කරන්නට මේ වන විට හැකියාව ලැබිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විශේෂයෙන් අපි කියන්නට ඕනෑ කාරණාවක් තිබෙනවා. මානව හිමිකම් කවුන්සලය ගැන අලුත් මාතෘකාවක් පාවිච්චි කරලා තිබෙනවා, අපි හරියට ඒකට මුහුණ දුන්නේ නැහැ, අපිට ජාත්‍යන්තර කාර්ය භාරය ගැන අවබෝධයක් නැහැ කියලා. අපේ ගරු විදේශ කටයුතු ඇමතිතුමා විශේෂයෙන් මාර්තු මාසයේ 22 වෙනි දා සිදු වුණ සිද්ධිවාචකය පිළිබඳව ප්‍රකාශ කළා. ඒ වාගේම ලෝකයේ රටවල් කළ ප්‍රකාශනයන් සහ සමස්ත සාමාජික රටවල් 47න් ඒ කළ කාර්ය භාරයන් තුළ පැහැදිලි වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ නිසා ලංකාව පිළිබඳව ලෝකයේ අලුත් මොඩලයක් ඇති වෙලා තිබෙනවා. සාමය ස්ථාපිත කළ, ඒ වාගේම ත්‍රස්තවාදය සම්පූර්ණයෙන්ම පිටු දැකපු රටක් විධියට ලංකාව ගැන අද ඇමෙරිකාව ඇතුළු සමහර රටවලට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා, මේ මොඩලය ගැන කියන්න.

අද මහින්ද රාජපක්ෂ කියන නායකයා ගැන ඔවුන්ට ප්‍රශ්නයක් තිබෙනවා. ත්‍රස්තවාදී ප්‍රශ්නය විසඳන්න පුළුවන් නායකයෙක් ලෝකයේ ඉන්නවා කියන එක ගැන ඔවුන්ට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ඒ අය අපට විවිධ සම්බාධක ඉදිරිපත් කරනවා. අපි දැක්කා ඔබාමා පෞද්ගලිකව විවිධ රටවලට කථා කරලා තිබුණා. එච්චර ඕනෑකමක් තිබෙන්නේ මොකටද? ප්‍රජාතන්ත්‍රවාදය, ඒකීය භාවය සහ සාමය ස්ථාපිත කරමින් රට සංවර්ධිත දිසාවකට යොමු කිරීමත් එක්ක තමයි අද සංචාරකයෝ විශාල ප්‍රමාණයක් ලංකාවට එන්නේ. අද කොළඹ ඇතුළු දකුණු ප්‍රදේශය සහ අනෙකුත් ප්‍රදේශවල සංචාරක හෝටල්වල සියලුම කාමර සංචාරකයින් සඳහා වෙන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාව නිදහසේ ඉන්න පුළුවන් රටක් විධියට, සංචාරය කරන්නට ඉතාමත් ගැළපෙන රටක් විධියට විවිධ සඟරාවල, සංචාරක වාර්තාවල සඳහන් වෙලා තිබෙන නිසා තමයි අද රට තුළ මෙවැනි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙන්නේ. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා. ලාංකිකයින් විධියට හැමෝටම සතුටු වෙන්න පුළුවන්. නමුත් විපක්ෂයට ඒ සතුට ලබා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ අය ඒක දකින්නේ අශුභවාදී විධියට. ඒ නිසා තමයි විවිධ අංශවලින් කාරණා ගනිමින් මේ පිළිබඳව පැහැදිලිවම කඩාකප්පල්කාරී ක්‍රියාවන් කරමින් යන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය සඳහා ග්‍රාම නිලධාරි කොට්ඨාස 14,870 ගණනාවටම රුපියල් ලක්ෂ 10 බැඟින් ලබා දෙනවා. ලංකා ඉතිහාසයේ කවරදාවත් එහෙම හම්බ වුණේ නැහැ.

එහෙම ගමට මුදල් ආපු යුගයක් තිබුණේ නැහැ. අද ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමාට, පළාත් සභා මන්ත්‍රීතුමාට, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට හැම වසමකම ජන සභාවක් පවත්වලා ජනතාවට අවශ්‍ය යෝජනාව ජන සභාවෙන් අරගෙන ඒක ක්‍රියාත්මක කිරීමට පුළුවන් ක්‍රමවේදයක් අද මේ රටේ ගොඩ නඟලා තිබෙනවා. ඒ යෝජනා අතර යෝජනා පහක් තිබුණොත් ගමේ ප්‍රමුඛත්වය දිය යුතු යෝජනාව මොකක්ද කියලා තෝරා ගෙන ජන සභාව විසින් ඒක ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළ ඇති කර තිබෙනවා. ඒ නිසා ගමට මුදල් ආපු යුගයත් එක්ක ප්‍රාදේශීය වශයෙන්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වශයෙන්, ආසන්න මැතිවරණ කොට්ඨාස වශයෙන්, දිස්ත්‍රික්ක වශයෙන්, පළාත් වශයෙන් ඒ සම්බන්ධීකරණ රැස්වීම් පවත්වනවා.

ඊට අමතරව අතිගරු ජනාධිපතිතුමා දිස්ත්‍රික්කයෙන්, දිස්ත්‍රික්කයට ගිහිල්ලා මේ ආර්ථික වැඩ පිළිවෙළ, මේ සංවර්ධන වැඩ පිළිවෙළ පිළිබඳ සියලු නිලධාරින් -මධ්‍යම ආණ්ඩුවේ නිලධාරින්, පළාත් සභාවේ නිලධාරින්, අනෙකුත් සංවිධානවල නිලධාරින්- කැඳවලා ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනවා. පසු ගිය දවස්වල පුත්තලම දිස්ත්‍රික්කයේත් එවැනි රැස්වීමක් පැවැත්වූවා. මේ වැඩ සටහන්වලදී රටේ රාජ්‍ය නායකයා කොළඹට නිලධාරින් කැඳවන්නේ නැතුව ගම් ප්‍රදේශයට ගිහිල්ලා ඒවා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් පිළිබඳව එකින් එකට අරගෙන සාකච්ඡා කළා. වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ඇති බාධාවන් මොනවාද, ඒ පිළිබඳව ඇති ගැටලු මොනවාද, ඒ සඳහා ක්‍රියාමාර්ග ගත යුත්තේ මොන ආකාරයෙන්ද කියන එක පිළිබඳව කථා කරන්න යෙදුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද එක්සත් ජාතික පක්ෂය තුළ විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා. සිරිකොතට පහර දීම පිළිබඳව අද එක්සත් ජාතික පක්ෂයේම නායක කණ්ඩායමකට වෙනම විනය පරීක්ෂණ පවත්වනවා. මැයි දිනය සම්බන්ධව පක්ෂයේ ලේකම්තුමා කියනවා, "මැයි දින දෙකක් නැහැ" කියලා. තව කණ්ඩායමක් කියනවා, "නැහැ, මැයි දින දෙකක් තිබෙනවා, යාපනයේ එකක් තිබෙනවා, කොළඹ වෙනම එකක් තිබෙනවා" කියලා. මේවා ගැන හරි ප්‍රකාශ නැහැ. සිරිකොතට පහර දීම පිළිබඳව සමහරුන් අද තමන්ගේම පක්ෂයේ අයගේ මූහුණු වීඩියෝ පටයකින් පෙන්වා ගෙන යනවා. ඒක පිළිබඳව ප්‍රශ්න මතු වුණාම ඒ තැන්වලම අර්බුද පටන් ගන්නවා; ඒ තැන්වලම ගුටි කෙළි පටන් ගන්නවා; ඒ තැන්වලම ප්‍රශ්න පටන් ගන්නවා.

අද එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තුවේ ඉන්න සමහර මන්ත්‍රීවරුන්ගේ අද සංවිධායකකම අයින් කරලා. ඒ සංවිධායකකම අයින් කරන්න තරම් දැන් පක්ෂයේ එක කොටසක ඒකග්‍රාහිත්වය වර්ධනය වෙලා තිබෙනවා. අපි කියන්න කැමැතියි, එක්සත් ජාතික පක්ෂයේ අර්බුදය දවසින් දවස මතු වන්නේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන මහා ශක්තිමත් වැඩ පිළිවෙළත් එක්ක අද කථා කරන්න මාතෘකා නැති වීම නිසාය කියා. අද කථා කරන්න වැඩ සටහන් නැති වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මොකක් හරි බංකොලොත් මාතෘකාවක් අරගෙන ඒක අනුගත කරමින් ක්‍රියාත්මක වීම තමයි අද එක්සත් ජාතික පක්ෂයේ වැඩ පිළිවෙළ.

ඊයේ-පෙරේදා පක්ෂයේ ලේකම්තුමාගේ ප්‍රකාශනයක් නිකුත් කර තිබුණා, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධානම නිලතලවලට ඡන්දයක් නැහැ කියා. ඒක අමුතුම ව්‍යවස්ථාවක්. අඩු වශයෙන් තමන්ගේ පක්ෂය තුළ සංහිඳියාවක් හදා ගන්න බැරි නම්, තමන්ගේ පක්ෂය තුළ ඒකාබද්ධතාවක්, ඒකග්‍රතාවක් හදා ගන්න

[ගරු ටී. බී. ඒකනායක මහතා]

බැරි නම් රට කොහොමද හදන්නේ? රටට දෙන වැඩ පිළිවෙළ මොකක්ද? එක්සත් ජාතික පක්ෂයේ අද මේ ආර්ථිකය ගැන කථා කරන කිසිම තැනකදී කියලා තිබෙනවාද අපේ ආර්ථික වැඩ පිළිවෙළ මෙන්න මේකයි, අපේ විදේශ ප්‍රතිපත්තිය මෙන්න මේකයි, එහෙම නැත්නම් අපි ක්‍රියාත්මක කරන අධ්‍යාපන ක්‍රමවේදය මේකයි කියා. එවැනි වැඩ පිළිවෙළක් අද වෙන කල් එක්සත් ජාතික පක්ෂයට ඉදිරිපත් කරන්න පුළුවන් වෙලා නැහැ. අපි කියන්න කැමැතියි, ඔබතුමන්ලා පුළුවන් නම් රට හමුවේ කියන්න, අපේ ආර්ථික වැඩ පිළිවෙළ මෙන්න මේකයි; බඩු මිල අඩු කරන ක්‍රමවේදය මෙන්න මේකයි; අධ්‍යාපන ක්‍රමවේදය මෙන්න මේකයි; විදේශ ප්‍රතිපත්තිය මෙන්න මේකයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්නේ නැතුව මෙතුමන්ලා නිකම් බොරුවට කෑ ගැහුවට තේරුමක් නැහැ. මේ අර්බුදය හමුවේ තමයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන යන්නේ. මේ රටට ආදර්ශවත් වැඩ පිළිවෙළක් යොදා තිබෙද්දී ඒ යොදා තිබෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා අද පක්ෂ ගණනාවක් ආණ්ඩුවත් එක්ක එකතු වෙලා තිබෙනවා. අද සමහර දිස්ත්‍රික්කවල එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන්න මන්ත්‍රීවරයකු නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලබා දුන්න කාලය අවසන්.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
දිස්ත්‍රික්ක ගණනාවක සංවිධායකවරු නැහැ. පොළොන්නරුවේ නැහැ, ඒ වාගේම නුවරඑළියේ නැහැ. ඒ වාගේ තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. අය වැය යෝජනා පිළිබඳව පාර්ලිමේන්තුවේ නැවත සාකච්ඡා කරමින් ඒවා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නයි අපේ යෝජනාව වෙලා තිබෙන්නේ. එහෙම නැතුව වෙන වැඩ පිළිවෙළක් නොවෙයි. එම නිසා 2012 අය වැය යෝජනාවේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම සඳහා වගන්ති ගණනාවක් අද මේකට ඇතුළු කරලා තිබෙනවා. ඒක පිළිබඳවයි මේ යෝජනාව තිබෙන්නේ. ඒක නිසා මේ යෝජනාව සඳහා තමුන්නාන්සේලාගේ සහාය ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

[පූ. භා. 11.43]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි කීයක් තිබෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි 14ක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ වැදගත් මාතෘකාව ගැන කථා කරන කොට මම කියන්න කැමැතියි, ටී.බී. ඒකනායක මැතිතුමා අදාළ මාතෘකාවට ආවේ එතුමාගේ කථාවේ අන්තිම හරියේදී බව. එතුමාගේ කථාවේ මැද හරියේදී පොල්පිතිගම හරි කොහේ හරි කරන එකක් අල්ලා ගෙන එතුමාගේ දේශපාලන කථාව පටන් ගත්තා. මම කියන්න කැමැතියි, පක්ෂවල අර්බුද තිබෙන බව. අපට මතකයි නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය 1994 වෙන කොට තිබුණු හැටි. චන්ද්‍රිකා මැතිනිය එන කොට තව කට්ටියක් මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කණ්ඩායමක් එක්ක හිටියේ. [බාධා කිරීමක්] ඒක තමයි මම කියන්නේ. දිනන්න එන කොට තමයි එහෙම වෙන්නේ. ඒකයි මම මේ කියන්නේ. දිනන්න එන කොට තමයි ඔය වාගේ ප්‍රශ්න ඇති වෙන්නේ. ඒවා විසඳී ගෙන එන කොට දිනනවා. ඒක හින්දා ඒ ගැන කලබල වෙන්න එපා. එහෙම ප්‍රශ්න ඇති වෙනවා. ටී.බී. ඒකනායක මැතිතුමාට මතක ඇති නේ. ඒ කාලයේ රූස්වීම් පවත්වපු හැටි අපි දන්නවා. දිනන්න එන කොට එහෙම තමයි. ඒ කාලයේ චන්ද්‍රිකා මැතිනිය එන කොට එස්.බී. දිසානායක මැතිතුමායි, මංගල සමරවීර මැතිතුමායි තමයි කඩා ගෙන බිඳ ගෙන ගියේ. එතකොට මහින්ද රාජපක්ෂ මහත්මයායි, අනිත් කට්ටියයි ඔක්කෝම පැත්තක. ඒ ගොල්ලෝ වෙනම බණිනවා. රූස්වීම්වල වේදිකාවට නගින කොට මහින්ද රාජපක්ෂ මහත්මයා බණිනවා චන්ද්‍රිකා මැතිනියට. තමුන්නාන්සේට මතක නැතුව නෙමෙයි නේ. හොඳට මතකයි. අපිත් පා ගමන් ගියා නේ. ඒකයි මම කියන්නේ. දිනන්න එන කොට එහෙම තමයි. [බාධා කිරීමක්] ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා, ගිහිල්ලා ඔබතුමාගේ තාත්තාගෙන් අහන්න. එතකොට කියයි. ඔක්කෝම පුත්තු ඉන්නේ. පුත්තු, මල්ලිලා, අයියලා ඔක්කෝම ඉන්නවා. ගිහිල්ලා අහගන්න. දිනන්න එන කොට එහෙම තමයි. එහෙම ප්‍රශ්න ඇති වෙලා තමයි දිනන්නේ. ඒක නිසා කලබල වෙන්න එපා. අපි ඒක කර ගන්නම්.

ඔබතුමන්ලා රනිල් වික්‍රමසිංහ මහත්මයා යාපනයට ගිහිල්ලා කරපු කථාවක් ගැන කියනවා. දැන් මේ ප්‍රශ්නය දිගටම අදිනවා. එතකොට, රනිල් වික්‍රමසිංහ මහත්මයා කිව්ව නිසාද ඔක්කෝම වුණේ? රනිල් වික්‍රමසිංහ මහත්මයා යාපනයට ගිහිල්ලා කිව්වා, එහේට වැඩක් කෙරිලා නැහැයි කියලා. ඒක නිසාද ජීනීවා ඡන්දය පැරදුණේ? මාර වැඩක් නේ. ඒ කියන්නේ ජාත්‍යන්තර ප්‍රජාව ඔක්කෝම එතුමාත් එක්කයි ඉන්නේ. එහෙමද? මේක පුදුම කථාවක්. එතකොට, එතුමා කියන ඒවා හැම කෙනෙක්ම අහනවා. හරි ෂෝක්. එහෙම නම් ඉතින් වැඩේ කර ගෙන යන්න රට භාර දෙන්න කෝ. එහෙම නම් අපි ජිනීවා ඡන්දයත් දිනනවා නේ. මේ ආණ්ඩුවේ තිබෙන නොහැකියාව කියලා මම කියන්නේ ඒකයි.

ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා දැන් මෙතැනදී ප්‍රකාශයක් කළා. එතුමා විශාල මහන්සියක් ගත්තා මේක බේරා ගන්න. මේ ප්‍රශ්නය ලබන ඔක්තෝබර් මාසයේදී ගේන්න කියලා එතුමා කිව්වා. බොහොම පැහැදිලිව එතුමා පුවත් පත්වල කිව්වා, කරුණාකරලා මේ ප්‍රශ්නය ලබන ඔක්තෝබර් මාසයේදී ගන්න කියලා. එතුමා තමයි විදේශ කටයුතු ඇමති වශයෙන් මේ කණ්ඩායමේ නායකයා වෙන්න ඕනෑ. එහෙම නැතුව වචන ඇමති නොවෙයි නායකයා වෙන්න ඕනෑ. විදේශ කටයුතු ඇමති තමයි කණ්ඩායමේ නායකයා වෙන්න ඕනෑ. Plantation Industries ඇමති තමයි, නැත්නම් වචන ඇමති, එහෙමත් නැත්නම් මහින්ද සමරසිංහ මහත්මයා තමයි අන්තිමට ඒකේ නායකයා බවට පත් වුණේ. එතුමා ගිහිල්ලා මොකක්ද කිව්වේ? විදේශ කටයුතු ඇමතිතුමා හැටියට ජී.එල්. පීරිස් ඇමතිතුමා කිව්වා, මේක ඔක්තෝබර් මාසයේදී ගන්න කියලා. මේක දැන් ගන්න ඕනෑ කියලා මහින්ද සමරසිංහ මහත්මයා ඉල්ලා ගෙන කෑවා. ඒකයි වුණේ. වෙන එකක් නොවෙයි. ඔබතුමන්ලා ඔක්තෝබර් මාසය දක්වා මේක ඇද ගෙන ගියා නම්, තව වැඩ කටයුතු ටිකක් කරලා, LLRC Report එකේ තිබෙන කාරණා ටික යම් යම් විධියට ඉෂ්ට කරලා තමුන්නාන්සේලාට මේ ප්‍රශ්නය ඉවර කර ගන්න තිබුණා; බේරා ගන්න තිබුණා. මොකක්ද කෙරුවේ? මෙතුමා ඒ ඉල්ලීම කරන කොට වැවිලි කර්මාන්ත ඇමතිතුමා -මහින්ද සමරසිංහ මහත්මයා- කිව්වා, නැහැ, නැහැ, මේක වහාම ගන්න ඕනෑ කියලා. ඒකේ ප්‍රතිඵලය තමයි මේ තිබෙන්නේ.

යෝජනාව පරාද වුණාම ප්‍රශ්නයක් නැහැ කියලා හිතන්න එපා. පරාද වුණු නිසා ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා කිව්වේත් ඒකයි. ශ්‍රී ලාංකිකයෝ විධියට අපට විශාල කනගාටුවක් තිබෙනවා. ගිය සැරේ තමුන්නාන්සේලා දිනලා ආවා නේ. මේ සැරේ පැරදිලා ආවේ ඇයි? දැන් ගේන අලුත්ම තර්කය තමයි, එහාට ඡන්ද 24යි, අපට ඡන්ද 23යි කියන එක. රටවල් 15යි ලු යෝජනාවට විරුද්ධ වුණේ, ඉතිරි කට්ටිය නිකම් හිටියා ලු. ඔබාමා ඒ ටික අනිත් පැත්තට එකතු කළා නම් මොකද වෙන්නේ? ඔබාමා ඒ ටික අනිත් පැත්තට එකතු කළා නම් මිනිහාට ඡන්ද 32යි, අපට ඡන්ද 15යි. එහෙමත් එකතු කරන්න පුළුවන්. කරුණාකරලා අංක ගණිතය වරද්දා ගන්න එපා. එක ඡන්දයකින් නොවෙයි පැරදුණේ. පැරදුණාය කියන එක ඉස්සෙල්ලා තේරුම් ගන්න. දැන් මෙතැනට ඇවිල්ලා කියනවා, එක ඡන්දයකිනුයි පැරදුණේ කියා. ඔබාමා 24ට 8ක් එකතු කළා නම්, 32යි. අපි 15යි. ඒත් හොඳයි එතකොට. මේ අංක ගණිතය කවුරු හෝ කෙනකු කිව්වාය කියලා කරුණාකර මෙහේ ඇවිල්ලා කියන්න එපා. දැන් බලන්න, ආණ්ඩුව ඇතුළේම ප්‍රශ්නයක් මේ තිබෙන්නේ; එක්සත් ජාතික පක්ෂයේ ප්‍රශ්නයක් නොවෙයි මේ තිබෙන්නේ. දැන් බලන්න, "මොකක්ද තිබෙන ප්‍රශ්නය?" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය 26 වැනිදා විදේශ කටයුතු අමාත්‍යාංශයේදී විදේශ ජනමාධ්‍යවේදීන් එක්ක සාකච්ඡාවක් තිබුණා. ඒකේදී ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් ඇමතිතුමා මෙන්න මෙහෙම කතාවක් කියා තිබෙනවා:

"අපි පැහැදිලි තීරණයක් ගත්තා, ප්‍රතිඵලය කුමක් වුවත් අපි මෙයට අවනත වන්නේ නැහැ කියා. අපේ රට සම්බන්ධයෙන් ගෙන එනු ලබන කිසිම යෝජනාවකට අපි එකඟ වන්නේ නැහැ. අපේ එකඟත්වය කිසි සේත් නැහැ. අලුත් දෙයක් අපි කරන්නේ නැහැ. කිරීමට අවශ්‍යතාවකුත් නැහැ."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද එතුමා කළේත් ඒ ප්‍රකාශයම තමයි. දැන් ඊයේ - [බාධා කිරීමක්] ඔව්. කමක් නැහැ, එතුමා විදේශ කටයුතු ඇමතිතුමා විධියට ඒ ප්‍රකාශය කෙරුවාය කියමුකෝ. නමුත් ඊයේ ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහත්තයා මොකක්ද කිව්වේ? එතුමා මෙහෙම කියා තිබෙනවා:

"ඒක පුද්ගලිකව එතුමාගේ ස්ථාවරය. ඒක කිව්වා මම අහගෙන හිටියා. නමුත් මේවා සේරම සාකච්ඡා කරලා රජයේ ප්‍රතිපත්තියක් හැටියට කියන්න එපායැ කිසියම් ක්‍රියාදාමයක්. එතුමා ප්‍රකාශයක් කළාට රජය නිල ප්‍රකාශයක් කළේ නැහැනේ. රජයක් හැටියට නිල ප්‍රකාශයක් කරන්න එපායැ? හැම ඇමතිවරයාම කරන ප්‍රකාශ රජයේ නිල ප්‍රකාශ නොවෙයිනේ."

ඊළඟට මාධ්‍යවේදියෙක් අහනවා,"රජයේ නිල ප්‍රකාශන කරන්නේ කවුද?"කියලා. එතකොට එතුමා මෙහෙම කියනවා:

"කැබිනට් එකේ සාකච්ඡා කරලා ස්ථාවරය මොකක්ද කියලා කියන්න ඕනෑ. තවම එහෙම නැහැ. මම කොහොමද කියන්නේ? මට කියන්න පුළුවන් එකම දේ මේක ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් පිළිබඳව කැබිනට් එක අවසන් තීන්දුවක් අරගෙන නැහැ කියන එකයි. නිල ප්‍රකාශයක් රජය කරයි ඉදිරියේදී කවදා හරි. ඒ ඒ ඇමතිවරුන්ගේ ප්‍රකාශ ගැන ඒ ඒ අයගෙන් අහනවා ඇරෙන්න මට උත්තරයක් දෙන්න බැහැ."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුද මේ කියන්නේ? ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. කවුද මේ රජය වෙනුවෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය පිළිබඳව කථා කරන්නේ? දැන් මා අහනවා, "ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමාගේ ප්‍රකාශය රජයේ ප්‍රකාශයක් නොවේද?" කියා. එහෙනම් කොහොමද ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහත්තයා ගිහිල්ලා මේ වාගේ කථා කියන්නේ? දැන් මෙතැනට ඇවිල්ලා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රකාශයි, අර ප්‍රකාශයි, මේ ප්‍රකාශයි, කෑ ගහපු ඒවායි ගැන කතා කර කර ඉන්නවා. මේ රටේ ඉතාමත් බැරෑරුම් තත්ත්වයක් ඇති වෙලා තිබෙන වෙලාවක් මේ. ඒ වාගේ වෙලාවක මේ ප්‍රකාශය කරපුවාම මේ ප්‍රකාශය වැරදියි කියලා ආණ්ඩුවේ කැබිනට් ප්‍රකාශක කියනවා නම් මා අහනවා, "ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමා විදේශ කටයුතු ඇමතිතුමා විධියට කොහේද ඉන්නේ?" කියලා. එතුමාගේ ප්‍රකාශය ගණන් ගන්නේ නැද්ද තමුන්නාන්සේලා? එහෙනම් එතුමා නොවෙයිද මේ ජිනීවා සාකච්ඡාවලට ගිහිල්ලා කතා කළේ? ඡන්ද 04ක් විතර ලැබෙන්න තිබුණු එක අඩුම තරමින් 15කට වැඩි කර ගත්තේත් එතුමා අප්‍රිකාවේ එහෙම ගිහිල්ලා ඒ අයට කතා කරලායි. දැන් ඒවා කතා කරන්නේ නැහැ. ලංකාවේ විදේශ මාධ්‍යවේදීන් එක්ක කතා කරනවා වෙන එකක්. ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහත්තයා ඊයේ කියනවා තව එකක්.

එතකොට ඔබතුමන්ලා අතරයි ප්‍රශ්නය තිබෙන්නේ, අපේ නොවෙයි. අපි අහන්න කැමැතියි, "හරි ප්‍රකාශය කරන්නේ කවුද?" කියලා. ඇත්තටම මේක කැබිනට් එකේ කතා කෙරුවේ නැද්ද තමුන්නාන්සේලා? ඇත්ත වශයෙන්ම ආණ්ඩුවේ ප්‍රකාශයක් තවම කළේ නැද්ද? ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමාගේ මතය ආණ්ඩුවේ මතය නොවෙයිද? ඒක වෙන කාගේ හරි මතයක්ද? ඒකට උත්තර දෙන්න. ඉතින් මේ ප්‍රශ්න ආණ්ඩුව ඇතුළේ තියා ගෙන කොහේද තමුන්නාන්සේලා මේ යන්නේ? "කොහේද යන්නේ, මල්ලේ පොල්" උත්තර මේ තියෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් විධියට මේ තත්ත්වය ඉතාම බැරෑරුම්. ඒකයි ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාත් කිව්වේ. මේ රට විධියට අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. තමුන්නාන්සේලා, තමුන්නාන්සේලාගේ එක එක agendasවලට දුවනවා. එක එක ඇමතිවරු එක එක කතා කියනවා. හැබැයි රටක් විධියට අපි මේකට මුහුණ දෙන්න ඕනෑ. මා අහනවා, "රජයේ මතය මොකක්ද?" කියලා. ගරු ජී.එල්. පීරිස් මැතිතුමාගේ මතය රජයේ මතය නොවෙයිද? එහෙනම් වෙන මතයක් රජයට තිබෙනවාද? තිබෙනවා නම් ඒ මතය කවුද කියන්නේ? කරුණාකර ඒක මේ රටට හෙළි කරන්න; විදේශ රටවල්වලට කියන්න. එච්චරයි අපි ඉල්ලන්නේ. මේක ඇතුළේ තිබෙන කුණාටු, ඇතුළේ තිබෙන ප්‍රශ්න, ඇමතිවරුන් අතර තිබෙන හැලහැප්පිලි, සණ්ඩුසරුවල්, එක එක විදේශ අමාත්‍යාංශවල නිලධාරින් එක්ක තිබෙන ප්‍රශ්න, එක එක තානාපතිවරුන් සමඟ තිබෙන ප්‍රශ්න අපට අදාළ නැහැ. අපට අදාළ රටේ ප්‍රශ්න. අපි රට විධියට කොහොමද මේ තත්ත්වයට මුහුණ දෙන්නේ? ඒක පැරදිලා මෙහාට ආපුවාම කියනවා රනිල් වික්‍රමසිංහ මහත්තයා යාපනයේ ගිහිල්ලා කරපු ප්‍රකාශය හින්දාලු පැරදිලා තියෙන්නේ කියලා. ඉතින් මා අහනවා, "කොහෙන්ද තමුන්නාන්සේලා මේ කාරණා හොයා ගන්නේ?" කියලා.

මම විශේෂයෙන් ඉල්ලනවා, කරුණාකර කවුරු හෝ ඉන්න ඇමතිවරයකු -මා හිතන විධියට ගරු ජී.එල්. පීරිස් මැතිතුමා අසරණ වෙච් මේවාට උත්තර දෙන්න ගියාම- රජයේ මතය මොකක්ද කියලා මේ විවාදය ඉවර වෙන්න කලින් කියන්නය කියලා. මොකද, ජිනීවා ගැන ඊළඟට කතා කරන්න කලින් අද අපි දැන ගන්න ඕනෑ, ඒ සම්මත කරපු යෝජනාව සම්බන්ධයෙන් ආණ්ඩුවේ මතය මොකක්ද කියලා. ඉතින් ඒක ගරු ජී.එල්. පීරිස් මැතිතුමාගේ මතය නොවේ නම්, තව කවුරු හරි මතයක් ඉදිරිපත් කරන්න ඉන්නවා නම් කරුණාකර ඒක කියන්න. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඉන්නවා. එතුමාට ඕනෑ නම් තව ප්‍රකාශයක් කරන්න පුළුවන්. එතුමා හෙමිහිට එහාට මෙහාට යනවා. මම කියන්නේ ඔබතුමා ඇවිල්ලාවත් ප්‍රකාශයක් කරන්න කියලායි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම යන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

යන්නේ නැහැ, ඉන්නවා නේ. එහෙම නම් ඇවිල්ලා ආණ්ඩුවේ ස්ථාවරය මොකක්ද කියලා ප්‍රකාශයක් කරන්න. මම කියන්න කැමැතියි, මේ කරන වැඩ කටයුතු ටික - මම ඒක වැඩිපුර අදින්න හොඳ නැහැ. ආණ්ඩුවේ අර්බුදය තව මෝරන්න ඉඩ දෙන්න ඕනෑ. [බාධා කිරීම්] අපේ බන්දුල ගුණවර්ධන මහත්තයා- [බාධා කිරීමක්] ආඩි හත් දෙනාගේ කැඳ හැළිය තව හොඳට හැඳිගාන්න. එතකොට අපට හොඳයි. ඒකයි මම කියන්නේ. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි. රටේ ප්‍රශ්න පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. තමුන්නාන්සේලාගේ කැඳ හැළිය තමුන්නාන්සේලාට ඕනෑ විධියට හදා ගන්න. [බාධා කිරීමක්] කඩා වැටෙන කොට ආණ්ඩුවේ ඉන්න එක එක අය, එක එක කථා කියනවා.

රුපියල් 7,500කින් තුන් දෙනකුට මාසයක් ජීවත් වන්න පුළුවන් කියලා බන්දුල ගුණවර්ධන මහත්තයා කියනවා. බන්දුල ගුණවර්ධන මහත්තයා කියන්නේ ආර්ථික විද්‍යාව පිළිබඳව දන්නා කෙනෙක්. ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂඥයෙක්. අපිත් එතුමාගෙන් ඉගෙන ගෙන තිබෙනවා. ඒකයි මට ලජ්ජා. මම "ඒ ලෙවල්" විභාගය කරන කාලයේ එතුමාගෙන් ආර්ථික විද්‍යාව ඉගෙන ගත්තා. [බාධා කිරීම්] හොඳට උගන්වලා තිබෙනවා. මට උගන්වපු ඒ පාඩමේ මේ ප්‍රශ්න තිබුණේ නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය. ඒ පාඩමේ මෙහෙම කියලා දුන්නේ නැහැ. එතුමා ආවස්ථික පිරිවැය දමලා, ඒකෙන් වැඩි වන්නේ කොහොමද, අඩු වන්නේ කොහොමද, ඉල්ලුම, සැපයුම සිදු වන්නේ කොහොමද කියන ඒවා ගැන කියා දුන්නා. නමුත් දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? දැන් එතුමා කියනවා, රුපියල් 7,500කින් තුන්දෙනකු සිටින පවුලකට මාසයක් ජීවත් වන්න පුළුවන් කියලා. මම කියනවා ඒකට "ඔව්" කියලා. ඒ කාලයේ ග්‍රීසියේ හිටියා ඩයෝජිනිස් කියලා පුද්ගලයෙක්. [බාධා කිරීමක්] එයා හිටියේ වස්ත්‍ර අඳින්නේ නැතිව පීප්පයක් ඇතුළේ. ඒ පීප්පය ඇතුළට හෝ එළියට වැටෙන දෙයක් අහුලා ගෙන කෑවා. උයාගෙන කෑවෙත් නැහැ, එළියට ගියෙත් නැහැ, පීප්පය ඇතුළේ තමයි ජීවත් වුණේ. දැන් කාලයේ හිටියා නම් ඒ මිනිහාට පුළුවන් පීප්පයක් ඇතුළට වෙලා, එහෙන් මෙහෙන් වැටෙන කොළ කෑලි ටිකක් කමින් රුපියල් 2500කින් ජීවත් වන්න. එතකොට රුපියල් 2,500ක් යන්නේ නැහැ. රුපියල්2,500ක් ඇතුළට දුන්නාම කීයක් හරි ඉතිරි කරන්නත් පුළුවන්. [බාධා කිරීමක්] නැහැ, ඒ පීප්පය ඇතුළට වෙලා ඉන්න පුළුවන්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මම අහන්න කැමැතියි, මේ අය කථා කරන්නේ පීප්ප ඇතුළේ ඉඳ ගෙනද කියලා. එතැනට වැටෙන්න එපා කියලා මම බොහොම කරුණාවෙන් කියනවා.

මට තව එක කාරණයක් කියන්න තිබෙනවා. අද ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පතේ ඔබතුමන්ලා දමලා තිබෙනවා 2011 අප්‍රේල් මස 11වන දිනෙන් ආරම්භ වන්නා වූ වසර 10ක කාල පරිච්ඡේදයක් තුළ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහාම දැවැන්ත ආදායම් බදු නිදහස් කිරීමක් කරන බව. සීමාසහිත ශ්‍රීලන්කන් ගුවන් සමාගම, සීමාසහිත මිහින් ලංකා පුද්ගලික සමාගම කියන මේ ආයතන මේ රටට දැවැන්ත බරක් වෙලා තිබෙන ආයතන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් වෙලා තිබෙන්නේ මොකක්ද කියලා බලන්න. ඒ බර කොච්චරද කියලා කියනවා නම් -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය අවසන් වී ගෙනයි එන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

තව එක විනාඩියක් මට දෙන්න. බලන්න දැන් මේ SriLankan Airlines ගුවන් සේවයට අයත් කටුනායක ගුවන් යානා නඩත්තු අංගනයේ hangar එකක නවත්වලා තිබෙනවා "සී"පරීක්ෂණය සඳහා ගෙන්වන ලද 4R-ADF ලියා පදිංචිය ඇති "ඒ 340 -300" ගුවන් යානය. 2012 ජනවාරි මාසයේ 18වැනි දා ඉඳලා මේ වන තුරු තවම මේ ගුවන් යානය hangar එක අස්සේ තියා ගෙන ඉන්නවා. දැන් මෙම ගරු සභාව තුළ සිවිල් ගුවන් සේවා ඇමතිතුමා නැහැ. වරාය හා මහාමාර්ග නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. දැන් මාස දෙකක් තිස්සේ මේ ගුවන් යානය තියා ගෙන ඉන්නවා. රුපියල් කෝටි දෙකකට වඩා පාඩුයි. "සී" පරීක්ෂණය සඳහා ගෙන්වන ලද ගුවන් යානය මේ hangar එක අස්සේ තියා ගෙන ඉන්නවා. තමුන්නාන්සේලා අපේ රටේ මිනිස්සුන්ගේ සල්ලි කෝටි ගණන් ණය වෙලා jumbo jets ගෙනැල්ලා තිබෙනවා. ඒවායේ seats දික් කරන්නත් බැහැ. මම මේ ළඟදි SriLankan Airlines ගුවන් යානයක ගියා. ඒක පහත් කර ගන්න බැහැ. කෑලි නැහැ. කෑලි නැති ඒවා තමයි තමුන්නාන්සේලා ගෙනැල්ලා තිබෙන්නේ. මේවා ගෙනැල්ලා පාඩු ලබන කොට තමයි තේරෙන්නේ. රටේ ජනතාවගේ මේ සල්ලි ආපහු එකතු කර ගන්නේ කොහෙන්ද කියලා මම අහනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු විපක්ෂයේ සංවිධායකතුමා ඔබතුමාට දී තිබෙන වෙලාව කෙටි කරලායි තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ නිසා කරුණාකර එයට පිළිතුරු දෙන්න කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට ගරු රෝහිත අබේගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා.

[පූ. භා. 11.58]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ කථාව ආරම්භ කළේ ගරු ටී.බී. ඒකනායක ඇමතිතුමාගේ කථාවට පිළිතුරක් ලබා දෙමිනුයි.

එතුමා බොහොම පාරිශුද්ධ විධියට කිව්වා, "ටී.බී. ඒකනායක ඇමතිතුමා, එතුමාට ලැබුණු වෙලාවෙන්, අන්තිම මොහොතේ තමයි එතුමා මාතෘකාවට අවතීර්ණ වුණේ" කියලා. එහෙම කිව්ව දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා බොහොම හොඳට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පැටිකිරිය, ඒ වාගේම-

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉතින් උත්තර දීලා ඉන්න. [බාධා කිරීමක්]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඔන්න ඉතින් අහ ගන්න හදනවා. ඉන්නකෝ, මෙතුමාට පිළිතුරු දීලා ඔබතුමාට දෙන්නම්. ඉන්න. [බාධා කිරීමක්] මොකක්ද? මට පේන්නේ මෙතුමාත් දැන් ඉන්නේ සරම ඇඳලා ඔළුවෙන් හිටගෙනද කොහේද. මම UNP එකේලු. [බාධා කිරීමක්] මෙතුමාත් ජාතික ඇඳුම ඇඳලා දැන් ඉන්නේ ඔළුවෙන් හිටගෙන. මගේ දේශපාලන ඉතිහාසයේ කවදාවත් එක්සත් ජාතික පක්ෂයත් එක්ක කිසිම ගනුදෙනුවක් තිබිලා නැහැ. ඒක බොහොම -[බාධා කිරීමක්] තමුන්නාන්සේ ජයන්ත අබේගුණවර්ධන මහත්මයාව බේරා ගන්න, තමුන්නාන්සේ දන්නේ නැති ඒවා කථා කරන්නේ නැතිව. තමුන්නාන්සේට පක්ෂය මාරු කිරීමේ ප්‍රතිපත්තිය තිබුණාට ඒක අනුන්ට ආරූඪ කරන්න යන්නේ නැතිව දැන් බොහොම පැහැදිලිව මේක අහගන්න. මම උත්තර ටික දෙන්න යන්නේ.

දැන් බලන්න, "Mrs. Jayasekara"ට ඉන්න බැරි හැටි. Mr. Jayasekara නොවෙයි Mrs. Jayasekara. තමන් කථාව කරලා තමන්ට පිළිතුරු ටික ලැබෙන කොට ඒක අහගෙන ඉන්න පුරුදු වෙන්න. අද බදු සංශෝධන පනත් කෙටුම්පත් ගැන කථා කරන එක පැත්තක තියලා එතුමා කථාව පටන් ගත්තේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් අර්බුද තිබුණා කියලායි. 1994 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ චන්ද්‍රිකා මැතිනිය, මහින්ද රාජපක්ෂ අපේ ජනාධිපතිතුමා එක්ක අර්බුද තිබුණා කියලා තමයි එතුමා කථාව පටන් ගත්තේ.

එතුමාට අමතක වෙලා තිබෙනවා එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ශක්තියක් දුන්න ගරු ජී.එල්. පීරිස් ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා වෙලා හිටපු බව. ඒක එතුමාට අමතක වෙලා. මෙතුමා අහසින් වැටිලා තිබෙන්නේ. සියලු දේ දත්, සියල්ලම කරන්න පුළුවන් එක්සත් ජාතික පක්ෂයට මහා මෙරක් වාගේ කෙනෙක් විධියට තමයි මෙතුමාව හදලා තිබෙන්නේ. එහෙම තමයි මේ සම්පූර්ණ කථාව ගොතා ගෙන ඇවිල්ලා කියා ගෙන යන්නේ. ජී.එල්. පීරිස් ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම් හැටියට කටයුතු කරපු එක එතුමාට දැන් මතක නැහැ. කළගුණ කියන දෙයක් ඔළුවටවත් දැනෙන්නේ නැහැ. [බාධා කිරීම්] ඒ කෘතවේදීභාවය එක දවසකවත් දැකලා නැහැ. මට මතකයි, එතුමා ඉතිහාසය කිව්වා. මෙතුමාගේ තව මිත්‍රයෙක් හිටියා රවි ජයවර්ධන කියලා.

එතුමාත් ජී.එල්. පීරිස් ඇමතිතුමා ළඟ හිටපු තවත් සම්බන්ධීකරණ ලේකම්වරයෙක්. ඒ කාලයේ අප ජී.එල්. පීරිස් ඇමතිතුමා හම්බ වෙන්න යන කොට අප දකිනවා දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා තමන්ගේ ගුරුන්නාන්සේට බොහොම බැගෑපත්ව, එතුමාගේ අර බෑග් එකත් අර ගෙන පිටිපස්සෙන් යන ආකාරය. එහෙම තමයි වන්න ඕනෑ. එහෙම හොඳයි. තමන්ගේ නායකයාට එහෙම සලකන්න ඕනෑ. හැබැයි තමන්ගේ ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. නායකයා කොයි පැත්තට ගියත්, මොන තත්ත්වයක් ඇති වුණත් තමන්ගේ මනුස්සකමක් තිබෙන්න ඕනෑ. අඩු ගණනේ, "අනේ! මට මේ දේශපාලන ගමන් මහට එන්න, එයට අවතීර්ණ වන්න මට සහයෝගය දුන්න නායකයාට ද මම මේ කථා කරන්නේ" කියලා හිතන්න ඕනෑ. [බාධා කිරීමක්] එහෙම කෘතවේදීකමක් තිබේ නම් මෙතුමා රනිල් වික්‍රමසිංහ මහත්මයාට මෙහෙම කරනවාද? නැහැ, මෙතුමන්ලා හැම තිස්සේම පුරුදු වෙලා තිබෙන්නේ එක දෙයකටයි. අර දැළි පිහි නැකතින් ඉපදිච්ච මන්ත්‍රීවරු මේ. මොකක්ද හේතුව? කපා ගෙනම තමයි යන්න හදන්නේ. කොයි වෙලාවේත් හිතන්නේ, කොහේද කපා ගෙන යන්න තිබෙන්නේ, ඒ වෙලාවට අම්මා තාත්තාගේ හරි බෙල්ල කපා ගෙන මම රජ වෙනවා කියන එකයි. "Match එක පැරදිච්ච දෙන්, මම century එක ගහන්න ඕනෑ" කියන අදහස තමයි තිබෙන්නේ. දැන් UNP එකේ match එක පරාදයි. හැබැයි දයාසිරි ජයසේකර century එකක් ගහපු බව පෙන්වන්න ඕනෑ. "UNP එකට හෙණ ගැහුවත් කමක් නැහැ, මම century එකක් ගහන්න ඕනෑ" කියලා තමයි මෙතුමා හිතන්නේ. එහෙම දේශපාලන චරිත තමයි අද මෙතැනට ඇවිල්ලා අපට මේ වැදි බණ කියන්නේ.

දැන් ඒ අස්සේ කියනවා, දිනන්න කිට්ටු වෙන කොට එහෙම වෙනවා ලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක ඔබතුමාටත් ඇහෙන්න ඇති නේ. දැන් සිද්ධ වෙලා තිබෙන්නේ මේකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසය දිහා බැලුවාට පස්සේ, මේ ගරු සභාව ඇතුළේ නොයෙකුත් දේවල් අපට කථා කරන්න පුළුවන්.

අපට නොයෙක් විවේචන කරන්න පුළුවන්. මේ ගෙනෙන පනත් කෙටුම්පත් ගැන අපට නොයෙකුත් අර්ථකථන දෙන්න පුළුවන්. මොන අර්ථකථනය දුන්නත් අවසානයේදී, මේ රටේ ජීවත් වන ජනතාවගේ හද ගැස්ම, ඒ ජනතාව අපට ආදරය කරන්නේ කෙසේද කියලා බලන මිනුම් දණ්ඩ තමයි මැතිවරණය. අපි මොනවා කථා කළත්, රට පාලනය කරන්න නොයෙකුත් ක්‍රමවේද භාවිත කළත්, අවසානයේදී අපි මැතිවරණයකට යන්න ඕනෑ. අපි මැතිවරණයකට ගිහින් ජනතාවගෙන් අහනවා, අපට ඔබේ කැමැත්ත ප්‍රකාශ කරනවාද නැද්ද කියලා. ඒක ජනාධිපතිවරණයක් වන්න පුළුවන්. ඒක පාර්ලිමේන්තු මැතිවරණයක් වන්න පුළුවන්. එහෙම නැත්නම් පළාත් සභා මැතිවරණයක් වන්න පුළුවන්. එහෙමත් නැත්නම් ප්‍රාදේශීය සභා මැතිවරණයක් වන්න පුළුවන්. ඒ මොන මැතිවරණයක් තිබ්බත් ඒ මැතිවරණයෙන් ලැබෙන ප්‍රතිඵලය දිහා බලලා තමයි අපට කියන්න පුළුවන් වන්නේ, ආණ්ඩුවක් හැටියට අපි ජනතාවගේ සිතුම් පැතුම් හරියාකාරව වටහාගෙන ඒ අනුව කටයුතු කළාද නැද්ද කියන එක.

ඉතිහාසය පුරාවට කැලි කැඩුණු පක්ෂයේ ඉන්න වික්‍රමසිංහ මහත්මයා ඇතුළු එක එක පාර්ශ්ව නොයෙකුත් කථා කිව්වත්, ඒ හැම මැතිවරණයකදීම මේ රටේ ජනතාව බොහොම පැහැදිලි ස්ථාවරයක සිටිමින් ඔප්පු කර පෙන්නුවා, "මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවත් එක්ක තමයි අපි ජීවත් වන්නේ" කියලා. අපේ ආණ්ඩුව මේ රටේ ජනතාව වෙනුවෙන් යමක් ඉටු කළාය කියන එක බොහොම පැහැදිලිව ඔවුන් පෙන්නුම් කරලා දුන්නා. යුද්ධය පැවැති අවස්ථාවේදී ජනතාව ජීවත් වුණේ ආණ්ඩුවත් එක්ක. ජනතාව කිව්වා යුද්ධ කරන්න, ත්‍රස්තවාදය මේ රටින් ඉවත් කරන්න, ත්‍රස්තවාදය නැති කරලා නිදහසේ ජීවත් වීමේ අයිතිය දෙන්න කියලා. ඒ වෙනුවෙන් ජනතාව කැප වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මීට ඉස්සෙල්ලා කථා කරපු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා මොනවාද කිව්වේ? එතුමාත් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා වාගේ අපේ පැත්තේ ඉඳලා ගිය එක්කෙනෙක්. ඒ ගොඩක් උදවිය මේ පැත්තේ ඉඳලා විරුද්ධ පාර්ශ්වයට ගිය උදවිය; අනාථ වුණු උදවිය. එහෙම ගිහිල්ලා හොඳක් වුණු උදවිය නොවෙයි, අනාථ වුණු උදවිය. [බාධා කිරීමක්] දැන් එල්ලෙන්න වැල් නැති උදවිය. [බාධා කිරීමක්] දැන් වැල් හොයා ගන්න වෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්] ඔය කෑ ගහන්නේ වේදනාවට. [බාධා කිරීමක්] ඔය

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

පපුවේ වේදනාව. ඕකට තමයි සැබෑ වේදනාව කියන්නේ. දරා ගන්න බැරි වේදනාවකින් ජීවත් වන්නේ. ඉතින් මොනවා කරන්නද? බලන්න වේදනාවේ හඬ කොච්චර ලස්සනට එනවාද කියලා. මම ඒක නේ කිව්වේ. [බාධා කිරීමක්] Mr., Mrs.වෙන්න පුළුවන්. පොඩි වෙලාවයි ඒකට යන්නේ. සමහර වෙලාවට Mr. Jayasekara, Mrs. Jayasekara වෙන්න පුළුවන්. ඒ වාගේ තත්ත්වයකට පරිවර්තනය වන්න පුළුවන්. ඒකට වැඩි වෙලාවක් යන්නේ නැහැ.

මොකක්ද ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය? ජිනීවා මානව හිමිකම් කවුන්සිලය හරහා ඇමෙරිකාව අපට විරුද්ධව ගෙනාපු යෝජනාවෙන් අපි පරාජය වීම ගැන ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කථා කරන විලාසය දිහා ඔබතුමා බලන්න. ඔබතුමා නැවත වතාවක් ඒ කථාව රූගත කරපු CD තැටිය අරගෙන බලන්න. "අපි පැරදුණා. අපි ඡන්ද 15ක් ලබා ගත්තා, යෝජනාව ගෙනාපු අය ඡන්ද 24ක් ලබා ගත්තා" කියලා කියන කොට මුහුණේ තිබෙන කාලකණ්ණි සතුට බලන්න. කොච්චර ලස්සන කාලකණ්ණි සතුටක් ලබනවාද කියලා බලන්න. ඒකට මොකක්ද හේතුව?

මහ ජනතාවගේ ආශිර්වාදයෙන් කවදාවත් එක්සත් ජාතික පක්ෂයට මේ රටේ බලයට එන්න හැකියාවක් නැහැ. එහෙම බලයට එන්න හැකියාවක් නැහැ. ඒකට සුදුසු නායකයෙක් පෙනෙන මානයකවත් නැහැ. කොන්ද පණ තියෙන නායකයෙකුත් නැහැ. කොන්ද පණ තිබෙනවාය කියලා හිතන්න පුළුවන් නායකයෙකුත් නැහැ. අනාගතයේදී මේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන් දරු සම්පත් බිහි කරන්න පුළුවන් නායකයොත් නැහැ. එහෙම නායකයෝ ඉන්න මේ පක්ෂයට අනාගතයේ කිසි දවස මේ රට පාලනය කරන්න බැහැ කියලා පෙනෙන කොට, ඇමෙරිකාවේ පිහිටෙන් හරි කමක් නැහැ එක දවසකට හෝ රජ වෙන්න පුළුවන්කමක් තිබෙනවා නම්, ඒ වෙනුවෙන් මේ ගොල්ලෝ දොළ පිදේනි දෙන්නේ නැද්ද? දෙනවා.

ඊයේ-පෙරේදා වික්‍රමසිංහ මහත්තයා කිව්වා, "මේ ආණ්ඩුව පෙරළන්න මේ රටේ සියලු ජාතීන්ට ඒක රාශි වෙන්න කියලා මම අඬ ගහනවා" කියලා. නමුත් ඒ අඬ ගැහුවේ අපේ රටේ අයට නොවෙයි. එහෙනම් කාටද? ඇමෙරිකන් ජාතිකයන්ට; එංගලන්ත ජාතිකයන්ට; ජර්මන් ජාතිකයන්ට. මෙන්න මේ වාගේ ජාතිකයන්ටයි ඒ අඬ ගහන්නේ. ඇයි ඒ? වික්‍රමසිංහ මහත්තයා මේ රටේ ආණ්ඩුව පෙරළන්න මේ රටේ සිංහල ජාතියට අඬ ගැහුවොත් ඒ ගොල්ලෝ කියනවා, "අනේ අපෝ! ඔයාත් එක්ක බැහැ" කියලා. එතකොට ප්‍රේමදාස මහත්මයාගේ පුත්‍ර රත්නය අඬ ගැහුවොත් කියනවා,"අනේ ඔයාත් ඒ ජාතියේමයි" කියලා. මේ ඔක්කෝම එක model එකේ බඩු. ඒ නිසා මේ ගොල්ලන්ට දැන් ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තියෙනවා, මේ ආණ්ඩුව යුද්ධය අවසන් කරලා, ඒ වාගේම රටේ වැඩ කටයුතු සාර්ථකව කරගෙන ගිහිල්ලා රට සංවර්ධන මාවතක යන්න හදන කොට, ඒක නවත්වා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඒ අයට තියෙනවාද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයේ මේ මන්ත්‍රීතුමන්ලාට නොයෙකුත් හීන ඇති. නමුත් ඒ හීන කවදාවත් සැබෑ කර ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙන්නේ නැහැ. ඒ හීන හැම දාම හීන හැටියට තමයි එක්සත් ජාතික පක්ෂය ඇතුළේ තියෙන්නේ කියන එක අපි බොහොම පැහැදිලිව මතක් කරන්න ඕනෑ.

ඔන්න දැන් තමයි දයාසිරි මන්ත්‍රීතුමාට වාගේ මටත් මතක් වුණේ අදාළ මාතෘකාවට එන්න. සාමාන්‍යයෙන් එකට ඉන්න කොට පුරුද්ද එනවා නේ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් අදාළ මාතෘකාවට ආවේ කථාවේ අන්තිමට. ඒ නිසා මටත් කථාවේ අන්තිමේදී මාතෘකාවට එන්න සිද්ධ වුණා. [බාධා කිරීමක්] පොඩ්ඩක් නිහඬ වෙච්ච නිසා මාතෘකාවට එන්න හිතුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බදු පනත් කෙටුම්පත් ගැන කථා කරන කොට දැන් කිව්වා,- [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, කාලය සීමිතයි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,- [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක් තියෙනවා. [බාධා කිරීම්]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඔබතුමාද මූලාසනයේ ඉන්නේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාද මූලාසනයේ ඉන්නේ කියන ප්‍රශ්නය තමයි මට තිබෙන්නේ. [බාධා කිරීම්] හරි හරි. ආපසු මම මාතෘකාවට යනවා.[බාධා කිරීම්] සාමාන්‍යයෙන් වෙලාව ඉවර වෙච්ච අය තමයි වැඩි පුර කෑ ගහන්නේ. ඇයි හේතුව? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම පැහැදිලිව මේ කාරණය මතක තියා ගන්න. දැන් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ වෙලාව ඉවරයි. මොකද හේතුව? රනිල් වික්‍රමසිංහ කියන එක්සත් ජාතික පක්ෂයේ නායකයා -ඒ දේශපාලන නායකයා- එසේ මෙසේ නායකයෙක් නොවෙයි. [බාධා කිරීම්] දැන් කොහොමත් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ කාලය අහවරයි. ඒ කාලය අහවර වෙලා නිසා තමයි දැන් ඔය තියෙන ප්‍රශ්න ටිකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තියෙන්නේ. එක්සත් ජාතික පක්ෂයේ දැන් ඉතුරු වෙලා ඉන්න මේ මන්ත්‍රීතුමන්ලාට අපි බොහොම පැහැදිලිව කියනවා,- [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමා බාධා කරන්න එපා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
එතුමාට ඉවසා ගන්න බැරිකම. මොනවා කරන්නද ඉතින්? මොනවා කරන්නද දැන් කාලය අවසන් වුණාට පස්සේ? කවුද දන්නේ දැන් තියෙන මේ ප්‍රශ්නත් එක්ක එතුමාට රට සුදු කොඩි පෙනෙනවාද කියලා. කවුද දන්නේ ගොක් කොළ පෙනෙනවාද කියලා. මම දැකලා තියෙනවා නේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මෙතැනට ඇවිල්ලා වික්‍රමසිංහ මහත්තයා ළඟ බැගෑපත් වෙන හැටි. මොකටද ඔච්චර බැගෑපත් වෙන්නේ? තමන් නායකයාත් එක්ක රණ්ඩු වුණා නම් කොන්ද කෙළින් තියාගෙන ඉන්න ඕනෑ. එක පැත්තකින් රණ්ඩු වෙනවා. අනික් පැත්තෙන් ආපසු ඇවිල්ලා "අනේ සර්" කියලා දෙකට නැමෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉදිරිපත් කරලා තියෙන පනත් කෙටුම්පත්වලින් මේ රටේ ජීවත් වන සමස්ත ජනතාවට,

ව්‍යාපාරිකයන්ට යම් සේවාවක් ඉටු කර ගන්න පුළුවන් බව මම මතක් කරනවා.ඉවසීමක් නැති මන්ත්‍රීවරුන්ට ඉවසන්න පුරුදු කරන්නය කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.14]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතුවා, අද මට කලින් කථා කළ රෝහිත අබේගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් මොකක් හෝ දෙයක් කථා කරයි කියලා. කථා කරනවායි කියලා එතුමා කියපු නිසා මම අහගෙන සිටියා, ඒ සම්බන්ධයෙන් පිළිතුරක් දෙන්න අන්තිමට හෝ මොකක් හෝ දෙයක් කියයි කියලා. කිසිම දෙයක් කිව්වේ නැහැ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථාව කර ගෙන යන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මම කථාව කර ගෙන යන්නම්.

දැන් අපට කියන්නේ, 2012 අය වැයෙන් ගෙනා යෝජනා සම්මත කරන්න තමයි මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කර තිබෙන්නේ කියලායි. එහෙම නම් 2012 අය වැයේදී මොනවාද, මේ පනත් කෙටුම්පත් ගැන කිව්වේ? මම හිතන්නේ එතැනින් තමයි අපි පටන් ගන්න ඕනෑ. අපට කියලා තිබෙන්නේ ඒක නේ. ඒ සම්බන්ධයෙන් නේ අද මේ විවාදය පවත්වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමැතියි, 163 වන පනත් කෙටුම්පත -මුදල් පනත් කෙටුම්පත- පිළිබඳව කථා කරන්න. නොයෙක් දේවල් ආණ්ඩුවෙන් කරන්න ඕනෑයි කියලා කියනවා. මුදල් පනත් කෙටුම්පතේ IV වන කොටසට මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එහි සඳහන් වනවා, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත, (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත සහ 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත යන පනත්වල විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කිරීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ළඟ දැන් තිබෙනවා, 2012 අය වැය කථාව. මුදල් ඇමතිවරයා හැටියට අතිගරු ජනාධිපතිතුමා 2012 අය වැය කථාව මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒ අය වැය කථාවෙන් කියපු දේවල් සම්මත කර ගන්න තමයි එහෙම නම් මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 අය වැය කථාවේ තිබෙනවා, "කේන්ද්‍රස්ථාන සේවා (විශේෂ විධිවිධාන) පනත" කියලා පනතක් ඉදිරිපත් කරනවාය කියලා. නමුත් එහෙම පනතක් ඉදිරිපත් කරලා නැහැ. මම බැලුවා. මට දීලා තිබෙන මේ පනත් කෙටුම්පත් හයේ එහෙම පනත් කෙටුම්පතක් නැහැ. හැබැයි ඒ කරනවායි කියපු දේවල්වලට සමාන - යම්කිසි සමානාත්මකතාවක් තිබෙන- දේවල් මේ මුදල් පනත් කෙටුම්පතේ iv වන කොටසේ තිබෙනවා. ඉතින් මගේ කථාව පටන් ගන්න කලින්, මෙතැන තිබෙන පරස්පරය මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න මම කල්පනා කළා. මොකද, මම විශ්වාස කරනවා, අපට යමක් කරනවායි කියලා කිව්වා නම්, අපි ඒක සම්මත කළා නම්, දැන් කියනවා නම් ඒ දේ තමයි කරන්නේ කියලා, එහෙම නම් ඒ කරනවායි කිව්ව දේයි කරන දේයි එක දේ වෙන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "අය වැය කථාව 2012, සම්බන්ධිත ලේඛන සහ තාක්ෂණික සටහන්"වල 27 වන පිටුවේ "කේන්ද්‍රස්ථාන සේවා (විශේෂ විධිවිධාන) පනත" යන ශීර්ෂය යටතේ මෙසේ සඳහන් වනවා:

"20.1 රේගු ආඥා පනත, (ඒ යටතේ වන රෙගුලාසි ඇතුළුව) ආනයන අපනයන පාලන පනත, සහ විනිමය පාලන පනත, ආයෝජන මණ්ඩලය විසින් පහත සඳහන් කටයුතුවල නිරත සමාගම් ලෙස හඳුනාගත් ව්‍යවසායන් සම්බන්ධයෙන් අදාළ වීමෙන් නිදහස් කිරීම සඳහා වූ නව මුදල් පනතක් හඳුන්වා දෙනු ලැබේ."

දැන් මොකක්ද මෙයින් කියන්නේ? හොඳට අහ ගන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ යටතේ පළමුවැන්න මෙසේයි:

"ඇහලුම් ආශ්‍රිත ආනයනයන්, සරල සකස් කිරීම සහ ප්‍රතිඅපනයනය සම්බන්ධයෙන් වන අන්තරාල වෙළඳාම"

ඇහලුම් සඳහා මේ පනත් කෙටුම්පත ගෙනෙනවා කියලා තමයි මේ 2012 අය වැය කථාවෙන් කියන්නේ.

ඒ යටතේ දෙවැන්න මෙසේයි:

" ඇහලුම්, රෙදිපිළි, සම්පාදනය හෝ නිෂ්පාදනය එක් රටක සිදු වී, ශ්‍රී ලංකාවේ නාවික ක්‍රියාකාරකම්වලට ගෙන ඒමක් නොමැතිව තවත් රටකට අපනයනය කෙරෙන ඇහලුම්, රෙදිපිළි ප්‍රතිනැව්ගත කිරීමේ ව්‍යාපාරයක්."

මේ රේගු ආඥාපනතෙන්, ආනයන අපනයන පාලන පනතෙන්, විනිමය පාලන පනතෙන් ඒවා නිදහස් කරනවා කියලා තමයි අතිගරු ජනාධිපතිතුමා 2012 අය වැය කථාවේදී අපට කිව්වේ.

ඒ යටතේ තුන්වැන්න මෙසේයි:

"කලාපීය ඇහලුම් නිෂ්පාදකයින්ට පෙර නිමි සේවා සැපයීම"

ඒකට තමයි අපි ඡන්දය දුන්නේ? හැබැයි දැන් මොකක්ද, ගෙනැල්ලා තිබෙන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ඔබතුමා ඡන්දය දුන්නා? කාටද දුන්නේ?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

"අපි" කියලා කිව්වේ මේ ගරු සභාව. මම ඡන්දය දුන්නේ නැහැ. දැන් බලන්න, මේ මුදල් පනත් කෙටුම්පතේ මොකක්ද තිබෙන්නේ කියලා. මුදල් පනත් කෙටුම්පතේ 16.(1)(අ) උප වගන්තියේ සඳහන්ව තිබෙන්නේ, "ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රතිඅපනයනය සම්බන්ධ අන්තරාල වෙළඳාම" කියලායි. නමුත් 2012 අය වැය කථාවේ සඳහන්ව තිබෙන්නේ, "ඇහලුම් ආශ්‍රිත ආනයනයන්, සරල සකස් කිරීම සහ ප්‍රතිඅපනයනය සම්බන්ධයෙන් වන අන්තරාල වෙළඳාම" කියලායි. මුදල් පනත් කෙටුම්පතේ සඳහන්ව තිබෙන්නේ, "ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රතිඅපනයනය සම්බන්ධ අන්තරාල වෙළඳාම" කියලායි. කෝ ඇහලුම්? කෝ රෙදි පිළි? මෙතැන කිව්වේ, ඇහලුම් සම්බන්ධයෙන් අපට නිදහස් වරායක් - Free Port එකක්- ගෙනෙනවාය කියලායි. ඒකටයි ඡන්දය ගත්තේ. දැන් මොකක්ද කරන්නේ? ඇහලුම් එකත් පැත්තකට දමා වෙන වෙන දේවල්වලට තමයි මේ Free Port එක දැන් ගෙනෙන්න හදන්නේ.

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුද කියනවා මට ඇහුණා, මේ පිළිබඳව අපි ධනාත්මකව කථා කළේ නැහැ; විවේචනයක් විතරයි ඉදිරිපත් කළේ කියලා. මා මේ ඉදිරිපත් කරන විවේචනය සාධාරණ විවේචනයක් නොවෙයිද? අපට ඇහලුම්වලට Free Port එකක් දෙනවාය කියලා අනික් ඔක්කොම ඒක අස්සේ ඔබන එක හරිද? ඒකටද ඡන්දය ගත්තේ? මෙතැන සත්‍යය මොකක්ද? දැන් බලන්න. මේ මුදල් පනත් කෙටුම්පතේ ඇහලුම් පිළිබඳව කිසිම සඳහනක් නැහැ. මේක නංගි පෙන්වලා මුළු පවුලම පංගාර්තු කරන්න හදනවා වාගෙයි. ඉස්සෙල්ලා කිව්වා, නංගි පෙන්වලා අක්කා දෙනවාය කියලා. දැන් එහෙම නොවෙයි. නංගි පෙන්වලා නැන්දම්මායි, මාමයි, අක්කායි, මල්ලියි, බල්ලායි ඔක්කොම දෙන්නයි යන්නේ. [බාධා කිරීමක්] මොකක්ද මේකේ යටි අරමුණ?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඔයාගේද model එක?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මගේ එහෙම model එකක් නැහැ. මම නංගි බැලුවා නම් නංගිත් එක්කයි යන්නේ. [බාධා කිරීමක්] දැන් බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්] මේ ගොල්ලෝ ඉතින් මල්ලිලාත් එක්ක යන ඒවා ගැන, කළුතර පැත්තේ මල්ලිලාත් එක්ක යන ඒවා ගැන කථා කළා නම් අපට හෙට උදේ වන කල් මල්ලිලා ගැන කථා කරන්න පුළුවන්. අපි එතැනට යන්නේ නැහැ. අපි අද ඇවිල්ලා තිබෙන්නේ, -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගැලරියේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ඉන්නවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔව්. ඒක තමයි. ගැලරියේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ඉන්නවා. එම නිසා ඒ ගැන කථා කරන්න එපා.

ඇත්තටම මේකේ යටි අරමුණ මොකක්ද? මා පැහැදිලි කරන්නම්. ඇත්ත වශයෙන්ම මේ සඳහා නව මුදල් පනත් කෙටුම්පතක් ගෙනෙන්න අවශ්‍යතාවක් තිබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේකට වඩාත් යෝග්‍ය වුණේ රේගු ආඥාපනත, ආනයන සහ අපනයන පාලන පනත, විනිමය පාලන පනත කියන පනත් සංශෝධනය කිරීම තුළින් මේ අවශ්‍යයි කියන ආයතනවලට මේ බදු නිදහස්, විනිමය නිදහස් ලබා දීමයි. දැන් මෙතැන එහෙම වුණා නම් මා දන්නා විධියට පනත බලපවත්වනවා. යම් යම් ආයතන සඳහා නිදහසක් - exemption එකක්- ලැබෙනවා. ඒක නේ වෙන්නේ. එතකොට නියාමනයත් තිබෙනවා; රෙගුලාසියත් තිබෙනවා. ඒ නියාමනය, රෙගුලාසිය තුළ නොයෙකුත් නිදහස් කිරීම් වනවා. මෙතැන එහෙම දෙයක් නොවෙයි වන්නේ.

අපි හිතමු, අපි වැටක් ගහනවාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ගෙය වටේට වැටක් හෝ තාප්පයක් ගහලා තිබෙනවා. ඔය තාප්පය හෝ වැට හෝ ගහලා ගේට්ටුවක් දමනවා. ගේට්ටුව ඇරියාම ඔබතුමාට කැමැති පුද්ගලයන් ඇතුළට ගන්න පුළුවන්, අකැමැති පුද්ගලයන්ට එළියට යන්න පුළුවන්. දැන් ඔබතුමා හමු වන්න මා ආවාය කියමු. ඔබතුමා මාත් එක්ක මොකක් හෝ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමා security එකට කියනවා, ගේට්ටුව අරින්න එපාය කියලා. එතකොට මම එළියේ. මට ඇතුළට එන්න බැහැ. නමුත් මේ තාප්පය හෝ වැට ගැලෙව්වා නම් මට එන්න පුළුවන්. ඔබතුමා කැමැති වුණත්, අකැමැති වුණත් මට ඇවිල්ලා ඔබතුමාත් එක්ක සාකච්ඡාවක් ඕනෑය කියලා මොකක් හෝ මගේ ප්‍රශ්නයක් කියන්න පුළුවන්. ඒ වාගේ දෙයක් තමයි මෙතැන සිද්ධ වෙලා තිබෙන්නේ. මේ තාප්පය, මේ ගේට්ටුව, මේ වැට ඔක්කොම ගලවලා. අන්න එතැන තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ විවේචනය තිබෙන්නේ. අන්න ඒ ගැනයි මේ විවේචනය අපි සාධාරණව ඉදිරිපත් කරන්නේ. රේගුවට අදාළ කිසිම නීතියක්, ආනයනයට සහ අපනයනට අදාළ කිසිම නීතියක්, විනිමය පාලනයට අදාළ කිසිම නීතියක් මේ ආයතනවලට බලපාන්නේ නැහැ. මේක පුදුම කථාවක් නේ. කොහොමද මෙහෙම කරන්නේ?

BOI Act එක, එහෙම නැත්නම් GCEC Act එක යටතේ ඒ නීති, රෙගුලාසි, පනත් ඔවුන්ට බලපවතිනවා. බලපැවැත්වුවාට exemption එකක්, නිදහසක් ගන්නට පුළුවන්. ඔබතුමන්ලා සමහර අය දන්නවා ඇති, සමහර අය නොදන්නවා ඇති, "නව ලිබරල්වාදය, නව ලිබරල්වාදය" කිය කියා හැම තිස්සේම කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි නව ලිබරල් වාදය කියන්නේ, එහි උච්චතම තැන. නව ලිබරල්වාදය කියලා කියන්නේ, කිසිම නීතියක්, කිසිම රෙගුලාසියක් නැති එකයි. හත් දෙයියනේ! දැන් මෙතැන මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? නීති, රෙගුලාසි, ඔක්කොම ඉවත් කරලා. එහෙම නම් මීටත් වඩා නව ලිබරල්වාදයක් මම දන්නා ආර්ථික විද්‍යාවේ නැහැ. [බාධා කිරීමක්] මේක වැදගත් දෙයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට කලින් කථා කරපු ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා, ඇමතිතුමන්ලා දෙවන වර කියැවීම සඳහා අද මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් ගැන නොවෙයි කථා කළේ. වෙනත් වෙනත් දේවල් ගැනයි කථා කළේ. මේක වැදගත් දෙයක්. අපි කල්පනා කරලා බලන්නට ඕනෑ, මෙහෙම උච්චතම විධියට නව ලිබරල්වාදය ක්‍රියාත්මක කරනවා නම්, සියලුම නීති, සියලුම රෙගුලාසි අයින් කරනවා නම්, අපි පාලනයක් ඇති කර ගන්නේ කොහොමද කියලා. කිසිම පාලනයක් නැත්නම් ඕනෑම දෙයක් කර ගන්න පුළුවන් වෙනවා.

දැන් බලන්න, ආණ්ඩුවම නේ පළමුවෙන්ම මේ වැරැදි අඩිය තැබුවේ. ආණ්ඩුවම නේ අපිට කිව්වේ, මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්නේ ඇහලුම් සඳහායි කියලා. ආණ්ඩුවම නේ කිව්වේ. ඇහලුම්වලට මේ වැඩේ කරනවා කියලා ආණ්ඩුවම කියලා, ආණ්ඩුවම අද "ඇහලුම්" කියන එක අයින් කරලා, ඒ වෙනුවට "සියලුම" කියන වචනය යොදලා තිබෙනවා නේ. හරි, එහෙම නම් මොකක්ද මෙතැන කරන්නේ? මොකක්ද මෙතැන විය හැක්කේ? මම කියන්නේ නැහැ, ආණ්ඩුව මේ දේ බලාගෙනම මේ වැඩේ කරනවායි කියලා. හොර ජාවාරම්කරුවන්ට, කළු සල්ලි සුදු කරන මනුෂ්‍යයන්ට, කුඩු බිස්නස්කාරයන්ට, කැසිනෝකාරයන්ට මේ දේ කරනවා කියලා මම කියන්නේ නැහැ. නමුත් නීතියක් නැත්නම්, කිසිම විධියකට රෙගුලාසියක් නැත්නම් මේ හැමෝටම මේ දේ කරන්න පුළුවන් නේ. ලෝකයේ කොච්චර හොරු ඉන්නවාද? නීති දමලා තිබෙන්නේ, අර වැට ගහලා තිබෙන්නේ, ඒ මිනිසුන්ව වැටෙන් එහා පැත්තේ තබන්නයි.

අනෙක් කාරණය තමයි, මොන වරායේ ද මේ වැඩ කටයුත්ත කරන්න යන්නේ? ඔය කියන නිදහස් වරාය කොහොමද ස්ථාපනය කරන්නේ? වරාය නියෝජ්‍ය ඇමති ඒ ගැන වචනයක්වත් කථා කළේ නැහැ. එතුමා අද වරාය ගැන හොඳට කථා කළ නිසා, වරායේ අර ගල ගැන එහෙම හොඳින් කථා කළ නිසා, නිදහස් වරායක් ස්ථාපනය කරන්නේ කොහොමද කියලා

එතුමාගේ කථාවේ දී එතුමා මේ ගරු සභාව දැනුවත් කරයි කියලා අපි කල්පනා කළා. ඒ ගැන එතුමා කිසි දෙයක් කථා කළේ නැහැ. ඇත්ත වශයෙන්ම මා දන්නේ නැහැ, එතුමාවත් දන්නවාද කියලා කොහොමද මේ නිදහස් වරාය ස්ථාපනය කරන්නේ කියලා. වරාය අධිකාරියේ අධීක්ෂණයක් යටතේ කියලා කියනවා. මා මෙම වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බඳු පනත කියවලා බැලුවා. එහි කිසිම විධියකට නිදහස් වරායක් සම්බන්ධයෙන් ඔවුන්ට බලයක් නැහැ. ඉතින් කොහොමද මේක කරන්නේ?

අනෙක් කාරණය බලන්න, අපේ රජයට මේ වරායවල්වල කොච්චර අයිතියක් තිබෙනවාද? දැන් බලන්න, ඔබතුමා හොඳට දන්නවා, දකුණු කොළඹ වරාය පටන් ගන්නත් කලින් චීන රජයට සියයට 85ක් අයිති වන බව. කොළඹ දකුණු වරාය පර්යන්තය සියයට 85ක් චීනයට අයිතියි. අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමා මේ ළඟදී කියනවා මා අහගෙන සිටියා, දැන් මේ නොරොච්චෝලේ ප්‍රශ්න තිබෙන නිසා ඒ ප්‍රශ්න විසඳා ගන්නට අපි සමහරවිට චීන ආයතනවලටම මේ නොරොච්චෝලේ භාර දෙන්නට ඉඩ තිබෙනවා කියලා. එතුමා අහනවා, මොකක්ද ඒකේ වැරැද්ද කියලා. එහෙම නම් හම්බන්තොට වරායේත් මේ ප්‍රශ්න එක්ක මේ ණය ටික ගෙවා ගන්න බැරිවුණාම කාට හරි කියන්න පුළුවන්, "අපි මේ හම්බන්තොට වරායත් චීන ආයතනයකට භාර දෙමු" කියලා. ඉතින් එහෙම වුණාම කොහොමද මේ Free Port එක -

***[මේ අවස්ථාවේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සභා ගර්භයට පැමිණියේය]***

*[இச்சந்தர்ப்பத்தில் மேதகு சனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*

*[At this stage His Excellency President Mahinda Rajapaksa entered the Chamber.]*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member
මන්ත්‍රීතුමා, කථාව කර ගෙන යන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේ අවස්ථාවේ දී ගරු සභාවට පැමිණි අතිගරු ජනාධිපතිතුමාව මා ඉතාමත්ම සාදරයෙන් පිළිගන්නවා. ගරු ජනාධිපතිතුමනි, මා කියමින් සිටියේ මේ Free Port එක සම්බන්ධවයි. ඔබතුමා එදා මේ ගරු සභාවට ඉදිරිපත් කළ 2012 අය වැය ලේඛනයේ සම්බන්ධිත ලේඛන සහ තාක්ෂණික සටහන් යටතේ 27 වැනි පිටුවේ තිබෙනවා, මේ නිදහස් වරාය - Free Port එක - හඳුන්වා දෙන්නේ ඇඟලුම් ආශ්‍රිත ආනයන සහ අපනයන සඳහා කියලා.

ගරු ජනාධිපතිතුමනි, ඇඟලුම් සඳහා කියලා තමයි Budget එකෙන් මේ යෝජනාව ගෙනාවේ. දැන් මගේ තර්කය වෙන්නේ, ඇඟලුම්වලට කියලා ගෙනැල්ලා අද ඉදිරිපත් කරන පනත් කෙටුම්පතට සියලුම දේවල් අන්තර්ගත කරලා තිබීමයි. ඇඟලුම්වලට එහා ගිහිල්ලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමනි, එතැනදී අපේ විවේචනය වෙන්නේ, අපි අය වැයේදී මේ දේ සම්බන්ධයෙන් ඡන්දය දීලා නොවෙයි ඒක pass කර ගත්තේ කියන එකයි.

ගරු ජනාධිපතිතුමනි, මම කියමින් හිටියේ නව ලිබරල්වාදය ගැන. ඔබතුමාත් හැම වෙලාවේම නව ලිබරල්වාදය ගැන කථා කරනවා. පාර්ලිමේන්තුවේ අය වැය ඉදිරිපත් කරන දවසේත් නව ලිබරල්වාදයෙන් තමයි ඔබතුමා කථාව පටන් ගත්තේ. මට හොඳට මතකයි. ඔබතුමාගේ 2011 අය වැය කථාවේ, දෙවැනි පරිච්ඡේදයේ නව ලිබරල්වාදය ගැන මෙසේ තිබෙනවා:

"1977 පටන් අපේ රට විනාශකාරී මඟකට ඇද වැටුණා. එක් අතකින් නව ලිබරල්වාදී ප්‍රතිපත්තිවලටත් අනෙක් අතින් බෙදුම්වාදී ත්‍රස්තවාදයටත් මෙම ගමන් මඟ යට වුණා."

අතිගරු ජනාධිපතිතුමා එහෙම කියනවා. එතකොට මම විග්‍රහ කරමින් හිටියේ මෙයයි අපේ අතිගරු ජනාධිපතිතුමනි. නව ලිබරල්වාදයේ උච්චතම අවස්ථාව තමයි අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනම මුදල් පනත් කෙටුම්පතින් පෙන්වන්නේ. මොකද, රේගු ආඥාපනත, ආනයන සහ අපනයන (පාලන) පනත සහ විනිමය පාලන පනත යන මේ සියලුම පනත් මේ තෝරා ගත්තු ආයතනවලට බලපාන්නේ නැහැ කියලා කියනවා. එතකොට ඒ සියලුම නීති අයින් කරලා තිබෙනවා මේ ආයතනවලට. එතකොට කිසිම විධියකට රෙගුලාසියක්, නියාමනයක්, නීතියක් නැති වෙනවා මේ Free Port එහෙමත් නැත්නම්, නිදහස්-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කරුණාකර නිශ්ශබ්ද වන්න, පස් වරු 12.30 සිට තවත් විනාඩි 5ක් සභාව පවත්වා ගෙන යෑමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව කර ගෙන යන්නද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. කථාව කරන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එතකොට එහෙම වුණාම වෙන්නේ කිසිම විධියකට පාලනයක් කර ගන්න බැරි වීමයි. මම කිව්වේ, මේ වැටක් ගහලා තිබෙන්නේ අනවශ්‍ය කට්ටිය වැටෙන් එළියේ තියන්න. ගේට්ටුව දාලා තිබෙන්නේ අපට ඕනෑ කට්ටිය ඇතුළට ගෙනෙන්න. නමුත් අතිගරු ජනාධිපතිතුමනි, මේ පනත් කෙටුම්පතින් වෙන්නේ සම්පූර්ණයෙන්ම වැට ගලවන එක. ඒ නිසා මම ඔබතුමාගෙන් නැවතත් ඉල්ලා සිටිනවා අවධානය යොමු කරන්න කියලා, මේ මුළු වැටම ගලවන එක හරිද, එහෙම නැත්නම් අපි වැට තියලා ගේට්ටුවක් දමමුද අපිට අනවශ්‍ය කට්ටිය එළියෙන් තියන්න කියන එක ගැන. දැන් ඒ කථාව මම එතැනින් නවත්වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි කීයක් තිබෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම එච්චර වෙලා කාලය ගන්නේ නැහැ. මම හිතන්නේ අපේ අතිගරු ජනාධිපතිතුමාත් කථා කරනවා ඇති කියලායි. මම දැන්

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

අහන්න කැමැතියි "මොනවාටද මේ බදු ගහන්නේ?" කියලා. බදු ගහන්නේ ජනතාවට සෙතක් සලසන්න. බදුවලින් තමයි මේ සෙත සලසන්නේ. එහෙම නම් ඇයි මේ බදු ඉවත් කරන්නේ? බදු ඉවත් කරන එකෙනුත් අපි බලාපොරොත්තු වෙන්නේ තව ආයෝජන ගෙනැල්ලා, ඒ ආයෝජන තුළින් රට සංවර්ධනය කරලා, ඒ තුළින් ජනතාවට සෙතක් සලසන්න.

ගරු ජනාධිපතිතුමනි, කොහොමද සංවර්ධනය මනින්නේ? අපිට අපේ ඇමතිතුමන්ලා, මහ බැංකු අධිපතිතුමා කියනවා, "මෙන්න බලන්න, අපේ රටේ ඒක පුද්ගල ආදායම දැන් ඩොලර් 2,500ට වැඩි වෙලා තිබෙනවා" කියලා. ඒක හොඳයි. ඇත්ත වශයෙන් ඩොලර්වලින් 2,500 කියන ගණන රුපියල්වලට හරවලා ගෘහස්ථයකට ආදේශ කළොත් ඩොලර් 2,500ක් ලැබෙනවා කියන්නේ එක පුද්ගලයකුට මාසයකට රුපියල් ලක්ෂයක් ලැබෙනවා කියන එකයි. එහෙම රුපියල් ලක්ෂයක් හම්බ වෙන්නේ නැහැ. එහෙම නම් ඇත්ත වශයෙන්ම සංවර්ධනය මනින්න ඕනෑ ගෘහස්ථයකට ලැබෙන ආදායමින්. අපි කාලයක් තිස්සේ බලන්න ඕනෑ ඒක වැඩි වෙනවාද, අඩු වෙනවාද කියලා. එතකොට ගෘහස්ථයකට ලැබෙන ආදායම වැඩි වෙනවා නම් අන්න අතිගරු ජනාධිපතිතුමනි, එතැන තමයි සංවර්ධනය තිබෙන්නේ. ඔබතුමා කොයි වෙලාවෙත් ගමට ගිහිල්ලා මිනිස්සුත් එක්ක කථා කරලා, ඒ තමන්ගේ ගමේ පුද්ගලයෝ පිළිබඳව මනා අවබෝධයකින් කථා කරනවා. එහෙම නම් ඔබතුමාත් බලන්න ඕනෑ ඒ සංවර්ධනය සිද්ධ වෙනවාද කියලා. අපි ඒක මනින්නේ මූර්ත ආදායම කියන මිනුම් දණ්ඩෙන්. අතිගරු ජනාධිපතිතුමනි, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මූර්ත ආදායම වසර 3කට, නැත්නම් 4කට වරක් හදලා ඉදිරිපත් කරනවා.

මට කියන්න කනගාටුයි, -මම මේක කලිනුත් කියා තිබෙනවා. - 2006 වර්ෂයේ දී තිබුණු මූර්ත ආදායමට වඩා -ඊට පස්සේ අප මේ මූර්ත ආදායම මැන්නේ 2010 වර්ෂයේදී ගරු ජනාධිපතිතුමනි.- 2010 වර්ෂය වන කොට මූර්ත ආදායම අඩු වෙලා තිබෙනවාය කියලා. මම මේක කියන්නේ ගරු ජනාධිපතිතුමනි, ඉතාමත්ම වග කීමෙන්. මේක දේශපාලන කථාවක් නොවෙයි, ගරු ජනාධිපතිතුමනි. සුළු ගණනකින් අඩු වෙලා තිබෙන්නේ. නමුත් අඩු වී තිබෙනවා. එහෙම නම් අප කොහොම ද කියන්නේ සාමාන්‍ය ගෘහස්ථයක ජීවන තත්ත්වය වැඩි වෙලා තිබෙනවා කියා; සාමාන්‍ය ගෘහස්ථයක ජීවන තත්ත්වය සංවර්ධනය වෙලා තිබෙනවාය කියා. මම ඔබතුමාට මේ ප්‍රශ්නයේ තිබෙන-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

අද දින දිවා ආහාරය සඳහා විවේකය පැය භාගයකට සීමා කිරීමට සහ දිවා ආහාරයෙන් පසුව ගරු සභාව අපර භාග 1.05ට නැවත රැස්වීමට සභාවේ එකඟතාව?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 5ක් දුන්නොත් මගේ කථාව අවසන් කරනවා. තව විනාඩි 5ක් දුන්නොත් මගේ කථාවත් ඉවරයි නේ. විනාඩි 5කින් මට කියන්න. මගේ කථාව එතකොට ඉවරයි. [බාධා කිරීම්] නවත්වන්න පුළුවන්. නැවතත් එන්න ඕනෑ නැහැ නේ. [බාධා කිරීම්] විනාඩි 5ක් දෙන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ආපසු එන්න. අප සතුටුයි ඔබතුමාගේ කථාව ආපසු අහන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

දවල් කෑමෙන් පසුව-

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

හරි.එහෙම නම් විනාඩි පහෙන් මගේ කථාව නවත්වනවා. එහෙම නම් ඔය පසුබිම තුළ තමයි -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, we have to suspend Sittings now.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Dr. Harsha De Silva, you are always late.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

විනාඩි පහෙන් නවත්වනවා. විනාඩි පහක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The Sitting is suspended till 1.05 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.05ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා (ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා) ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.05 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் (மாண்புமிகு முருகேசு சந்திரகுமார் )அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.05 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES (THE HON. MURUGESU CHANDRAKUMAR ) *in the Chair.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. (Dr.) Harsha de Silva, you can continue with your speech.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Mr. Deputy Chairman of Committees, it was unfortunate that we had to stop just as I was building up my argument. Nevertheless, I will attempt to recharge myself and go at it.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම අතිගරු ජනාධිපතිතුමාටත් පෙන්නුම් කරලා දුන්නා, ඇත්ත වශයෙන්ම රටේ සංවර්ධනය මනින්න ඕනෑ, ගෘහස්ථයක - ගෙදරක,

කුටුම්භයක- ජීවන තත්ත්වය වැඩි වෙලාද නැද්ද කියන එකෙන්ය කියා. අවාසනාවකට 2006 - 2010 කාල පරිච්ඡේදය තුළ ගෘහස්ථයක මූර්ත ආදායම අඩු වෙලා තිබෙනවාය කියාත් මම පෙන්නුම් කර දුන්නා. ඒකෙන් මම එතුමාට පෙන්නුම් කරලා දුන්නේ මහ බැංකු අධිපතිවරයා සහ අනික් කට්ටිය කියන per capita income එක ඩොලර් 2,500 වුණාට සාමාන්‍ය ගෙදරක ජීවන තත්ත්වය ඔය කියන විධියට ඉහළ ගිහින් නැහැ, ඇත්ත වශයෙන්ම යම්කිසි විධියකට පහළ වැටීමක් සිද්ධ වෙලා තිබෙනවාය කියන එකයි. ඒ නිසා ආණ්ඩුවේ සියලුම දෙනා කල්පනා කර බැලිය යුතු වෙනවා, මේ සංවර්ධනය සාමාන්‍ය ජනතාව අතරට ගෙන යන්නේ කොහොමද කියන එක ගැන.

අවසාන වශයෙන් වැදගත් කාරණයක් සම්බන්ධයෙන් මට කථා කරන්නට තිබෙනවා. එහා පැත්තේ ඉන්න අපේ ආර්ථික විද්‍යාඥයා -බන්දුල ගුණවර්ධන ඇමතිතුමා- මේ ළඟදි කථාවකදී කියා තිබෙනවා, රුපියල් 2,500කින් මිනිහෙකුට කරදරයක් නැතිව මාසයක් ජීවත් වෙන්න පුළුවන්ය කියා. මම ඒක ප්‍රතික්ෂේප කරනවා. ඒක කරන්න බැරි බව මම මේ සභාවේදී ඊළඟ විනාඩි තුනේදී ඔප්පු කරන්න බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම එතුමා අභියෝගයක් ඉදිරිපත් කරලා කියා තිබෙනවා, අවුරුදු 15 ඉඳලා ආර්ථික විද්‍යාව හදාරපු ඕනෑම කෙනෙකුට ඒ අභියෝගය බාර ගන්න එන්නය කියලා. මම අවුරුදු 15 ඉඳලා ආර්ථික විද්‍යාව හදාරලා නැති නිසා එතුමා ඉතාමත්ම සූක්ෂ්ම ලෙස මා ඒ විවාදයෙන් -ඒ රාමුවෙන්- එළියට දමා තිබෙනවා. ගරු ඇමතිතුමනි, කවුද මේ පාර්ලිමේන්තුවේ ගෘහ නිර්මාණ ශිල්පියා? ජෙෆ්රි බාවා මැතිතුමා නේ. ජෙෆ්රි බාවා මැතිතුමා කියන්නේ ලංකාවේ හිටපු හොඳම ගෘහ නිර්මාණ ශිල්පියා. එතුමා ගෘහ නිර්මාණ ශිල්පය පටන් අරගෙන තිබෙන්නේ වයස අවුරුදු 40ට කිට්ටු වුණු අවධියේදීයි. එතෙක් එතුමා නීතිඥවරයෙක් හැටියටයි කටයුතු කරලා තිබෙන්නේ. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියනවා නම් අවුරුදු 15 ඉඳලා ආර්ථික විද්‍යාව ඉගෙන ගත්තු කෙනෙකුට විතරයි එතුමාත් එක්ක විවාදයට එන්න පුළුවන් කියා, ඒක හරි පුහු, අවැදගත් තර්කයක්.

කෙසේ නමුත් එතුමා දන්නවා ඇති ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරන දරිද්‍රතා රේඛාව ගැන. 2012 පෙබරවාරි මාසයේදී ඒ දරිද්‍රතා රේඛාව තිබෙන්නේ රුපියල් 3,329ටයි. ඒ කියන්නේ පුද්ගලයෙකුට රුපියල් 3,329ක් වියදම් කරන්න බැරි නම් ඒ පුද්ගලයාට ඔය කියන ජීවත් වීමේ හැකියාව නැහැ. කොහොමද මේ දරිද්‍රතා රේඛාව හැදිලා තිබෙන්නේ? දරිද්‍රතා රේඛාව හැදිලා තිබෙන්නේ දිනකට කිලෝ කැලරි 2,030ක් පරිභෝජනය කරන්න හැකියාවක් තිබෙනවාද, ඒ සඳහා වියදම් කරන්න හැකියාවක් තිබෙනවාද කියන එකෙනුයි. නිර්වස්ත්‍රව නොසිට විළි වැහෙන්න ඇඳ ගන්න මොකක් හරි තිබෙනවා නම්, කෑම ටික උයා ගන්න ගෑස් ටිකට, භූමි තෙල් ටිකට වියදම් කරන්න, ඒ ටික බස් එකේ හරි, ත්‍රී වීලර් එකකින් හරි ගෙදරට අරගෙන යන්න, ටකරන් වහලක් යට හරි තෙමෙන්නේ නැතුව අසනීප නොවෙන විධියට ජීවත් වෙන්න තිබෙනවාද කියන ඔය ටික කර ගන්න තමයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රුපියල් 3,329ක් අවශ්‍ය වෙන්නේ. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියන තුන් දෙනෙක් ඉන්න පවුලකට ඒ අනුව බැලුවාම රුපියල් 9,987ක් අවශ්‍ය වෙනවා. නමුත් අපි එතැනින් එහාට පොඩ්ඩක් යන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සාමාන්‍යයෙන් ලෝකයේ පිළිගත්තු දුප්පත්කම මනින ක්‍රමයට අනුව දිනක ආදායම ඩොලර් දෙකකට අඩු නම් දුප්පත් කියා තමයි කියන්නේ. ඒක සංවර්ධනය වන රටවල පාවිච්චි කරන මිනුම් දණ්ඩයි. ඇත්ත වශයෙන්ම ලංකාවට වඩා ඇමෙරිකාවේ දුප්පත්කම වැඩියි. ඒක තමයි ලංකාවේ තිබෙන ආශ්චර්යය. ආසියාවේ ආශ්චර්යය මොකක්ද? ලංකාවේ දුප්පත්කමට වඩා ඇමෙරිකාවේ දුප්පත්කම වැඩියි. මෙතුමන්ලා කියන විධියට ලංකාවේ දුප්පත්කම සියයට 8.9යි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Please give me two more minutes.

නමුත් ඇමෙරිකාවේ දුප්පත්කම සියයට 12යි; 13යි. මොකද, ඇමෙරිකාවේ දුප්පත්කම මනින්නේ වෙන විධියකටයි. ඩොලර් 26ක් හම්බ කළේ නැත්නම් ඒ කට්ටිය දුප්පත්ය කියා තමයි කියන්නේ. නමුත් අන්ත දුප්පත්කම - extreme poverty - මනින්නේ ඩොලර් එකකින් අපට දවසක වියදම පියවා ගන්න පුළුවන්ද කියන එකෙනුයි. ඩොලර් එකක් වියදම් කරන්න බැරි නම් සාමාන්‍යයෙන් ලෝකය පිළිගන්නේ ඒක අන්ත දුප්පත්කම - extreme poverty - හැටියටයි. එහෙම නම් රුපියල් 3,329 කියන්නේ දවසකට ගත්තොත් රුපියල් 111යි. රුපියල් 127 ගණනේ අමෙරිකන් ඩොලර්වලින් බැලුවොත් ශත අසූ ගණනක් තමයි තිබෙන්නේ. ඒ කියන්නේ ලංකාවේ දුප්පත්කම කියලා ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරලා තිබෙන්නේ ඩොලර් එකට නොවෙයි ශත අසූ ගණනට වඩා වියදම් කරන්න බැරි නම් තමයි. නමුත් බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියන විධියට දවසකට රුපියල් 83කින් කරදරයක් නැතිව මිනිහෙකුට ජීවත් වෙන්න පුළුවන්. ඒ කියන්නේ ඇමෙරිකන් ඩොලර්වලින් ගත්තොත් ශත 60 ගණනක්. ලෝකය පිළිගන්න අන්ත දුගී, දුප්පත්, දුප්පත්ම මිනිසුන් කියන්නේ ඩොලර් එකක් වියදම් කරන්න බැරි අයට. එහෙම නම් ඩොලර් ශත 63කින් ජීවත් වෙන්න පුළුවන් කියන එක විශ්වාස කරන්න බැරි දෙයක්.

මම තව එක කාරණයක් කියන්නට ඕනෑ. මිනිසුන්ට කිලෝ කැලරි ප්‍රමාණය අවශ්‍ය වන්නේ අපි energy කියලා කියන, ජීවත් වෙන්න අවශ්‍ය ශක්තිය ලබා ගන්න. මිනිසුන්ට බස් එකේ නැඟලා යන්න ඕනෑ; තෙරපෙන්න ඕනෑ; කෝච්චියේ එල්ලෙන්න ඕනෑ. දහඩිය පෙරා ගෙන මේ වැඩ කටයුතු කර ගන්න මිනිසුන්ට කිලෝ කැලරි 2,000 ගණනක් අවශ්‍ය වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1985 - 1986 කාලයේ අපි දුප්පත්කම මනින විට මිනිහෙකුට ජීවත් වෙන්න කිලෝ කැලරි 2,500ක් ඕනෑ කියලා කිව්වා. නමුත් 2004, -ගරු ඇමතිතුමා ඔබතුමන්ලාගේම ආණ්ඩුව කාලයේ- මේ 2,500ක කිලෝ කැලරි ප්‍රමාණය 2,030 දක්වා අඩු කරලා තිබෙනවා. ඔය 2,030 කිලෝ කැලරි ප්‍රමාණය ගන්න තමයි දැන් දරිද්‍රතා රේඛාව හදලා තිබෙන්නේ. මම හිතන හැටියට මෙතැන කිසිම විවාදයක් නැහැ. මොකද, මේක මම කියන දෙයක් නොවෙයි. මේක ශ්‍රී ලංකා ආණ්ඩුවේම නිල දත්තවලින් ඉදිරිපත් කරලා තිබෙන දෙයක්. එක පුද්ගලයෙකුට ජීවත් වෙන්න අවශ්‍ය මූලික ආදායම- ඇත්ත වශයෙන්ම කියනවා නම් වියදම් කිරීමේ හැකියාව- රුපියල් 3,329ක් වෙන්න පුළුවන්. නමුත් ඒකත් අන්ත දුගී දුප්පත් ගණයට වැටෙන තත්ත්වයක තමයි තිබෙන්නේ. බොහොම ස්තුතියි.

[අ.භා. 1.14]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ මිත්‍ර ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාගේ -ආර්ථික විශේෂඥතුමාගේ- කථාවෙන් පසුව මට වචන කිහිපයක් කථා කිරීමට ලැබීම ගැන සන්තෝෂ වෙනවා. නමුත් මම එතුමාට මතක් කරන්න ඕනෑ, අපි මේ සාකච්ඡා කරන

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

හැම කරුණක්ම පසු ගිය නොවැම්බර් 21වෙනි දා අය වැය ලේඛනයෙන් සම්මත කර ගත්ත කාරණා බව. මේ තාක්ෂණ සටහන් හොඳට කියෙව්වොත් ඔබතුමාට හිතෙයි අප කුමක් සඳහා විවාද කරනවාද කියලා. කෙසේ වෙතත් එතුමා එක තර්කයක් කිව්වා. මම ඒ තර්කයට උත්තරයක් දෙන්න ඕනෑ.

මේ කෙටුම්පතේ සඳහන්ව තිබෙනවා, (235වන අධිකාරය වූ) රේගු ආඥාපනත, (423වන අධිකාරය වූ) විනිමය පාලන පනත සහ 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත යන පනත්වල විධිවිධාන අදාළ වීම නිදහස් කිරීම පිණිස ද; කියලා. මේක තමයි මූලික කාරණය. මේක Free Port එකක් නොවෙයි. මේක Free Port එකක් කරන්නට අපේ කිසිම අදහසක් නැහැ. ඒකේ එකින් එක කරුණු කියලා තිබෙනවා. මට මේ හැම කරුණක්ම කියන්නට වෙලාව මදි. නමුත් මේ කෙටුම්පතේ තිබෙනවා re-export කරන හැටි, bonded warehouses ගැන. මේක වරාය ඇතුළේ කරන සිද්ධාන්තයක්. නමුත් මේක රේගු ආඥාපනත යටතේ වරායත් එක්ක ඒ අයගේ අධීක්ෂණය යටතේ කරන්න සිද්ධ වෙනවා කියන එක මම එතුමාට පැහැදිලිවම කියන්න ඕනෑ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ඇමතිතුමා, මට විනාඩියක් දෙන්න.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මට වෙලාව නැහැ. මට විනාඩි හත, අටයි තිබෙන්නේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
13 පිටුවේ, 16 (2) (a) උප වගන්තිය යටතේ තිබෙනවා "Free Port" කියලා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
නැහැ. Free Port කියන කථාන්තරයක් නැහැ. ඔබතුමා බලන්න, මුදල් පනත් කෙටුම්පතේ 11වෙනි පිටුවේ 16.(1) සහ 12 වෙනි පිටුවේ 5 සිට 15 දක්වා පේළිවල මේක පැහැදිලි ලෙසම කියලා තිබෙනවා. එම නිසා අපි මේකෙන් කරන්න බලාපොරොත්තු වන්නේ මොනවාද?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Free Port කියන වචනය තිබෙනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
Free Port කියන වචනය වැරදියි. සම්පූර්ණ වැරදියි. [බාධා කිරීමක්] මට ඒ ගැන කථා කරන්න ගියොත් වෙලාව යනවා; ප්‍රශ්නවලට උත්තර දෙන්න බැරිව යනවා. [බාධා කිරීම්]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු මන්ත්‍රීතුමා මේ සභාව නොමඟ යවනවා.

Clause 16 (2) (a) of the Finance Bill states, I quote:

"shall carry out such activities either in a Free Port operated under the supervision of the Sri Lanka Ports Authority......."

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
"Under the supervision of ...". එහෙමයි තිබෙන්නේ. සීමිත ප්‍රමාණයක් පමණයි.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
It is in relation to the provisions of the Act. Hon. Member, you are misleading this House.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
It states, "Free Port".

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඊ ළඟට කියන්න ඕනෑ, ඇයි අපි මේවා කරන්නේ කියලා. විශේෂයෙන්ම මේ අපනයනත්, ආනයනත් අතර පරතරය අඩු කරන්න ඕනෑ. අපි රටක් හැටියට බලද්දී බොහෝ දේවල් ආනයනය කරනවා; අපනයන කරන ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. එම නිසා value additionවලට සහනයක් දෙන්න තමයි මේ හැම දෙයක්ම කරලා තිබෙන්නේ.

උදාහරණයක් වශයෙන් මේ කාරණය කියන්නම්. අපි මාසයකට කිරි පිටි ටොන් 3,500ක් දැනට ගෙන්වනවා. ඒ සඳහා අපට යූඑස් ඩොලර් මිලියන 350ක් වියදම් වෙනවා. එම නිසා කිරි හරක් ගේන්න සහන දෙනවා. දැන් කිරි හරක් දෙදහස් ගණනක් ගෙනැල්ලා තිබෙනවා. ඒවාට සහන දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොච්චර බෙහෙත් ගේනවාද කියලා බලමු. ඖෂධවලට යූඑස් ඩොලර් මිලියන 400ක් යනවා. රටින් ගෙන්වන ඒවාට value add කරලා, මෙහේ හදන ඒවාට සහන දුන්නාම අපේ රටට ඔය කියන කතන්දරයක් නැතුව ඉස්සරහට යන්න පුළුවන්. අධ්‍යාපනය වෙනුවෙන් සියයට 10ක් සහන දෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා සියයට 12ක් සහන දෙනවා. කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත, තේ දළු, රබර්, කුරුඳු වාගේම ආර්ථික වාසි නොලබන ව්‍යාපාර සඳහා NBT එකත් නිදහස් කරලා තිබෙනවා. පිරිවැටුම කාර්තුවකට මිලියන 50 දක්වා වන ව්‍යාපාර සඳහා ආර්ථික සේවා ගාස්තු සම්පූර්ණයෙන් නිදහස් කරලා තිබෙනවා. ඉස්සර පිරිවැටුම මිලියන 25 දක්වා තිබ්බ එක දැන් මිලියන 50 දක්වා වැඩි කරලා තිබෙනවා. බලන්න කොච්චර සහනයක්ද කියලා. ඉතින් මේකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ දෙපයින් නැඟී සිටීමයි. ඒක තමයි ජනාධිපතිතුමාගේ පරමාර්ථය. ඉතින් ඒ පරමාර්ථය ඉෂ්ට කරන්න අපි කල්පනා කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ලංකාවේ මේ වෙද්දී විදේශ ණය ප්‍රමාණය බිලියන 21ක් වනවා. එය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 41ක් වනවා. මෙයින් ඩොලර් මිලියන 1,686ක් විදේශ ණය; 116ක් ප්‍රදාන; grants. අපට දැන් ප්‍රධාන ණය සපයන්නා කවුද? චීනයයි. අපේ ණයවලින් සියයට 44ක් චීනය දෙනවා. අපි ලෝක බැංකුවට අත පානවා; නැමෙනවා කියන කථාවට මම පුංචි උත්තරයක් දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපට දෙවන ණය සපයන්නා තමයි ජපානය. අපේ ණයවලින් සියයට 29ක් ජපානය දෙනවා. ආසියානු සංවර්ධන බැංකුවේ ණය දායකත්වය සියයට 13යි. ලෝක බැංකුවේ ණය දායකත්වය සියයට 6යි. අපි ජාත්‍යන්තර අරමුදලට සහ ලෝක බැංකුවට යට වෙලාය කියා විපක්ෂය නඟන චෝදනාව අද සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා තිබෙනවා. අද අපි වෙනත් පාරක යනවා. චීනයෙන් ඩොලර් මිලියන 784ක ණය ප්‍රමාණයක් අපට ලබා දී තිබෙනවා. ජපානයෙන් ඩොලර් මිලියන 520ක් ලබා දීලා තිබෙනවා. ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 231ක් ලබා දීලා තිබෙනවා. අපි ලෝක බැංකුවෙන් ඩොලර් මිලියන103යි අරගෙන තිබෙන්නේ. ඉතින් මේවායින් මොනවාද කරලා තිබෙන්නේ? මේවායින් carnivals දානවාද, සංවර්ධනය කරනවාද? අපට ඒ ගැන කියන්න පුළුවන්. අපි ළඟ දත්තයන් තිබෙනවා, ඕනෑ තරම් කියන්න. ප්‍රමුඛතාව දීලා තිබෙන වැඩසටහන් පිළිබඳ විස්තර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විදේශ ණය ගෙවන්න තිබෙන්නේ අපි ගත්ත ඒවා විතරක් නොවෙයි. ඒ කාලයේ ගත්ත ඒවාත් තිබෙනවා. මොනවාටද මේවා පාවිච්චි කරලා තිබෙන්නේ? දැන් තමුන්නාන්සේලා හැම දාම කියන්නේ මේවා පාවිච්චි කරලා තිබෙන්නේ carnivals දාන්න කියලායි. ඒක සම්පූර්ණ මුසාවක්. උදාහරණයක් වශයෙන් චීනයෙන් ගත්තු ණයවලින් මාර්ග දියුණු කරන්න ඩොලර් මිලියන 500ක් වැය කරලා තිබෙනවා. දක්ෂිණ අධිවේගී මාර්ගයට ඩොලර් මිලියන 75ක් වියදම් කරලා තිබෙනවා. මන්නාරම කරෙයිතිව් මාර්ගයට ඩොලර් මිලියන 48ක් වියදම් කරලා තිබෙනවා. මන්නාරම මරිච්චිකඩෙ මාර්ගයට ඩොලර් මිලියන 73ක් වියදම් කරලා තිබෙනවා. ඌව පළාතට විදුලිය දෙන්න -නොදියුණු පළාතක් විධියට තමයි අපි ඌව පළාත ගත්තේ.- ඩොලර් මිලියන 24ක් වියදම් කරලා තිබෙනවා. වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හදන්න, පොදු පහසුකම් සඳහා, කාන්තා කටයුතු සඳහා වාගේම කන්කසන්තුරේ වරාය සංවර්ධනය කිරීමට තව වියදම් කර තිබෙනවා. මේ ඔක්කෝම උතුරට දීපු ඒවායි. අපේ රටේ සංවර්ධන වේගය සියයට 8ක් වුණාට උතුරේ සංවර්ධන වේගය සියයට 20යි; 22යි. මේක තමයි ඇත්ත. තමුන්නාන්සේලා මේවා ගැන කථා කරන්නේ නැහැ. අපි මෙහේ ඉඳන් කථා කරන්නේ නැහැ. එහාට ගිහිල්ලා බලන්න. බලපුවාම තේරෙනවා, වෙලා තිබෙන්නේ මොනවාද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කිලිනොච්චියට හදිසි ස්වභාවික ආපදා සඳහා යෙන් මිලියන 91ක් වියදම් කරලා තිබෙනවා. රූපවාහිනී සේවා වැඩි දියුණු කරන්න යෙන් මිලියන 5ක් වියදම් කරලා තිබෙනවා. ගොවීන් සඳහා -ආහාර සුරක්ෂිතතාවට- යෙන් මිලියන 4ක් වියදම් කරලා තිබෙනවා. මඩකලපුවේ මුත්තනයි පාලම හදන්න යෙන් මිලියන 15ක් වියදම් කරලා තිබෙනවා. ග්‍රාමීය විදුලි ව්‍යාපෘතියක් සඳහා ඩෙන්මාර්කයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 54ක් වියදම් කරලා තිබෙනවා. පකිස්ථානයෙන් පාසල් ගොඩනැඟිලිවලට ඇමෙරිකන් ඩොලර් මිලියන 0.12ක් වියදම් කරලා තිබෙනවා. ජල සම්පාදනය සඳහා, සනීපාරක්ෂක කටයුතු සඳහා ආදී වශයෙන් වියදම් කළ ඒවා ගොඩාක් තිබෙනවා. කියන්න ගියොත් ගොඩාක් වෙලා යනවා. ඒ නිසා මේ ගත්ත ණය සියල්ලම වැය කරලා තිබෙන්නේ මේ සංවර්ධන ව්‍යාපෘතිවලටයි.

ඒ දවස්වල මේ පාර්ලිමේන්තුව හදද්දී මිනිස්සු දොස් කිව්වා නේ. මොකටද මෙතැන මේ තරම් ගොඩනැඟිල්ලක් හදන්නේ කියලා මිනිස්සු දොස් කිව්වානේ. අද බලන්න කොහොමද කියලා. අද මේකේත් ඉඩ මදි වෙලා තිබෙනවා. එදා මහවැලිය හදද්දී ගාමිණී දිසානායක මහත්මයාට දොස් කිව්වා නේ. නමුත් අද මොකද කියන්නේ? ඒ නිසා ඒ කලට අවශ්‍ය දේ කරන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා නිසි කාලයේදී ත්‍රස්තවාදය විනාශ කළා වාගේම සංවර්ධනයත් ඉක්මනින් කරනවා. අද ඒක හරියට කළොත් මේ කරන ආයෝජන මතුවට ඉතිරියක් වෙනවා. එදා සිමෙන්ති කොට්ටයේ මිල කීයද? අද කීයද? මෙන්න මේ විධියට තමයි ව්‍යාපාර ක්ෂේත්‍රයේදී ගණන් බලන්න ඕනෑ. මම කියන්න කැමැතියි, ඔබතුමන්ලාගේ මේ තර්ක ඇත්ත වශයෙන්ම තාර්කික නැහැ, අතාර්කිකයි කියලා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමා, ඔබතුමාට රුපියල් 2,500න් මාසයක් ජීවත් වෙන්න පුළුවන්ද?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ඒක වෙන කතන්දරයක්. ඒක ගැන මම කියන්නම් කෝ. ඒකට මම වෙනමම උත්තරයක් දෙන්නම්. රුපියල් 2,500, 3,000 පැත්තකට දාන්න.

බලන්න, ඉස්සර අපි අපනයනය කළේ රබර් ෂීට්. දැන් රබර් ෂීට් යවන්නේ නැහැ. මගේ ආසනයේ තමයි ලෝඩ්ස්ටාර් ආයතනය තිබෙන්නේ. අද වෙන කොට හුළං නොගහන ටයර්වලින් -ඒ කියන්නේ තද ටයර්වලින්- වැඩිම ප්‍රමාණයක් ලෝකයට අපනයනය කරන්නේ ලෝඩ්ස්ටාර් ආයතනයෙන්. මේවාට value addition එකක් තිබෙන්න ඕනෑ. මාළුවලටත් value addition එකක් තිබෙන්න ඕනෑ. ටින් මාළු මෙහේ නිෂ්පාදනය කරන්න සහන දීලා තිබෙනවා. ආණ්ඩුවේ මේ ආර්ථික ප්‍රතිපත්තිවලින් අපට ලොකු බලාපොරොත්තුවක් තියා ගන්න පුළුවන්; ඒ වාගේම සංවර්ධනය ඉක්මන් කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම චීනය ගත්තොත්, චීනය ඒ ගොල්ලන්ගේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම දියුණු කරලා තිබෙන්නේ, සාම්ප්‍රදායික අපනයන අයින් කරලා දාලා electronics පැත්තට ගිහිල්ලායි. එතකොට electronic දේවල් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මෙහේ නිෂ්පාදනය කිරීමට අපට හැකියාවක් තිබෙනවා. ඒක ඉතාම සාර්ථක වැඩ පිළිවෙළක්.

අපි ඉස්සර රාජ්‍ය මැදිහත් වීමක් නැතිව ආර්ථිකය සම්පූර්ණයෙන් විවෘත කෙරුවා. එහෙම විවෘත කරලා ආර්ථිකය වැරදි පාරේ යනවා නම් මහ බැංකුව මොනවාද කරන්නේ? ඒක පාලනය කරනවා; ඒ පාලනය රජය අතට ගන්නවා. කාලයක ඒ පාලනය රජය අතට ගන්නවා, තව කාලයක අයින් කරලා දානවා. කාලයක් ඩොලරය පාලනය කරනවා, නැවත අත් හැරලා දානවා, නැවත පාලනය කරනවා. තවත් කාලයක නිදහසේ තියෙන්න හරිනවා. නමුත් ඕනෑවට වැඩිය පාලනයෙන් පිට ගියොත් ඒක කළමනාකරණය කිරීමේ හැකියාව මහ බැංකුවටත් තිබෙන බව මම මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ආර්ථික දරිද්‍රතාව ගැන කිව්වා. කොළඹ ජනගහන දරිද්‍රතා දර්ශකය 1989 ඉඳලා 1993 දක්වා සියයට 16.2ක් වශයෙන් තිබුණා. එය 1994 ඉඳලා 2003 දක්වා සියයට 12යි; 2005 ඉඳලා 2011 දක්වා සියයට 3.6යි. අවුරුදු 50ක් ගියා අපේ රටේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 1,000ක් වෙන්න. පසු ගිය අවුරුදු පහ ඇතුළත ඒක වැඩිදියුණු වෙච්ච හැටි බලන්න. ඒවා ගැන කල්පනා කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කය අරගෙන බැලුවොත්, එම දර්ශකය 1989 ඉඳලා 1993 දක්වා සියයට 14.7යි; 1994 සිට 2003 දක්වා සියයට 14.1යි; 2005

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

සිට 2011 දක්වා 3.9යි. මාතලේ, කුරුණෑගල, අනුරාධපුරය වාගේ දිස්ත්‍රික්ක අරගෙන බැලුවොත්, 1994 ඉඳලා 2003 දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ එම දර්ශකය සියයට 46.4ක්ව තිබුණා. අද සියයට 10.5ට බැහැලා තිබෙනවා. ඒවාගේම එය කෑගල්ල දිස්ත්‍රික්කයේ සියයට 36ක් තිබුණා. අද ඒක 10.8ට බැහැලා තිබෙනවා. මේ ඉලක්කම් වැරැදි නැහැ. ගිහිල්ලා බලන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වාණිජ බැංකු අරගෙන බලන්න. අද රටේ තිබෙන මේ තත්ත්වය නිසා මුදල් කළමනාකරණයක් විතරක් නොවෙයි මුදල් සංසරණයකුත් වෙනවා. ඒකට උදාහරණයක් කියන්න පුළුවන්. 2001දී අපේ රටේ තිබුණු බලපත්‍රලාභී වාණිජ බැංකු සංඛ්‍යාව 1,121යි. 2010 වෙද්දී කොච්චර තිබෙනවාද? 2,343ක් තිබෙනවා. ඒක සියයට 100ක වර්ධනයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විදේශ බැංකු ශාඛා කීයක් තිබුණාද? 2001දී තිබුණේ 37යි. 2010 වෙද්දී ශාඛා 216ක් තිබුණා. ගිහිල්ලා බලන්න, මේවා බොරුද ඇත්තද කියලා. ඒ වර්ධන වේගය සියයට 600කටත් වඩා වැඩියි. පුද්ගලයන් දහසකට වාණිජ බැංකු ශාඛා කොතරම් ප්‍රමාණයක් පවතිනවාද කියලා බැලුවොත්, 2001දී පුද්ගලයන් දහසකට වාණිජ බැංකු ශාඛා 6යි තිබුණේ. අද වෙද්දී කොහොමද? 2010 වෙද්දී පුද්ගලයන් දහසකට වාණිජ බැංකු 11ක් තිබෙනවා, සේවය සපයන්න. ඒ බැංකු නිකම්ම එනවාද?

කිලිනොච්චියේ බැංකු ශාඛා දැම්මේ ඇයි? කිලිනොච්චියේ බැංකුවලට දාලා තිබෙන මුදල් ප්‍රමාණය බලන්න. මුදල් සංසරණය වන හැටි බලන්න. මෙහේ එක් අයෙකුට තිබෙන ඉඩම් ප්‍රමාණය අඩු වුණාට එහේ වැඩියි. මෙහේ ගොවියෙකුට ලියැදි දෙක තුනක් තිබුණාට, එහේ ගොවියෙකුට අක්කර හතර පහ තිබෙනවා. ඉතින්, ඒ ගොල්ලන්ගේ ආර්ථිකයත් සශ්‍රීක වෙනවා. එහෙම සශ්‍රීක වෙන්න නම් අපි ඒ අයට අත්වැලක් දෙන්න ඕනෑ; බදු සහන ලබා දෙන්න ඕනෑ. ඒක තමයි අපේ තර්කය. අපේ ජනාධිපතිතුමා ඉතාම හොඳට ඒ කාර්යය කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් කාරණයක් කියන්නට ඕනෑ. විශේෂයෙන්ම අපේ ආර්ථිකය ගැන ඔය කියන තර්ක පිළිබඳව කථා කරන්න ඕනෑ. ඒ තර්ක ගැන කතා කරද්දී, කවුරු නැහැයි කිව්වත් අපි මේ ආර්ථික කළමනාකාරිත්වය නිසියාකාරව කරගෙන යන බව විශේෂයෙන්ම කියන්න ඕනෑ. අපි දන්නවා ඉස්සර අපේ අපනයන වැඩිපුරම කෙරුණේ යුරෝපයට බව. නමුත් දැන් කොහේටද? දැන් යුරෝපයට අපනයනය කරන එක එන්න එන්න අඩුවෙලා ආසියාවේ, අප්‍රිකානු කලාපයේ රටවලට අපි අපනයනය කරනවා. විශේෂයෙන්ම කුරුඳු සහ රබර්. අද තේ ප්‍රධාන අපනයනයක් නොවෙයි. තේවලට value addition එකක් දීලා තිබෙනවා. මාළුවලටත් එහෙමයි. Value addition එකක් දුන්නොත් විතරයි සහන ලබා දෙන්නේ. ඉතින් නිකම් එන්නේ නැහැනේ value addition ගන්න. ඒ සඳහා අපි මෙහෙන් බදු සහන දෙන්න ඕනෑ. බදු සහන දීපුවාම එකක් වෙනවා. එනම්, ඒ අය නැවත වරක් ඒ ව්‍යාපාරයට ආයෝජනය කරනවා. නැත්නම් බදු ගෙව්වාම කොහොමද ආයෝජනය කරන්නේ? අලුත් machines ගන්නේ කොහොමද? අලුත් වැඩ කරන්නේ කොහොමද? මේ කරුණු කාරණා ටික ඔබතුමන්ලාට මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ අමාත්‍යාංශයේ විෂය පථය ගැන බලද්දී, මගේ අමාත්‍යාංශයටත් ලොකු සහනයක් දීලා තිබෙනවා. එනම්, Braille machinesවලට, ඇස් කණ්ණාඩිවලට. ගිය වර අය වැය ලේඛනය ඉදිරිපත් කළ වෙලාවේත් මම මේ ගැන මතක් කළා. Braille machines අමතර කොටස්, කිහිලි කරු, රෝද පුටු, ශ්‍රවණාධාර ආදී උපකරණ දිහාත් ආණ්ඩුව බලලා තිබෙනවා. කවුරුත් කතා කරන්නේ නැහැ ඒ ගැන.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, මෙවර සාමාන්‍ය පෙළ විභාගයෙන් "ඒ" සාමාර්ථ නවයක් ලබා ගත්ත ආබාධිත ළමයෙක් ඉන්නවා. ඒ ළමයාට-

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ඒ ළමයාව අපි ගෙන්වනවා. ගෙන්වලාපොඩි තෑග්ගකුත් දීලා -

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, ඒ ළමයාට උසස් පෙළ වැඩ කටයුතු කරගෙන යන්න ශිෂ්‍යත්වයක් වාගේ දෙයක් දෙනවා නම් හොඳයි නේද?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

අනිවාර්යයෙන්ම. ඒ ළමයාගේ දෙමාපියන්ට කතා කරලා වෙලාවක් දුන්නා ඇවිල්ලා අපව හම්බ වෙන්න කියලා. අපි උපහාරයක් පුද කරනවා.

ඉතින් Braille machines තිබුණාට, Braille ශාස්ත්‍රය උගන්වන ඉන්න කණ්ඩායම මදි. ඒකයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Minister, you have only one more minute.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

හොඳයි. කියන්න නම් මට තව බොහෝ දේවල් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද බලන්න අපේ සංචාරක කර්මාන්තය දිහා. සංචාරක කර්මාන්තය ඉතාම දියුණු තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. යුරෝපයෙන් සංචාරකයන් එන්නේ සියයට 50යි. ආසියා පැසිෆික් කලාපයෙන් සියයට 22යි. ඇමෙරිකාවෙන් සියයට 16යි. මැද පෙරදිගින් සියයට 6යි, අප්‍රිකාවෙන් සියයට 6යි. ඔහොම තමයි සංචාරකයන් පැමිණෙන්නේ. ලෝක ආර්ථික විශේෂඥයින් කියන කතාවක් තමයි මොනවා නැති වුණත් සංචාරක ව්‍යාපාරය ශක්තිමත් නම් රටක් වැටෙන්නේ නැහැ කියන එක. අපේ රටේ සංචාරක ව්‍යාපාරය ශක්තිමත් වෙන්න මූලික හේතුව වෙලා තිබෙන්නේ මේ රටේ පැවැති බිය නැති කිරීමයි. එනම් යුද්ධය නැති කිරීම. යුද්ධයක් තියෙද්දී කවුරුත් එන්නේ නැහැනේ. බෝම්බයක් පිපිරුණොත් එන්නේ නැහැ. යාපනයේ බෝම්බයක් පිපිරුණොත් රොයිටර් වාර්තා කරන්නේ කොළඹදී පිපිරුණා කියලායි. ඒ නිසා යුද්ධයක් තියෙද්දී සංචාරකයන් කවුරුත් එන්නේ නැහැ. ඒ නිසා යුද්ධය නැති කරලා දැම්ම නිසා තමයි මේ ආර්ථික වර්ධනය වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආර්ථික සංවර්ධනයේ මුල් පුරුක එහෙම නැත්නම් නියමුවා කවුද? අතිගරු ජනාධිපතිතුමායි. එතුමා තමයි යුද්ධය නවත්වන්න එපා, කරගෙන යන්න කියලා ඒ තීරණය ගත්තේ. ඉස්සරත් මම ඒක කිව්වානේ. [බාධා කිරීමක්] ජයසුන්දර මහත්තයාත් හොඳයි. අපරාදේ කියන්න බැහැ, ගමේ හැදිච්ච මනුෂ්‍යයෙක් වශයෙන් එතුමා ග්‍රාමීය පැත්ත ගැන කල්පනා කරලා තමයි ආර්ථිකය කළමනාකරණය කරන්නේ. එහෙම නැතිව උඩින් ඇවිල්ලා වාගේ කටයුතු කරන්නේ නැහැ.

දැන් බලන්න, ශ්‍රී ලංකාවට එන සංචාරකයන්ගෙන් සියයට 79ක් එන්නේ මොනවාටද? ඔවුන් එන්නේ විනෝදය පෙරදැරි කරගෙන. සියයට 13ක් එනවා ව්‍යාපාර කටයුතුවලට. සියයට 17ක් එනවා පැය 24කට වැඩිය අඩු කාලයක් ඉඳලා යන්න. සියයට 83ක් එන්නේ රට තුළ සංචාරය කරන්න. ඉතින් මේ දත්ත, මේ කරුණු කාරණා වැරදියට පැහැදිලි කරලා මේ ආණ්ඩුවට චෝදනා ඉදිරිපත් කරනවා නම් ඒක හෘදය සාක්ෂියට එකඟව කරන කටයුත්තක් විධියට අපි දකින්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා මා විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, තමුන්නාන්සේලා විවේචන කළාට කමක් නැහැ, මේ රට කෙළින් හිට ගන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න ගෙනෙන මේ සංශෝධන ගැන මීට වඩා වෙනස් විධියකට හිතන්න කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව විනාඩි පහක් දෙන්න බැරිද?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
No, I am sorry.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
එහෙම නම් විනාඩි දෙකක් දෙන්න. මම කියන්නේ, මෙන්න මේ කරුණු ගැන අපි කල්පනා කරලා බලන්න ඕනෑ කියන එකයි.

ඊළඟට මම තවත් කාරණයක් කියන්න ඕනෑ. අද රටේ පාරවල් ටික හදලා තිබෙන ආකාරය දිහා බැලුවාම, විශේෂයෙන්ම පිට රට ගිහිල්ලා හිටපු ද්‍රවිඩ ප්‍රජාව අවුරුදු ගණනකට පස්සේ ඇවිල්ලා මොනවාද කියන්නේ? අපි ළඟටත් එනවා ඒ අය; අපේත් යාළුවෝ. ඒ අය කියන්නේ අපට අදහා ගන්න බැහැ කියලායි. කිලිනොච්චියේ බැංකු ඇති වෙලාය කියනවා. ඒ ප්‍රදේශයේ මිනිස්සු දැන් බය නැතිව ජීවත් වෙනවාය කියනවා. ඒ බය සම්පූර්ණයෙන් ඉවත් වෙලා ගිහිල්ලාය කියනවා. යුද්ධය යළි නොඑන්න කියලා ඒ ගොල්ලෝ යාඥා කරනවාය කියනවා. ඒ වාගේම කියනවා මීට පස්සේ අපට යුද්ධයක් ඕනෑ නැහැ, සිංහල ජාතියත් එක්ක, ප්‍රධාන ජාතියත් එක්ක සමඟියෙන් ඉන්නයි අපට ඕනෑ කියලා.

ද්‍රවිඩ භාෂාව කතා කරන ජනතාව සියයට 52ක් කොළඹ ඉන්නවා. සුළුතරයක් කියලා කියනවා. ඒ වාගේම, මහ ජාතිය කියලා කියනවා. මහ ජාතියක් කියලා එකක් නැහැ. හැම ජාතියක්ම එකයි කියන සංකල්පයෙන් තමයි අතිගරු ජනාධිපතිතුමා කටයුතු කරන්නේ. නමුත් ජාතිය බෙදන්න යන්නේ කවුද? ජාතියට වින කරන්නේ කවුද? පාලන බලයට එන්න මොකක් හරි හේතුවක් සොයා ගත්ත දේශපාලනඥයන්. ඒ නිසා මේ පොදු ප්‍රතිපත්තියෙන් බැහැර වෙලා රටේ සංවර්ධනය වෙනුවෙන් විපක්ෂයට ලොකු සේවාවක් කරන්න පුළුවන් කියලා මම හිතනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Please wind up now.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
විපක්ෂයේ සේවාව උඩ තමයි රටේ අභිමානයත් රැකෙන්නේ කියන එක කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 1.32]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අද දින සාකච්ඡාවට ගැනෙන්නේ, පසු ගිය නොවැම්බර් මාසයේ 21 වැනි දින අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කරපු යෝජනාවලට අදාළව ඒ නීතිමය රාමුවට ගැළපෙන ආකාරයට ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත් කිහිපයක් පිළිබඳවයි. පසු ගිය සතියේ මේ පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවක් හදිසියේ කැඳවා තිබුණා. ඒ උපදේශක කාරක සභාවට ගියාට පස්සේ මේ පනත් කෙටුම්පත් අපට ඉදිරිපත් කළා. මෙය පසු ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ අය වැයෙන් ඉදිරිපත් කරන ලද කථාවක්. ඒකට අවශ්‍ය කරන නීතිමය තත්ත්වය හදා ගන්න තමයි, දැන් මේ සංශෝධනයන් ගේන්නේ. ඒ නිසා මේක හරියට අර "වස්කා නම් බළලා ඇහුම්කන් දෙයි. එහෙත් කා ගෙන යයි" වාගේ තමයි. ආණ්ඩුව වැඩේ කර ගෙන යනවා. නීතිය හදා ගන්න, පස්සේ සංශෝධනයන් ගේනවා. නමුත් අද ඒ සංශෝධනත් එක්ක සංශෝධන ගොඩක් table කරලා තිබෙනවා.

මේක පුංචි නීතිමය රාමුවක්. මහ අමාරු දෙයක් නොවෙයි. පසු ගිය නොවැම්බර් මාසයේ සම්මත කරපු ඒවා. නොවැම්බර් මාසයේ අය වැයට හදපු ඒවා. එතකොට ඒක නීතිපති අංශයෙන් කෙටුම්පත් කරලා, කොළ දෙකකින් සමන්විත ඒ පනත් කෙටුම්පත උපදේශක කාරක සභාවට ඉදිරිපත් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එයට සංශෝධන හැටියට කිලෝවක් විතර බර පිටු ටිකක් අද උදේ ගේනවා. ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමනි, මේක කියවන්නේ කවුද, මේක අධ්‍යයනය කරන්න වෙලාවක් තිබෙන්නේ කාටද කියලා කල්පනාකර බලන්න. එහෙම නම් උපදේශක කාරක සභාව කැඳෙව්වේ මොකටද? මොකද, අද ගෙන එන සංශෝධනයන්ගෙන් මේ පනත්වල අන්තර්ගතය මොන විධියට වෙනස් වනවාද කියලා අපි දන්නේ නැහැ. [බාධා කිරීමක්] ඒ pass කරපු ටික තමයි ගරු ඇමතිතුමනි. ඒක සංශෝධනය හැටියට ගෙනැල්ලා උපදේශක කාරක සභාවේ කථා කළා. අපි වචනයෙන් වචනය ඇහුවා. ඒ සංශෝධනය සම්මත කර ගන්න නම් අද මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්නේ, එය ඉදිරිපත් කළාට කමක් නැහැ. ඒ සංශෝධනයට අමතරව තවත් සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. ඔබතුමා කථා කළේ ඒවා දැක්කේ නැතිවද? සංශෝධනයට තවත් සංශෝධන තිබෙනවා. ඒ නිසා මේවා ගැන අපි ඔබතුමන්ලාට මෙතැන දී කථා කරලා වැඩක් නැහැ. ආණ්ඩුව හොඳට තමන්ගේ වැඩේ කර ගෙන යනවා. ඒකට ඕනෑ විධියට සංශෝධනත් හදා ගන්නවා. තුනෙන් දෙකේ බලයක් තිබෙන නිසා අතත් උස්සා ගන්නවා. නමුත් අපට තිබෙන ප්‍රශ්නය මේකයි. මේ මුදල් අමාත්‍යාංශයේ, මේ ආර්ථිකයේ, මහ බැංකුවේ, භාණ්ඩාගාරයේ සියලු පව්වලට වන්දි ගෙවන්නේ මේ රටේ ජනතාවයි.

ලෝක ආර්ථික අර්බුදයක් තිබෙනවා, ඒ නිසා තෙල් මිල වැඩි කරන්න ඕනෑ කියලා ඔබතුමන්ලා කිව්වාම "හා" කියනවා. තෙල්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මිලට විදුලි බිල ගළපන්න ඕනෑ කිව්වාම ඒකටත් "හා" කියනවා. විදුලි බිලත් එක්ක තව මොකක් හරි ගළපන්න ඕනෑ කිව්වාම ඒකටත් "හා" කියනවා. මේ අත උස්සලා සම්මත කරන දේවලට වන්දි ගෙවන්නේ මේ රටේ ජනතාවයි. අපට තිබෙන ප්‍රශ්නය හෘදය සාක්ෂියට අනුව අපට මේවායේ කොටස්කාරයෝ වන්න බැරි එකයි.

අය වැය ලේඛනය සම්මත වුණාට පස්සේ ඒකට අවශ්‍ය නීති හදා ගන්න සංශෝධන ගෙන එන එක ගැන අපට ගැටලුවක් නැහැ. හැබැයි, උපදේශක කාරක සභාවේ ඒ ගැන කථා කරනකොට මේ සම්පූර්ණ සංශෝධන අපට දෙන්න බැරි මොකද? අපි උපදේශක කාරක සභාවේ සාකච්ඡා කරලා, අද විවාද කරන්නේ ඒ සංශෝධන නේ. ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමනි, මම කියන දේ තේරෙනවා නේද? හැබැයි, ඒ සංශෝධනයට තවත් සංශෝධන අද උදේ ගේනවා. ඒක සාකච්ඡා කරන්නේ කවුද?

ඒ කාරණාව එහෙම තිබේද්දී ඇත්තටම අද ආර්ථිකය තුළ තිබෙන තත්ත්වය මොකක්ද? අද රටේ බරපතළ ආර්ථික අර්බුදයක් තිබෙන බව අපි කවුරුත් දන්නවා.කොටස් වෙළෙඳ පොළ අර්බුදයට ගිහිල්ලා තිබෙනවා. මූල්‍ය සමාගම් අර්බුදයට ගිහිල්ලා තිබෙනවා. විදේශ වත්කම් සංචිතයේ හිඟයක් තිබෙනවා. මේ අර්බුද ගැන පී.බී. ජයසුන්දර මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා කියනවා "බය වන්න එපා, ඉතා ඉක්මනින් ඩොලරය රුපියල් 125ට එනවා" කියලා. පී.බී. ජයසුන්දර ලේකම්තුමා කියන්නේ එහෙමයි. එතුමා එහෙම කියන්නේ අවුරුදු 15ක් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට ඉඳලායි. අවුරුදු 15ක් තුළ එතුමාගේ ආර්ථික කළමනාකරණයේ ප්‍රතිඵලය අනුව තමයි, රුපියල් 110ට තිබුණ ඩොලරය අද රුපියල් 130ට පල්ලම් බහින්නේ.

රුපියල බාල්දු වෙනවා. රුපියලේ අගය කඩා වැටෙනවා. ඉන්ධන මිල නඟිනවා. බස් ගාස්තු නඟිනවා. විදුලි බිල නඟිනවා. දැන් මේ මාසයේ විදුලි බිල එන්නේ වැඩි වූ ඉන්ධන මිලට සියයට 30ක් ගැළපිලා; වැඩි වෙලා. එහෙම තත්ත්වයක් තිබෙන වෙලාවේ අපේ හිටපු ආර්ථික විද්‍යා දේශක බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියනවා, -ජාතියේ වාසනාවටද, අවාසනාවටද දන්නේ නැහැ එතුමාම තමයි අධ්‍යාපන ඇමතිතුමාත්- "එක පුද්ගලයෙකුට රුපියල් 2,500කින් මාසයක් කාලා බීලා ජීවත් වෙන්න පුළුවන්" කියලා. එතුමා ඒක කියලා නිකම් ඉන්නෙත් නැහැ. එතුමා අභියෝගයකුත් කරනවා, "පුළුවන් නම් මේ ගැන මාත් එක්ක විවාද කරන්න එන්න" කියලා. එතුමාත් එක්ක විවාද කරන්න එන්න කිව්වාට පස්සේ, අපට ඉතින් තව දේවල් තිබෙනවා කියන්න. ඒක භාර නොගත්තොත් එතුමා කියනවා, "ඔන්න කවුරුවත් ඒක භාර ගත්තේ නැහැ" කියලා. ඒ හින්දා දැන් අපත් ලෑස්තියි ඒ විවාදයේ අභියෝගය භාර ගන්න. හැබැයි එතුමා මේක කියන්නේ කොහොමද කියලා අපි හිතමු. එතුමා මේ කියන කාරණය ඕනෑ කෙනෙකුට තේරෙනවා. හඳට, "ඉර" කියලා කිව්වොත් එහෙම ඒක කවුරුවත් පිළිගන්නේ නැහැ නේ. මොකද කවුරුත් දන්නවා ඒක හඳ කියලා.

දැන් අප ජීවත් වෙන මේ ලංකාවට, මේක ලංකාව නොවෙයි, වෙන නමක් තිබෙන්නේ" කියලා කිව්වොත් එහෙම කවුරුත් පිළිගන්නේ නැහැ. මොකද මේ රටේ ඉන්න කෝටි දෙකකට ආසන්න ජනතාව දන්නවා මේක ලංකාව කියලා. ඉස්කෝලේ යන පුංචි දරුවාත් ඒක දන්නවා. බන්දුල ගුණවර්ධන ඇමතිතුමාත් ඒක දන්නවා. ඒ වාගේ දන්නා පරම සත්‍යයක් තමයි එතුමා මේ බොරු කරන්න යන්නේ. එතුමා කියනවා රුපියල් 83.33කින් මනුස්සයෙකුට කාලා බීලා දවසක් ජීවත් වෙන්න පුළුවන් කියලා. එතකොට රුපියල් 83.33කින් ජීවත් වෙන විදිය එතුමා රටට කියන්න ඕනෑ. එතුමා කියන්නේ නොමැරී ජීවත් වෙන්න. එතකොට තුන් වේලම කන්න ඕනෑ නැහැ කියලාත් තර්ක කරන්න පුළුවන්. එතුමාට කියන්න පුළුවන් දවසක් ඇර දවසක් කෑවාම ඇතිය කියලා. එතුමාට කියන්න පුළුවන් මාසේ දවස් 30ම නොවෙයි කන්න ඕනෑ, නොමැරී ඉන්න නම් දවස් 15ක් විතර එක වේලක් කෑවත් ඇති කියලා. මම හිතන්නේ නැහැ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා වාගේ කෙනෙක් ඒ තරම් තකතීරු, මෝඩ කථාවක් කියයි කියලා. මොකද එතුමාට ඊට වඩා දැනුමක් තිබෙනවා; ඊට වඩා නුවණක් තිබෙනවා. අඩු තරමේ එතුමා ළමයින්ට ආර්ථික විද්‍යාව උගන්වපු දැනුමවත් තිබෙනවා. එහෙම නැත්නම් එතුමා මහජන එක්සත් පෙරමුණේ හිටපු කාලයේ වමේ දේශපාලනය ගැන කථා කරපු හැඟීමවත් ඇතිය කියලා මම විශ්වාස කරනවා. එතුමා ඒ තරම්ම ගොන් අදහසක් රටට කියයි කියලා මම හිතන්නේ නැහැ.

ග්‍රීසියේ හිටපු ඩයෝජිනිස් ජීවත් වුණා වාගේ අද මේ රටේ දුක් විඳින මිනිස්සුන්ට ජීවත් වෙවී ඉන්න කියලා බන්දුල ගුණවර්ධන ඇමතිතුමා යෝජනා කරයි කියලා මා හිතන්නේ නැහැ. ඩයෝජිනිස් ජීවත් වෙච්ච විදියක් තිබෙනවා නේ. ඔහු පීප්පයක් ඇතුළේ නිරුවතින් ජීවත් වුණා. එතකොට නොමැරී ඉන්න නම් ඇත්තටම ඉගෙන ගන්න ඕනෑ නැහැ. එතකොට අධ්‍යාපන ඇමතිතුමා මේ රටේ ළමයින්ට කියයිද නොමැරී ඉන්න ඕනෑ නිසා පාසල් යන්න එපා කියලා? එහෙම කියන්නේ නැහැ නේ ඇමතිතුමනි? අපේ අධ්‍යාපන ඇමතිතුමා මේ රටේ ළමයින්ට එහෙම කියන එකක් නැහැ නේ? නොමැරී ඉන්න ඕනෑකම නිසා ඉගෙන ගන්න යන්න ඕනෑ නැහැ, ඇවිදින්න යන්න ඕනෑ නැහැ, ගමන් බිමන් යන්න ඕනෑ නැහැ, ඇඳුම් අඳින්න ඕනෑ නැහැ, නිරුවතින් හිටියත් ජීවත් වෙන්න පුළුවන්. නිරුවතින් හිටියාට මැරෙන්නේ නැහැ නේ. ඒක ඇත්ත. නොමැරෙන නිසා නිරුවතින් ඉන්න පුළුවන් කියලා එතුමා කියයි කියලා මා හිතන්නේ නැහැ. [බාධා කිරීමක්] ඔව්, කොණ්ඩය කපන්නේ නැතිව හරි. ඔබතුමා කියනවා වාගේ නේද? ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා කියනවා කොණ්ඩය කපන්නේ නැතිව හිටියාට මැරෙන්නේ නැහැ කියලා. ඇත්ත. එතුමාට කොණ්ඩය නැහැ නේ. ඉතින් එතුමා කියනවා කොණ්ඩය කපන්නේ නැතිව ඉන්න පුළුවන් කියලා. ඒක ඇත්ත. ෆීලික්ස් පෙරේරා ඇමතිතුමාට කොණ්ඩය කපන ගාස්තුවක් යන්නේ නැහැ. ඉතින් මා හිතනවා බන්දුල ගුණවර්ධන ඇමතිතුමාටත් මෙහෙම හිතුවොත් එහෙම කරන්න පුළුවන් කියලා.

ඇත්තටම මෙන්න මේ විදියට හිතුවොත් ඔය රුපියල් 2,500ත් ඉතුරු කර ගන්න පුළුවන්. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ආර්ථික මධ්‍යස්ථානයකට ගියොත් එහෙම එළවලු ටික හම්බ වන්නේ නොමිලේ නම්,- [බාධා කිරීමක්] ඔව්, දත් මදින්නේ නැතිව හිටියත් ඉන්න පුළුවන් නේ. හැබැයි ඉන්න බැහැ, දත් තිබෙනවා. [බාධා කිරීමක්] නා ගන්නත් ඕනෑ. හවසට shot එකක් දමා ගන්නත් ඕනෑ. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා ආර්ථික මධ්‍යස්ථානයකට ගියාම -ආර්ථික මධ්‍යස්ථාන හදපු නිසා- එතුමාට එළවලු ටික හම්බ වන්නේ නොමිලේ නම්, එතුමා හෝටලයකට ගියොත් කන්න ටික හම්බ වන්නේ නොමිලේ නම්, එතුමාගේ වාහනයට තෙල් ටික ගහන්නේ ආණ්ඩුවෙන් නම්, එතුමාගේ දුරකථන බිල ගෙවන්නේ පාර්ලිමේන්තුවෙන් නම්, එතුමාට ගෙවල් කුලී ගෙවන්න ප්‍රශ්නයක් නැත්නම් එතුමාට ඉතින් ඇත්තටම රුපියල් 2,500 ඉතිරියි තමයි. එහෙම ගත්තොත් ඒක හරි. මේ රටේ ජනතාවට ඒ පහසුකම නැහැ. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා තමන්ගේම වූ පෞද්ගලික අත් දැකීමෙන් මේක කියනවාද කියලා මා දන්නේ නැහැ. එහෙම ගත්තොත් ඇත්තටම එතුමා වාගේ ජීවත් වෙනවා නම් අනික් අයට රුපියල් 2,500 යන්නේ නැහැ. මේ රටේ ආර්ථික විද්‍යාව ඉගෙන ගත්ත, උගන්වපු, ඒක විෂයයක් හැටියට ජනතාවට කියා දුන්න බන්දුල ගුණවර්ධන මැතිතුමා වාගේ වැදගත් ඇමතිවරයෙක් ඒ තරම් තකතීරු කථාවක් කියයි කියලා මා හිතන්නේ නැහැ. ඩයෝජිනිස් ග්‍රීසියේ ජීවත් වෙච්ච විදියට පීප්පයක් ඇතුළේ නිරුවතින් ජීවත්

වෙන්න කියලා බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මේ රටේ ජනතාවට කියයි කියලා මා හිතන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේක කියන්නේ සාමාන්‍ය කෙනෙක් නොවෙයි, කැබිනට් ඇමතිවරයෙක්. නිකම් කෙනෙකුත් නොවෙයි. රටේ අධ්‍යාපන ඇමතිවරයා. ඒ නිසා අභියෝගය භාර ගන්න අපි ලැහැස්තියි. එක පුද්ගලයෙක් මාසයක් රුපියල් 2,500කින් ජීවත් වන විධිය; එහෙම නැත්නම් දවසක් රුපියල් 83.33කින් ජීවත් වන විධිය මේ රටට කියන්න ඕනෑ. නැතුව මේ විහිළුව හැම දාම කරන්න බැහැ. එතුමා හිතනවාද දන්නේ නැහැ, වීරවංශ ඇමතිතුමා කිව්වාට වඩා වැඩියෙන් හිනා යන කථාවක් කියලා වීරයෙක් වන්න. ඊට වැඩියෙන් ලොකු joke එකක් කළොත් කාටුන්කාරයෝ වීරවංශව අතහැරලා මාව බදා ගනියි කියලා හිතුවාද දන්නේ නැහැ. එහෙම හිතලා ජනප්‍රිය වන ක්‍රමයකට තේරුවාද කියා අප දන්නේ නැහැ. කොහොම වුණත් බන්දුල ගුණවර්ධන ඇමතිතුමා එහෙම විහිළු සපයන කෙනෙක් කියා මම හිතන්නේ නැහැ. එතුමා මේක කියන්න ඇත්තේ බොහොම විශ්වාසයෙනුයි. ඒ නිසාම අපත් ලැහැස්තියි, අභියෝගය භාර ගන්න; එතුමා කැමැති මාධ්‍යයකට එන්න. කැමැති විධියකට අපි මේ සාකච්ඡාව කරමු.

රුපියල් 2,500 කින් ජීවත් වන්න පුළුවන්ය කියා බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියන මේ ආර්ථිකයේ ඇත්ත තත්ත්වය මොකක්ද? අපි ඔබතුමන්ලා කවුරුත් හෘදය සාක්ෂිය අනුව ඒක දන්නවා. මොකක්ද? නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය ගෙනල්ලා මුළු ලෝකයම නතර වුණු තැනක් තිබෙනවා. ලෝකයේ දියුණු යයි සම්මත වුණු, ණය දෙනවා කියපු රටවලට අද අපට ණය දෙන්න බැහැ. බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඊයේ-පෙරේදා කියලා තිබුණා, අපි යුරෝපයටත් ණය දෙමු කියා. එතුමාත් කල්පනා කළාද දන්නේ නැහැ, එතුමා කාටුන්කාරයන්ගෙන් මහ හැරිලා තිබෙන නිසා GSP Plus අපට නොදුන්නු යුරෝපයට ණය දෙනවා කිව්වාට පසු අඳියි කියා. තැචර් නෝනලාගේ පසුපස අපි ගියා ණය ගන්න. සර්කෝස්ලාගේ පසු පස අපි ගියා ණය ගන්න. දැන් ඒ රටවලටත් ණය දෙමුයි කියලා කියනවා. නමුත් ඇත්ත තත්ත්වය මොකක්ද? අද ලෝකය පුරා දැවැන්ත ආර්ථික අර්බුදයක් තිබෙනවා. ලෝකයේ කොටස් වෙළෙඳ පොළවල් පවත්වාගෙන යන්න බැරි අර්බුදයක් තිබෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදයේ පවා ඩොලර් ට්‍රිලියන ගණනක අය වැය හිඟයක් තිබෙනවා. එහෙම තිබෙන ආර්ථික අර්බුදයේ ප්‍රවාහය අපේ රටවලට කඩාගෙන ඇවිත් තිබෙනවා. එදා 1997 මැලේසියාව, අග්නි දිග ආසියාව, තායිලන්තය ආදී රටවලට ඒ අර්බුදය එන විට අපට ආවේ නැහැ. ඒ අර්බුදය අපට ආවේ නැත්තේ අපේ ආර්ථිකය බොහොම හැකිළිලා පුංචි තත්ත්වයක තිබුණු නිසයි. නමුත් අපේ අර්ථිකයත් මූල්‍ය වෙළෙඳ පොළට ගියා; කොටස් වෙළෙඳ පොළට ගියා; මූල්‍ය සමාගම් අතරට ගියා.

ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා ඒ උදාහරණය අරගෙන කිව්වා. මෙතුමා වාණිජ බැංකුවල වර්ධනය ගැන කිව්වා. කලින් 1000කට 6ක් තිබුණා, දැන් 1000කට 11ක් තිබෙනවා කියා. ඒක වෙන්න පුළුවන්. උතුරු නැඟෙනහිරත් ඊළාම් බැංකු වෙනුවට පෞද්ගලික වාණිජ බැංකු පටන් ගත්තා. නමුත් ඇමතිතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ මූල්‍ය වෙළෙඳ පොළේ මුදල් සංසරණය වුණාට, ලීසිං සමාගම්වල මුදල් සංසරණය වුණාට, රක්ෂණ සමාගම්වල මුදල් සංසරණය වුණාට, වාණිජ වෙළෙඳ පොළේ මුදල් සංසරණය වුණාට ඒ සංසරණය වන මුදලින් අලුතින් දෙයක් මවන්නේ නැහැ; අලුතින් දෙයක් උපදවන්නේ නැහැ. අලුතින් දේ උපදවන්නේ භූමියෙන්. නිෂ්පාදන ආර්ථිකය ඇතුළත. නිෂ්පාදන ආර්ථිකය ඇතුළත උපදවන දේ තමයි වාණිජ ආර්ථිකය ඇතුළත මූල්‍ය වෙළෙඳ පොළ ඇතුළත සංසරණය කරන්නේ. කොටස් වෙළෙඳ පොළේ ආදායම මොකක්ද? [බාධා කිරීමක්] සමා වන්න. ඇමතිතුමනි, මටත් පොඩි වෙලාවක් තමයි තිබෙන්නේ. ඔබතුමාගේ කොණ්ඩේ වාගේ තමයි මගේ වෙලාව. පොඩ්ඩයි තිබෙන්නේ. ඒ නිසා මේක ඉවර කරන්න දෙන්න. මේ මූල්‍ය වෙළෙඳ පොළේ සංසරණය වන මුදල් එක් කෙනෙක්ගෙන් තව කෙනෙක් අතට යන්න පුළුවන්. ආණ්ඩුව දඩයක් ගැහුවා කියා හිතමු. දඩයක් ගහලා ආණ්ඩුව සල්ලි ටික ගත්තාට පසු ඒ දඩය ගහපු මනුෂ්‍යයාට වියදම් කරන්න තිබෙන සල්ලි ටික තමයි ආණ්ඩුව ගන්නේ. ඒක ඒ මනුෂ්‍යා වියදම් කළත් ආර්ථිකය ඇතුළත තිබෙන්නේ එක පංගුවයි. දඩය ගහපු කෙනා වියදම් කළත් එච්චරයි. දඩයක් ගහලා ඒක ණයට කිරුළට වියදම් කළයි කියා ආර්ථිකයට අලුතින් යමක් උපදින්නේ නැහැ. ඩිව් ගුණසේකර ඇමතිතුමා මේක දන්නවා. නිෂ්පාදන ක්‍රියාවලිය ඇතුළත තමයි අලුතින් යමක් උපදින්නේ.

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)
ඒක ආයෝජනය කළාම?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක ආයෝජනය කළාම මොකක්ද වන්නේ? ඒක ආයෝජනය කළාම නැවත මූල්‍ය වෙළෙඳ පොළේ සංසරණය වුණත් මුදල් විතරයි සංසරණය වන්නේ. නිෂ්පාදනය කොටස් වෙළෙඳ පොළේ සංසරණය වන්නේ නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා ඉන්න. නිෂ්පාදනය එහෙම සංසරණය වන්නේ කොහොමද? අන්න එහෙම තිබෙන නිසා තමයි අපේ වෙළෙඳ ශේෂය සෘණ වන්නේ. වෙළෙඳ ශේෂය සෘණ වන විට මේක තේරෙනවා. අපේ ජී.එල්. පීරිස් ඇමතිතුමා දන්නවා, 2011 ජනවාරි සිට දෙසැම්බර් වන තුරු අපේ අපනයන තිබුණේ ඩොලර් මිලියන 10,486.9යි කියා. මම කියන්නේ මහ බැංකු වාර්තාව -මහ බැංකුව නිකුත් කරපු නිවේදනය- අනුවයි. එතකොට අපේ ආනයන ඩොලර් මිලියන 20,230.1යි. අපනයන වර්ධනය සියයට 22.4යි. ආනයන වර්ධනය සියයට 50.4යි.

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
ඒ මොනවාද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම කියන්නම්. නිකම් නොවෙයි. ඔබතුමා වාඩි වන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා වෙළෙඳ ශේෂය කීයද? වෙළෙඳ ශේෂය සියයට 99.6යි. 2011 ජනවාරි මාසයේ ඉඳලා දෙසැම්බර් මාසයේ 31 වන තුරු වෙළෙඳ ශේෂය සෘණ ඩොලර් මිලියන 9,743.2යි.

ප්‍රශ්නය මේකයි. අපනයන වාගේ දෙගුණයක් ආනයන වැඩි වන කොට ඒ ආනයන අපනයන පරතරය -වෙළෙඳ ශේෂය- පියවන්න යන කොට ඔබතුමාට මොකද වෙන්නේ? ඔබතුමාට සිද්ධ වනවා, ණය ගන්න. නැතුව මුදල් මවන්න බැහැ නේ. මවන්න බැහැ. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා හැම තිස්සේම කියනවා වාගේ බියගම තියෙන සල්ලි machine එකෙන් සල්ලි අච්චු ගහන්න බැහැ. අපි ඩොලර් ගන්න රුපියල් අච්චු ගහලා රුපියල් ඩොලර්වලට හරවන්න බැහැ. මොකද මුදල් කියන්නේ භාණ්ඩ හුවමාරු මාධ්‍යයක් මිසක මුදල් හුවමාරු මාධ්‍යයක් නොවෙයි. රුපියල්වලින් ඩොලර් මිලදී ගන්න බැහැ. එහෙම නම් අපට පුළුවන් නේ අපේ machine එකෙන් පුළුවන් තරම් මුදල්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

නෝට්ටු ගහලා ගෙනිහිල්ලා "ඩොලර් දීපන්" කියලා කියන්න. එහෙම බැහැ. ලෝකයේ කොහෙන් හරි ඩොලරයක් ගේන්න ඕනෑ නම් ඒ ඩොලරය ගේන්න අපි අනිවාර්යයෙන් නිෂ්පාදනය කරන්න ඕනෑ. අපේ රටේ භාණ්ඩ හදන්න ඕනෑ. අපේ නිෂ්පාදන ක්‍රියාවලිය ඇතුළේ විතරයි අලුතින් වටිනාකම් උපදවන්න පුළුවන්. නැතිව බියගම තියෙන සල්ලි අච්චු ගහන machine එකට බැහැ, අපේ ආර්ථික අර්බුදය විසඳන්න. එහෙම වුණොත් වෙන්නේ උද්ධමනාකාරී තත්ත්වය වැඩි වන එකයි. රටේ මුදල් සැපයුම වැඩි කරන්න පුළුවන්කම තියෙන්නේ භාණ්ඩ හුවමාරු වන වාර ගණනට විතරයි. ඒක පරම සත්‍යයක්. ඒක මුළු ලෝකයේම තියෙන සත්‍යයක්. ඒක බන්දුල ගුණවර්ධන ඇමතිතුමාත් දන්නවා; ජී.එල්. පීරිස් ඇමතිතුමාත් දන්නවා. භාණ්ඩ හුවමාරු වන වාර ගණන අනුව විතරයි මුදල් හුවමාරු කරන්න පුළුවන්. භාණ්ඩ හුවමාරු වන වාර ගණනට වඩා වැඩියෙන් මුදල් හුවමාරු කරනවා කියන්නේ උද්ධමනයක්.

දැන් සිම්බාබ්වේ ගන්න කෝ. පෝර උරයක මුදල් ගෙනිහිල්ලා ෂොපින් බෑග් එකක භාණ්ඩ ගේන්න පුළුවන්. පෝර උරයක සල්ලි පුරවාගෙන ගියත් ඒ ප්‍රමාණයට භාණ්ඩ ගේන්න බැහැ. ඉතින් අපට මුදල් අච්චු ගහන්න බැහැ. අපේ රටට ණය දෙන්නේත් නැත්නම්, ණය වාරණයන් එනවා නම්, ණය සීමා එනවා නම්, ණය මතම ජීවත් වන්න බැරි නම්, බදු මතම ජීවත් වන්න බැරි නම්, දඩ මතම ජීවත් වෙන්න බැරි නම් අපේ ආර්ථිකයේ තිබෙන මේ අර්බුදයට උත්තර තියෙන්නේ කොහේද? දැන් අපේ පී.බී. ජයසුන්දර ලේකම්තුමා හිතනවා ඇති හෙට අනිද්දාට ඩොලරය 125 වෙනවාය කියපු ගමන්ම පිට රටවල්වල ඉන්න කට්ටිය සල්ලි ටිකක් එවයි කියලා. එහෙම නේ හිතන්නේ. එතුමා පත්තරවලටත් ඒ ගැන කියලා තිබුණා. එදා උපදේශක කාරක සභාවේදීත් කිව්වා, "අජිත් නිවාඩ් කබ්රාල් මහත්තයා කියන්න ඕනෑ එකක් මම කිව්වේ. මොකද, එහෙම වුණාම සල්ලි ටිකක් එවයි." කියලා. එහෙම තාවකාලික හීනවලින් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. අර කියනවා නේ "වළකට වැටෙන එක මොළයට හොඳයි" කියලා. දැන්වත් ඒක තේරුම් ගන්න ඕනෑ.

දැන් මේ මුලා වෙළෙඳ පොළේ කරපු සූදුව නිසා, මේ කොටස් වෙළෙඳ පොළේ සූදුව නිසා ඔබතුමන්ලාගේ විදේශ වත්කම් සංචිතයේ තිබුණු සල්ලි කොටස් වෙළෙඳ පොළට දාලා, අර්ථ සාධක අරමුදලේ තිබුණු සල්ලි කොටස් වෙළෙඳ පොළට දාලා, ආසියාවේ වේගවත්ම කොටස් වෙළෙඳ පොළ අපට තියෙනවාය කියන කීර්ති නාමය - credit එක - ගන්න ගියා. හම්බ වුණා නේ. කීර්ති නාමය හම්බ වුණා. පසු ගිය දවස්වල වාර්තා කළා, අපි තමයි ආසියාවේ වේගවත්ම කොටස් වෙළෙඳ පොළ කියලා. ඉතින් ඒ ගෞරවය තියා ගන්න පුළුවන් වුණේ කොච්චර දවසක්ද? අපි කියන්නේ ඒකයි. ඒ ගෞරවය හැම දාම තියා ගන්න. කමක් නැහැ. ඒ ගෞරවය ශ්‍රී ලංකාවට දෙන්න, තියා ගන්න. ඒක ආසියාවේ වේගවත්ම කොටස් වෙළෙඳ පොළ කරන්න නම්, ආසියාවේ වේගවත්ම නිෂ්පාදන ආර්ථිකය බවට මේ ආර්ථිකය හරවන්න ඕනෑ. නිෂ්පාදන ආර්ථිකය වේගවත්ම ආර්ථිකයක් බවට හරවන්නේ නැතිව කොටස් වෙළෙඳ පොළ හැදුවාට වැඩක් නැහැ. දැන් මෙතුමා කියනවා නේ ආනයනය කළාය කියලා. ඒක ඇත්ත.

මහ බැංකු වාර්තාවේම තියෙනවා, වැඩිම ආනයනයන් කරලා තියෙන්නේ මොනවාටද කියලා. "මෝටර් රථ සහ මෝටර් බයිසිකල් ආනයන වියදම 2010 වසරේ වාර්තා වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 546ට සාපේක්ෂව 2011 වසරේදී එක්සත් ජනපද ඩොලර් මිලියන 1,001 දක්වා වැඩි වීමට දායක විය" කියා තිබෙනවා. ඒ කියන්නේ මෝටර් වාහන ගෙන්වන්න දක්වපු දායකත්වය සියයට 76ක්. පසු ගිය අවුරුද්ද ගත්තොත් එය සියයට 76ක්. ප්‍රශ්නය තියෙන්නේ මෙතැනයි. ඒ මෝටර් වාහන ගෙනැල්ලා ඒක නිෂ්පාදනය ක්‍රියාවලියට යොදවන්න ඕනෑ. අධිවේගී මාර්ගය හැදුවා නේ. ඒක හොඳයි. හැබැයි අධිවේගී මාර්ගයේ කොට්ටාවේ ඉඳලා කෙනෙක් විනෝද ගමනක් ගියොත් මොකද වෙන්නේ? අධිවේගී මාර්ගයේ කොට්ටාවේ ඉඳලා කෙනෙක් මළ ගෙදරක ගියොත් මොකද වෙන්නේ? අධිවේගී මාර්ගයේ මළ ගෙදරක ගියාය කියලා ඒක නිෂ්පාදන ක්‍රියාවලියට දායකත්වයක් වෙන්නේ නැහැ. හැබැයි අධිවේගී මාර්ගයේ අර නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමන්ලාගේ ගමේ ඉඳලා කිරි හට්ටි කන්ටේනරයක් ගෙනැල්ලා වරායෙන් පැටෙව්වොත් එහෙම මොකද වෙන්නේ? ඒක නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වෙනවා. කිරි හට්ටි කන්ටේනරයක් ගේන්න ඕනෑ. මේකේ වෙන්නේ ඒක නොවෙයි. අධිවේගී මාර්ගයේ ගේන්නේ පරණ ලෑලි කන්ටේනරයක්. ඒකට යට වෙලා මනුස්සයෙක් මැරෙනවා. ඉතින් පරණ ලෑලි කන්ටේනරය දෙයියනේ පරණ පාරේ ගේන්නත් පුළුවන්. ඕක අලුත් පාරේම ගේන්න කියලා එකක් නැහැ. ජොලියටත් එක්ක වාහනය අලුත් පාරට දමනවා. දාලා, පාරේ ලොරිය කඩා ගෙන වැටිලා මිනිස්සු මැරෙනවා.

මේ දවස්වල ඇමතිතුමන්ලාට දීලා තිබෙනවා, තව ගංජා පාරක්. මේ ආණ්ඩුවෙන් තවත් අලුත් වැඩක් පටන් ගෙන තිබෙනවා. මොකක්ද? "ගමකට වැඩක්". මම කියන්නේ මේක ඇත්තටම "ගමකට වැඩක්" නොවෙයි, "ඇමති කෙනෙකුට වැඩක්". ඇයි? ගමකට වැඩක් කියලා දෙනවා, රුපියල් මිලියනයක්. ඇමතිතුමනි, රුපියල් ලක්ෂ දහයක් නේද දෙන්නේ?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඔව්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
රුපියල් ලක්ෂ 10ක් එක ගමකට දෙනවා කියලා නේ කියන්නේ. ඒ, රුපියල් මිලියනයක් නේ. එතකොට ග්‍රාම නිලධාරි වසම් 14000ක් තිබෙනවා. රුපියල් මිලියන 14,000ක් බෙදුවා කියන්නකෝ. එතකොට අධිවේගී මාර්ගය හදන්න වැය වුණේ කොච්චරක්ද? රුපියල් මිලියන 90,000ක්. ඔබතුමන්ලා එක් ග්‍රාම නිලධාරි වසමකට ලක්ෂ 10යි කියලා පත්තරේ දැන්වීම් දමනවා; බැනර් දමනවා; පෝස්ටර් ගහනවා; හැම මන්ත්‍රී කෙනෙක්ම ගිහිල්ලා විවෘත කරන උත්සවයක් තියනවා. ඒ වැඩ ටික කරනවා. මේ වැඩ පිළිවෙළේ ඒ පුංචි කාලයට හරි ජොලියක් තිබෙනවා. මේ වැඩ පිළිවෙළින් මුළු රටටම වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 14,000යි. දක්ෂිණ අධිවේගී මාර්ගයට විතරක් වැය කරලා තිබෙනවා, රුපියල් මිලියන 90,000ක්. එතකොට රුපියල් මිලියන 90,000ක් වැය කර හදපු පාර අරගේ නිකම් ළත වෙනවා; රටේ නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වන්නේ නැහැ. ඒක සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ වන්නේ නැහැ. ඒක දායක වන අතුරු නිෂ්පාදන ඵලයක් නැහැ. ඒක එහෙම තියෙද්දී ගමක සන්දර්ශනයක් දමනවා.

**ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)
නැහැ, නැහැ. ඒ සංවර්ධනය රටට යනවා නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගමේ සන්දර්ශනයක් දමනවා. මේ ආනයන වියදම් වැඩි වුණාට කමක් නැහැ. ආනයන වියදම් වැඩි වන්න ඕනෑ, ඒක සංවර්ධන ක්‍රියාවලියත් එක්ක සම්බන්ධ වෙලා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
අධිවේගී මාර්ග නිසා අද ගමනකට යන කාලය පැය දෙකක් විතර අඩු වනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
කාලය අඩු වනවා. ඒක මමත් පිළිගන්නවා. අන්න හරි. මම කියන්නේ ඇමතිතුමනි, ඒ අඩු වන කාලය-

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒකෙන් මන්ත්‍රීතුමා, මාළු ටික, එළවලු ටික වෙලාවට ගෙනෙනවා නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක හරි. ඉන්න කියන්න. ඒ ඉතිරි වන කාලය වෙන මොකකටද යොදවන්නේ? ඒ කාලයේ යෙදෙන ක්‍රියාවලිය මොකක්ද? අද වරාය හදනවා, නැව් එන්නේ නැහැ. තාප බලාගාර හදනවා, විදුලිය නැහැ. එහෙත් ක්‍රීඩාංගණ හදනවා, matches නැහැ. නෙළුම් පොකුණ හදනවා, එතැන කලාකාරයෝ ළත වනවා, ඒකේ පෙන්වා ගන්න සල්ලි නැහැ. ඉතින් මේක තේ ඇත්ත ප්‍රතිඵලය. ආනයන වියදම වැඩි වෙලා අවසානයේ ණය බර පැටවෙනවා, ජනතාවගේ කරට. [බාධා කිරීමක්]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නෙළුම් පොකුණට ණය නොවෙයි, ආධාරයක් හම්බ වුණා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හරි, හරි. අද ඇත්ත ප්‍රතිඵලය මොකක්ද? අද ඇත්ත ප්‍රතිඵලය මේකයි. අන්න විදුලිබල මණ්ඩලයේ සේවකයෝ කියනවා, "අපට හිඟ වැටුප දුන්නේ නැති වුණොත් එහෙම අවුරුද්දට කළුවරේ ඉන්න පුළුවන්" කියලා. CTB එකේ සේවකයෝ කියනවා, "අපේ වැටුප වැඩි කරපු එක දීපල්ලා, නැත්නම් බස් වර්ජනය කරනවා" කියලා. වරායේ කට්ටිය කියනවා, "දස මාසයක හිඟ වැටුප දීපල්ලා, අපට අවුරුදු කන්න විධියක් නැහැ" කියලා. ඒකට දෙන උත්තරය මොකක්ද? එතකොට මෙතැන තිබෙන ප්‍රශ්නය අන්න ඒකයි. වරාය කියන්නේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වෙච්ච තැන. එතැන ඉන්න මිනිසුනට මාස දහයක හිඟ වැටුප දීලා නැත්නම් ඒකට උත්තරයක් සොයන්න ඕනෑ. විදුලිබල මණ්ඩලය කියන්නේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වන තැන. එතැන ඉන්න සේවකයන්ගේ හිඟ වැටුප් ගෙවලා නැත්නම් ඒකට උත්තරයක් හොයන්න ඕනෑ. සිංහල-හින්දු අලුත් අවුරුද්දට කළුවරේ ඉන්න බලා ගෙන ඉඳලා හරි යන්නේ නැහැ. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා වාගේ පුරසාරම් දොඩවලා හරි යන්නේ නැහැ. පී.බී. ජයසුන්දර මහත්තයා වාගේ හීන දැකලා හරි යන්නේ නැහැ. එතුමා ඩොලර් එක රුපියල් එකසිය විසිපහ වෙන තෙක් බලා ගෙන ඉන්නවා අර එළුවාගේ මොකක්ද එක වැටෙන කල් බලා ගෙන සිටියා වාගේ. ඒ හින්දා අපි ඔබතුමන්ලාට කියන්නේ දැන්වත් කරුණාකරලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එළුවාගේ මොකක් වැටෙන කල්ද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මොකක්ද එක වැටෙන කල්. ඒක මේ ගරු සභාවේදී කියන්න බැහැ නේ. "වළකට වැටෙන එක මොළයට හොඳයි" කියලා කියමනක් තිබෙනවා. ඒ නිසා දැන්වත් උජාරුවට කථා කරන්නේ නැතුව මේ ආර්ථික අර්බුදය ගැන ඇත්ත තේරුම් ගන්න කියලා ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.55]

**ගරු අචල ජාගොඩගේ මහතා**
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැයෙන් සම්මත වුණු මුදල් පනතේ යෝජනාවලට අදාළ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීම ගැන පළමු කොටම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අද විවාදය අපි මුල සිටම බලා ගෙන සිටියා, එක්සත් ජාතික පක්ෂයේ පැත්තේ මන්ත්‍රීවරුන්ගෙන්වත් මේ සම්බන්ධයෙන් වූ සාධාරණ විවේචනයක් ඉදිරිපත් වෙනවාද කියලා. නමුත් කිසිවක් ඉදිරිපත් වුණේ නැහැ. මම බලාපොරොත්තු වෙලා සිටියා, අඩු තරමින් ව්‍යාපාර නියෝජනය කරන විජ්ලවචාදී මන්ත්‍රීවරුන්ට හෝ මේකට සාධාරණ විවේචනයක් ඉදිරිපත් කිරීමට පුළුවන්කමක් තිබෙනවාද කියලා. "වළකට වැටෙන එක මොළයට හොඳයි" කියන කියමන ගැන අහද්දී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට හිතෙනවා, දැන් ඒකත් වැරදිලාද කියලා. එක වළක නොවෙයි වළවල් සියයක වැටුණත් මොළේ පෑදිලා නැති බව නම් පසු ගිය කථාව දිහා බැලුවාම අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා.

අද නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කරන්නේ නැතුව රටේ ආර්ථිකය දියුණු වන්නේ නැහැයි කියලා මට කලින් කථා කළ මන්ත්‍රීවරයා කිව්වා. පසු ගිය අය වැයේ යෝජනා වෙලා තිබුණු ඉලක්ක බොහොම පැහැදිලිව ගත්තොත් ඒවා යොමු කර තිබුණේ මේ රටේ නිෂ්පාදන කර්මාන්ත වැඩි කිරීමේ දිශාවටයි කියන එක අපට පෙනෙනවා.

අද මේ සම්මත කරන පනත් කෙටුම්පත්වල අඩංගු යෝජනා ටික කියවා බැලුවා නම්, අඩු තරමින් ඒවා පිළිබඳව යම් කිසි ආකාරයක හැදෑරීමක් කළා නම් මේ ඉදිරිපත් කරන කරුණු රටේ ජාතික ආර්ථිකය ගොඩ නැඟීමේ දිසාවට මිසක වෙන මොන දිසාවටද යොමු වෙලා තිබෙන්නේ කියන එක පිළිබඳව එතුමාට තේරුම් ගැනීමේ හැකියාවක් තිබෙයි කියලා මා හිතනවා.

නිෂ්පාදන උපකරණ වැට් බද්දවලින් නිදහස් කරලා තිබෙනවා. විශේෂයෙන් ඖෂධ නිෂ්පාදනය කරන උපකරණ වැට් බද්දවලින් නිදහස් කරලා තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් කියපු නිසා එක් එක් උදාහරණවලින් මා කියන්න ලෑස්තියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඖෂධ කියන්නේ ලෝකය පුරාම තිබෙන ජාවාරමක්. පසු ගිය කාලයේ අපි විදේශවලට විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කළා, මේ රටට ඖෂධ ගෙන්වන්න. හැබැයි මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා බලාපොරොත්තු වුණා සේ අද අපි මේ රටේ ඖෂධ නිෂ්පාදනය කිරීම කෙරෙහි අවධානය

[ගරු අචල ජාගොඩගේ මහතා]

යොමු කර තිබෙන බව මේ බදු නිදහස් කිරීම හරහා පෙන්නුම් කරලා තිබෙනවා. ඒ වාගේම මේ පනත් කෙටුම්පතේ තිබෙනවා, හරිතාගාර ආචාර්යවරුන් සඳහා අවශ්‍ය වන උපාංග වැට් බදුවලින් නිදහස් කර තිබෙනවාය කියලා. මේකේ අරමුණ බවට පත් වන්නේ මොනවාද? හෙට ලෝකයේ මතු වන ආහාර අර්බුදයට ලංකාව සූදානම් කළ යුතුව තිබෙනවා. ග්‍රාමීය කෘෂි කර්මාන්තය විතරක් දියුණු කරලා ඒ කටයුත්ත කරන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ. ඒ සඳහා විද්‍යාත්මක කෘෂි කර්මාන්තය දියුණු කළ යුතුව තිබෙනවා. එම නිසා විද්‍යාත්මක කෘෂි කර්මාන්තය දියුණු කර ගත්ත, ඒ වාගේම අපනයනය සඳහා ඉලක්ක කර ගත්ත නිෂ්පාදන දියුණු කිරීම සඳහා වූ වැඩ පිළිවෙළකට අපි යන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය වන මූලික උදවු කිරීම් මේ පනත් කෙටුම්පත හරහා ගෙනැවිත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ගුවන් යානා, නැව් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියා මාර්ග සඳහා බදු සහන ලබා දෙන්න මේ පනත් කෙටුම්පත තුළින් කටයුතු කර තිබෙනවා. මා මේ ඉතාමත් කෙටියෙන් කරුණු කිහිපයක් පමණයි කිව්වේ. මේ රට ඉලක්කයක් නැතුව ගමන් කරන රටක්ය කියන තර්කය මේ ඉදිරිපත් වෙලා තිබෙන කරුණු අනුව බිඳ වැටෙනවා.

ඒ විතරක් නොවෙයි. මා විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ මේ කාරණය. මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් කථා කරනවා වෙනුවට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම ගැන තමයි එක්සත් ජාතික පක්ෂයේ මුල්ම කථිකයෝ තමන්ගේ කථාවන් තුළින් කරුණු ඉදිරිපත් කළේ. බටහිර බලවේගවලට අවශ්‍ය විධියට වැඩ කරන මහත්වරු අද උත්සාහ කරනවා, බටහිරට එරෙහි අදහස් ප්‍රමාණයක් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කටින් මේ සභාව තුළ කියවා ගන්න. එහෙම කියවා ගෙන, බටහිර රටවල පිහිටෙන් නැවත වතාවක් කෙසේ හෝ තමන්ගේ ආණ්ඩුව පිහිටුවා ගන්න පුළුවන් වෙයි කියන අදහස තමයි ඒ කථිකයින්ගේ කථාවන් තුළින් දැක්කේ.

ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී කිව්වා, - එතුමා දැන් මේ සභාවේ නැහැ. මා ඒ ගැන කනගාටු වනවා- ලංකාවට එරෙහි යෝජනා අතීතයේදී පරාජයට පත් කළා, නමුත් අද ඒක බැරි වෙලා තිබෙනවා, එය එතුමා හුඟක් කනගාටුවට ලක් වන කරුණක් බවට පත් වෙලා තිබෙනවාය කියලා. අද එතුමාට විදේශ රටවලට යන්න ලජ්ජයි ලු. එතුමාට ලජ්ජා ඇති. මොකද, එතුමන්ලා මේ රට ඇතුළේ කරන්න හදපු බටහිර ගැති උපක්‍රම අද පරාජයට පත් වෙලා තිබෙනවා. එම නිසා එතුමන්ලාට තමන් බලාපොරොත්තු වුණු ඉලක්ක සම්පූර්ණ කර ගැනීමට බැරි වීම පිළිබඳ කනගාටු ඇති කියලා මා විශ්වාස කරනවා. නමුත් අපට කනගාටුවට පත් වන්න කිසිම කරුණක් ඉතුරු වෙලා නැහැ. අද නිදහස් ස්වෛරී රාජ්‍යයක් හැටියට තිබෙන ශ්‍රී ලංකාවට එරෙහිව යෝජනාවක් ඉදිරිපත් කර ගන්න පසු ගිය කාලයේ කිසිම රටක් සොයා ගන්න බැරි වුණු තැන ලෝකයේ ප්‍රධානම අධිරාජ්‍යවාදී රට වන ඇමෙරිකාව අපට එරෙහිව යෝජනාවක් ඉදිරිපත් කළා. එක ඡන්දයකින් විතරයි අපි පරාජයට පත් වුණේ. එම නිසා අද අපට හැකියාව ලැබී තිබෙනවා, කොන්ද කෙළින් තබා ගෙන කටයුතු කරන රාජ්‍යයක් බවට ලෝකයට ඔප්පු කරලා පෙන්වන්න. ඒ වාගේම අපට අභිමානයට ලක් වන්න පුළුවන් කරුණක් ඒ තුළ ඉතුරු වෙලා තිබෙනවාය කියන එක මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. එදා තමුන්නාන්සේලා බටහිර පදයට නටද්දී අපට එරෙහිව යෝජනා සම්මත නොවුණාට, එදා බටහිර පදයට යටත් වෙලා බටහිර කියන විධියට වැඩ කරද්දී අපට එරෙහි නොවුණාට, අද අපට එරෙහි වනවාය කීම ඇතුළේම අපට පෙන්නුම් කරන්නේ, අපට එරෙහිව යෝජනා සම්මත කරන්න උත්සාහ කිරීම හරහා පෙන්නුම් කරන්නේ වෙන මොකක්වත් නොවෙයි; මේ රටේ ගමන, මේ රටේ ආර්ථික සංවර්ධනයේ ගමන, රටක් හැටියට ස්වාධීනව නැඟිටලා ඉදිරියට යන්න හදන ගමන ඉතා ශක්තිමත් බවයි, කාටවත් ගැති නොවී අපි ගමන් කරන බවයි. ඒ ගැන මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අද ඉදිරිපත් කෙරුණු පනත් කෙටුම්පත් පිළිබඳව සාකච්ඡා කරනවා වෙනුවට එක්සත් ජාතික පක්ෂය දිගටම කළේ මොකක්ද? එක්සත් ජාතික පක්ෂයට ආර්ථික ප්‍රතිපත්තියක් තිබුණාද කියන කාරණාව පිළිබඳව මා මතක් කරන්න කැමැතියි. එදා රජයේ සේවකයන් 2/3ක් ගෙදර යවන්න හදපු එක්සත් ජාතික පක්ෂය තමයි අද කම්කරුවාගේ ආර්ථික ප්‍රශ්නය පිළිබඳව, වැඩ කරන ජනතාවගේ ආර්ථික ප්‍රශ්නය පිළිබඳව කථා කරන්න උත්සාහ කරන්නේ.

අද එක්සත් ජාතික පක්ෂය පත් වෙලා තිබෙන බංකොලොත් භාවය අපට පෙනෙනවා. අපි රජයේ සේවයට අලුතෙන් සේවකයෝ බඳවා ගනිද්දී, ඒ බඳවා ගැනීම් කරපු විධිය වැරැදියි කියලා කියන්න යූඑන්පී එකේ සමහර මන්ත්‍රීවරු අද උසාවියට යනවා. අද මේ රටේ රාජ්‍ය සේවය ශක්තිමත් කරන්නට මේ රජය කටයුතු කරමින් සිටිනවා කියන එක ඒකෙන් පෙන්නුම් කරනවා. ඒ විතරක් නොවෙයි, අද මේ රජය යටතේ විශේෂයෙන්ම ආර්ථිකය නංවන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු අචල ජාගොඩගේ මහතා**
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)
මේ කරුණ ඉදිරිපත් කරලා මා කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද අපේ රටේ සංචාරක කර්මාන්තය ඉතාමත් ශක්තිමත් තැනකට එසවෙමින් තිබෙන බව අපට පෙනෙන කාරණයක් බවට පත් වෙලා තිබෙනවා. මීට අවුරුදු දෙකකට කලින් අපි සංචාරක හෝටල් සඳහා, විශේෂයෙන්ම තරු පහේ හෝටල් සඳහා හෝටල් කාමරයකට අවම මුදල ඩොලර් 100ක් අය කළ යුතුයි කියන නියෝගය පනවනකොට සමහර හෝටල් හිමියන් ඊට විරුද්ධ වුණා. නමුත් අද කොළඹ තිබෙන තරු පහේ හෝටලයක හෝටල් කාමරයක් ඩොලර් 185කට වඩා වැඩි මුදලකට අළෙවි වන තැනට පත් වෙලා තිබෙනවා. අද හෝටල් කාමර සොයා ගන්නට නැහැ. ඒ නිසා තමයි අද ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත හරහා අය වැයෙන් ඉදිරිපත් වුණු යෝජනාව ක්‍රියාත්මක කරන්නට අපට සිදු වෙලා තිබෙන්නේ; ඒ හෝටල් කාමරවල නවතින්නට එන ගුවන් සමාගම්වල සේවකයන්ට බදු මුදල අඩු කරලා, අඩු මුදලකට ඒ හෝටල් කාමර ලබා දෙන්න අද සිදු වෙලා තිබෙන්නේ. මොකද, ගුවන් සමාගම් මේ රටට ගෙන්වීමේ අවස්ථාව අප රැක ගන්නට ඕනෑ නිසා. ඒ මට්ටමට අපේ රටේ ආර්ථිකය ශක්තිමත් වන බව මේ ඉදිරිපත් වුණු කරුණු හරහා අපට පෙනෙන්නට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම දෙවන වර කියැවීම සඳහා අද ඉදිරිපත් කළ මේ පනත් කෙටුම්පත් මේ රටේ ආර්ථිකය තවදුරටත් ශක්තිමත් කිරීමේ දිසාවකට මිසක, එය කඩා වැටෙන දිසාවකට නොවන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.03]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා හිතනවා අද මේ විවාදය තුළ වැදගත් වන්නේ රජය මේ අවස්ථාවේදී ඉදිරිපත් කර

තිබෙන මේ පනත් කෙටුම්පත්වලින් බලාපොරොත්තු වන්නේ මොකක්ද කියන එකයි කියලා. අද අපට පුංචි ප්‍රශ්නයක් තිබෙනවා. මේ මුළු රට තුළම දේශප්‍රේමීත්වය කියන මාතෘකාව ගෙන යන මේ ආණ්ඩුව, මෙම පනත් කෙටුම්පත්වලින් බලාපොරොත්තු වන්නේ මොකක්ද කියන එක පිළිබඳව අපි පුංචි විග්‍රහයක් කිරීමේ අවශ්‍යතාව තිබෙනවා.

අද දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ සංශෝධන පනත් කෙටුම්පත් තුළින් අපේ උගත් මිත්‍ර හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේ මුලදීම බොහොම පැහැදිලිව පෙන්වා දුන්නා, අය වැය කථාවේදී ඉදිරිපත් කර තිබෙන යෝජනා තුළයි, අද මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධන පනත් කෙටුම්පත් තුළයි තිබෙන වෙනස මොකක්ද කියන එක. ඒ අවස්ථාවේ එතුමාගේ වාසනාවකට වාගේ ගරු ජනාධිපතිතුමාත් ගරු සභාවට ආවා. මා හිතන්නේ ගරු ජනාධිපතිතුමාටත් එතුමා පැහැදිලිව ප්‍රකාශ කර පෙන්වා දුන්නා, මෙහි තිබෙන පරස්පර විරෝධතාව ගැන. අද මේ ආණ්ඩුවේ උත්සාහය තිබෙන්නේ, මේ දේශප්‍රේමීත්වය ගමට විකුණන්නයි. ගමේ අපිට ශ්‍රී ලංකා කොඩියත්, ජාතිකත්වයත් ඉස්සරහට තියලා, මේ පනත් කෙටුම්පත් ඔක්කොම හරහා පිටුපසින් දොර අරින්නට හදනවා, විදේශීය ව්‍යාපාරිකයාට. මේ ලෝකය තුළ සිටින විදේශීය ව්‍යාපාරිකයාට මේ ලංකාව තුළට ඇවිල්ලා, මේ ලංකාව තුළ සියලු සම්පත් සූරා කාලා යන්න පුළුවන් ක්‍රමවේදය මේ ආණ්ඩුව ලස්සනට ක්‍රියාත්මක කරගෙන යනවා.

අද එක ඇමතිවරයෙක් කිව්වා, නිදහස් වරායක් - Free Port - ගැන මේ සංශෝධන පනත් කෙටුම්පතේ නැහැ කියලා. මම හිතන විධියට එතුමා මේ පනත් කෙටුම්පතවත් කියවලා නැහැ. නිදහස් වරායක් ගැන එහි පැහැදිලිව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා අද කථා කළා. අඩුම ගණනේ නිදහස් වරායක් පිහිටුවන්නේ කොහේද, මොකක්ද කරන්නේ කියලා මේ උත්තරීතර සභාවට වචනයක්වත් කියන්න එතුමාට බැරි වුණා. එක්සත් ජාතික පක්ෂයට මඩ ගහපු එක විතරයි එතුමා කළේ. ඒ වරාය නියෝජ්‍ය ඇමතිවරයායි. මේක තමයි මේ ආණ්ඩුවේ ක්‍රියා පිළිවෙත. මේ ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත මොකක්ද, මේකෙන් වෙන්නට යන්නේ මොකක්ද කියලා ආණ්ඩුවේ සිටින ඇමතිවරුන්ගෙන් භාගයක්වත් දන්නවා ඇති කියලා මා හිතන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ කථිකයෝ කිහිප දෙනෙකුට මඩ ගහන්න විතරක් කථිකයෝ කිහිප දෙනෙක් ඉදිරිපත් කළා. පනත් කෙටුම්පත ඉදිරිපත් කළ ඇමතිවරයාත් පාර්ලිමේන්තුවේ නැහැ; පනත් කෙටුම්පත ගැන වගකීමක් ගන්න කෙනෙකුත් පාර්ලිමේන්තුවේ නැහැ. ඔළු ගෙඩි ටික තිබෙනවා, පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත පාස් කර ගන්නවා, ඊට පසුව මෙතැනින් එහාට පොහොසත් මිනිසුන් තවත් පොහොසත් කරන යුගය මේ ආණ්ඩුව අති විශාලව ඉතාමත්ම ආඩම්බරකාරී ලෙස පවත්වාගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහි තිබෙන පරස්පරය බලන්න. මේක හරි විහිළුවකට, විජ්ජාවකට, හිනාවට, හාස්‍යයට හේතුවක්. අද අපි බටහිර බලවේගයන්වලට බණිනවා; බටහිර බලවේගයන් අභියෝගයට ලක් කරනවා. මට ඉස්සෙල්ලා කථා කළ කථිකයා කිව්වා, ඇමෙරිකාව ගෙනාපු යෝජනාව අපි එක ඡන්දයකින් තමයි පැරදුණේ කියලා. එතුමා කියනවා, ඇමෙරිකා එක්සත් ජනපදය ගෙනාපු යෝජනාවට පක්ෂව 24 දෙනෙක් ඡන්දය දුන්නා;

ලංකාවේ සහයෝගයට රටවල් 15ක් ඡන්දය දුන්නා; රටවල් 8ක් ඡන්දය නොදී හිටියා; එතකොට යෝජනාවට පක්ෂව රටවල් 24යි; විරුද්ධව රටවල් 23යි; එක ඡන්දයෙන් තමයි අපි පැරදුනේ කියලා. බලන්න එතුමාගේ බුද්ධියේ තරම. එහෙම ගණන් හදලා බැලුවොත් ඔබතුමන්ලාගේ අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාටත් මේ රටේ ජනාධිපති වෙන්න බැහැ. ඇයි? ලක්ෂ 140ක් ඡන්දදායකයෝ ලංකාවේ ඉන්නවා. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට හම්බ වුණේ ඡන්ද ලක්ෂ 58යි. එතකොට විපක්ෂයට දුන්නු ඡන්ද ගණනයි, ඡන්දය නොදී හිටපු ගණනයි ගත්තාම ඒ ගණන ඊට වඩා වැඩියි. එහෙම සැසඳුවොත් නම් ඉතින් දෙවියනේ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාටත් මේ රටේ ජනාධිපති වෙන්න අයිතියක් නැහැ.

ඔබතුමන්ලාගේ වාසියට කියනවානේ, "දෙන්නේ ඊ ළඟ පාර"; "හොම්බට දෙන්නේ"; "එකෙන් මිස් වුණේ"; "ළඟින් ගියේ"; "ඊ ළඟ පාර වැඩ පෙන්වනවා" කියලා. ඒවා තමයි අපේ රටේ විදේශ ප්‍රතිපත්ති. එහෙම ප්‍රකාශ කරලා මේ පැත්තෙ හොර දොරෙන් සුද්දන්ට කන්න පුළුවන් හොඳ ගේමක් ගහනවා. නිදහස් වරායවල් හදනවා; බදුවලින් නිදහස් කරනවා; සියලු ප්‍රතිපත්ති අත හරිනවා. පොහොසතා තවත් පොහොසත් කරනවා. අපේ ගමේ එකාට ඒවා තේරෙන්නේ නැහැ. ගමේ එකා ගෙදරට වෙලා, "මේ බලන්නකෝ අපේ රජය" කියලා ආණ්ඩුවට හුල්ල හුල්ලා, බෝධි පූජා කර කර ඉන්නවා. ඒක තමයි දේශපාලනයේ සම්පූර්ණ රැවටීම, විජ්ජාව.

අද අපි ජාත්‍යන්තර ප්‍රශ්නය හමුවේ ඇමෙරිකාව ගැන කථා කරනවා. උද්ඝෝෂණ කරන කෙනෙක් -තුම්මුල්ලේ විමලේ මහත්තයා- ඉන්නවා. ඔහු කියනවා, "ඇමෙරිකාවට විරුද්ධ වෙමු; ඇමෙරිකාවේ බඩු පරිභරණය නොකරමු; ඇමෙරිකාවත් එක්ක සම්බන්ධතා නොපවත්වමු" කියලා. මෙතැන වරාය නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නවා. අපි දන්නවා වරායේ කොච්චර ලොකු වැඩ කටයුත්තක් ඇමෙරිකාවත් එක්ක අපි කරනවාද කියලා. අපේ ලංකාවේ රේගුවේ -Sri Lanka Customs එකේ- ආදායමෙන් සියයට 40ක් එන්නේ ඇමෙරිකාවත් එක්ක කරන ගනුදෙනු හරහායි. ඒ විතරක් නොවෙයි, ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමාම කිව්වා "ලෝඩ්ස්ටාර් ආයතනයේ" ටයර් ගැන. ඒ ආයතනයේ ටයර් වැඩියෙන්ම යවන්නේ කොහේටද? ඇමෙරිකාවට වැඩියෙන්ම ටයර් අපනයනය කරන රටක් තමයි ලංකාව. මොනවාද අපි චීනයට යවන්නේ? මොනවාද අපි රුසියාවට යවන්නේ? අද උදේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කථා කරන කොට ලස්සනට, පැහැදිලිව කිව්වා, "ඇමෙරිකාවට විරුද්ධව කියුබාව යෝජනාවක් ගෙනාවාම කියුබාව දිනුවා; ඇමෙරිකාවට ඡන්ද දෙකයි හම්බ වුණේ" කියලා. ලෝකයේ බලවතා කියලා ඇමෙරිකාවට එක්සත් ජාතීන්ගේ සමුළුවේදී ඡන්ද ලැබෙන්නේ නැහැ. මානව හිමිකම් කවුන්සලයේදී ඡන්ද ලැබෙන්නේ නැහැ.

අපේ ප්‍රතිපත්තිය පැහැදිලි වෙන්න ඕනෑ. අපි 71 දෙනෙකු ජිනීවා නුවරට අරගෙන ගියා. බලන්න එතැනදීත් කරපු ගොන් වැඩේ. දැන් 71 දෙනෙකු අරගෙන ගියාම ජිනීවා නුවර ඉන්නේ නියෝජිතයෝ විතරයි. මානව හිමිකම් උල්ලංඝනය වුණාය කියලා ලංකාවට විරුද්ධව 1989-1990 දී සාක්ෂි දීපු තමරා කුනනායගම් තමයි අද අපි එහේ තානාපති කරලා තිබෙන්නේ. එහෙම නම් අපිට දැන් එයා විතරයි ඉන්නේ. අපි උදාහරණයකට ගනිමු, දැන් ඒ තිබුණු ඡන්දය වෙනුවෙන් උත්සාහයක් යොදන්න වෙන කාව හරි යැවුවොත් එයාට තීන්දු තීරණ ගන්න පුළුවන්ද? අපි 71 දෙනෙකු යවන්න තිබුණේ ඡන්දය තිබෙන රටවල ජනාධිපතිවරු, මූලිකයෝ, විදේශ ඇමතිවරු මට්ටමින් සාකච්ඡා කරන්න. 71 දෙනෙකු ගිහිල්ලා සාමාන්‍ය විධියට සොමියක් දාලා, චුං එකක් දාලා ජිනීවා නුවර සැප අරගෙන ආවා. අන්තිමට ප්‍රතිඵලයක් නොමැති වුණා.

බලන්න ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේකේ තවත් භයානක පැත්තක් තිබෙනවා. මේකේදී ඡන්දය දීපු කට්ටිය, නොදීපු කට්ටිය නොවෙයි ප්‍රශ්නය. ඒ යෝජනාව ගෙනෙන කොට, ඒ යෝජනාවට ලෝකයේ රටවල් 40ක් co-sponsorsලා හැටියට ගියා. ඒ කියන්නේ සහාය අනුග්‍රාහකයෝ හැටියට රටවල්

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

40ක් අත්සන් කළා. ඒකෙන් රටවල් 13කට විතරයි ඡන්දය තිබුණේ. රටවල් 24කට ඡන්දය තිබුණේ නැහැ. එංගලන්තය, ඕස්ට්‍රේලියාව, ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නවසීලන්තය කියන්නේ ලෝකයේ බලවත් රටවල්. ඒවාත් ලංකාවට විරුද්ධව සභාය අනුග්‍රාහකත්වය දුන්නා. අද අපි ඒ ඔක්කෝම රටවල් එක්ක තරහා වෙනවාද? දැන් මේ ප්‍රතිපත්තියේ අතිවිශාල ප්‍රශ්නයක් තිබෙනවා. අපි ලෝකයට බැණ බැණ ඉන්න කොට, මෙවැනි වෙළෙඳ ප්‍රතිපත්තියක් ගෙනෙන කොට, free port සහන දීලා මේ ලංකාවට ගෙන්නා ගන්නේ කාවද? අපි ලෝකයත් එක්ක තරහා වෙලා free port එකෙන් ලෝකයේ රටවල්වල ව්‍යාපාරිකයෝ ලංකාවට ගෙනෙන්නේ කොහොමද? මේ ලංකාවට investments ගෙනෙන්නේ කොහොමද? බලන්න, මානව හිමිකම් ඒ තරමට උල්ලංඝනය වෙලා. මම හිතන්නේ අද ආණ්ඩු පක්ෂයේ ඉන්න ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු හැසිරෙන්නේ මේ ලෝක ඉතිහාසයේ කවරදාකවත් නොවෙච්ච විධියට කියලායි. මිනී මරනවා. සංචාරක ව්‍යාපාරය ගැන කථා කරලා, සංචාරකයෝ මරනවා. ප්‍රාදේශීය සභා සභාපති-

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ඒවාට දඬුවම් දීලා තිබෙනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
දඬුවම් දුන්නේ කොහේද? පෝරකේට ඇරියාද? තවමත් උසාවියේ තීන්දුවක් දීලා නැහැ. [බාධා කිරීම්]අයියෝ! වැදගත් කථාවක් කර ගෙන යනකොට කෑ ගහලා නිකං "වාටර්" කරනවා නේ. මම හැම දාම කියනවා, ඔබතුමාට නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිකම නොවෙයි, මුල්ලේරියාවේ ඇමතිකම තමයි හරි යන්නේ කියලා. මුල්ලේරියාවේ ඇමතිකම තමයි ඔබතුමා ගන්න ඕනෑ. ඔබතුමා මුල්ලේරියාවේ අධිපති වෙන්න ඕනෑ. [බාධා කිරීමක්] ඉඳගන්නකෝ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ලෝකයත් එක්ක යන්න ඕනෑ ගමනක් වෙනුවෙන් ඉදිරිපත් කළ පනත් කෙටුම්පතක් මේක. අපි ලෝකයත් එක්ක බද්ධ වෙලා කටයුතු කරන්න යන ගමනක් මේක. නමුත් අපේ විදේශ ප්‍රතිපත්තිය තුළ අතිවිශාල අනාගැනීමක්, නා ගැනීමක් වෙලා තිබෙන අවස්ථාවක් මේක. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කරුණාකර මෙතුමාව සන්සුන් කරන්න. මම හිතන විධියට එතුමා අද බෙහෙත් පෙත්ත බීලා නැහැ. මට කිව්වා නම් මම ගෙනැල්ලා දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ලෝකය ගැන මෙතුමන්ලා වෙනම අර්ථ කථනයක් කරන්න හදනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඉන්න පාක්ෂික කණ්ඩායමක් ඊයේ මාධ්‍ය හමුවකදී කථා කරනවා මම දැක්කා. එහිදී ඇමෙරිකාව ගෙනාපු යෝජනාව ගැන සම්පූර්ණයෙන්ම වෙනස් අර්ථ කථනයක් කළා. මම කියන්නේ මේකයි. ඒ අය ලංකාවට විරුද්ධව යෝජනාවක් ගෙනැල්ලා නැහැ. ලංකාවට විරුද්ධව කිසිම යෝජනාවක් ගෙනැල්ලා නැහැ. කියලා තිබෙන්නේ එකම දෙයයි. ඔබතුමන්ලා පත් කරපු උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න කියන එක විතරයි කියන්නේ.

මේ කටයුත්තේදී විපක්ෂය ආණ්ඩුවත් එක්ක එකතු වෙලා කටයුතු කරන්නට සූදානම් කියලා අපි ප්‍රකාශ කළා. TNA එකත් මේ ගැන ප්‍රකාශයක් කරන්න ඕනෑ. ඔවුන් එක තැනකදී ප්‍රකාශ කර තිබෙනවා මා දැක්කා, කරුණානිධි ප්‍රකාශ කළ ඊළම පවා අපි ඉල්ලන්නේ නැහැ, අපි ඒකට සම්පූර්ණයෙන් වෙනස් කියලා. එතකොට TNA එකත් සහයෝගය දෙන්න සූදානමක් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය සහයෝගය දෙන්න සූදානමින් ඉන්නවා. අපි ඒ ගැන ලිපියක් යැව්වා. ඒකට උත්තරයක් එව්වේ නැති ආණ්ඩුවක් එක්කයි අපි ගනුදෙනු කරන්නේ.

බලන්න, එදා පාර්ලිමේන්තුවේදී සභානායකතුමා උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව සභාගත කරලා, එතුමාගේ ප්‍රකාශය අවසාන කළේ මෙහෙමයි.

"තවද මෙම ගරු සභාවේ සියලුම මන්ත්‍රීවරුන්, තම තමන්ගේ පක්ෂ සම්බන්ධතා ඉක්මවා යමින් යෝජිත වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ගෙන යාමට මෙම තීරණාත්මක අවස්ථාවේදී සහාය දෙනු ඇතැයි රජය අපේක්ෂා කරයි."

ගරු සභානායකතුමා එහෙම ප්‍රකාශ කළා. නමුත් 26.03.2012 "ද අයිලන්ඩ් " පත්‍රයට මෙහෙම කියනවා:

"Feasible LLRC recommendations will be implemented -Govt

No referendum, No role for Opp."

"No role for Opposition." විපක්ෂයට කිසිම කාර්ය භාරයක් මෙම කටයුත්තේදී නැහැ. අතිගරු ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ සමුළුවට ගිහින් කියනවා, "ලෝකයේ කාගේවත් ඇඟිලි ගැසීම් මගේ රටට එපා. මගේ රට තුළ දෙන්න ඕනෑ පිළියම මම දෙනවා. ලංකාව තුළින් සකසන ලද - home-grown - විසඳුමක් මම දෙනවා " කියලා. එතකොට කෝ ඒ විසඳුම? විපක්ෂයක් නැතිව, විපක්ෂයක් ඕනෑ නැතිව, තනි ආණ්ඩුවට ඒ සියලු දේ කරන්න පුළුවන් කියලා හිතන නිසා නේද මේ අනාගැනීම වෙලා තිබෙන්නේ? අද එක්සත් ජාතික පක්ෂය ඇතුළු මේ සියලුම පක්ෂ එකතු වෙලා ලෝකය ඉදිරිපිටට ගිහින් සිටියා නම්,- [බාධා කිරීමක්] දන්නේ නැති දේ ගැන කෑ ගහන්න එපා. අපි පෙබරවාරි 09 වන දා යවපු ලියුමට පිළිතුරක් දුන්නේ නැති ආණ්ඩුවක් මේක. ලියුමකට පිළිතුරක් නොදෙන මන්ද බුද්ධික ආණ්ඩුවක්. ඒ නිසා ඔබතුමා කරුණාකර මේ කථාව අහගන්න. [බාධා කිරීමක්] එකසිය හතළිස්හත් දෙනෙක් ඉන්න එක ගැන නේ ඔය කථා කරන්නේ. ඒ එකසිය හතළිස්හතයි, මේ පැත්තෙන් පැනපු පූසෝ ටිකයි,- [බාධා කිරීම්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Lalith Dissanayake, please sit down. Hon. Member, you continue with your speech.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටේ අනාගතයට වෙන දේ තමයි මේ පෙන්වන්නේ. මෙතුමන්ලාගේම ඇමතිවරයෙක් ප්‍රකාශ කර තිබුණා දැක්කානේ. "මාධ්‍යවේදීන්ගේ කකුල් කඩනවා, කකුල් කඩලා මාධ්‍යවේදීන් පිටරට යැව්වේ මම" කියලා තිබුණා. අන්න එහෙම ආණ්ඩුවක ඉන්න මේ අය මේ වාගේ හැසිරීම සාමාන්‍ය දෙයක්. මේ හැසිරීමෙන් තමයි ආණ්ඩුවේ ප්‍රතිපත්තිය පෙන්වන්නේ. මේ හැසිරීම නිසා තමයි අද ලෝක ප්‍රජාව මේ ආණ්ඩුව පිළිකුල් කරන්නේ. අද මේ ආණ්ඩුව පිළිකුල් කරන්නේ මේ හැසිරීම නිසා.

මෙවැනි වැදගත් උත්තරීතර සභාවක යමක් ප්‍රකාශ කරනකොට ඒක දරා ගන්න බැරි ඇමතිවරු තමයි මේ. අනික් එක මේ සෞඛ්‍ය නියෝජ්‍ය ඇමති! වෙන ඇමතිකමක් නම් ඒත් කමක් නැහැ. වනජීවී වාගේ සම්බන්ධ ඇමතිකමකුයි දෙන්න තිබුණේ, සත්තුත් එක්ක පොඩ්ඩක් ජීවත් වෙන්න. මොකද, සත්තු වාගේ තමයි මේ අය හැසිරෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී අපි ප්‍රකාශ කරන්න ඕනෑ, අද මේ ගෙනෙන සංශෝධන හොඳයි කියන එක. හැබැයි, හදිසියේවත් එක්සත් ජාතික පක්ෂයෙන් මේ වාගේ දෙයක් ගෙනාවා නම් මොකද වෙන්නේ? බැරි වෙලාවත් මේ බදු නිදහස් කිරීමේ ප්‍රතිපත්තිය එක්සත් ජාතික පක්ෂයෙන් ගෙනාවා නම් මොකද වෙන්නේ?[බාධා කිරීමක්] අද දේශප්‍රේමියා මේ ගරු සභාවේ නැහැ. තුන්මුල්ලෙ විමලේ මේ ගරු සභාවේ නැහැ. පාඨලී චම්පික මේ ගරු සභාවේ නැහැ. මේධානන්ද ස්වාමීන් වහන්සේ මේ ගරු සභාවේ නැහැ. මේක සම්පූර්ණ neoliberal ප්‍රතිපත්තියක්.

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඇතුළු අපි හැමෝම මුල ඉඳලාම කිව්වා, එදා ගෙනාවේ neoliberal අය වැයක් කියලා. අද ඒක පැහැදිලිව පෙන්නුවා. මේ බදු මුලින්, ඇහලුම්වලට පමණයි කියලා ඊට පසුව කියනවා, සියලු භාණ්ඩවලට කියලා. ගරු මන්ත්‍රීතුමෙක් ඒක ලස්සනට කිව්වා. නංගි පෙන්නලා, අංග විකල නංගිවයි, මුළු පවුලේම අයයි බන්දලා දෙනවා කියලා. ඒ වාගේ "ගේමක්" තමයි මේක. ඒක තමයි මේ ආණ්ඩුවේ "ගේම." මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය, මේ ආණ්ඩුවේ අශෝභන ක්‍රියාවලිය මේක තමයි. [බාධා කිරීමක්] රනිල් වික්‍රමසිංහ එල්ටීටීඊ එකට මේ රට විකුණුවා නම්, මේ රටේ ජනාධිපති වෙන්නේ රනිල් වික්‍රමසිංහ. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රට විකුණුවා නම් මහින්ද රාජපක්ෂ මැතිතුමා ජීවිතේටවත් ජනාධිපති වෙන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ ජනාධිපති වෙන එකටයි කොටියා භය වුණේ. ඒක මේ රටේ මිනිස්සු දන්නවා. ඒ නිසා ඔබතුමා ඉඳගන්න. ඔබතුමා දිගින් දිගටම දිගින් දිගටම මට බාධා කරනවා.

අද ඔබතුමන්ලා සංචාරක ව්‍යාපාරය ගැන කථා කරනවා; සංචාරක ව්‍යාපාරය දියුණු වෙන්න ඕනෑය කියනවා. එහෙම කියන ගමන් එක පැත්තකින් ඇමෙරිකන් කොඩිය ගිනි තියනවා. එංගලන්තෙ එවුන්ට බණිනවා. ප්‍රංශයට, ජර්මනියට කුණුහරුපෙන් බණිනවා. ඕස්ට්‍රේලියාවෙන් ආවොත් හොම්බට අණිනවාය කියනවා. කකුල් කඩනවා කියලා ඇමතිවරු කියනවා. පාර්ලිමේන්තුවේදී සරම නැතිව, ඔළුවෙන් හිටගෙන කථා කරනවා. ඉතින් මේ සියලු දේවල් එක්ක මේ රටට සුද්දෝ එයිද? සුද්දන්ට බැණ බැණ සුද්දන්ට එන්න කියනවා. [බාධා කිරීමක්] බණින්නේ නැහැ කියන්නේ කොහොමද? සුද්දන්ට බණින්නේ නැත්නම් සුද්දාගේ කොඩිය ගිනි තියන්නේ මොකටද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Member, you have only one more minute. - [*Interruption.*] Hon. Azwer, please sit down. He is going to wind up.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ ඉල්ලීමක් කරන්නේ. ඔබතුමන්ලාට මේ රට සාර්ථකත්වයට ගෙන යන්න ඕනෑ නම් මේ වාගේ දෙබිඩි පිළිවෙතක් ගෙන යන්න එපා. දේශප්‍රේමීත්වයේ ලේබලය ඔළුව උඩ තියාගෙන,- [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කරුණාකරලා මෙතුමා නිහඬ කරවන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Hon. Lalith Dissanayake, please sit down. Hon. Member, can you please wind up your speech now?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

දේශප්‍රේමීත්වය එළියට දමාගෙන, උදේ හවස දේශප්‍රේමීත්වය විකුණලා, මේ කරන්නා වූ වංචාවට තමුන්නාන්සේලාට හොඳ පාඩමක් ඉගෙන ගන්න වේවි. මම කියනවා,- [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කරුණාකරලා මෙතුමා නිහඬ කරවන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Please sit down, Hon. Azwer. He is going to wind up now.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

හරි, හරි. ඔබතුමන්ලා දිනුම්. ආණ්ඩුව දිනුවා වාගේ මේකත් දිනුම්. අවසාන වශයෙන් පුංචි කවියක් කියනවා. පොඩ්ඩක් මේක හොඳින් අහගෙන ඉන්න.[බාධා කිරීමක්] ඇයි මොකද කියන්න බැරි? එහෙම කොහොමද බැහැ කියන්නේ?

"කන බොන අඳින පළඳින අය වැය ඇත බරට - දන පණ
නසන විදුලි බිල එයි සැරට

ලන තොණ්ඩුවකි චින්තනයෙන් රට පෙරට - එන සතියේදී
නැඟ එයි බදු බර අහසට"

මතක තියා ගන්න මේ ආණ්ඩුවටත්, ඔබතුමන්ලා කරන ප්‍රෝඩාවටත් -

[අ.භා. 2.21]

**ගරු ඩීව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Human Resources)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2012 අය වැය යෝජනාවලියට අදාළ පනත් කීපයක් සංශෝධනය කිරීමේ අරමුණින් ඒවා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා අද ඉදිරිපත් කර තිබෙනවා. අය වැය විවාදයේදී මේ පිළිබඳ සංකල්ප, ප්‍රතිපත්ති අපි පිළිගෙන තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන සුළු සංශෝධන කිහිපයක් තමයි මෙහි තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම මේවා මහා විවාදයක් අවශ්‍ය සංශෝධන නොවෙයි. මොකද, මේකේ ප්‍රතිපත්තිය, සංකල්පය යන සියල්ලක්ම අපි වාද විවාද කරලා, සම්මත කරලා -දෙවෙනිවර කියවීම සම්මත කරලා, තුන්වෙනිවර කියවීම සම්මත කරලා- තිබෙන කාරණා. ඒවා ක්‍රියාත්මක කිරීමට පෙර ඉදිරිපත් කරන සංශෝධන කිහිපයක් තමයි මේ.

[ගරු ඩිව් ගුණසේකර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහි පළමුවෙනියට තිබෙන්නේ, එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් කිරීමයි. දෙවෙනියට තිබෙන්නේ යෙදවුම් බදු සීමා කිරීම, ලිහිල් කිරීමයි. ඒ වාගේම ආයෝජනය දිරි ගැන්වීම සඳහා ආදායම් බදු සංශෝධනය සහ අනෙකුත් ආදායම් බදු නිදහස් කිරීම, ඒ වාගේම සහනදායී ආදායම් බදු අනුපාතය තීරණය කිරීම, ප්‍රාග්ධන වියදම් සහ ගමන් වියදම් ආදායම් බදු ගෙවීමට යටත් වන ආකාරයෙන් ආදායම අඩු කිරීමට ඉඩ දීම, ඒ වාගේම ජාතිය ගොඩ නැඟීම පිළිබඳව වරාය සංවර්ධනය සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම, ආර්ථික සේවා ගාස්තු තීරණය කිරීම, ඒ වාගේම මුදල් පනත යටතේ රේගුවට, ආනයන පාලනයට සහ විනිමය පාලනයට අදාළ සංශෝධන කිහිපයක් මෙහි තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මූලික වශයෙන් මෙය ප්‍රාග්ධනය සම්පාදනය කිරීම, ප්‍රාග්ධනය ඒක රාශි කිරීම, ප්‍රාග්ධනය ආයෝජනය කිරීම දිරි ගැන්වීම සඳහා කෙරෙන සුළු සංශෝධන කිහිපයක්. ඒ නිසා ඒ විවිධ බදු ගෙවීම්වලින් මේවා නිදහස් කරලා ඇත්ත වශයෙන්ම දිරි ගැන්වීමක් තමයි කරන්නේ. නිදහස් කරන ඒවා තිබෙනවා. අඩු කරන ඒවා තිබෙනවා. ප්‍රතිශතය වෙනස් කිරීම් තිබෙනවා. සරල වශයෙන් කියනවා නම් මේ ආකාරයෙන් තමයි. දීර්ඝ කාලීන වශයෙන් ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, ඒ වාගේම දීර්ඝ කාලීන වශයෙන් අපේ රජයේ ආදායම වැඩි කර ගැනීමත් අරමුණු කර ගෙන තමයි මේ සංශෝධන ඉදිරිපත් කරන්නේ. මේ අවුරුද්ද තුළ ඒවා ක්‍රියාත්මක වන ආකාරය බලලා එය හරියට ක්‍රියාත්මක නොවුණත්, එහෙම නැත්නම් ඒවා වේගවත් කරන්නට ඕනෑ නම් හෝ ඊට වඩා අපේ ආදායම වැඩි කර ගන්න දිරි ගැන්වීම් ඇති කර ගන්න අවශ්‍ය වෙනවා නම් සමහර විට ඊ ළඟ අය වැය සකස් කරන විට අපට ඒවාට යළිත් සංශෝධන ගෙන එන්න සිදු වේවි. ඒ නිසා මේවා මහා විවාදයක් අවශ්‍ය කාරණා නොවෙයි.

මගේ මිත්‍ර ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා සාරවත් කථාවක් කළා. එතුමා හැමදාමත් දක්ෂ ලෙස කරුණු ඉදිරිපත් කරනවා. නමුත් ඒ අදාළ කාරණාවලට අපි දවස් දෙකක විවාදයක් දීලා තිබෙනවා. ඒ වෙලාවේ අපේ වැඩ පිළිවෙළ සාකච්ඡා කරමු. විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශයට අදාළ කාරණා විවාද කරන අවස්ථාවේදී විදේශ අමාත්‍යාංශයේ කාරණා සාකච්ඡා කිරීම අවශ්‍ය වන්නේ නැහැ. අද උදේ පක්ෂ නායකයන් තීරණය කළා අප්‍රේල් 3 සහ 4 දිනවල ඒ පිළිබඳව දින දෙකක මහා විවාදයක් දෙනවා කියලා. ඒ නිසා මට දීලා තිබෙන මිනිත්තු කිහිපය තුළ මේ විෂයට සීමා වෙලා කථා කරන්නයි මම බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් අපේ පාර්ලිමේන්තුවේත්, සාමාන්‍ය සමාජයේත්, ජනමාධ්‍යයේත් හැම තැනම අඩුවෙන් සාකච්ඡා කරන කාරණාවක් තමයි රජයේ ආදායම පිළිබඳ ප්‍රශ්නය. අපි හැමෝම රජයේ වියදම් ගැන කථා කරනවා. නැත්නම් වෙන් කළ සල්ලි මදි කියලා කියනවා. නමුත් රජයේ ආදායම ගැන අවධානය යොමු වන්නේ අඩු වශයෙන් තමයි. මම ඒකට පසුබිම් වන කාරණා කිහිපයක් ඔබතුමන්ලාගේ අවධානය යොමු වීම සඳහා ඉදිරිපත් කරන්නම්.

1977 සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට ආණ්ඩුව බාර දෙන අවස්ථාවේදී තිබුණ රජයේ ආදායම් තත්ත්වය මොකක්ද? සංඛ්‍යා ලේඛන අනුව දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 24ක් රජයේ ආදායම ලැබුණා. දැන් ඒක ක්‍රමානුකූලව පහතට වැටි වැටී ඇවිල්ලා 2004 වන විට සියයට 13කට අඩු වුණා. අය වැය විවාදය පවත්වන හැම අවස්ථාවේදීම මම අවධාරණයෙන් කියූ කාරණාවක් තමයි අපේ රජයේ ආදායම වැඩි නොකළොත් අපිට ඉදිරියේදී නොයෙකුත් ප්‍රශ්නවලට, අභියෝගවලට මුහුණ පාන්න සිදු වෙනවා කියන එක. රජයේ ආදායම අඩු වීම බලපාන්නේ සමාජයේ පහළ තලයේ අයට. ඉහළ තලයේ අයට නොවෙයි. පහළ තලයේ අයට. මේක අපේ අධ්‍යාපනයට බලපානවා; සෞඛ්‍යයට බලපානවා; සුබ සාධනයට බලපානවා. සහනාධාරවලට බලපානවා. රජයට ආදායම් ලැබෙන වෙනත් මාර්ග නැහැ. ණය මුදල්වලින් රජයේ ආදායම ගේන්න බැහැ. ණය මුදල්වලින් යටිතල පහසුකම් වාගේ නොයෙකුත් දේවල් කරන්න පුළුවන්.

අපට මුදල් නෝට්ටු අච්චු ගහන්න බැහැ. නෝට්ටු අච්චු ගහන්න පුළුවන් ලොකුම හයිය තිබුණේ ඇමෙරිකාවටයි. අච්චු ගහලා, ගහලා දැන් ඒක නතර කරලා. මොකද, මුදල් නෝට්ටු අච්චු ගහලා දැන් ඒක අර්බුදයකට ගිහින්. ණය අර්බුදයකට ගිහින්. අපි වාගේ පුංචි ආර්ථිකයක් -දළ දේශීය නිෂ්පාදනය බිලියන 50ක් වාගේ තිබෙන ඉතා පොඩි ආර්ථිකයක්- තිබෙන රටක් තුලනාත්මකව ආර්ථිකය මෙහෙයවන්න අවශ්‍යයි. එක පැත්තකින් අපේ ආයෝජන ප්‍රමාණය තිබෙන්න ඕනෑ. අනෙක් පැත්තෙන් අපේ ඉතිරි කිරීම් තිබෙන්න ඕනෑ. ඒ වාගේම රජයේ ආදායමත් තිබෙන්න ඕනෑ. රජයේ ආයෝජනත් තිබෙන්න ඕනෑ. රජයේ ආයෝජන වැඩි කරලා තිබෙනවා. ඒක හරි. අපි ඉතිරි කිරීම් වැඩි කරලා තිබෙනවා. ඒකත් හරි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ආයෝජන - investments - ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා. ඒකත් වැඩි වෙලා තිබෙනවා. ඒකත් හරි. නමුත් අපට පෙනෙන දෙයක් තමයි රජයේ ආදායම වැඩි වෙලා නැහැයි කියන එක. ආණ්ඩුවේ ඇමතිවරු විධියට අපි කථා කරනවා, දළ දේශීය නිෂ්පාදනය වැඩි වීම ගැන. මධ්‍යම බැංකුවේ වාර්තාවලිනුත්, භාණ්ඩාගාරයේ වාර්තාවලිනුත් අපේ දළ දේශීය නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවාය කියලා ඉදිරිපත් කරලා තිබෙනවා. ඇත්ත.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අපේ වර්ධන වේගය වැඩි වෙලා. 2005 ඉඳලා 2012 දක්වා සියයට 6ත්, 8ත් අතර වර්ධන වේගයක් තිබුණා. මෙවැනි වැඩි වීමක් නිදහසින් පස්සේ, එක් අවස්ථාවක ඇරෙන්න කවදාකවත් තිබුණේ නැහැ. 1948න් පස්සේ පළමු වැනි වතාවට සියයට අටකට ගියේ 1979දීයි. යළිත් අපි පසු ගිය අවුරුදු දෙකේ සියයට අටට ආවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. ඒ වැඩි වීම තුළ ඒක පුද්ගල ආදායම වැඩි වෙලා; දළ දේශීය නිෂ්පාදනය වැඩි වෙලා; වර්ධන වේගය වැඩි වෙලා. නමුත් මම ප්‍රශ්නයක් මතු කරනවා. මේ තුළ රජයේ ආදායම පිළිබිඹු වෙනවාද? රජයේ ආදායම පිළිබිඹු වෙන්නේ නැහැ. මධ්‍ය බැංකුවේ වාර්තාවක් තිබෙනවා, මේ වර්ධනයත් එක්ක අපේ රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් යටත් පිරිසෙයින් සියයට 20 දක්වාවත් තිබෙන්න ඕනෑ කියලා. නමුත් වර්ධනය පිළිබිඹු වෙන්නේ නැහැ. ඉතින් ඒක නිසා මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒක නිසා අපි මේක සාකච්ඡා කළ යුතු ප්‍රශ්නයක්. මම ඇමතිවරයෙකු වුණත්, ආණ්ඩුව වෙනුවෙන් වුණත් මේක ස්වයං විවේචනාත්මකව සාකච්ඡා කිරීම සඳහායි සමාජයට, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ. මෙතැන කොතැන හරි ප්‍රශ්නයක් තිබෙනවා. මොකද අපට මේක මේ ආකාරයෙන් යන්න ඉඩ දෙන්න බැහැ. රජයේ ආදායම් වැඩි වෙන්නේ නැත්නම් මේක බලපාන්නේ සමාජ තලයටයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ආර්ථිකය අරගෙන බලන කොට එක පැත්තකින් තිබෙනවා, විධිමත් පෞද්ගලික අංශය. ඊ ළඟට තිබෙනවා, විධිමත් රාජ්‍ය අංශය. මේ දෙකටම අයිති නැති එකක් තිබෙනවා, අවිධිමත් ආර්ථිකය. සියයට 62ක් ශ්‍රමිකයන් ඉන්නේ අවිධිමත් ආර්ථිකය තුළයි. විධිමත් පෞද්ගලික අංශයේත්, විධිමත් රාජ්‍ය අංශයේත් සේවකයන්ට අර්ථ සාධක අරමුදල තිබෙනවා; pension ක්‍රමයක් තිබෙනවා; වෘත්තිය සමිති හරහා හෙට්ටු කරන්න පුළුවන්. හෙට්ටු කරලා පඩි වැඩි කර ගන්න පුළුවන්. නමුත් ශ්‍රමිකයන් සියයට 62ක් ඉන්න අවිධිමත්

ආර්ථිකයේ ඔවුන්ට හෙට්ටු කරන්න සමිති මොකුත් ඇත්තේ නැහැ. ඔවුන් සාමාන්‍යයෙන් පදික වේදිකාවේ ව්‍යාපාර කරන, කෘෂි කර්මාන්තයේ යෙදෙන, three-wheelers එළවන වාගේ අයයි. මේ වගේ කට්ටිය තමයි -අවිධිමත් ආර්ථිකය තුළ ඉන්න ශ්‍රමිකයන් තමයි- සමාජයේ අති බහුතරය. අපේ ආණ්ඩුව පිහිටුවන්න උදව් කරපු අයගේ සමාජ බලවේගයන් ඉන්නේ මෙතැනයි. මේ සියයට 62 තුළයි. අර දෙකේ නොවෙයි. මෙතැන තමයි ප්‍රතිශතය වැඩි. රජයේ ආදායම වැඩි නොවීමේ බලපෑම තිබෙන්නේ අර සියයට 62ක් පමණ ශ්‍රමිකයන් ඉන්න අවිධිමත් ආර්ථිකයටයි. ඒ නිසා අපේ බදු ප්‍රතිපත්තිය ගැන අපි යළි සලකා බැලීම අවශ්‍ය වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ලෝකයේ අනෙකුත් රටවල් සමඟ සංසන්දනය කරලා බලන කොට අපේ බදු ප්‍රතිශතය කීයද? සියයට 24යි. සියයට 24යි කියලා කියන්නේ ලෝකයෙන්ම අඩුම ප්‍රමාණයයි. ආචාර්ය එන්.එම්. පෙරේරා මහතා මුදල් ඇමතිවරයා හැටියට කටයුතු කළ කාලයේ ඉහළම තලයේ තිබුණේ සියයට 75යි. ඒ ප්‍රමාණය 60 වෙලා මේක බැහැගෙන, බැහැගෙන, සියයට 35කට ආවා. එහෙම නම් රජයට ආදායම් එන්නේ කොහෙන්ද? අනෙක් පැත්තෙන් බලන කොට අපේ සංවර්ධනයත් එක්කම සමාන්තරව පෙනෙන කාරණයක් තමයි ඇති, නැති පරතරය පුළුල් වෙලා තිබෙන එක. ඒක මධ්‍යම බැංකුවේ සංඛ්‍යා ලේඛනවලින් පෙන්නුම් කරලා තිබෙනවා. අද ලොකු මධ්‍යම පන්තියක් ඇති වෙලා තිබෙනවා. ඉතින් ඒක අපට පෙන්නුම් කරනවා.

අද ආර්ථික විද්‍යාවේ අලුතෙන්ම උගන්වන කාරණාව මොකක්ද? මේක බොහෝ දෙනා දන්නේ නැහැ. අද තිබෙනවා, වුවමනාවන් හා අවශ්‍යතාවන් කියලා දෙකක්. අලුත් විද්‍යාව හා තාක්ෂණයත් එක්ක ආර්ථිකය වෙනස් වෙලා; සමාජය වෙනස් වෙලා. අවශ්‍යතාවන් කියන්නේ අවශ්‍යම දේයි. නමුත් වුවමනාවන් - wants - කියන්නේ මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, mobile telephone එක අද අවශ්‍යතාවක් වෙලා. මීට අවුරුදු කිහිපයකට ඉස්සෙල්ලා මේක වුවමනාවක් පමණයි. නමුත්, අද මිලියන 20ක population එකක් තිබෙන රටකට mobiles මිලියන 21ක් තිබෙනවා. එක එක්කෙනා කොයි තරම් වියදම් කරනවාද කියලා දවස අන්තිමේදී අරගෙන බලන්න. අද පල්ලෙහාම තලයේ අයට විදුලි බලය සඳහා දවසකට ශත 22ක් වැඩි වෙනවා. එක telephone call එකක් නොගෙන හිටියොත් ඒ ශත 22 බේරා ගන්න පුළුවන්. ඉතිරි කරන්නේ කොහොමද කියලා ජනතාව දැනුවත් කරන්න ඕනෑ බව මම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයටත් කිව්වා, මාධ්‍යයටත් කිව්වා. මොකද, අර්බුදකාරී තත්ත්වයක් එන කොට මේවා ප්‍රශ්න. ඒ නිසා විශේෂයෙන්ම අදායම වැඩි කරලීම සඳහා අපි යළි සලකා බැලීම කළ යුතුයි. මේක භාණ්ඩාගාරයේ අවධානය යොමු විය යුතු කාරණාවක්. මේක මධ්‍යම බැංකුවේ අවධානය යොමු විය යුතු කාරණාවක්.

ආදායම වැඩි නොකර ඉන්නවා කියන්නේ අහිංසක, පල්ලෙහාම සමාජ තලයේ ඉන්න අයටත් බලපාන දෙයක්. ඔවුන්ගේ අධ්‍යාපනයට, සුභසාධනයට, කිසි එකකට අපට අත දෙන්නට හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒක නිසා මම අද වෘත්තීය සමිති රැස්වීමේ කථා කරන කොට කිව්වා, "තමුන්නාන්සේලා පඩි වැඩි කිරීම් ඉල්ලන කොට පඩි වැඩි කරන්න නම් මුදල් හොයන ක්‍රමය මේකයි යනුවෙන් යෝජනාවක් ඉදිරිපත් කරන්න" කියලා. ඒ ඉල්ලීමත් දාන්න කිව්වා. ඉස්සර අපේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ ප්‍රවීණත්වයක් තිබුණා. ආණ්ඩුවට ඉල්ලීම් ඉදිරිපත් කරන කොට ඒ සඳහා මුදල් හොයන ආකාරයත් කිව්වා. අද ඒක නැහැ. අද ඒ වෘත්තීය සමිති සංස්කෘතිය නැහැ. අද ඒ දේශපාලන සංස්කෘතිය නැහැ. ඒ නිසා මුදල් අමාත්‍යාංශය රජයේ ආදායම් පිළිබඳව අණපනත් සකස් කරන වෙලාවේදී මුදල් අමාත්‍යාංශයට බුද්ධිය පහළ වෙයි කියලා මම කල්පනා කරනවා.

ආදායම වැඩි කිරීම අනිවාර්යයෙන් අවශ්‍යයි. එහෙම නැත්නම් මේක ඉදිරි කාලයේ මේ සමාජයේ පහළ තලයේ අයට අතිශයින්ම, ප්‍රබලව බලපාන කාරණාවක් වෙනවා. විශාල වශයෙන් ඇති නැති පරතරයක් තිබෙනවා. අද ආදායම් බදු මඟ හැරීම විශාල වශයෙන් තිබෙනවා. Tax evasion කිව්වාම එහි දෙකක් තිබෙනවා. ඒ, Intensive tax evasion and extensive tax evasion. Intensive tax evasion කියන්නේ, තිබෙන filesවල බදු ප්‍රමාණය අඩුවෙන් පෙන්වන එකයි. ඒ තත්ත්වය තමයි වැඩියෙන්ම තිබෙන්නේ. ඊ ළඟට තිබෙනවා, extensive tax evasion. එය ගෙවන්න පුළුවන් අය ගෙවන්නේ නැහැ.

අද තත්ත්වය බලන්න, මේ සමාජයේ මිනිස්සුන්ගේ තිබෙන වුවමනාවන් සහ අවශ්‍යතාවන් ගැන. අවශ්‍යතාවන්ට වැඩිය වුවමනාවන් වැඩි වෙලා තිබෙන සමාජයක කී දෙනාද බදු ගෙවන්නේ? ඒ තත්ත්වය නිසා අපට සුභසාධන සම ආර්ථිකයක් අරගෙන යන්න පුළුවන් වෙනවාද? ඉතින්, මේක අවශ්‍ය වන කාරණාවක්. මේක දැඩි ලෙස හා ප්‍රබලව පාර්ලිමේන්තුවේ සාකච්ඡා විය යුතු කාරණාවක්; සමාජයේ සාකච්ඡා විය යුතු කාරණාවක්. මොන ජනමාධ්‍යයෙන්ද ඉල්ලා තිබෙන්නේ, රජයේ ආදායම වැඩි කරන්න ඕනෑ කියලා. කවදාවත්, කොතැනකවත් කියන්නේ නැහැ. මොන වෘත්තීය සමිතියද කියන්නේ? තමන් වැඩියෙන් ඉල්ලනවා මිසක්, ඒ ඉල්ලීම්වලට මුදල් සොයා ගන්නා ආකාරය පිළිබඳ මඟ පෙන්වීමක් කරන්නේ නැහැ. මේක ඉස්සර වෘත්තීය සමිති කළා. කුමන පක්ෂයකට අයත් වුණත් ඉස්සර තිබුණු වෘත්තීය සමිති වගකීමක් ඇතිව කටයුතු කළා. පඩි වැඩි වීම් ඉල්ලන කොට මෙන්න රජයේ ආදායම වැඩි කරන ආකාරය කියලා ආණ්ඩුවට කියනවා. මේක වැඩි කරන්න, මේක වැඩි කරන්න කියලා කියනවා. අය වැයක් ඉදිරිපත් කරන කොට අනිත් පැත්තෙන් විකල්ප අය වැය යෝජනා ඉදිරිපත් කරනවා. අපේ වෘත්තීය සමිති ව්‍යාපාරයත් මෙහෙයවීම අවශ්‍යයි. ඒ අයගේ අදහස් වෙනස්. අද සමාජයේ බුද්ධිමය වශයෙන් හිස් තැනක් තිබෙනවා. ඒකට මම කියන්නේ, intellectual paucity කියලා. ඒක අපේ ජාතික ප්‍රශ්නයටත් බලපා තිබෙන කාරණාවක්. සමහර විට අපේ ආර්ථික, සමාජ ප්‍රශ්නවලටත් බලපා තිබෙන කාරණාවක්.

ප්‍රමාණවත් ලෙස සාකච්ඡා වෙන්නේ නැහැ. විශ්වවිද්‍යාල පද්ධතියේ බුද්ධිමතුන්ගෙන් අදහස් ගලා ගෙන එන්නේ නැහැ. දේශපාලනඥයන්ටත් බුද්ධිමය අදහස් එන්නේ ප්‍රබුද්ධ කොටස්වලට පමණයි. ඒ ප්‍රබුද්ධ කොටස් නිහඬව ඉන්නවා. විශ්වවිද්‍යාල පද්ධතියේ බුද්ධිමත් කොටස්වල, corporate sector එකේ, OPA එකේ, ඒ කොටස්වල අදහස් අපි සැලකිල්ලට ගන්නට ඕනෑ. අද එදා වාගේ නොවෙයි, අමාරු, සංකීර්ණ ආර්ථිකයක් තිබෙන්නේ. අද තිබෙන ප්‍රශ්න සංකීර්ණයි. ජාත්‍යන්තර ප්‍රශ්න සංකීර්ණයි. ඒ නිසා අපි සියලු අදහස් තේරුම් ගැනීම අවශ්‍යයි. පොඩ්ඩක් හිතන්නට ඕනෑ. ප්‍රශ්න ඇති වීමට තුඩු දුන් හේතු සාධක තෝරා බේරා ගන්නට ඕනෑ. අන්න ඒ නිසා අපි සියලුම පක්ෂවල මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලන්නේ, තමුන්නාන්සේලා ඒ වාගේ ප්‍රබුද්ධ මත ඉදිරිපත් කරන්න දායක වෙන්න කියලායි. බොහොම ස්තුතියි.

[2.37 p.m.]

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

Hon. Deputy Chairman of Committees, from morning I have been listening to all the speeches made by the Hon. Members about political parties, personalities, the Geneva Resolution, the LLRC Report but nothing was said about the Bills, which are before the House today.

[ගරු . ඒ. විනායගමූර්ති මහතා]

With regard to the Geneva Resolution, I think the Hon. (Prof.) G.L. Peiris, Minister of External Affairs was asked to go to the United States of America and meet Bill Clinton about three months before this Resolution was passed. But, he did not go. He wanted three months to implement it. Now, India has come to our rescue and because of India's help, we have been given one year to implement the recommendations.

World's elder statesmen, along with Nelson Mandela, have urged the Government to implement that Resolution. Otherwise, they say, we will have to face a strict resolution than this. So, we are responsible for the Resolution that was passed in Geneva. But, in some way it has helped this Government to overcome some difficulties they face due to the rise in the cost of living.

What is the LLRC Report? The LLRC was appointed by this Government. They have issued interim directives and then a final advice. In Geneva, the Hon. Mahinda Samarasinghe told the Commission that they will implement the LLRC Report. But, in Sri Lanka I hear a Senior Minister saying, "We cannot implement the entire LLRC Report. They have gone beyond their powers". Is this the way to look at it? Who are they? We have not appointed them. It is the Government that appointed them. What is that Resolution? The Resolution wants you to implement the recommendations of the LLRC, which was appointed by you. If we do not implement it, you may have to face a more strict resolution at the next session.

Now, I come to Clause 5 (3) (c) of the Value Added Tax (Amendment) Bill. It states in page 17, I quote:

"(xxxv) any goods, (other than motor vehicles and goods for personal use) required for the purpose of provision of services being international transportation which is consigned to Sri Lankan Air Lines Limited, Mihin Lanka (Pvt) Ltd.

or Air Lanka Catering Services Ltd.;"

I am totally opposed to this and I want this to be deleted. I do not know why the Government wants to help these two institutions; they are two white elephants. I think Mihin Lanka (Pvt.) Limited fell into economic difficulties and the Treasury had to bail them out. Why did the Treasury bail them out? If they were unable to maintain themselves, they could have got a loan from a bank, not from the Government. Mihin Air had been paid billions and billions of rupees to cover their losses. Who paid it? Our people had to pay. I am opposed to this and I do not want any kind of exemption given to SriLankan AirLines Limited, Mihin Lanka (Pvt.) Limited and Air Lanka Catering Services Limited. If the SriLankan Airlines is unable to manage their affairs economically and efficiently, let them wind up or let them get a loan from a bank and manage it; not from Dr. P.B. Jayasundera, Secretary to the Treasury.

Regarding the cost of living, my Friend, the Hon. Bandula Gunawardane has said, according to newspapers, that a sum of Rs. 7,500 is sufficient for a month for a family. I do not know where he is living; whether in this world or in some other world. A bundle of *keerai* is Rs. 50. So, how can people exist in this country? I am a diabetic patient. I buy a medicine named "NovoMix(r)30" and I have to pay Rs. 1,300 for one pack, which is sufficient only for two days. It was Rs. 1,000 earlier but recently what has happened is, the prices of medicines have also gone up. Who is suffering? The poor people are suffering. How can they live? The real problem we are facing is the cost of living and we are facing an economic crisis. Do not forget that. In time to come, you cannot even get loans because we are getting loans to pay the loans.

Some Ministers were speaking about the development in Jaffna. I go to Jaffna every month. I spend about 10 days going all over. But, there is no development work taking place there. What is being done is, they are putting up some roads. Who are the labourers? They are the Chinese and the people from the South. I ask this Government and the Hon. Minister of Economic Development whether they have spent any money in development work, which may generate employment for the people in Jaffna.

There are several graduates who are unemployed. There was a newspaper advertisement saying, "Please join the SLFP by paying Rs. 250, if you want employment." Is the Government giving appointments only to the SLFP graduates?

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Hon. Member, that is totally false. Anyone can join the Sri Lanka Freedom Party and become a member. It costs you only Rs. 10 and nothing else. Please do not misrepresent facts in the House.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
I am sorry. This is what has happened in Jaffna. "Your SLFP man" has said that.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Where?

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
In Jaffna.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Do not mislead the House.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
It appeared in newspapers. They want these people to join the SLFP if they want any jobs.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
More and more people in Jaffna join the SLFP. - [*Interruption*.]

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
No, - [*Interruption*.] Be generous as far as we are concerned. - [*Interruption*.] We are not asking for the moon. We are only asking -

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
The Geneva issue has polarized your community further and thousands of people will join the SLFP. You will see that very soon.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
We are not - [*Interruption*.] We are not preventing anybody from joining the SLFP. I know that this Government is trying to bring down the strength of the TNA by doing several acts.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
The Government is not trying to do that. You are doing that by yourself.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
No, no.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
The TNA is polarized today and by that you have marginalized and alienated yourself from your own Tamil community. That is a fact that has to be realized. What you are saying is controversial.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
I am saying this from what I hear and what I come to know from Jaffna when I go there every month. - [*Interruption*.] Yes, do not worry about us.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
We are not worried about the TNA but we are worried about the large community that is living in Jaffna. - [*Interruption*.] You are trying to segregate the Tamil community. That is what we are worried about. That is our primary responsibility being in the Government.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
[*Interruption*.] Hon. Sajin De Vass Gunawardena, we were prepared to continue with the talks. Who stopped it?

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
We invited you. You can still continue talks with us.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
Who stopped it? We are still prepared to negotiate with the Government.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Hon. Member, there is a Parliamentary Select Committee -

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
No, but what you must do - [*Interruption*.]

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
You are undermining Parliament. - [*Interruption*.]

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
No.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Why do you not come to the Parliamentary Select Committee and join the process? Why are you making a time-bound proposal? What is there to be afraid of?

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
When the Government - [*Interruption.*]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
There is a point of Order being raised.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, you must allow the Hon. Vinayagamoorthy to speak.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, do not disturb him.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Sir, we are having a nice and friendly exchange of ideas.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Vinayagamoorthy, you continue with your speech.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
Sir, I want to tell the Hon. Member that we are still prepared to have negotiations with the Government to solve our problem.

**ගරු වසන්ත සේනානායක මහතා**
(மாண்புமிகு வசந்த சேனாநாயக்க)
(The Hon. Vasantha Senanayake)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! A point of Order is being raised. Hon. Member, what is your point of Order?

**ගරු වසන්ත සේනානායක මහතා**
(மாண்புமிகு வசந்த சேனாநாயக்க)
(The Hon. Vasantha Senanayake)
Hon. Member, you made a statement and most of the hard facts that you spoke of were matters you had heard of. So, are they merely hearsay or are they factual? - [*Interruption.*]

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
They are factual.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. Hon. Vinayagamoorthy, you carry on with your speech.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
Sir, all what I want to say is, for God's sake, do not squander our money, the public money, by bailing out Mihin Air and the SriLankan Airlines. SriLankan Airlines was bailed out. It was running at a loss and the Treasury had to give the money. Why does the Treasury give the money to SriLankan Airlines or Mihin Air? If they are unable to manage their own affairs -

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Hon. Member, you must first understand as to what the aviation industry is.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
I do not want any disturbance to be made.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
This is not disturbance. I am only pointing out the facts. What you are telling is totally irrelevant.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)
You can answer at the time you speak. - [*Interruption.*]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, you carry on with your speech.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

So, what I am saying is, not only is the Government squandering money on SriLankan Airlines and Mihin Air, but it is also spending people's money unnecessarily on functions held in every village and everywhere.

What happened in Anuradhapura? What is the amount of money you spent there and what did you achieve there? As far as we are concerned, we are still prepared for a negotiated settlement with the Government.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

So, why do you not come without wasting time?

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

You are not coming; you have suspended talks with us. We are prepared to come even now.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

No. You give us the names of your representatives now. Then, we can have it tomorrow.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

I am sorry.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

I know that you are sorry. We can understand your "sorry". Anyway, the solution is in your hands.

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

What I want to tell you is this: when the Government is faced with a problem, what does the Government normally do? They appoint a commission and shelve the issue. That is what has happened now. You are not prepared to implement the recommendations of the LLRC Report. Why is that?

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

Hon. Member, there is a Parliamentary Select Committee.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Yes, Hon. Azwer.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

You tell us whether you are prepared to come and participate in the Parliamentary Select Committee. Tell us the point of view of the TNA? Tell us and tell the world, "Yes" or "No".

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

We are not prepared to do that now but we are prepared to have talks with the Government. India and the United States of America have told the Government to speak to the TNA and come to a settlement.

Thank you very much.

[අ.භා. 2.51]

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් හය - එකතු කළ අගය මත බදු (සංශෝධන) ආදී- වෙනුවෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව විශේෂයෙන්ම මා සතුටු වනවා. විශේෂයෙන්ම දේශීය නිෂ්පාදනයන් දිරි ගැන්වීම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට පහසුවක් ඇති කිරීම, දේශීය කර්මාන්ත හා ව්‍යවසායකයන් දිරි ගැන්වීම සඳහා බදු සහන රාශියක් ලබා දෙන බව මුදල් අමාත්‍යවරයා හැටියට අතිගරු ජනාධිපතිතුමා අය වැය ලේඛනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරද්දී ප්‍රකාශ කළා. ඒ ප්‍රකාශ කළ විධියටම, ඒ සහනයන් ලබා දීම සඳහා තමයි මේ පනත් කෙටුම්පත් අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ.

අපි දැක්කා විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කළ ආකාරය. විශේෂයෙන්ම ගරු හර්ෂ ප්‍රනාන්දු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී වාගේම, කථාව අවසන් කරමින් කියා සිටි කවියෙනුත් කිව්වේ ජනතාව මත විශාල බදු පැටවීමක් කරන්න සූදානම් වනවා කියලායි. මේ පනත් කෙටුම්පත් හය පිළිබඳව මොන තරම් අධ්‍යයනය කරලාද එතුමා කථා කළේ කියලා එතුමාගේ ඒ කථාවත් එක්ක අපට පැහැදිලි වනවා. රජයේ වැඩ පිළිවෙළ යටතේ සූදානම් කර තිබෙන මේ කාර්යයන්වලින් අංශ ගණනාවකට දිරි දීම සඳහා තමයි මේ කටයුතු කර තිබෙන්නේ කියලා අපට විශේෂයෙන්ම පැහැදිලි වනවා. ඒ නිසා ජනතාව මත බදු පටවන්න මේ පනත් කෙටුම්පත් ගෙනැල්ලා සම්මත කරන්න හදනවාය කියන විපක්ෂයේ චෝදනාව -එතුමන්ලාගේ තර්කය-

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

අපි බැහැර කරනවාය කියන එක මේ ගරු සභාවේ දී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මට පෙර කථා කරපු ගරු විනායගමූර්ති මන්ත්‍රීතුමාත් එල්එල්ආර්සී වාර්තාව පිළිබඳව සහ ඒ ආශ්‍රිතව කරුණු කිව්වා. අප්‍රේල් 03වැනි දා සහ 04වැනි දා ඒ සම්බන්ධව කථා කරන්න අපි වෙනම විවාදයක් සූදානම් කර තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව කාලය වැය කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් අපේ ගරු හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා කිව්වා ජිනීවා සමුළුවේදී අපේ රටේ වැඩ පිළිවෙළ ගැන කථා කරන්න 71 දෙනෙක්ම ගිහිල්ලා තිබුණාය කියලා. ඒක හාස්‍යයට ලක් කරමින් තමයි එතුමා ඒ ප්‍රකාශය කළේ. ඒ කියන්නේ විශාල පිරිසක් ගිහිල්ලා මුදල් නාස්ති කරලා ඒ සම්බන්ධයෙන් කටයුතු කළාය කියන එක තමයි එතුමාගේ අදහස වුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජිනීවා සමුළුවේදී සිදු වුණ කාර්ය භාරයන් පිළිබඳව පසු ගිය දිනක "දිවයින" පුවත් පතේ පැහැදිලි විග්‍රහයක් කරලා තිබුණා. එම ලිපිය මා ළඟ තිබෙනවා. එහි එක තැනක බොහොම පැහැදිලිව කියනවා "ජිනීවා ඇමෙරිකානු තානාපතිනි අයිලින් ඩොනහෝ මේ යෝජනාව සම්බන්ධව විදෙස් තානාපතිවරුන්ට දැඩි බලපෑම් එල්ල කිරීම සඳහා රාජ්‍ය නිලධාරින් 115 දෙනෙක් ජිනීවා වෙත කැඳවා තිබුණි. " කියලා. ඒ කියන්නේ අපේ රටට යම් සහයෝගයක් ලබා දෙන්න බලාපොරොත්තු වන රටවලට දැඩි බලපෑම් එල්ල කිරීම සඳහා, ඒ වෙනුවෙන් විතරක් 115 දෙනෙක් කැඳවා තිබෙනවා. මේ ගැන කැන්වස් කරලා -ඒ අය දැනුවත් කරලා- අපේ රටට විරුද්ධව කටයුතු කිරීමේ කාර්යයට විතරක් 115 දෙනෙක් කැඳවා තිබුණා. ඒ විතරක් නොවෙයි, ඊට පසුව එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධ විශාල කණ්ඩායම් මේ වෙනුවෙන් ගෙනැල්ලා තිබුණා. අපේ රටට එරෙහිව මේ වැඩ පිළිවෙළ දියත් කරන්න 15,000කට වැඩි කණ්ඩායමක් යොදවලා විවිධාකාරයෙන් තර්ජන ගර්ජන එල්ල කරන අවස්ථාවේ අපේ මේ පුංචි රට වෙනුවෙන් 71 දෙනෙක් ගිහිල්ලා කටයුතු කළාය කියලා ඒකට විරුද්ධව තමයි එතුමා ඒ කථාව කළේ. ඒ නිසා මේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ තර්ක, පුහු තර්ක, කටට එන විධියට ඔහේ කියා ගෙන ගියාට තේරුමක් නැහැ. මෙවැනි දේවල් සිදු වන්නේ මොන වාගේ පසුබිමක් තුළ ද කියන එක පිළිබඳව අපි තේරුම් ගත යුතුව තිබෙනවා.

අද ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත්වලින් සිදු වන දේ ගැන එක් උදාහරණයකින් මම පැහැදිලි කරන්න ඕනෑ. එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් කිරීම යටතේ එක උදාහරණයක් ගනිමු. ලොරි, ට්‍රක් රථ, බස් රථ ඒ වාගේම ක්‍රීඩා උපකරණ, රබර් හෝ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ, සුවඳ විලවුන් ඒ වාගේම දැව, කුකුළු මස් නිෂ්පාදනය සඳහා අවශ්‍ය උපකරණ, උදලු හා මුල්ලු, අවු කණ්ණාඩි ඒ වාගේම නිර්මාණ කණ්ණාඩි, ඇස් කණ්ණාඩි, දේශීය නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය, ආලෝක සංවේදී අර්ධ සන්නායක උපකරණ ආනයනය හෝ සැපයීම වෙනුවෙන් එකතු කළ අගය මත බදු සම්පූර්ණයෙන්ම නිදහස් කරන්න කටයුතු කරනවා. ඉතින් ඒ වාගේ සහන රාශියක් ලබා දෙන පනත් කෙටුම්පත් කිහිපයක් තමයි අද අපි සම්මත කරන්න බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා විශේෂයෙන්ම අපේ රජයේ වැඩ පිළිවෙළ පිළිබඳව, ඒ වාගේම මේ රටේ ආර්ථිකය පිළිබඳව විශාල වශයෙන් කථා කළා. ඒ පිළිබඳව අපි වචනයක් කියන්න ඕනෑ. අද අපි දන්නවා, අපේ රටේ ඉතිහාසය තුළ සියයට 8කට එහා ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යන්න ලැබුණේ අවස්ථා දෙකකදී බව. හැබැයි ඒ අවස්ථා දෙකේදීත් පිට පිට ආර්ථික වර්ධන වේගය සියයට 8කට එහා පැත්තේ පවත්වා ගන්න හැකියාව ලැබුණේ නැහැ. 2010ත්, 2011ත් පමණයි ඒ අවස්ථාව අපට උදා කර ගන්න හැකියාව ලැබුණේ. ඒ, අපේ රජයේ වැඩ පිළිවෙළ සහ මේ ආර්ථික ප්‍රතිපත්තියත් එක්කයි. විශේෂයෙන්ම අපේ රටේ ආර්ථික ශක්තිය මනින දර්ශක දිහා බලපුවාම, ඒ වාගේම රටේ සංවර්ධනය මනින දර්ශක දිහා බලපුවාම අපි අද ඒ හැම අංශයකින්ම ඉදිරියට එමින් පවතින රටක්. ඒ හැම අංශයක්ම, හැම දර්ශකයක්ම ධනාත්මක ප්‍රවේශයට අද හැරිලා තිබෙනවා. ඉතින් මේ තත්ත්වය අගය කරන්න විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාට නොහැකි වීම පිළිබඳව අපි කනගාටු වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන් අද අපේ රටේ වාහන පාවිච්චිය සම්බන්ධයෙන් ලබා ගත්ත සංඛ්‍යා බනත් එක්ක බලපුවාම පසු ගිය වර්ෂය අවසාන වන කොට ලක්ෂ 47ක් වූ ජනතාව වාහන ගෙනැල්ලා පාවිච්චි කරන තත්ත්වයට පත් වෙලා තියෙනවා. පසු ගිය වර්ෂයේ විතරක් ලක්ෂ 05කට වඩා වැඩි වාහන ප්‍රමාණයක් අපේ රටට ආනයනය කරන්න කටයුතු කරලා තියෙනවා. මේකෙන් පැහැදිලි වන්නේ පුද්ගලයන්ගේ ආදායම් තත්ත්වය වර්ධනය වීමයි. වාහන විතරක් නොවෙයි, අද දුරකථන පාවිච්චිය දිහා බලන්න. ඒ හැම අංශයකින්ම අපි දකිනවා, විශාල ආර්ථික ශක්තියක් ජනතාව තුළ වර්ධනය වෙලා ඒ පවුල්වල ආර්ථිකය ශක්තිමත් වෙමින් ඒ වාගේම පුද්ගලයන්ගේ ආදායම් තත්ත්වය වර්ධනය වෙමින් පවතින අවස්ථාවකට අද යොමු වෙලා තිබෙනවා කියා.

දැන් ඇත්තටම අපි තේරුම් ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ තමයි අපේ වියදම් ලැයිස්තුව වැඩි කරගෙන තිබෙනවා කියන කාරණය. ඒ කියන්නේ, අපේ අවශ්‍යතාවන් පහසු පරිදි ඉටු කර ගැනීම සඳහා දරන වියදම් ලැයිස්තුව කතා කරන මා ඇතුළු අපේ රටේ සියලු ජනතාවම වැඩි කරගෙන තිබෙනවා. දුරකථන එකක් නොවෙයි, දෙක තුනක් පාවිච්චි කරනවා. රූපවාහිනිය පාවිච්චි කරද්දී දැන් අපි සාමාන්‍ය රූපවාහිනිය නොවෙයි, පාවිච්චි කරන්නේ. PEO TV, Dialog TV වැනි cable රූපවාහිනී සේවාවන් පාවිච්චි කරනවා. ඒවාට මාසයේ අන්තිමට බිලක් එනවා. අද ලංකාව පුරාම විදුලිය ලබා දීලා තිබෙනවා. සෑම නිවසකටම විදුලිය ලබා දෙන අපේ අතිගරු ජනාධිපතිතුමාගේ වැඩසටහනත් එක්ක සෑම නිවසක්ම විදුලිය ගනිද්දී මාසයේ අන්තිමට විදුලි බිල එකතු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අද පානීය ජල පද්ධති පුළුල් කරගෙන යනවා. ඒ පානීය ජල පද්ධති පුළුල් වෙන්න, පුළුල් වෙන්න ඒ නිවාස පානීය ජලය ලබා ගන්නවා කියන්නේ මාසය අන්තිමට තමන්ගේ වැය ලැයිස්තුවට ජල බිලක් එකතු වෙනවාය කියන එකයි. පරිගණක පාවිච්චි කිරීම, ඒ තුළින් ලැබෙන අන්තර්ජාල පහසුකම්වලට වාගේම ඩොන්ගලයක් පාවිච්චි කරනවා නම් ඒ සඳහාත් වැය බර මාසය අවසානයට එකතු වෙනවා. මේ විධියට ගත්තාම විශාල වැය ලැයිස්තුවක් එනවා. හැබැයි ඒවා නැතිව ජීවත් වෙන්න පුළුවන්. නමුත් අපේ පහසුව වැඩි කර ගැනීම සඳහා -සුඛ විහරණය සඳහා- අපි ඒවාට යොමු වීම නිසා අද ඒක අපේ පවුලේ ආර්ථිකයට විශාල වශයෙන් බලපානවා වාගේම ඒ වියදම් මාසිකව වැඩි වන තත්ත්වයට පත් වෙලා තියෙනවා. ඒ නිසා මේක රජය හොඳින් තේරුම් අරගෙන මේ වෙනුවෙන් වැඩ පිළිවෙළක් සූදානම් කරන අවස්ථාවක් මේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,අද දිවි නැඟුම වැඩ පිළිවෙළ සකස් කරලා තියෙන්නේ පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහායි. ඒ වැය වන ප්‍රමාණයට අපේ පවුලට මුදල් ප්‍රමාණයක් ලැබෙන්නේ නැත්නම් -අය වෙන්නේ නැත්නම්- එතැන ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා තමයි පවුලේ ආර්ථිකය

ශක්තිමත් කරන්න දිවි නැඟුම වැඩ පිළිවෙළ හඳුන්වා දීලා ඒවා බිම් මට්ටමින් ක්‍රියාත්මක කරගෙන යන්නේ. ඒ නිසා අපට දැන් අවශ්‍යයි අපේ රටේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කරන්න. ඒ වාගේම අපනයන ආර්ථිකය අපි ශක්තිමත් කරන්න ඕනෑ. ඒවාට උර දෙන විධියට කටයුතු කරන්නයි මුදල් අමාත්‍යාංශය විසින් මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම අපේ දේශීය කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවාට දිරියක් ශක්තියක් ලබා දෙමින්, පවුලේ ආර්ථිකය ශක්තිමත් කරන්න වාගේම ඒ පුද්ගලයන්ගේ ආර්ථික මට්ටම ඉහළ මට්ටමට ගෙනැල්ලා ආදායම් තත්ත්වය වර්ධනය කරලා මේ පවතින ආර්ථිකයට මුහුණ දීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කරන්නයි මේ සියල්ල සූදානම් කරන්නේ කියන එක මතක් කරමින් මා නිහඬ වනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Kabir Hashim. Before he starts his speech, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ.භා. 3.01]

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මා කථා කරන හැම අවස්ථාවකම ගරු අස්වර් මන්ත්‍රීතුමා සභාපති පුටුවේ වාඩි වෙනවා. මේක set කරලා කරන වැඩක්ද කියන්න මා දන්නේ නැහැ. ඒකට කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලංකාවේ බොහෝ දෙනෙක් කථා කරනවා පසු ගිය දිනවල බොහෝ ආශ්චර්යවත් දේවල් සිදු වෙලා තිබෙනවා කියලා. එකක් තමයි, 2010 දී යුද්ධය අවසන් වුණාට පස්සේ, 2010 දී ප්‍රභාකරන් මැරුණාට පස්සේ ලෝක කොටස් වෙළෙඳ පොළේ හොඳම වෙළෙඳ පොළවල් අතරින් ලංකාවේ කොටස් වෙළෙඳ පොළ දෙවන ස්ථානය ලබා ගත්තාය කියන එක. නමුත් 2011 දී, යුද්ධය අවසන් වෙලා වර්ෂයක් ගියාට පස්සේ ලෝකයේ දුර්වලම කොටස් වෙළෙඳ පොළවල් අතරින් දෙවන ස්ථානයට පත් වෙන්න ලංකාවේ කොටස් වෙළෙඳ පොළට හැකියාව ලැබුණා. මේක තමයි ආසියාවේ ආශ්චර්යය! ඊළඟට අපි දැක්කා කෞතුකාගාරය හොරු කැඩුව හැටි. ඒ වාගේම මධ්‍යම මට්ටමේ රටක් හැටියට නම් කරපු ශ්‍රී ලංකාවේ කැබිනට් එක නියෝජනය කරන ඇමතිවරයෙක් කියනවා, "රුපියල් 7,500කට තුන් දෙනෙකුගෙන් යුත් පවුලක් ජීවත් කරවන්න පුළුවන්" කියලා. මෙන්න මේ වාගේ අරුම පුදුම දේවල් පසු ගිය කාලයේ සිද්ධ වුණා. ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා මේ වාගේ ප්‍රකාශයක් කිරීම පිළිබඳව මම අදහස් කීපයක් ප්‍රකාශ කරන්න ඕනෑ. මොකද, මේ රටේ මිනිසුන්ගේ ප්‍රායෝගික බුද්ධියට කරපු සමච්චලයක් හැටියට තමයි අපි මේ ප්‍රකාශය දකින්නේ. දුප්පත්කමට සමච්චල් කරන එක වැරැදියි. දුප්පත්කමටත් ගෞරවයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම 2010 දරිද්‍රතා සීමාව - povertyline - අනුව එක පුද්ගලයෙකුට මාසයකට ජීවත් වෙන්න අවශ්‍ය අවම ආදායම රුපියල් 3,100ක් බව විශේෂඥයෝ ප්‍රකාශ කරලා තිබෙනවා. ඒකත්, "A dollar a day" කියන එකත් බොහෝ දෙනෙක් පිළිගන්නේ නැහැ. බොහෝ දෙනෙක් කියන්නේ, "Two dollars a day" කියලා. ඒ කියන්නේ, දරිද්‍රතා රේඛාවෙන් ඉහළ මට්ටමක ජීවත් වෙන්න නම් මාසයකට අවම වශයෙන් රුපියල් 7,500ක්වත් ඕනෑය කියන එක. ආර්ථික විශේෂඥයෝ කියනවා එය අවම වශයෙන් 3,100ක්වත් විය යුතුය කියලා.

බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියන්නේ රුපියල් 2,500කින් එක පුද්ගලයෙකුට මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියලායි. දුප්පත්කම -දිළිඳුභාවය- මනින්නේ ආදායම්වලින් හෝ මුදල්වලින් විතරක් නොවෙයි. කෙනෙකුගේ මූලික සේවාවලට ප්‍රවේශ වීමේ අවස්ථා - access to basic needs - ගණනාවක් තිබෙනවා. අධ්‍යාපනය, සෞඛ්‍යය, සමාජ අපේක්ෂා ආදිය මෙහිදී සලකා බැලිය යුතු කාරණා. මේ විධියට බොහෝ දේවල් තිබෙනවා දුප්පත්කම මනිනවා නම්. මේ ඇමතිවරයා මෙහෙම කියන්නේ කොහොමද? මේකෙන් ඉතාම පැහැදිලියි ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ සහ ආණ්ඩුවේ මානසිකත්වය කොහේද තිබෙන්නේ කියලා. ඇමතිවරු ඇතුළු ආණ්ඩුවේ සියලු දෙනාම හොඳට කාලා බීලා සුපිරි ජීවිතයක් ගත කරන අතර, සාමාන්‍ය මිනිසුන්ට ලෙව කාගෙන ජීවත් වෙන්න කියන පණිවුඩය තමයි කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය අවසන් වෙලා වසර තුනකින් පසුව මේ වාගේ ප්‍රකාශයක් කරන එක ගැන කනගාටුයි. බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට විශේෂයෙන්ම මා මේ කාරණය කියන්න ඕනෑ. එතුමා අභියෝග කරලා තිබුණා එතුමා එක්ක තර්ක කරන්න උපාධියක් කරපු කෙනෙක් එවන්න කියලා. එතුමා එක්ක තර්ක කරන්න උපාධියක් කරපු කෙනෙක්ම යවන්න ඕනෑ නැහැ. එතුමාගේ මේ වාගේ බොළඳ තර්කවලට උත්තර දෙන්න අපි යවන්නේ කවුද? අපි බලාපොරොත්තු වන්නේ කම්කරුවෙක්, එහෙම නැත්නම් කුලී වැඩ කරන කෙනෙක් යවන්නයි. කුලී වැඩ කරන කෙනකුට ප්‍රායෝගිකව මේ ගැන කථා කරන්න පුළුවන්. රුපියල් 2,500කින් එක් කෙනෙකුට ජීවත් වෙන්න පුළුවන්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
What is your point of Order?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා ගැන සඳහන් කරන එක වැරැදියි. එතුමා දැන් මේ ගරු සභාවේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි. ගරු කබීර් හාෂිම් මන්ත්‍රීතුමා කථාව කර ගෙන යන්න.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මම එතුමා කරපු ප්‍රකාශයක් ගැන කියන්නේ. එතුමා ගැන පෞද්ගලිකව කිසිම දෙයක් කියන්නේ නැහැ. අපි කියන්නේ, එතුමා ඒ කරපු අභියෝගයට උත්තර දෙන්න කුලී වැඩ කරන කෙනෙක් යවන්න ලෑස්තියි කියන එකයි. එයා කියයි රුපියල් 7,500කින් තුන් දෙනෙකුට ජීවත් වෙන්න පුළුවන්ද බැරිද කියලා. ඒ තර්කය බිඳින්න උපාධිධාරියෙක්ම ඕනෑ නැහැ; න්‍යායයන්, පොත් ඕනෑ නැහැ. ඒ ගැන කියලා දෙන්න ආර්ථික විද්‍යාව ඉගෙන ගන්න ඕනෑ නැහැ.

බුදුරජාණන් වහන්සේ සිගාලක ගෘහපති පුත්‍රයාට සිගාලෝවාද සූත්‍රය දේශනා කරමින් කිව්වා, කෙනෙක් උපයන ආදායම වියදම් කරන්නේ කොහොමද කියලා. ඒ මෙහෙමයි.

"ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය,
ද්වීහි කම්මං පයෝජයේ,
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය,
ආපදාසු භවිස්සතීති"

ඒ අනුව බන්දුල ගුණවර්ධන ඇමතිතුමා සහ මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු දැන ගන්න ඕනෑ කෙනෙක් උපයන ආදායම කොටස් හතරකට බෙදී යන්න ඕනෑ බව. ආදායමින් හතරෙන් එක කොටසක් තමන්ගේ පරිභෝජනය සඳහා පාවිච්චි කරන්න ඕනෑ. බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියන විධියට තුන් දෙනෙකුට රුපියල් 7,500ක්. එතකොට එක් කෙනෙකුට රුපියල් 2,500ක්. රුපියල් 2,500න් හතරෙන් එකක් නම් රුපියල් 600යි. රුපියල් 600න් තමයි කන්න වන්නේ. ආදායමින් හතරෙන් දෙකක් පාවිච්චි කරන්න ඕනෑ ආයෝජනයට. ඉතුරු හතරෙන් එක හදිසියකට ගන්න ඉතිරි කරන්න ඕනෑ. ආපදාසු භවිස්සතීති. මෙහෙම තමයි ආණ්ඩුවත් හිතන්න ඕනෑ. මේ ආණ්ඩුවේ බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කියන්නේ රුපියල් 2,500 කින් කෙනෙකුට ජීවත් වන්න පුළුවන් කියලායි. මේක විහිළුවක්. අද ආණ්ඩුව කොහේද ඉන්නේ කියන එක මේ කථාවෙන් පැහැදිලි වනවා. ඒ නිසා අපි තරයේම මේ ප්‍රකාශයට විරුද්ධ වනවා.

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය අය වැය විවාදයේදී මම කිව්වා, මේ රජය අන්ත නියෝ ලිබරල්වාදී ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා කියලා. දේශප්‍රේමී මුහුණක් දමා ගත්තාට මේ ආණ්ඩුවට තිබෙන්නේ නියෝ ලිබරල්වාදී ප්‍රාණයක්. මම එහෙම කිව්වේ හේතුවක් ඇතුව. ඒකට සාක්ෂි ඇතුවයි කථා කරන්නේ.

මේ රටේ මූලික ගිණුම් තුනක් තිබෙනවා. ජංගම ගිණුම, ප්‍රාග්ධන ගිණුම සහ විදේශ සංචිත ගිණුම වශයෙන්. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය අනුගමනය කළාට, කිසිම දවසක ප්‍රාග්ධන ගිණුම විවෘත කළේ නැහැ. එහි තිබෙන සීමා මායිම් අයින් කළේ නැහැ. ඒ ගනුදෙනුවලට රෙගුලාසි පනවා තිබුණා. නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මහින්ද චින්තනය යටතේ, 2010 නොවැම්බර් 22 වන දා ඒ රෙගුලාසි අයින් කරලා ප්‍රාග්ධන ගිණුම සම්පූර්ණයෙන්ම විවෘත කළා. ලෝකයේ සිටින ජාත්‍යන්තර හොර ජාවාරම්කරුවන් ලංකාවට ඇවිත් එක එක ජාවාරම් කරලා මෙහෙන් ඩොලර් අරගෙන යන දොරටුව සම්පූර්ණයෙන්ම විවෘත කර දැම්මා. ඒ අනුව මහින්ද චින්තන නියෝ ලිබරල්වාදී ගමන ඉදිරියටත් ගෙන යන වැඩ පිළිවෙළක් තමයි අද ගෙනෙන මේ පනත්වලින් අපි දකින්නේ. ඒ කරුණ අද මේ පනත්වලින් සහතික වනවා. මම ඒක තේරුම් කරලා දෙන්නම්.

අද දෙවන වර කියැවීම සඳහා මුදල් පනත් හයක් ඉදිරිපත් කළා. මුදල් පනත් කෙටුම්පතේ 11 වන පිටුවේ IV වන කොටසේ සඳහන් අන්දමට බටහිර රටවලට අනුගත වීම, IMF එකේ නීතිරීතිවලට යටත් වීම වාගේම නියෝ ලිබරල්වාදී විලාසයක් මේ පනත් කෙටුම්පත්වල අන්තර්ගත වී තිබෙන බව ඉතා පැහැදිලිව අපට පෙනී යනවා. මේ පනතෙන් ඉඩ හැදෙන්නේ මොකටද? ජාත්‍යන්තර ජාවාරම්කරුවන්ට ලංකාවේ නීතිරීතිවලට උඩින් ක්‍රියාත්මක වෙන්න පුළුවන් ක්‍රමවේදයක් මේ පනත්වලින් සකස් කර තිබෙනවා. ඒ කියන්නේ කළු සල්ලි ජාවාරම්කරුවන්ට, මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට මේ ලංකාව පාවිච්චි කරන්න පුළුවන්, ලංකාව කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කරන්න පුළුවන් අවස්ථාව මේ පනත්වලින් ඇති වෙනවා කියන එක තමයි අපේ විශ්වාසය. 2012 අය වැය කථාවේදී ජනාධිපතිතුමා මේ පනත් ගැන කියලා, එක් තැනක ඒක ප්‍රකාශ කර තිබෙනවා. නමුත් එදා අය වැය විවාදයේදී ඉදිරිපත් කරපු යෝජනා මේ පනත්වලට ගෙනාපු ආකාරයේ වෙනසක් -පරස්පරයක්- තිබෙනවා. මෙතැන රංජිත් සියඹලාපිටිය ඇමතිතුමා ඉන්නවා. එතුමා අය වැය යෝජනා ටික බැලුවා නම් පෙනෙයි. අය වැය කථාව 2012, සම්බන්ධිත ලේඛන සහ තාක්ෂණික සටහන් යටතේ 27 වන පිටුවේ කේන්ද්‍රස්ථාන සේවා (විශේෂ විධිවිධාන) පනත යටතේ මෙහෙම සඳහන් වනවා :

"කේන්ද්‍රස්ථාන සේවා (විශේෂ විධිවිධාන) පනත

... -ඇහලුම් ආශ්‍රිත ආනයනයන්, සරල සකස් කිරීම සහ ප්‍රතිඅපනයනය සම්බන්ධයෙන් වන අන්තරාල වෙළඳාම.

- ඇහලුම්, රෙදිපිළි, සම්පාදනය හෝ නිෂ්පාදනය එක් රටක සිදු වී ශ්‍රී ලංකාවේ නාවික ක්‍රියාකාරකම්වලට ගෙන ඒමක් නොමැතිව තවත් රටකට අපනයනය කෙරෙන ඇහලුම්, රෙදිපිළි ප්‍රතිනැව්ගත කිරීමේ ව්‍යාපාරයක්."

මේ හැම තැනකම ඇහලුම් ගැන තමයි කථා කරන්නේ. නමුත් මුදල් පනත් කෙටුම්පත ගෙනැවිත් තිබෙන්නේ වෙනත් විධියකටයි. මේ මුදල් පනත් කෙටුම්පතේ ඇහලුම් සම්බන්ධ කථාවක් නැහැ. මුදල් පනත් කෙටුම්පතේ 11 වන පිටුවේ IV වන කොටසේ මෙහෙම සඳහන් වනවා:

"IV වන කොටස

(235 වන අධිකාරය වූ) රේගු ආඥා පනත, (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත සහ 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත යන පනත්වල විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කිරීම. ..."

මෙම මුදල් පනත් කෙටුම්පතේ IV වන කොටසේ 16. (1) උප වගන්තියෙන් මෙහෙම කියනවා.

"ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ඇති කර ගත් ගිවිසුමක අර්ථානුකූලව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරවල නිරත වන යම් ව්‍යවසායක්, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් වන්නේය:"

රේගු ආඥාපනතෙන් - Customs Ordinance එකෙන්-, පහත සඳහන් වන ව්‍යාපාර සම්පූර්ණයෙන්ම නිදහස් කරන්න තීරණය කර තිබෙනවා. මෙය exemption නොවෙයි. සම්පූර්ණයෙන්ම free කරනවා, කිසිම පාලනයකින් තොරව. එම ආයතන මොනවාද? මුදල් පනත් කෙටුම්පතේ 16.(1) උප වගන්තියේ තවදුරටත් මෙසේ තිබෙනවා.

"(අ) ආනයනය, සුළු පිරිසැකසුම් සහ ප්‍රතිඅපනයනය සම්බන්ධ අන්තරාල වෙළඳාම; offshore businesses.

(ආ) එක් රටකින් සපයනු ලැබිය හැකි හෝ එක් රටකදී නිෂ්පාදනය කරන ලද හෝ භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබීමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කළ හැකි අක්වෙරළ ව්‍යාපාර;

(ඇ) විදේශීය සේවාදායකයන්හට පෙර නිමි සේවා සැපයීම;

(ඈ) මූල්‍ය සැපයුම් දාමය කළමනාකරණය කිරීම සහ බිල්ගත කිරීම මෙහෙයවීම මඟින් ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ මූලස්ථාන මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

(ඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් සැපයීම හෝ විවිධ රටවල් සංගෘහිත කිරීම වැනි සැපයුම් සේවා සිදු කිරීම;"

මේවා රේගු ආඥාපනතෙන් විතරක් නොවෙයි නිදහස් කරන්නේ. ඊ ළඟට මෙම මුදල් පනත් කෙටුම්පතේ 17. (1) උප වගන්තියෙන් මොකක්ද කියන්නේ? එය මෙසේයි:

"ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ඇති කර ගත් ගිවිසුමක අර්ථානුකූලව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරවල නිරතවන යම් ව්‍යවසායක්, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් වන්නේය".

සම්පූර්ණයෙන්ම විනිමය පාලනයෙන් නිදහස් කිරීම කිසිම පාලනයක් නැතිව කරනවා. එය සම්පූර්ණ නිදහස් කිරීමක්. ඒකත් මදිවාට, 18. (1) වගන්තියෙන් කියනවා, මේ සියලුම දේවල් "1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් වන්නේය" කියලා. මේවා ආනයන සහ අපනයන පනතෙනුත් නිදහස් වෙනවා. විනිමය පාලනයක් නැති වනවා. ඒ වාගේම ආනයන සහ අපනයන පාලනය නැති වෙනවා. ඒ වාගේම අපේ රටේ රේගු ආඥාපනතින් මේ ආයතන ටික සම්පූර්ණයෙන්ම නිදහස් වෙනවා. මේක එතැනින් නවතින්නේ නැහැ. එතැනින් එහාට මොකක්ද කියන්නේ? ආයතන කීපයක් ගැන කථා කරන අතර මුදල් පනතේ 18.(3) උපවගන්තියේදී මෙහෙම කියනවා.

"භාණ්ඩ, ගුදම් භාණ්ඩ හෝ වෙළෙඳ භාණ්ඩ සංචලනයෙහි නොයෙදෙන, (1) වන උපවගන්තියේ සඳහන් යම් ව්‍යවසායක් ඉහත සඳහන් නිදහස් වරායකින් හෝ බන්ධිත ප්‍රදේශයකින් පිටත තම ක්‍රියාකාරකම් සිදු කරනු ලැබිය හැකිය".

මෙයින් පෙන්වා දෙන්නේ නිදහස් වරාය කලාපයේ - Free Port එකක- විතරක් නොවෙයි, බන්ධිත ගබඩා ප්‍රදේශයක විතරක් නොවෙයි, ලංකාවේ ඕනෑ තැනකට -ගම්පහ, නුවරඑළිය, හැටන්, යාපනයේ- විදේශ ආයෝජකයෙකුට ඇවිල්ලා කොම්පැනියක් ආරම්භ කරලා, මේ පනතට අනුව ආණ්ඩුවට ඕනෑ නම් තීරණය කරලා අපේ කිසිම කළමනාකරණයකින් තොරව කටයුතු කරන්න ඒ විදේශිකයාට සම්පූර්ණ සහනය දෙන්න පුළුවන් කියන එකයි. විනිමය පාලනයක් නැතිව, ඒ වාගේම අපේ රේගු ආඥාපනතේ කිසිම පාලනයක් නැතිව, ආනයන සහ අපනයන පනතේ කිසිම පාලනයකින් තොරව, තමන්ට කටයුතු කරන්න ඉඩ දෙන්න මේ පනත අද ක්‍රියාත්මක කරනවා. නියෝ ලිබරල්වාදී රටක්වත් මේ වාගේ පනතක් ඉදිරිපත් කරන්නේ නැහැ. ඇමෙරිකාවට එක එක විධියට පහර ගහනවා අපි දැක්කා, Google පාවිච්චි කරන්න එපා, කෝකා කෝලා බොන්න එපා, චොක්ලට් කන්න එපාය කියලා. එහෙම බොළඳ තර්ක ගේන කොට මේ පැත්තෙන් ලංකාවේ ශුද්ධ වූ භූමිය එක එක විදේශික ජාවාරම්කරුවන් ඇවිල්ලා මත් ද්‍රව්‍ය කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කරන්න, කළු සල්ලි ජාවාරම් කරන කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කරන්න, මේ ආණ්ඩුව ගෙනෙන මේ මුදල් පනතෙන් කෙළින්ම ඒ අයට licence දෙනවාය කියන එක තමයි අපේ මතය.

**ගරු රෝහණ දිසානායක මහතා (ප්‍රවාහන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹண திசாநாயக்க - போக்குவரத்து பிரதி அமைச்சர்)
(The Hon. Rohana Dissanayake - Deputy Minister of Transport)
"Regaining Sri Lanka" -[බාධා කිරීමක්]

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
අපි දැන් කථා කරන්නේ "මහින්ද චින්තනය" ගැනයි, නියෝජ්‍ය අමාත්‍යතුමනි. "Regaining Sri Lanka" ගැන නොවෙයි. අපි කරපු හැම දෙයක්ම-[බාධා කිරීමක්] නැහැ, නැහැ. වරද්දා ගන්න එපා. අපි හොරෙන් පනත් ගෙනාවේ නැහැ. ලජ්ජා නැහැ, තමුන්නාන්සේලා හොරෙන් පනත් ගෙනෙනවා. අපි කිසි දවසක හොරෙන් පනත් ගෙනාවේ නැහැ. මුළු රටටම කියලා අපේ ප්‍රතිපත්තිය ගැන කථා කළා. අපි විවෘත ආර්ථික ප්‍රතිපත්තිය අනුගමනය කෙරුවායි කියලා අපි කිව්වා. තමුන්නාන්සේලා දේශීය ප්‍රතිපත්තියක් අනුගමනය කරනවාය කියනවා. අද ලජ්ජා නැහැ. රෙදි ඇඳගෙනද, තමුන්නාන්සේලා අපේකම ගැන කථා කරන්නේ? අද රටේ සාරධර්ම පවා විකුණන, සමාජය පිරිහෙන ආකාරයට, සංස්කෘතිය පිරිහෙන ආකාරයට නිරුවත් වෙළෙඳ තීරු, කැසිනෝ වීදි, සුද්දන්ට රට විකුණන මේ වාගේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කරන්නේ මේ ආණ්ඩුවට ලජ්ජා නැතිකම නිසාද කියලා මම අහන්න කැමැතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මේවා ගැන දන්නේ නැතුව විවාද කරන්න එපා. තමුන්නාන්සේලාත් අපිත් එක්ක එකතුවන්න, මේවා පරද්දන්න. මේ පනත භයානකයි. තමුන්නාන්සේලා කොයි පැත්තේ සිටියත් මේ පනත රටට භයානක පනතක් කියලා අපි තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ නිදහස් වරාය පිහිටුවන්නේ කොහේද කියලා තවම කියලා නැහැ. හම්බන්තොටට ආයෝජකයෝ යන්නේ නැති නිසාද මේ වාගේ දණ ගහගෙන ගිහිල්ලා, වැඳලා, සුද්දන්ට මෙහෙම සහන දීලා තිබෙන්නේ. පළමු වතාවට විනිමය පාලකයාට කිසිම අයිතියක් නැතිවනවා, මේ රටට කිසිම බලයක් නැති වනවා, මේ පනතෙන් අනුමත වන ආකාරයට ආයෝජකයන් ඇවිල්ලා මේ රටේ ජාවාරම් කරන කොට ඒ අයව පාලනය කරන්න. කෝටි ගණනක ඩොලර් ගෙනැල්ලා ගෙනියන්න පුළුවන්. කළු සල්ලි සුදු කරන්න පුළුවන්. ඒකට තමයි මේ මුදල් පනතෙන් licence එක දීලා තිබෙන්නේ.

එහෙම නම් මේ දණ ගහ ගෙන මෙහෙම යන්නේ ආයෝජකයෝ එන්නේ නැති නිසාද? අපි එක පැත්තකින් වාචිකව බටහිර රටවලට ගහනවා. අනෙක් පැත්තෙන් මේ බටහිර ජාවාරම්කරුවන්ට මේ ආණ්ඩුව licence දෙනවා, මෙහේ ඇවිල්ලා අපේ සංස්කෘතිය නැති කරන්න; අපේ සමාජය නැති කරන්න; අපේ ආර්ථිකය ආක්‍රමණය කරන්න. මේක තමයි මහින්ද චින්තනයේ සැබෑ තත්ත්වය. මේක දැන ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මෙය තවදුරටත් සහතික කරන්න කැමැතියි. අපේ විදේශ සංචිතය ගන්න. 2012

[ගරු කබීර් හාෂීම් මහතා]

ජනවාරි මාසය වන කොට -ඒ මාසය තුළ- අපේ විදේශ සංචිතය සියයට 39කින් කඩා ගෙන වැටුණා. ඩොලර් බිලියන 08ක් තිබුණු විදේශ සංචිතය ඩොලර් බිලියන 05ට කඩා ගෙන වැටුණා. අපේ ගෙවුම් ශේෂයේ, වෙළෙඳ ශේෂයේ අද අර්බුදයක් නිර්මාණය වෙමින් පවතිනවා. අපේ වෙළෙඳ ශේෂයේ සහ ගෙවුම් ශේෂයේ ප්‍රශ්නය උග්‍ර වෙමින් පවතිනවා.

ඇත්තටම මේ ආණ්ඩුවේ ආනයන ප්‍රතිපත්තිය කුමක්ද? එහි පාලනයක් තිබෙනවාද? ඒකට කාරණාවක් තිබෙනවා, අහන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම උදාහරණයක් කියන්නම්. පසු ගිය වසර දෙක තුළ ලංකාවේ රත්තරන් ආනයනය බලන්න. 2010 දී ලංකාවට ගෙනා රත්තරන්වල වටිනාකම රුපියල් කෝටි 23යි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒක හොඳ නැද්ද?

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඒක හොඳයි. 2011 වන කොට ලංකාවට ආනයනය කළ රත්තරන් ප්‍රමාණයේ වටිනාකම රුපියල් කෝටි 67යි. ඒ කියන්නේ එක අවුරුද්දක සිට අනෙක් අවුරුද්ද වන කොට - 2010-2011 වර්ෂය අතර- රුපියල් කෝටි 44කින් එනම් සියයට 200කින් ලංකාවේ රත්තරන් ආනයනය වැඩි වෙලා තිබෙනවා. අපට විදේශ විනිමය නැහැයි කියනවා, ළමයින්ට කිරිපිටි ගෙනෙන්න; ළමයින්ට බෙහෙත් ටික ගෙනෙන්න. රත්තරන් ගෙනැල්ලා ඒවාට මොකක්ද කළේ? ඒ හා සමානව ස්වර්ණාභරණ නිෂ්පාදනයේ වැඩිවීමක් අපි දැක්කේ නැහැ. අපි දැක්කේ නැහැ, රත්තරන්වලින් නිෂ්පාදනය කරපු භාණ්ඩ අපනයනය වෙනවා. නමුත් මේ ආනයනය වැඩි වුණේ කොහොමද? මේකේ මොනවා හෝ ජාවාරමක් තිබෙනවාද? හොර ජාවාරමක් තිබෙනවාද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මුස්ලිම් අයගේ මඟුල් ගෙවල්වලට තමයි රත්තරන් වැඩියෙන් පාවිච්චි කරන්නේ. ඒකත් එපා කියනවාද?

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මේ ආණ්ඩුව කියනවා, මිනිසුන්ට කන්න පාන් දෙන්න බැහැයි කියලා. මිනිසුන්ට රත්තරන් කන්න කියලාද මෙච්චර රත්තරන් ආනයනය කරන්නේ? අපි අහන්නේ මොකක්ද මේ ප්‍රතිපත්තිය කියලා. තමුන්නාන්සේලාගේ මහින්ද චින්තනය දේශීය ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා නම් මේ වාගේ රටේ ආර්ථිකය විවෘත කරන්නේ මොන හේතුවක් මතද? අපට කනගාටුයි, ලජ්ජයි, තමුන්නාන්සේලා කරන වැඩ ගැන කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික හෙළ උරුමයේ නායකයා - චම්පික රණවක මැතිතුමා- මේ ආණ්ඩුවේ කොටස්කරුවෙක්. එතුමා ප්‍රකාශයක් කර තිබුණා, "අද සමාජය පිරිහීමට ප්‍රධාන හේතුව ආර්ථිකය කඩා වැටීම" කියලා. එක පැත්තකින් ඇත්ත. සමහර වෙලාවට සමාජය බිඳ වැටෙන්නේ, සමාජය පිරිහෙන්නේ ආර්ථිකය බිඳවැටීමත් එක්ක. එතුමා අද ඒක පිළිගන්නවා. එතුමා පිළිගන්නවා, ආර්ථිකය කඩා වැටිලායි කියලා. නමුත් එක පැත්තකින් අප දකිනවා, පසු ගිය කාලයේ මේ ආණ්ඩුව සමාජයීය හා සංස්කෘතික ආක්‍රමණය බටහිර බලවේගවලට භාර දී ඉවරයි කියන එක. ආර්ථික ආක්‍රමණය කොහොම ද සිද්ධ වෙලා තිබෙන්නේ? මේ ආණ්ඩුව මහ ලොකුවට කථා කළාට, මොනරාගල පැත්තේ හේන් ගොවීන්ගේ ඉඩම් අක්කර දහස් ගණන් ඇමෙරිකාවේ ඩෝල් සමාගමට කෙසෙල් වගාවට භාර දීලා ඉවරයි. එතකොට ඒවා ආර්ථික ආක්‍රමණයක් නොවෙයිද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ ආණ්ඩුව අපේ රජ කාලයේ හදාපු වැව් ටික සුද්දන්ට බදු දෙන්නට දැනට අනුමත කර ඉවරයි. [බාධා කිරීම්] විදේශිකයෝ ගෙන්වන්නට රටේ සංස්කෘතියත් ඉවර කරනවා. එපමණක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංස්කෘතික කඩා වැටීම බලන්න. මේ ආණ්ඩුව අනුමත කර තිබෙනවා, නිරුවත් වෙරළ තීරු ආරම්භ කරන්න. කැසිනෝ වීදිය කියා එක පළාතක්ම කැසිනෝ දාන්නට දැන් අනුමත කර තිබෙනවා. අද මේ රටට ඕනෑ වී ඇත්තේ තෙල් පිරිපහදුවක් නොවෙයි. ඇත්තටම මේ රටට ඕනෑ වී ඇත්තේ කුඩු පිරිපහදුවක්. මොකද, අද මුළු සමාජයේම කුඩු ව්‍යාප්ත වෙලා තිබෙනවා. අද මේ රටට කුඩු පිරිපහදුවක් ඕනෑ. මොකද, මත් ද්‍රව්‍ය ජාවාරම වර්ධනය වෙමින් පවතින්නේ, මේ වාගේ ප්‍රතිපත්ති අනුගමනය කරන නිසායි. [බාධා කිරීමක්] ගරු චම්පික රණවක ඇමතිතුමන්ලාටත් අප කියන්නේ මොකක්ද? ඔබතුමන්ලා අපේක්ෂ ගැන කථා කරනවා. මේ ආර්ථික කඩා වැටීම සිදු වී තිබෙන්නේ ඇයි? අපේකම කියන්නේ මොකක් ද? අද බලන්න. වී ගොවීන්ට සහතික මිලක් දෙන්න බැහැ. තමන්ගේ වී ටික විකුණා ගන්න බැහැ. හේතුව මොකක්ද? දැනට අවුරුදු දෙකකට කලින් ගරු ජනාධිපතිතුමා මෙහෙ ඇවිත් කිව්වා, පිටි ගෙනෙන එක අඩු කරනවා, නතර කරනවා කියා. මොකක් ද වෙලා තිබෙන්නේ? 2010 වර්ෂයේදී පිටි මෙට්‍රික් ටොන් නව ලක්ෂ හතළිස්පන්දාහක් ගෙනාව එක, 2011 වනකොට මෙට්‍රික්ටොන් මිලියන 1.3කින් මේ රටට පිටි ගෙන ඒම වැඩි වෙලා තිබෙනවා. වටිනාකමින් බලනකොට මිලියන 24,000කින් පිටි ආනයනයට වැඩි වියදමක් ගිහින් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Hon. Member, please wind up now.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
පිටි වැඩි ප්‍රමාණයක් රටට ආනයනය කර තිබෙන අතර අපේ ගොවීන්ගේ වී ටික විකුණා ගන්න බැරි වෙලා තිබෙනවා. මොකක්ද මේ ප්‍රතිපත්තිය? මහ ලොකුවට අපේකම ගැන කථා කරනවා. "අපි පාන් කන්න දෙන්නේ නැහැ. පිටි ගෙනෙන්නේ නැහැ. වී නිෂ්පාදනය වැඩි කරනවා"යි කියනවා. මෙන්න අවුරුද්දක් ඇතුළත පිටි ආනයනය වැඩි වෙලා තිබෙනවා. මේකද, මහින්ද චින්තනය? තමුන්නාන්සේලා මේ වාගේ පනත් කෙටුම්පත් පාර්ලිමේන්තුවට ගෙනැවිත් විදේශිකයාට මෙහි ඇවිත් ජාවාරම් කරන්න ඉඩ දෙනවා මිසක් මේ රටේ දේශීය කර්මාන්තකරුවාට නැඟිටින්න, දේශීය ගොවියාට නැඟිටින්න අවස්ථාවක් ලබා දෙන්නේ නැහැ. හේන් ගොවියාව අයින් කරලා ඇමෙරිකාවේ කෙසෙල් ගොවියාට ඉඩම් ටික දෙනවා. ඒ වාගේම වී ගොවියාට පහර දීලා විදේශ සංචාරකයන්ට වැව් ටික බදු දෙනවා. මේකද, මහින්ද චින්තනය?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
එම නිසා මේ පනත් කෙටුම්පත් මේ රටට හානි කරන පනත් කෙටුම්පත් බව මෙම අවස්ථාවේදී විපක්ෂය වෙනුවෙන් අපි ප්‍රකාශ කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක් තිබෙනවා.

[අ.භා. 3.23]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කබීර් හාෂිම් මන්ත්‍රීතුමා කියපු දේ නිසා එතුමාට අද ගමේ යන්නත් බැරි වෙයි. මොකද, වැඩිපුර රත්‍රන් පළඳින්නේ අපි නොවෙයි, මුස්ලිම් මහුල් ගෙවල්වලටයි. එතුමා කියනවා, රත්‍රන් ගෙන්වනවාත් වැඩියි ලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෙල්ල තිබෙන්න ඕනෑ තැල්ල දමන්න. අද ඕනෑ කෙනකුට උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ ඕනෑ තැනකට කිසි කරදරයක් නැතුව යන්න පුළුවන්. ද්‍රවිඩ ජනතාව සිංහල ජනතාවට වඩා විශාල වශයෙන් රත්‍රන් පාවිච්චි කරනවා. මුස්ලිම් මඟුල් ගෙදරක ගියාම මා දැක්කා, රත්‍රන් පුරවලා තිබෙනවා. මුස්ලිම් කාන්තාවෝ විශාල වශයෙන් රත්‍රන් පැළඳ ගෙන ඉන්නවා. කබීර් හාෂිම් මන්ත්‍රීතුමාට පොඩි ප්‍රශ්නයක් වෙයි. තමුන්නාන්සේට ගමට යන්න බැරි වෙයි. [බාධා කිරීම්] අපි සීමා කරන්නේ නැහැ, - [බාධා කිරීම්] කබීර් හාෂිම් මන්ත්‍රීතුමා මුස්ලිම් ජනතාවට කියනවා, රත්‍රන් මාල පළඳින්න එපාය කියලා. අද බෙල්ල තිබෙනවා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇයි, මන්ත්‍රීතුමන්ලාගේ නායකයා නේ, bracelets දෙනවාය කිව්වේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්න අද බෙල්ල තිබෙනවාය කියලා අපි කියනවා. බෙල්ල තිබෙන නිසා තැල්ල දමන්න පුළුවන්. තැල්ල දමන්න පුළුවන් නිසා අද රත්‍රන් ගෙනෙන්න පුළුවන්. රත්‍රන් ගෙනෙන එක වැඩියි. එතුමන්ලාගේ කාලයේ රත්‍රන් ගෙනෙන්න බැහැ. එතුමන්ලාගේ නායකතුමා කිව්වා, ගොවීන්ට bracelets දෙනවාය කියලා. නමුත් ගොවියාට bracelets දෙනවාය කිව්වාට ඒ කාලයේ ගොවියා වහ බිව්වා. මොකද, ඔවුන්ගේ බඩු ටික විකුණා ගන්න බැහැ. තක්කාලි ගොවියා වහ බිව්වා. ඊට අමතරව නැඟෙනහිර ප්‍රදේශයට යන්න බැහැ. ගිවිසුම් ගහලා, tax ගෙවලා යන්න ඕනෑ. ඉතින් අද නැඟෙනහිර ප්‍රදේශයට යන්න නිදහස තිබෙනවා. අද මේ රටට නිදහස තිබෙනවා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්න. එම නිසා දැන් මේ අය කෑ ගහනවා.

මේ පනත් කෙටුම්පත් තුළින් ඉතා වැදගත් බදු සංශෝධනයන් ගෙනැවිත් තිබෙනවා. දේශීය ආර්ථිකයට උදවු කරන ඕනෑම කෙනකුට, දේශීය කියා හිතන ඕනෑම කෙනෙකුට මේ සංශෝධනයන් ඉතාම වැදගත් වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවා ජාතිය ගොඩනැඟීමේ බද්ද වන්න පුළුවන්, එහෙම නැත්නම් එකතු කළ අගය මත බදු පැනවීමක් වෙන්න පුළුවන්.

මෙම අවස්ථාවේදී, අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මේ සභාවේ නොසිටියත් මා කියන්න ඕනෑ, එතුමා අන්තරාල වෙළෙඳාම ගැන කියා සිටි බව. අන්තරාල වෙළෙඳාම අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම ව්‍යාපාරයක මේ රටේ ව්‍යාපාරිකයෝ ඉන්නවා. අපි හිතමු, ඉන්දියාවට හා එංගලන්තයට බඩු අපනයනය කරන ව්‍යාපාරිකයෙක් ඉන්නවාය කියලා. ඔහු පිට රටින් බඩු ගෙන්වා ආපසු පිට රටට බඩු යවන කෙනෙක්. ඔහුගේ ව්‍යාපාරයට අපි උදවු කරන්න ඕනෑ. ඒ වාගේ ව්‍යාපාරිකයන් රාශියක් ඉන්න කොට ඔවුන්ට පිට රට බඩු ගෙනැවිත් ඒවා ප්‍රතිඅපනයනය කරන්න අවස්ථාව දීම තමයි අන්තරාල වෙළෙඳාම කියලා කියන්නේ. ඒ කියන්නේ සැපයුම් ක්‍රියාවලියේ කොටසක් හැටියට විතරයි මේක සිද්ධ වෙන්නේ. මේ රට තුළ නැවත සැකසීමක් සිද්ධ වන්නේ නැහැ. ඔහු භාණ්ඩය ගෙන්වනවා. ඒ ගෙන්වන භාණ්ඩය ඔහු නැවත ප්‍රතිඅපනයනයක් කරනවා. ඒක ඔහුගේ ව්‍යාපාරයට දියුණුවක් වනවා. ඒකෙන් වරායට ලොකු වාසියක් වනවා. එය වරායේ කටයුතුවලට ලොකු ප්‍රයෝජනයක් වනවා. ඒ වාගේම ඒ මඟින් අපේ වෙළෙඳ කටයුතු පුළුල් වීමක් සිද්ධ වනවා.

අන්තරාල වෙළෙඳාම යටතේ ලොකු වින්නැහියක් වෙනවාය කියලා බොරු යකෙකු පෙන්වන්න යනවා. මේ රට තුළ එවැනි වෙළෙඳ ව්‍යාපාරික කටයුතු කරන අයට, මේ රටට භාණ්ඩ ගෙන්වා, නැවත පිට රට යවන අයට මේ තුළින් ලොකු සේවාවක් සැපයෙනවා. මේ ක්‍රියාවලිය ගැන දන්නේ නැතුව, මේක වැරදි විධියට පෙන්වා, ව්‍යාපාරික ප්‍රජාවේ පුද්ගලයන් හැටියට තමන්ගේ රටේ ජීවත් වන මෙවැනි ව්‍යාපාර කරන පුද්ගලයන්ට විරුද්ධව තමයි හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කථා කළේ කියන එක අපි කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. මේ අන්තරාල වෙළෙඳාම සම්බන්ධයෙන් තිබෙන බද්ද නිසා වංචාවන් සිද්ධ වනවාය කියලා කිව්වා. ගරු කබීර් හාෂිම් මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ, කම්ටු අවස්ථාවේදී මුදල් පනත් කෙටුම්පතේ 16, 17 හා 18 වගන්ති සම්බන්ධයෙන් සංශෝධනයන් ගෙනැවිත් තිබෙනවාය කියලා. ඒ සංශෝධනයන් හරහා තමයි ඒ අය කටයුතු කරන්නේ. ඒ වාගේම ඒකේ සීමාවන් පනවා තිබෙනවා, කොයි ආකාරයෙන්ද කටයුතු කරන්න ඕනෑ කියලා. එම නිසා මෙයින් කිසිම අවස්ථාවක දේශීය වෙළෙඳ පොළට භාණ්ඩ නිකුත් වීමක් සිද්ධ වන්නේ නැහැ. එවැනි වංචාවක් සිද්ධ වන්නේ නැහැයි කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. මේකෙන් සිද්ධ වන්නේ දේශීය වශයෙන් ඒ වෙළෙඳාම කරන ව්‍යාපාරිකයාට ලොකු සහනයක් ලැබෙන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මා පැහැදිලිවම කියන්නට ඕනෑ, මේ රාජ්‍ය ආදායම ගත්තාම රුපියල් බිලියන 1,200ක් පමණ වන රාජ්‍ය ආදායමෙන් අද අපි රුපියල් බිලියන 397ක් ගෙවන්නේ රජයේ වැටුප් කියන එක. විශ්‍රාම වැටුප් සඳහා රුපියල් බිලියන 110ක්, තවත් රුපියල් බිලියන 12ක් විතර රණවිරුවන් වෙනුවෙන් වැය කරනවා. එතකොට මෙතුමන්ලා කියනවා, මෙතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ කිසි බද්දක් අය කළේ නැහැ කියලා. නමුත් මෙතුමන්ලාගේ ආණ්ඩුව කාලයේත් පෙට්‍රල් ටික ගෙන්වනකොට බදු අය කළා. පෙට්‍රල් ටික නිකම් ගෙනාවේ නැහැ, බදු අය කළා. අද ඩීසල් ලීටරයකට රුපියල් 2.25ක බද්දක් විතරයි අය කරන්නේ. අද එක්සත් ජාතික පක්ෂය උත්සාහ කරනවා, එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ මේ බදු අය කළේ නැහැ කියලා කියන්න. දැන් බදු අය කරන්නේ මොකටද කියලා අහනවා. අපේ රට සංවර්ධනය වෙමින් පවතින රටක් හැටියට බදු අදායමක් නැතිව රජයක් ඉදිරියට ගෙන යන්න

[ගරු ලලිත් දිසානායක මහතා]

හැකියාවක්, ශක්තියක් ලැබෙන්නේ නැහැ කියන එක අපි පැහැදිලිවම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා කිව්වා, සංචිතයක් ගැන. ඇමෙරිකන් ඩොලර් බිලියන 8ක සංචිතයක් තිබුණු එක ඇමෙරිකන් ඩොලර් මිලියන 5 දක්වා අඩු වෙලා තිබෙනවා. මොකද හේතුව, රුපියලේ අගය අපි පා කරලා හැරියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය නිතර හිර කරලා තබාගෙන ඉන්න බැහැ. ඒ නිසා ඩොලර් බිලියන 8ක් තිබුණු සංචිතය ඩොලර් බිලියන 5 දක්වා අඩු වෙලා තිබෙනවා. මේ විදේශ සංචිතයක් කියලා කියන්නේ, ස්ථාවර තැන්පතුවක් - FD එකක්- නොවෙයි. මෙය රටේ වෙළෙඳ ගනුදෙනු සිදු වීමේ දී ප්‍රයෝජනයට ගත යුතු දෙයක්.

දැන් ඩොලරයක අගය රුපියල් 134ට ගිහිල්ලා තිබෙනවා, මේ ප්‍රමාණය රුපියල් 122 දක්වා තව අඩු වෙනවා. අපි රුපියලේ අගය තියාගෙන ඉන්නකොට කියනවා, මේක හිර කරගෙන තියාගෙන ඉන්නවා, නිදහස් කරන්නේ නැහැ කියලා. නමුත් අද අපි පැහැදිලිව කියනවා, අද මේ රටේ සියයට 8ක ආර්ථික වර්ධනයක් තිබෙන බව. එය නැහැ යි කියලා කියන්න බැහැ. එතකොට එතුමා පිළිගත්තා විදේශ සංචිත ඩොලර් බිලියන 8ක් තිබුණු බව. තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලයේ විදේශ සංචිත බිලියන කීයද තිබුණේ? රනිල් වික්‍රමසිංහ මහත්මයා ආණ්ඩු කරපු ඒ කෙටි කාලය තුළ බොහොම අඩු ප්‍රමාණයක් තිබුණේ. ඒ ප්‍රමාණය අඩු වෙලා තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමා -රනිල් වික්‍රමසිංහ මහත්මයා- ඊයේ කිව්වා, අපි ණය ගෙවීම සඳහා මේ දේශීය වෙළෙඳ පොළේ මිල වැඩි කරලා තිබෙනවා කියලා. 2003 එතුමාගේ ආණ්ඩුව කාලයේ විදේශ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 107කට වඩා තිබුණා. අද එය සියයට 73 දක්වා අඩු කර තිබෙනවා. රුපියල් 100ක ආදායමක් ලබන කෙනෙකුට ගන්න පුළුවන් රුපියල් 10ක ණය මුදලක් නම්, ඔහුගේ ආදායම රුපියල් 1,000ක් වනකොට ඔහු ණය මුදල රුපියල් 100ක් ගන්නවා. ඉතින් මෙන්න මේක තේරුම් ගන්න බැරි විපක්ෂයක් තමයි අද ඉන්නේ. ඒ නිසා දළ ජාතික නිෂ්පාදනයත් එක්ක සංසන්දනය කරනකොට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ තිබුණාට වැඩියේ ඉතාම අඩු මට්ටමක තමයි, අපේ විදේශ ණය තත්ත්වය තිබෙන්නේ. ඒ නිසා රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමා කියනවා නම්, මේ රජය විදේශ ණය ගෙවන්න මිල ඉහළ දැම්මා කියලා, ඒක අමූලික අසත්‍යයක් කියන එක අපි කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය කරනු ලබන බදු තුළින් මේ රටේ මොනවාද කරන්නේ? අද මේ රට සහලින් ස්වයං පෝෂණය කරලා තිබෙනවා. සහලින් මේ රට ස්වයං පෝෂණය කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ කුමක් නිසාද? අද ඇමෙරිකාව මොන සම්බාධක පැනෙව්වත් අපට පොල් සම්බෝලයක් එක්ක බත් ටිකක් කාලා ඉන්නට පුළුවන්, ගරු කබීර් හාෂීම් මන්ත්‍රීතුමනි. ඒක පුළුවන් නේ? තමුන්නාන්සේගේ වත්තේ රබර් ටිකට අපි හොඳ මිලක් දීලා තිබෙනවා, කබීර් හාෂීම් මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේගේ තාත්තා තමයි කෑගල්ල දිස්ත්‍රික්කයේ හොඳම රබර් ව්‍යාපාරිකයා. ඒ නිසා තමුන්නාන්සේ කොළඹ සිටියත්, පාකිස්තානයේ සිටියත් තමුන්නාන්සේට ආදායම් තිබෙනවා. ඒක හොඳයි. ඒ මොකද, මේ රටේ තිබෙන ආර්ථික ප්‍රතිපත්තිය නිසා. මේ රටේ හොඳ ආර්ථික ප්‍රතිපත්තියක් තිබෙන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නම් අපේ ආදායම් ප්‍රමාණය ගැන. සංචාරක කර්මාන්තය ගැන අපේ බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා බොහොම තරහෙන් කථා කළා. තරහෙන් කථා කරලා වැඩක් නැහැ. දැන් මේ 2011 පළමු නව මාසය ගත්තාම සංචාරකයන්ගේ වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. 2011 පළමු නව මාසය ගත්තාම සංචාරකයන් 5,98,000ක්, ඒ කියන්නේ සංචාරකයන්ගේ පැමිණීම සියයට 34කින් වැඩි වෙලා තිබෙනවා. මේ වැඩි වීම නිසා ඇමෙරිකන් ඩොලර් මිලියන 580ක්, ඒ කියන්නේ සංචාරකයන්ගෙන් ලැබෙන ආදායම සියයට 48කින් වර්ධනය වෙලා තිබෙනවා. මේ සල්ලි තමයි මේ රටට ගලාගෙන එන සල්ලි. මෙතුමා කිව්වා, මේක කඩා ගෙන වැටිලා කියලා. කබීර් හාෂීම් මන්ත්‍රීතුමා, ඒක හරියට අර එළුවාගේ පස්සෙන් යනවා වාගේ තමයි. කඩා වැටෙන්නේ නැහැ.

මේ රටේ පැවැති යුද්ධය අවසාන වීම නිසාත්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාර්ය ශූර පාලනය නිසාත්, ප්‍රභාකරන්ගේ ත්‍රස්තවාදය අවසන් වීම නිසාත් අද සංචාරක ව්‍යාපාරය දියුණු වෙලා තිබෙනවා. අන්න ඒ නිසා සියයට 48ක්, ඒ කියන්නේ පසු ගිය අවුරුද්දට වැඩියෙන් පළමු වැනි මාස නවය තුළ ඇමෙරිකන් ඩොලර් මිලියන 580ක් වැඩි වෙලා තිබෙනවා. සියයට 7ක, සියයට 8ක වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම සංචාරකයා කරන වියදම ගත්තොත්, 2010 දී ඇමෙරිකන් ඩොලර් 88ක් වුණු සංචාරකයන්ගේ වියදම් ප්‍රමාණය 2011 මුල් මාස නවය තුළ ඇමෙරිකන් ඩොලර් 97 දක්වා වැඩි වෙලා තිබෙනවා. එතකොට බලන්න, සංචාරකයා මේ රටට මුදල් වියදම් කරන ප්‍රමාණයත් වැඩි වෙලා තිබෙනවා. එතකොට ඒ සංචාරකයන්ගෙන් ගලාගෙන එන මුදල් තමයි මේ රටට ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2010 පළමු මාස 06 තුළ ආදායම් ගිණුමේ හිඟය රුපියල් මිලියන 354ක් තිබුණු එක, 2011 පළමු මාස 06 තුළ ගත්තාම එය රුපියල් මිලියන 55 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒවා තමයි මේ රටේ දියුණුව, සංවර්ධනය කියන්නේ. ඔබතුමන්ලා නිකම් මේ රට දියුණු නැහැ, දියුණු නැහැ කියලා කියන්න එපා. මේවා බලන්න. පොත්පත් කියවලා බලන්න. බැංකු වාර්තා කියවලා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011 පළමු මාස හය තුළ පොලී සහ අනෙකුත් ලැබීම් ගත්තාම ඒ ආදායම්වල වර්ධනයක් ඇති වෙලා තිබෙනවා. ඒකට හේතුව මොකක්ද? විදේශ විනිමය සංචිත මත ලැබුණු පොලිය මේ රටට ආපු අදායමක්. ඒ වාගේම සුරැකුම් හා විදේශ විනිමය ගනුදෙනුවලින් එන ආදායම, සුරැකුම්පත් වෙළෙඳ පොළේ තිබෙන ආදායම රටට ගලා ගෙන ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටට ආදායම් ගෙනෙන ප්‍රධාන අංශයක් තමයි විදේශ සේවා නියුක්තිය. අද ඇමෙරිකන් ඩොලර් එක රුපියල් 134ට යන කොට විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ වර්ධනය වෙලා තිබෙනවා. 2011 පළමු මාස අට තුළ විදේශ ප්‍රේෂණ ඇමෙරිකන් ඩොලර් මිලියන 3,381 දක්වා, එනම් සියයට 27.1කින් වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ වසරේ මුල් කාර්තුවේ මැද පෙරදිග තිබුණු අර්බුදකාරි තත්ත්වය නිසා සියලු මුදල් මෙහාට ප්‍රේෂණය වුණා. මේවා ප්‍රායෝගිකව සැබෑ ලෝකයේ සිද්ධ වන දේවල්. නමුත් ආර්ථිකය කඩා වැටුණාය, මේ රටට ආදායම් ගලා ගෙන එන්නේ නැතිය, මේ රටින් මිනිස්සු යනවාය කියලා මෙතුමන්ලා අසත්‍ය තර්ක ගෙනෙනවා. ඩොලර් එක රුපියල් 134ට නෙඟින කොට ගරු කබීර් හාෂීම් මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාගේ මාවනැල්ලෙන් කොරියාවේ ගිය කොල්ලාගේ රුපියල් සියයට අද රුපියල් 134ක් හම්බ වෙනවා. ඒ එක පැත්තක්. අපිට වැඩිපුර ගෙවන්න වන එක අනෙක් පැත්තෙන් වෙන්න පුළුවන්. ඒකේ දෙපැත්තක් තිබෙනවා. රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිඵල දෙකක් තිබෙනවා. අපට ප්‍රේෂණ වන මුදල, එහෙම නැත්නම් කොරියාව වැනි විදේශ රටවල සිට අපට ආදායම් සපයන අපේ අහිංසක සේවා නියුක්තිකයන්ගේ ආදායම වැඩි වෙනවා. මොකද,

ඩොලරයේ අගය වැඩි වීම නිසා. මේකේ පැති දෙකක් තිබෙනවා. තමුන්නාන්සේලා එක පැත්තක් විතරක් පෙන්වන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2010 ප්‍රථම භාගයත් එක්ක සංසන්දනය කිරීමේදී-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාගේ වේලාව අවසන්.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
2010 ඍජු ආයෝජන ප්‍රමාණය ගත්තාම ඇමෙරිකන් ඩොලර් මිලියන 208.1ක් වුණා. එය 2011 ප්‍රථම භාගයේදී ඇමෙරිකන් ඩොලර් මිලියන 413.3ක් දක්වා, එනම් සියයට 98.6කින් වර්ධනය වෙලා තිබෙනවා. මෙතුමන්ලා කියන්නේ අසත්‍යය කියලා. ඒ වර්ධනය වෙලා තිබෙන ක්ෂේත්‍රය මොකක්ද? ඍජු ආයෝජන වර්ධනය වෙලා තිබෙන්නේ හෝටල්, ආපන ශාලා අංශයෙන්. ඒ අංශයෙන් සියයට 45.8ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. දුරකථන සහ විදුලි සංදේශ අංශයෙන් සියයට 23.7ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම ලෝහ භාණ්ඩ නිෂ්පාදනය, යන්ත්‍ර සූත්‍ර සැකසුම් කියන අංශයෙන් සියයට 07ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඒ තුළින් අද මේ රටේ ඍජු ආයෝජන ප්‍රමාණය වැඩි වෙලා මේ රටේ ආර්ථිකය ශක්තිමත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම කියන්න ඕනෑ අද බදු ගැන කථා කළාට, බද්දට වැඩිය මෙතුමන්ලා කථා කළේ ජිනීවා යෝජනාවක් ගැනයි කියා. අපි පැහැදිලිව එක දෙයක් කියන්න ඕනෑ. ජිනීවා යෝජනාවට අපේ රජයට, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට මුහුණ දෙන්නට සිද්ධ වුණේ ඇයි? ඇමෙරිකාව අපට ඇඟිල්ල දික් කළේ ඇයි? ඒ සියල්ල වුණේ අපි මේ රටේ තිබුණු ත්‍රස්තවාදය අපිට ඕනෑ විධියට නැති කළ නිසායි. අද බටහිර ප්‍රජාවට අපට බලපෑම් කරන්න බැහැ. එදා රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ යූඑන්පී එකට -අලියාට- කතිරය ගහලා ඡන්දය දුන්නාට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට සිද්ධ වුණා මායිම් ගම්මාන ඇති කරන්න ප්‍රභාකරන් එක්ක ගිවිසුම් අත්සන් කරන්න. ඇයි? මේ රටේ ත්‍රස්තවාදය තිබුණා. නමුත් අපි අද අවංකව හිතන්න ඕනෑ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒක වෙනස් කරලා තිබෙනවාය කියා. මේ රජය ඒක වෙනස් කරලා තිබෙනවා.

මේ රටේ ජනතාවට සාමය ලැබිලා තිබෙනවා. ඒ සාමයට බලපෑම් කරන්න තමයි මානව අයිතිවාසිකම් කඩ කළා කියන මුවාවෙන් ඒ යෝජනා ගෙනැල්ලා තිබෙන්නේ. අද රනිල් වික්‍රමසිංහ මහත්තයා කියනවා, "උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව ක්‍රියාත්මක කරවු" කියා. අද රනිල් වික්‍රමසිංහ මහත්තයා ඇමෙරිකන්කාරයත් එක්ක ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ලජ්ජයි. අපි ඒ කොමිසම ගෙනාවේ ඇයි? විදේශ බලවේග අපට ඇඟිල්ල දික් කළා මේ රටේ හමුදාව හා පොලීසිය යුද අපරාධ කළා කියලා. අපි කිව්වා, එහෙම දෙයක් වුණේ නැහැ, අපි කොමිසමක් පත් කරලා, සාක්ෂි දෙන්න මිනිස්සු කැඳවනවා කියලා. හුඟක් අය ඒකේ පොට වරද්දා ගෙන තිබෙනවා. ඒ උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් නොවෙයි.

මේ රටේ ත්‍රස්තවාදය නැති කිරීමට ක්‍රියාත්මක කරපු මානුෂික මෙහෙයුමේදී මේ රටේ වැරදි දෙයක් සිද්ධ වුණේ නැහැ කියලා බටහිර ප්‍රජාවට පෙන්වන්නයි ඒක ගෙනාවේ. ඒක වැරදි පොටක් හැටියට රනිල් වික්‍රමසිංහ මහත්තයා යොදා ගෙන, ඇමෙරිකන්කාරයොත් එක්ක එකතු වෙලා ඉන්නවා. අද අපි පැහැදිලිව කියනවා, විදේශ බලවේග අපට විරුද්ධව එන්න එන්න මේ රටේ ජනතාව පක්ෂ හෝ පාට භේදයෙන් තොරව මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් එක්ක එකතු වෙලා තිබෙන බව. මේ රට හොඳට සංවර්ධනය වෙනවා. මේ බදු සංශෝධන ඉතාම කාලෝචිතයි. ඒ තුළින් මේ රටේ සංවර්ධනයට විශාල දායකත්වයක් ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,මම නැවත වතාවක් ගරු කබීර් හාෂිම් මන්ත්‍රීතුමාට කියන්නේ, දැන් බෙල්ල තිබෙන නිසා තැල්ල බඳින්න පුළුවන් කියායි. ඒ නිසා රත්තරන් ගෙන්වන එක හොඳයි. ඔබතුමා රත්තරන් ගෙන්වන එක සීමා කරන්න එපා. මොකද, අද රත්තරන් ගෙන්වලා තිබුණොත් රත්තරන් පවුමක මිල ඉහළ යන කොට ඒකේ ප්‍රතිලාභය ලැබෙන්නේ මේ රටට කියන එකත් හිතේ තියා ගන්න. රත්තරන්වල මිල දිනෙන් දින ඉහළ යනවා. වෙනත් දෙයක් ගෙනැල්ලා තිබ්බොත් තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒක තේරුම් ගන්න බැරි එතුමාගේ ආර්ථික න්‍යාය මොකක්ද කියලා මම දන්නේ නැහැ. එතුමාට ඒ කාරණයත් හිතට ගන්න කියමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.38]

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත් හයෙන් ජනතාවටත් ඒ වාගේම මේ රටේ ව්‍යාපාර කරන පිරිසටත් වාසි රැසක් ලැබෙන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට ඕනෑ. ආණ්ඩුවෙන් මොන දෙය ඉදිරිපත් කළත් ඒ දෙය හොඳ නැහැ කියා තමයි විපක්ෂයෙන් කියන්නේ. එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ ක්ෂේත්‍ර ගණනාවකට සහන ලබා දී තිබෙන බව අප දන්නවා. ලොරි, ට්‍රක් රථ, බස් රථ - අවුරුදු පහකට නොඅඩු කාලයක් ඇති- ක්‍රීඩා උපකරණ, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ, සුවඳ විලවුන්, ඉරු ඇව, කුකුළු මස් නිෂ්පාදනය සඳහා අවශ්‍ය උපකරණ සඳහා සහන ලබා දී තිබෙන බව මෙහි දක්වා තිබෙනවා.

එකතු කළ අගය මත බදු සංශෝධය කිරීමෙන් ඒ අයට ලොකු පහසුවක් ලැබෙනවා. පසු ගිය කාලයේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ යම් යම් ප්‍රශ්න ඇති වුණාමත් බස් රථ ආනයනය කිරීමේ සහනයක් ලැබුණාට පස්සේ පැරණි බස් රථ වෙනුවට අලුත් බස් රථ ගෙනෙන්නට කටයුතු කරන්නට පුළුවන්කම ලැබුණා. එයින් ජාතික ප්‍රවාහන සේවය ශක්තිමත් වෙනවා. මේ වන කොට අලුත් බස් රථ රාශියක් ලංකාවට ගෙනැවිත් තිබෙනවා, අප දැක්කා. බදු සහන ලැබෙන කොට ඒ අය අලුත් බස් රථ මේ රටට ගෙන එන්නට කටයුතු කරනවා. කෘෂි කර්මාන්තයට අවශ්‍ය උපකරණ සඳහාත් සහන ලැබෙන කොට තමයි ඒ සඳහා දිරිමත් වී කටයුතු කරන්නේ. මේ බදු පනත් කෙටුම්පත්වලින් අප දකින්නේ හොඳ දෙයක්. මේ කටයුතුත් එක්ක කෘෂි කර්මාන්තයට සම්බන්ධ අය වැඩියෙන් ඒ සඳහා පෙළඹෙන එක අප දකින දෙයක්. තමන්ට යම් කිසි සහනයක් ලැබුණොත් තමයි, තමන් නිෂ්පාදනය කරන දෙයකට වැඩි ලාභයක් ලබන්නට පුළුවන්.

[ගරු ජානක වක්කුඹුර මහතා]

මේ පනත් කෙටුම්පත් සම්මත කර ගැනීමත් එක්ක මේ රටට එන ආයෝජකයන් වැඩි වන බව අප දකිනවා. ඒ වාගේම මේ රටේ මුදල් තිබෙන අය ඒ මුදල් වියදම් කරන්නේයම් කිසි ලාභයක් ලැබීමටයි. අද ගරු කබීර් හාෂිම් මන්ත්‍රීතුමා රත්රන් ගැන කිව්වා. මා වුණත් රත්රන් පළඳින්නේ නැහැ, මට සල්ලි නැත්නම්. ආර්ථිකය ශක්තිමත් වුණොත් විතරයි; තමන් අතේ සල්ලි තිබුණොත් විතරයි තමන් වාහනයක් ගන්නේ. රත්රන් ගන්නේත් අතේ සල්ලි තිබෙනවා නම් තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අද උදේ විදුලි යෝජනා ක්‍රම දෙකක් ජනතා අයිතියට පත් කිරීමේ උත්සවයකට ගිහින් කොළඹ එනකොට, නගර මැද්දෙන් එන්න බැහැ. අවුරුද්දට තව සුමාන තුනක් විතර තිබෙනවා. පාරක යන්න බැහැ, මිනිස්සු පිරිලා. ඇයි? මිනිස්සු අතේ සල්ලි තිබෙනවා. සල්ලි නැත්නම් කඩවලට යන්නේ නැහැ නේ. මේ අවුරුද්දට සුමාන දෙකක්, තුනක් තිබෙද්දී දැන් සිටම රෙදිපිළි ගන්න, ගෙවල්වලට තීන්ත ගාන්න උනන්දු වී කටයුතු කරනවා. ආර්ථිකය ශක්තිමත් නිසා තමයි, ජනතාව අතේ මුදල් තිබෙන නිසා තමයි මේවාට පෙළඹී තිබෙන්නේ. අප ඉස්සර බොහෝ වෙලාවට දකින්නේ අප්‍රේල් මාසයේ 05, 06 වැනිදා වන කොට තමයි මිනිස්සු හුහක් ඒවාට පෙළඹෙන්නේ. හැබැයි, අද මිනිස්සු කාලය තිබෙද්දීත් ඒ සඳහා කටයුතු කරනවා. ආර්ථික වශයෙන් ජනතාව ශක්තිමත් වී තිබෙන නිසා තමයි රත්රන් වාගේ දෙයක් පිට රටින් ආනයනය කරන්නේ. හැබැයි, මේවා අඩුවෙන් ගෙනැල්ලා තිබුණා නම් කියනවා, අද මේ රටේ මිනිසුන්ට තමන්ගේ දරුවෙක් දීග දෙන විට ඒ දරුවාට චේන් එකක් අරගෙන දෙන්නවත් පුළුවන් කමක් නැහැ කියා. වැඩියෙන් ගෙනාවාම අහනවා, ගෙනාවේ මොකට ද කියා.

අද රට දිහා බැලුවාම ආර්ථික වශයෙන් ශක්තිමත් බව අපට පෙනෙනවා. ආණ්ඩුව ආර්ථික වශයෙන් ශක්තිමත් නිසා තමයි මේ හැම කටයුත්තක්ම කරන්නට පුළුවන්කම ලැබී තිබෙන්නේ. මංමාවත් ටික හදා තිබෙනවා. මම අද උදේත් විදුලි යෝජනා ක්‍රම විවෘත කිරීමේ උත්සවයකට ගියා. විදුලි යෝජනා ක්‍රම සඳහා අපේ රජයෙන් මුදල් ලබා දෙනවා. ජනතාවට ඒ වාගේ පහසුකම් රාශියක් ලබා දී තිබෙනවා. මේ විධියට හොඳ බදු කළමනාකරණයක් ඇති කර බදු ආදායම් ලබා ගෙන තමයි ජනතාවට මේ සහන ලබා දී තිබෙන්නේ. එවැනි සහන රාශියක් ලබා දෙන්නට අපේ රජය කටයුතු කරනවා. මෙහි සඳහන් වෙනවා, කෘත්‍රිම පාද, රෝද පුටු, කිහිලිකරු, ශ්‍රවණ ආබාධ සඳහා අවශ්‍ය උපකරණ, අත්වාරු වාගේ දේවල් ගෙන්වීමේදීත් බදු සහන ලබා දී තිබෙනවාය කියන එක. මේවා ජාතිය ගොඩනැඟීමේ බද්දෙන් නිදහස් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඊයේ ජනාධිපති ආර්යාවත් එක්ක ගිහිල්ලා අයගම ප්‍රදේශයේ 3000කට විතර ශ්‍රවණ උපකරණ, කිහිලිකරු, රෝද පුටු ආදිය බෙදා දුන්නා. ඒ සඳහා විශාල පිරිසක් ආවා. අන්න ඒ වාගේ අපේ රටේ ඉන්න අහිංසක මිනිස්සුන්ට මේවා දෙන කොට මේ බදු සහන ලබා දෙන්න ඕනෑ. ඒ නිසා ජාතිය ගොඩනැගීමේ බද්ද ඒකෙන් අයින් කරලා තිබෙනවා. ඒ වාගේ අහිංසක අයට අපි ඒවා නොමිලේ නොදුන්නත් කඩේක හරි තිබෙනවා නම් ඒ අයට ඒවා අඩු මිලට ගන්න පුළුවන් වෙනවා. මේ පනත් කෙටුම්පත හොඳ නැහැ, මේක රටට අහිතකර පනත් කෙටුම්පතක්ය කියා කවුරු හරි කියනවා නම් අහිංසක මනුස්සයෙකුට යමක් අඩු මිලට ගන්න පුළුවන් වෙන විධියට බදු සහන දෙන එක හොඳ නැහැ කියායි ඒ කියන්නේ. සුඛෝපභෝගී භාණ්ඩ සඳහා අපි මේ පනත් කෙටුම්පතින් බදු සහන ලබා දී නැහැ. සුඛෝපභෝගී වාහන ලියා පදිංචි කරනකොට අය කරන බද්ද වැඩි කරලා තිබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පතින් කර තිබෙන්නේ මේ රටේ අහිංසක ජනතාව දිරි ගැන්වීමක්. ඉදිරියේදී ආයෝජකයන් මේ රටට එනකොටත්, තමන්ගේ මුදල් ආයෝජනය සඳහා වියදම් කරනකොටත් මේකෙන් බදු විරාමයක් දී තිබෙනවා. අවුරුදු තුන, හතර,පහ ආදී වශයෙන් මිලියන ගණන්වලට බදු විරාම දී තිබෙනවා. සහන කාලයක් ලබා දී තිබෙන නිසා අපේ රටේ ව්‍යාපාරිකයන්ටත් තමන්ගේ මුදල් යොදවා තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කරන්න පුළුවන් වෙනවා.

රටක් දියුණු වෙනකොට ආයෝජකයන් ගෙන්වා ගන්න යම් යම් ක්‍රම පාවිච්චි කරන්න ඕනෑ. ආයෝජකයන් එන්නේ නැති වුණාම සහන දෙන්නේ නැහැ කියනවා. ඒ නිසා එවැනි සහන දීලා මේ රටේ විරැකියාව නැති කරන්න කටයුතු කරන්න ඕනෑ. අද මේ රටේ හෝටල් රාශියක් ඉදි කරනවා. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා අපේ ප්‍රදේශයට ගිය වෙලාවේ අපේ ප්‍රදේශයේ ජනතාව කිව්වේ රත්නපුරයට හොඳ සුපිරි හෝටලයක් හදා දෙන්නය කියායි. මොකද, ඒ පැත්තට විදේශිකයන් ආවොත් ඒ අයට හොඳ හෝටලයක් නැති නිසායි. ඒ නිසා පිට රටින් එන අයට යම් කිසි සහනයක් ලබා දෙන්න රජය කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා අපි දකිනවා, මේ පනත් කෙටුම්පත තුළින් මේ රටේ වැඩි දෙනෙකුට සහන රාශියක් ලැබෙන බව. ක්‍රීඩාවේ යෙදෙන අයට අවශ්‍ය ක්‍රීඩා උපකරණ ගෙන්වන්නත්, අනික් කටයුතුවලටත් මේ තුළින් යම් යම් සහන ලැබෙන්න සලස්වා තිබෙනවා. ඒ නිසා අද ඉදිරිපත් කරන මේ පනත් කෙටුම්පත් ගැන මේ රටේ මුදල් ඇමතිවරයා හැටියට අතිගරු ජනාධිපතිතුමා හරියට සොයා බලා, අමාත්‍යාංශ ලේකම්තුමා සමඟ සාකච්ඡා කරලා සෑම කටයුත්තක්ම හරියාකාරව කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ මංමාවත් ටික හදා තිබෙනවා. මේ රටේ උපාධිධාරීන් 15,000කට රැකියා ලබා දෙන වැඩ පිළිවෙළක් හැදුවා. ඉස්සර උපාධිය තිබුණත් රක්ෂාවක් හම්බ වුණේ නැහැ. මේ රටේ කිසිම කෙනෙකුට රක්ෂාවක් දුන්නේ නැති අවුරුදු දෙකක කාලයක් තිබුණා. අද මේ රටේ අයට රැකියා දෙන එක ගැන උසාවි ගිහින් තිබෙනවා. මෙවැනි හොඳ ආර්ථික වැඩ පිළිවෙළක් තිබෙන නිසා තමයි අපේ රට ආසියාවේ ආශ්චර්යවත් රට බවට පත් වෙන්නේ. ඒ නිසා එතුමාගේ මේ වැඩ පිළිවෙළ සාර්ථක වේවාය කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[අ.භා. 3.45]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මහාචාර්ය ජී.එල්.පීරිස් විදේශ ඇමතිතුමා කථා කරමින් කිවුවා, අපි ජාත්‍යන්තරයට යට වෙන්නේ නැහැ කියා. අපිත් ඒකට එකඟයි. නමුත් ජාත්‍යන්තරයට අපව යට කරන්න ඉඩ තියන්නත් එපාය කියා සඳහන් කරන්න අවශ්‍යයි. විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව විවාදයක් පවත්වන්නට යන නිසා මම ඒ ගැන කරුණු දක්වන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අද ඉන්දියානු ආරංචි මාර්ගවලින් දැන ගන්නට ලැබී තිබෙනවා, ආරුමුගම් තොණ්ඩමන් -එතුමාට දැන් ඇමතිතුමා කියන්නද, මන්ත්‍රීතුමා කියන්නද කියා මම දන්නේ නැහැ- මැතිතුමා රජයෙන් අස් වෙලාය කියා. ඒක ඇත්තද නැද්ද කියා අපිත් දැනගන්න කැමැතියි. මොකද, එතුමා කැබිනට් ඇමතිවරයෙක් නිසා අපටත් ඒක දැන ගන්නට අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011 රාජ්‍ය අය වැය මඟින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව අය කරමින් තිබුණු ව්‍යාපාර පිරිවැටුම් බද්ද අහෝසි කළා. ඒක අහෝසි කරලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් කළා.

මෙය සිදු කළ අවස්ථාවේදී මේ ක්‍රියාදාමය හේතු කර ගෙන නිලධාරින් 472කට ඔවුන්ගේ රැකියා පිළිබඳව අවිනිශ්චිත භාවයක් තිබුණා. මම මේ ප්‍රශ්නය මීට ප්‍රථමයෙන් -ඒ අය වැය කථාවෙන් මාස හතකට, අටකට පසුව- පාර්ලිමේන්තුවේදී මතු කළා. ඒ ජූනි මාසයේදී මට දැන ගන්න ලැබුණා අලුත් සේවා ව්‍යවස්ථාවක් හදලා ඉන් පසුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට මේ නිලධාරින්ව එකතු කරන්නට යනවා කියලා. නමුත් දැන් තව මාස 8ක් ගිහිල්ලා තිබෙනවා. ඒකයි මම මේ කාරණය මේ පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන්නේ. නමුත් ඒ අයට එහෙම දෙයක් සිදු වෙලා නැහැ. ඔවුන් තවම ඒ අවිනිශ්චිත භාවයේ සිටිනවා. අපි දන්නවා ඔවුන්ට අවුරුද්දට දෙවතාවක් -මාර්තු මාසයේ සහ සැප්තැම්බර් මාසයේ- දිරි දීමනාවක් ලැබෙන බව. නමුත් අද මාර්තු මාසයේ අවසාන දවස. ඔවුන්ට ඒ දිරි දීමනාව ලැබිලා නැහැ. මේ දිරි දීමනාව සඳහා මාස හතර හමාරක විතර වැටුපක් ලැබෙනවා. සාමාන්‍ය බදු නිලධාරි කෙනෙකුට ඒක රුපියල් හැත්තෑදහසක් පමණ වෙනවා. තව විධියකට කිව්වොත් ඒක මාසයකට රුපියල් 6,000ක විතර ආදායමක්. ඔවුන්ට ඒක විශාල ආදායමක්. එම නිසා මම නැවතත් මතු කරනවා, ඔවුන්ගේ රැකියාව නීත්‍යානුකූලව තිබුණත්, රැකියාවක් නැහැ වාගේ තත්ත්වයක් තිබෙන්නේ කියලා. වැඩ නැහැ. ඔවුන්ගේ මානසික තත්ත්වය වැටී තිබෙනවා. ඔවුන් බොහොම උගත් නිලධාරි කණ්ඩායමක්. ඒ නිසා මේ ප්‍රශ්නය ඉක්මනට විසඳන්න කියලා මම නැවතත් රජයෙන් ඉල්ලා සිටිනවා.

අද අපි පනත් කෙටුම්පත් හයක් ගැන කථා කරනවා. මේ පනත් කෙටුම්පත් ගැන කථා කරන විට මම බදු ගැන කරුණු කිහිපයක් කියන්නට කැමැතියි. "Doing Business Ranking" කියන ලෝක බැංකු වාර්තාවේ සඳහන් වෙනවා බදු ගෙවීමේදී ශ්‍රී ලංකාව රටවල් 183කින් 173වන ස්ථානයේ සිටිනවා කියලා. රටවල් 183කින් 173වන ස්ථානයේ තමයි ශ්‍රී ලංකාව සිටින්නේ. තවත් විධියකට කිව්වොත් දකුණු ආසියාවේ අන්තිම තැන සිටින්නේ. අපිට ඉදිරියෙන් මාලදිවයින සිටිනවා. ඇෆ්ගනිස්ථානයත් ලංකාවට ඉදිරියෙන් සිටිනවා. නේපාලය, බංග්ලාදේශය, ඉන්දියාව, පාකිස්ථානය වාගේ ආසියාවේ සෑම රටක්ම අපට වඩා ඉදිරියෙන් සිටිනවා. මම මේ කාරණය මතු කරන්නට හේතුවක් තිබෙනවා. ටික වෙලාවකට ඉස්සර ඩිව් ගුණසේකර ඇමතිතුමා රට තුළ ආදායම් බදු එකතු කිරීමේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා සඳහන් කළා. මේක තමයි ලෝක බැංකුවේ වාර්තාවේත් සඳහන් කරන්නේ. ඇයි මෙවැනි තත්ත්වයක් පවතින්නේ? රට තුළින් ලැබෙන බදු ප්‍රමාණය බදු ගෙවන ප්‍රමාණයෙන් බෙදුවාම සියයට සියයකින් වැඩියි කියලා සඳහන් කරන්න අවශ්‍යයි. ඒ වාගේම ව්‍යාපාරිකයෙක් බද්දක් ගෙවන්නට යනවා නම්, නොයෙකුත් බදු තිබෙන නිසා අවුරුද්ද තුළ හැත්තෑඑක් වතාවක් යන්න අවශ්‍ය වෙනවා. මේක බොහොම අසාර්ථක තත්ත්වයක්. මේක දියුණු කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා අවුරුදු ගණනාවකට ප්‍රථමයෙන් ජනාධිපතිතුමා ජනාධිපති බදු කොමිසමක් පත් කළාය කියන එක. නමුත් අපිට තවම මේ බදු කොමිසමේ වාර්තාව ලබා ගන්නට බැරි වුණා. ඇත්තටම අපි දන්නේ නැහැ මේ වාර්තාව තුළ මොනවාද තිබෙන්නේ කියලා. නොයෙකුත් අය ප්‍රවෘත්ති සාකච්ඡාවලදී නොයෙකුත් දේවල් කියලා තිබෙනවා. නමුත් උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාව වාගේම මේකත් රජයේ කොමිසමක්. මේකට රජයේ කොමසාරිස්වරුන් පත් කරලා තිබෙන්නේ. රජයේ නිලධාරින් සිටින්නේ. රජයේම වාර්තාවක්. අපි ඉල්ලා සිටිනවා මේ වාර්තාවත් විනිවිද භාවයෙන් ඉදිරිපත් කරන්න කියලා. මොකද, බදු පිළිබඳ මේ වාර්තාව තිබුණා නම් අපට මේ විවාදය මීට වඩා අර්ථවත් කරන්නට පුළුවන්. අපි දන්නවා රටට ලැබෙන බදු ප්‍රමාණයේ විශාල ගැටලුවක් තිබෙනවාය කියා.

1995 දී ඒක පුද්ගල ආදායම ඩොලර් 700ක් වුණත්, ලැබුණු බදු ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 20ක් විතර වුණා. අද ඒක පුද්ගල ආදායම ඊට වඩා හුඟක් වැඩි වුණත්, ඒ ලැබෙන බදු ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 15කට විතර බැහැලා තිබෙනවා. ලංකාව තුළ බදු වර්ග 25ක් විතර තිබෙනවා. දියුණු රටවල විතරක් නොවෙයි, සාමාන්‍යයෙන් ආසියාවේ රටවලත් මේ බදු වර්ග තිබෙන්නේ අටක් දහයක් වාගේ ප්‍රමාණයක්. අපේ බදු ක්‍රමය සරල කරනවා කියලා තමයි අය වැය සාකච්ඡාවලදී කිව්වේ. ඒ නිසා තමයි මේ කොමිසමේ රපෝර්තුව අපි ඉල්ලන්නේ. ඇත්තටම මේ බදු කොහොමද සරල වෙන්නේ කියලා එතකොට බලා ගන්න පුළුවන්.

ඒක විතරක් නොවෙයි, ඍජු බදු හා වක්‍ර බදු ගැන කියන්න ඕනෑ. ඍජු බදු කියන්නේ ආදායම් බදුවලට. රජයේ බදු ආදායම බලන කොට වැඩියෙන්ම තිබෙන්නේ -සියයට 80ක්ම - භාණ්ඩ හා සේවා පිළිබඳ බදු මිසක් ඍජු බදු නොවෙයි. අපට පෙනෙන විධියට ඒ බද්දේත් වෙනසක් සිදු වෙලා නැහැ. මේ ක්‍රමය නිසා අඩු ආදායම්ලාභීන්ට තමයි මේ රටේ වැඩියෙන්ම බදු ගෙවන්න සිදු වන්නේ. නැඟෙනහිර ආසියාව එක්ක සංසන්දනය කරලා බලපුවාම ලංකාවේ ලැබෙන බදු ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් භාගයක් විතර වෙනවා. මම දැක්කා, එක වාර්තාවක - IPS වාර්තාවක- තිබෙනවා, ව්‍යාජ ආනයන නිසා දවසකට රටට රුපියල් මිලියන 300ක් විතර අහිමි වෙනවා කියලා. අපි අහන්න කැමැතියි, මේ ව්‍යාජ ආනයන සම්බන්ධයෙන් මීට වඩා වැටලීම් කරලා, ඒවා අල්ලලා, ඒ අයට බදු ගහලා, ඒ බදු ප්‍රමාණය වැඩි කර ගන්න බැරි ඇයි කියලා. දවසකට රුපියල් මිලියන 300ක් කියලා වාර්තාවක තියෙන කොට ඒක විශාල ප්‍රමාණයක්. ඒ කියන්නේ රුපියල් බිලියන 50ත්, 100ත් අතර ප්‍රමාණයක්. ඇයි ඒක එකතු කරන්න බැරි කියලා අහන්න කැමැතියි.

අපි දන්නවා, BOI එක තුළින් බදු සහන දෙන බව. බදු සහන දුන්නාම අපේ රටේ බදු ආදායම තුළ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට එකක විතර අහිමි වීමක් වෙනවා. ඒ ආයෝජන මණ්ඩලය හරහා කරන ආයෝජනය තුළින් රටේ දේශීය නිෂ්පාදනයේ වැඩි වීම සියයට එකයි දශම පහයි. ඉතින් ඇත්තටම ඒ වෙනස බොහොම සුළු වෙනසක්. අපි දන්නවා, අය වැයෙන් BTT එක, GST එක වෙනුවට VAT එක -එකතු කළ අගය මත බද්ද- පනවන්න වෑයම් කළා කියලා. නමුත් ඒක ඒ තරම් සාර්ථක වෙලා නැති බව පෙනෙනවා.

රජයට යම් කිසි ඉලක්කයක් තිබෙනවා. ඒ ඉලක්කය මොකක්ද? වැය කිරීම් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 18ක් විතර වෙන්න, රාජ්‍ය ආයෝජනය සියයට 6ක්, 7ක් විතර කරන්න, ඒ වගේම අය වැය හිඟය සියයට 4ක් විතර කරන්න නැත්නම් 5ට අඩුවෙන් තබා ගන්න කියන ඒවා තමයි ඉලක්ක. ඒක තමයි රජයේ අරමුණ. නමුත් මේ අරමුණට කවදාවත් යන්න බැහැ කියලා අපට පැහැදිලි වෙනවා. මොකද, 2011 දී ඉලක්ක කළා, රුපියල් බිලියන 827ක් එකතු කරන්න. රුපියල් බිලියන 827ක් එකතු කරන්න අය වැය තුළින් ඉලක්ක කරගෙන තිබෙනවා. නමුත් ඇත්තටම දැන් වනතුරු එකතු කරලා තිබෙන මුදල රුපියල් බිලියන 417යි. මේකත් නිශ්චිත නැහැ. මේක අවසාන අංකය නොවෙයි, provisional number එකක්. නමුත් 417යි එකතු කරලා තිබෙන්නේ. ඒ කියන්නේ බොහොම අඩු මුදලක්. තව විධියකින් කිව්වොත්, එකතු කරන්න බලාපොරොත්තු වෙන මුදලින් සියයට 50ක් පමණයි, දැන් වන තෙක් එකතු කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි දන්නවා, පැහැර හැරි මුදල හැටියට 2010 වර්ෂයේ විශාල ගණනක් තිබුණු බව. ඒ ගණන රුපියල් බිලියන 200කට වැඩියි. නමුත් මේ වසරේදීත් රුපියල් බිලියන 94ක් විතර තිබෙනවා, පැහැර හැරි

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මුදල හැටියට. ඒකට වන්දි මුදල් එකතු කළොත් තවත් රුපියල් බිලියන 46ක් විතර එකතු වෙනවා.

ඒ කියන්නේ මුළු මුදල රුපියල් බිලියන 140ක් වෙනවා. අපි ඒ රුපියල් බිලියන 140, මේ වෙන කොට අය වැය තුළින් එකතු කරලා තිබෙන රුපියල් බිලියන 417ට එකතු කළොත්, ඒ විධියට එකතු කර ගන්නා මුළු බදු ප්‍රමාණය සියයට 67ක් පමණ වෙනවා. ඉතින්, රටේ ප්‍රශ්නයක් තිබෙනවා. බදු එකතු කිරීම පිළිබඳ දැඩි ප්‍රශ්නයක් තිබෙනවා. අද අපේ ඩිව් ගුණසේකර ඇමතිතුමා බොහොම සංවේගයෙන් මේ ගැන කථා කළා. මොකද, මෙවැනි ප්‍රශ්නයක් තිබෙන කොට විශේෂයෙන් ඒක අඩු ආදායම්ලාභීන්ට බලපානවා. ඇයි පුද්ගල ආදායම වැඩි කරන්නට බැරි? එතකොට ඉහළ ආදායම් ලබන අය වැඩියෙන් ආදායම් බදු ගෙවිය යුතුයි. අඩු ආදායම් ලබන ජන කොටස් විශාල ප්‍රමාණයක් සිටිනවා. ඒ අය තමයි මේ රටේ වැඩියෙන්ම බදු ගෙවන්නේ. ඒ අයගේ ආදායම අනුව බැලුවත්, ඒ අය වැඩියෙන් බදු ගෙවනවා. ඒ අයගේ වියදම හැටියට බැලුවත්, ඒ අය වැඩියෙන් බදු ගෙවනවා. ඉතින්, මේක විශාල අසාධාරණයක්.

බඩු මිල තවත් ඉහළ යනවා. ඒක අනිවාර්යයි. බඩු මිල ඉහළ යන එක නතර කරන්නට බැහැ. ඒ ඇයි? දැන් බඩු මිල ඉහළ යන්නේ රුපියල අවම කිරීම නිසාම නොවෙයි. රුපියල දැනටමත් අවම කරලා තිබෙන්නේ. රුපියල අවම කරපු එකත් බඩු මිල තුළට එනවා. ඒ වාගේම බඩු මිල ඉහළ යන්නේ තෙල් මිල ඉහළ යෑම නිසාත් නොවෙයි. මොකද, තෙල් මිලත් ඉහළ ගිහිල්ලා තිබෙන්නේ. තෙල් මිල ඉහළ යෑම දැනටමත් අපේ බඩු මිලට එකතු වෙලා තිබෙන්නේ. ඒ වාගේම බඩු මිල ඉහළ යන්නේ ලෝක ආර්ථික අර්බුදය නිසාත් නොවෙයි. ලෝක ආර්ථික අර්බුදය තිබුණා. 2009 දී තිබුණා. ලෝක ආර්ථික අර්බුදය 2011 සිට වැඩි වෙමින් පවතිනවා. නමුත්, ඒ කරුණු විතරක් නොවෙයි බඩු මිල වැඩි වීමට හේතුව. අපට අභ්‍යන්තර ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා තමයි බඩු මිල ඉහළ යන්නේ. බදු එකතු කරන්නට බැරි වුණාම, ආදායම් බදු, සෘජු බදු එකතු කරන්නට බැරි වුණාම වෙන්නේ ඉබේටම බඩු මිල තවත් ඉහළ දාන්නට සිදු වීමයි. රජයට අවශ්‍ය ආදායම් ලබා ගන්න බඩු මිල ඉහළ දමන්නට වෙනවා. 2012 මුල් කාර්තුවේ බඩු මිල ඉහළ යෑම වේගවත් ලෙස දිගටම සිද්ධ වන තත්ත්වයක් තමයි අපි දැක්කේ, මේ ආදායම් හිඟය නිසා. රජයට ඉලක්කයක් තිබුණා. නමුත්, ලැබුණු ආදායම ඉලක්කයට වඩා හුඟක් අඩුයි. රජය කොහොමද මේ ආදායම් හිඟය පියවන්නට යන්නේ කියලා අපි දැන ගන්නට කැමැතියි. නැත්නම් නැවතත් බඩු මිල ඉහළ දාලා තමයි ඒ ආදායම් හිඟය පියවන්නට සිදු වෙන්නේ.

අද හුඟක් ගරු මන්ත්‍රීවරු ජීවන වියදම ගැන කථා කළා. ඔවුන් කිව්වා, ජීවන වියදම ඉහළ යනවා, ජනතාවට ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ, බොහොම අපහසුවෙන් තමයි ජීවත් වෙන්නේ කියලා. මම හිතන විධියට ඒ ගැන කියන්න ඉගෙනුම තිබෙන්නට අවශ්‍ය නැහැ. ජීවන වියදම කියන එක ඇඟට දැනෙන දෙයක්. එදිනෙදා ජීවත් වන අය ඒක දන්නවා. එක ඇමතිතුමෙක් කිව්වා, කෙනකුට රුපියල් 2,500කින් මාසයක් ජීවත් වෙන්න පුළුවන් කියලා. මම නම් දන්නේ නැහැ, තණ කොළ කාලාද, පිදුරු කාලාද රුපියල් 2,500කින් ජීවත් වෙන්නට යන්නේ කියලා.

කෙනෙකුට දිනකට අවශ්‍ය කැලරි ප්‍රමාණයක් තිබෙනවා. ලංකාවේ දුගීභාවය මනින්නේ කෙනෙකු ලබා ගන්නා කැලරි ප්‍රමාණය අනුවයි. සමහර රටවල ඇමෙරිකානු ඩොලර් එකකින්, ඩොලර් දෙකකින් ජීවත් වෙන්න පුළුවන්ද කියලා බලනවා. ඒ රටවල දුගීභාවය ඒ මිම්මෙන් තමයි බලන්නේ. නමුත් ලංකාවේ බලන්නේ ලබා ගන්නා කැලරි ප්‍රමාණය අනුව. රජයේම දත්ත ගත්තොත් අපි දන්නා විධියට අවශ්‍යයි කියන ඒ කැලරි ප්‍රමාණය ලබා ගන්න ඇමෙරිකානු ඩොලර් ශත 87ක් විතර අවශ්‍යයි. ඒක රුපියල්වලින් වැඩි කළොත්, කෙනෙකුට රුපියල් 2,500ට වැඩිය මුදලක් මාසයකට අවශ්‍ය බව අපි දන්නවා. ජීවිතය ගෙනියන්න අවශ්‍ය කැලරි ප්‍රමාණය පමණක් ලබා ගන්න මාසයකට රුපියල් 2,500ට වැඩිය අවශ්‍යයි. ඒ සඳහා රුපියල් 3,300ක් විතර අවශ්‍ය වෙනවා. එතකොට කැලරි අරගෙන විතරක්ද ජීවත් වෙන්නට යන්නේ? සමබර ආහාරයක් අවශ්‍යයි; මන්ද පෝෂණයෙන් බේරෙන්න අවශ්‍යයි; ගෙවල් කුලී ගෙවන්නට ඕනෑ; විදුලි බිල ගෙවන්නට ඕනෑ. විදුලිය නැත්නම් ලාම්පු තෙල් කුප්පිය හෝ පාවිච්චි කරන්න ඕනෑ. අපි දන්නවා, ලාම්පු තෙල් මිල කොච්චර ඉහළට ගියාද කියලා. හතර දෙනකු ඉන්න පවුලකට දවසකට ලාම්පු තෙල් ලීටරයක් වැය වුණොත් මාසයකට ලාම්පු තෙල්වලට විතරක් රුපියල් 3,000කට වැඩිය යනවා. ගෑස් හෝ ලාම්පු තෙල් ඕනෑ ඔවුන්ගේ එදිනෙදා කටයුතු කරන්න. බස් ගාස්තුව සොයා ගන්නට ඕනෑ. බෙහෙත් හේත් අවශ්‍යයි. අධ්‍යාපනයට මුදල් අවශ්‍යයි. එතකොට රුපියල් 2,500 ගැන තර්ක කරලා වැඩක් නැහැ.

රුපියල් 3,300ක් කැලරි ලබා ගන්නට විතරක් වැය කළොත් ගෙවල් කුලී, විදුලි බිල, ලාම්පු තෙල්, ගෑස්, බස් ගාස්තු, බෙහෙත්, අධ්‍යාපනය යන මේ සියල්ලටම ඊට වැඩිය මුදලක් අවශ්‍යයි. මේක ජාත්‍යන්තර මට්ටමෙන් බලන්නේ, ඇමෙරිකානු ඩොලර් 2කට වඩා අඩු වියදමකින් ජීවත් වෙන්නේ කවුද කියලායි. ඒ නිසා තමයි අය වැය කථාවේදී අපේ මිම්ම අනුව කියන්න පුළුවන් වුණේ, දරිද්‍රතාව ජනතාවගෙන් සියයට 15ක් ලෙස පැවැති ප්‍රමාණය සියයට 7.5කට අඩු වුණා කියලා. නමුත් ජාත්‍යන්තර මට්ටමෙන් බැලුවා නම් එහෙම එකක් සිදු වෙලා නැහැ. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, විශාල ආර්ථික ප්‍රශ්නයකට අපි දැන් මුහුණ දෙනවා. නමුත් මේ ප්‍රශ්නය මීට වැඩිය උග්‍ර වෙන්නට යනවා. අපි රජයෙන් දැන ගන්නට කැමැතියි, රජය මොනවාද කරන්න යන්නේ කියලා; ජනතාවට එදිනෙදා ජීවිතය ගෙන යන්නට පහසු වන අන්දමට කොහොමද බඩු මිල අඩු කරන්න යන්නේ, කොහොමද රැකීරක්ෂා ඇති කරන්න යන්නේ, කොහොමද මේ රටට අවශ්‍ය ආයෝජන ගෙන එන්නට යන්නේ කියලා. ජාත්‍යන්තරය තරහා කරගෙන ඒ කටයුතු කරන්නේ කොහොමද කියලා අපි දැන ගන්න කැමැතියි. ස්තුතියි.

[අ. භා. 4.05]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாபிட்டிய - தொலைத் தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of Telecommunication and Information Technology)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා 2012 සඳහා වූ අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී, මේ රටේ ඉදිරි ගමනට ඉතාමත් සුවිශේෂී මඟ පෙන්වීමක් හැටියට බදු ක්‍රමය යොදා ගැනීම සම්බන්ධයෙන් ගෙන එන ලද යෝජනා ගණනාවක් නියමිත දිනයටත් පෙර අද දවසේ පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට ඉදිරිපත් කරපු අවස්ථාවේ ඒ සම්බන්ධව කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මෙය දකින්නේ රටේ බදු ක්‍රමය රටට අවශ්‍ය විධියට ගළපා ගැනීමක් ලෙසයි. තවත් පැත්තකින් වර්තමානයේ අපි මුහුණ දෙන ආර්ථික ප්‍රශ්නවලට විසඳුමක් ලෙස රාජ්‍ය ආදායම උපයා ගැනීම සඳහා බදු ක්‍රමය යොදා ගැනීමක් ලෙසයි. තවත් ආකාරයකින් බැලුවොත් අපි බලාපොරොත්තු වන සුවිශේෂී ගමන් මඟ ස්ථිර කර ගැනීමක් ලෙස කියන්න පුළුවන්. කවුරු මොනවා කිව්වත් අපි නිදහස ලැබූ දින දක්වා ආපස්සට ගියොත්, අතීතයත් එක්ක සන්සන්දනාත්මකව බැලුවොත්, සමහරු පාලනය කළ යුග එක්ක

සාපේක්ෂව බැලුවොත් අපි අද නරක තැනක නැහැ. මහා යුද්ධයකුත් නිමා කර ගෙන, ලෝකයේ තිබෙන විවිධ අභියෝගවලට මුහුණ දෙමින් අපි අද හොඳ තැනක ඉන්නවා. අන්න ඒ ගමන තවදුරටත් ස්ථිර කර ගෙන අපි බලාපොරොත්තු වනවා, ඉදිරි වර්ෂ කිහිපය තුළ ආසියාවේ ආශ්චර්යවත් රට කරා අපේ රට ගමන් කරවීමට. අන්න ඒ ගමන සඳහා මේ රටේ මූල්‍ය ක්‍රමය අවශ්‍ය විධියට ගැළපීමක් මේ බදු සංශෝධන තුළින් කරන්නට උත්සාහ කරනවායි කියන එක මේ රටේ ජනතාව හැටියට; මේ රටේ මිනිස්සු හැටියට අපි සුභවාදීව දකින්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපි මේ ඉදිරිපත් කරන බදු සංශෝධනවලින් සියයට 99ක්ම අතිගරු ජනාධිපතිතුමා 2012 අය වැය යෝජනා ඉදිරිපත් කරමින් මේ ගරු සභාවට ඉදිරිපත් කරලා මේ සභාවේ අපි වරු ගණන්, දවස් ගණන්, සති ගණන් විවාද කරලා මේ රටට පැහැදිලි කරලා, මේ විපක්ෂයට පැහැදිලි කරලා සම්මත කර ගත්ත යෝජනා. නමුත් අපට අපේ නීති පද්ධතිය තුළ එය එකින් එක නීතියක් හැටියට මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කර ගැනීමට අවශ්‍ය වෙලා තිබෙනවා. අද අපි කරන්නේ ඒ සාම්ප්‍රදායික කාරණාවයි කියන එකත් මේ ගරු සභාවට කියන්න අවශ්‍යයි. එහෙම නැත්නම් මෙතුමන්ලා කලබල වෙලා කථා කරන විධියට සමහරවිට හෙට මාධ්‍යවල පළ වන්න පුළුවන් අලුතින් බද්දක් ඇති කරලා -අලුතින් බදු ගහලා- අලුතින් රට හිර කරලා කියලා. සමහර අය මේවා දකින්නේ ඒ විධියටයි. පසු ගිය අය වැය ලේඛනයේ තිබුණ දේවල් හැටියට නොවෙයි, සමහර අය මේ ගැන කථා කරන්නේ. ඇත්තටම මේ දෙන සියල්ලම බදු සහන. ඒකත් අපි පැහැදිලිවම කියන්න ඕනෑ.

රාජ්‍ය ආදායම අඩු කර ගෙන ජනතාව දිරි ගැන්වීමක්, ආයෝජකයින් දිරි ගැන්වීමක්, රටේ ඉදිරි ගමනට මහ පෙන්වීමක් තමයි මේ කරන්නේ. හැබැයි, සමහර කථිකයින්ගේ කථා අහ ගෙන හිටියාම එක පැත්තකින් කෙනකුට හිතන්න පුළුවන් මහා බදු බරක් නැවත ජනතාව පිට පැටවීමක් කියලා. තවත් පැත්තකින් හිතන්න පුළුවන් මේක අලුත්ම දෙයක්, අය වැය ලේඛනයේ තිබුණු දෙයක් කියලා හිතන්නවත් බැහැයි කියලා. සමහරවිට එහෙම කථා කරනවා. අද විපක්ෂයට කථා කරන්න බොහෝ දේවල් අඩුයි.

අපි ඉතාම වග කීමෙන් පැහැදිලි කරන්න අවශ්‍යයි, මේවායින් සියයට 99ක්ම අතිගරු ජනාධිපතිතුමා 2012 අය වැය යෝජනා තුළින් ගෙනැල්ලා සම්මත කර ගෙන ක්‍රියාත්මක වන දේවල් කියන එක. ඒ වාගේම මේ සියල්ලම බදු සහන. එක පැත්තකින් රජය රාජ්‍ය ආදායම අඩු කර ගෙන ජනතාවට කරන මහ පෙන්වීමක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්න ඒක අපි පැහැදිලි කළ යුතුයි. අපි මේ කථා කරන මාතෘකා සියල්ලටම අවශ්‍ය ආදේශන තමයි මෙතැන තිබෙන්නේ. කථා කරන මාතෘකාවලට අවශ්‍ය මහ පෙන්වීම්. ආයෝජන දිරි ගන්වන්න ඕනෑ කියලා අද අපි කථා කරනවා. ආනයන ආදේශන දිරි ගන්වන්න ඕනෑ කියලා කථා කරනවා. පිටරටවලින් ගෙන්වන දේ වෙනුවට ඒවා මේ රටේ නිෂ්පාදනය කරන්න ඕනෑ කියලා අපි කෑ ගහනවා. අපනයන දිරි ගන්වන්න ඕනෑ කියලා අපි කියනවා.

අපේ වෙළෙඳ ශේෂය වැඩියි කියලා අපි හැම තැනම කථා කරනවා. එහෙම නම් අපේ රටින් පිට රටට යවන දේ වැඩි කරන්න අවශ්‍යයි. වෙළෙඳ ශේෂය ශක්තිමත් කරන්න අවශ්‍යයි කියලා අපි කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියනවා රුපියල ශක්තිමත් කරන්න අවශ්‍යයි කියලා. ආර්ථික සංවර්ධනයේ දී ග්‍රාමීය ප්‍රදේශවලට වැඩි වැඩියෙන් අවධානය යොමු කරන්න ඕනෑ කියලා අපි කියනවා. සමාජයේ උදවු ලැබිය යුත්තන්ට වැඩි වැඩියෙන් උදවු කරන්න අවශ්‍යයි කියලා අපි කියනවා. ඒ වාගේම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් දිරි ගන්වන්න අවශ්‍යයි කියලා අපි කියනවා. බදු ක්‍රමය සරල කරන්න කියලා අපි කියනවා. ක්‍රීඩාවන් වාගේම ක්‍රීඩකයන් දිරිමත් කරන්න කියලා කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාරාංශයක් හැටියට බැලුවොත් මේ කථා කරන සියල්ල වෙනුවෙන් රජය ගත් පියවරක්, රජය කරපු කැප කිරීමක් තමයි මේ තිබෙන්නේ. රජයට හරි පහසුවෙන් තමන් ආපු ගමන යන්න පුළුවන්. අය කර ගෙන ආපු බදු ක්‍රමය ගැන කවුරුවත් කෑගහන්නේ නැහැ. අය කරපු බද්ද ගැන කවුරුවත් චෝදනා කරන්නේ නැහැ. නමුත් රජය තමන්ගේ ආදායම අහිමි කර ගෙන ජනතාවට මහ පෙන්වීමක් කරනවා. අර මම කලින් කිව්ව ප්‍රශ්නවලට උත්තර සොයන්න උත්සාහ කරනවා. ඒක තමයි අද මේ සිද්ධ වන්නේ. ඉතින්, මේ මහා කැප කිරීම කරද්දී, ඒවායේ තිබෙන හොඳ පැත්තක් ගැන කථා කරන්න විපක්ෂයේ එකම කථික මන්ත්‍රීවරයකුටවත් පුළුවන් වුණාය කියලා මා හිතන්නේ නැහැ. විපක්ෂය යම් දෙයක, රජයේ ප්‍රතිපත්තිවල, රජයේ ක්‍රියාකාරකම්වල වැරදි තැන්, අකාර්යක්ෂම තැන් පෙන්වන්න ඕනෑ කියලා අපි පිළිගන්නවා. ඒක තමයි විපක්ෂයක ප්‍රධාන වගකීම. හැබැයි, මේවායේ තිබෙන එක හොඳක් කථා කරන්න මේ විපක්ෂයට පුළුවන් වුණාද? අතිගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට මේ රටට ගෙන එන කාලෝචිත යෝජනායි මේ.

ගරු නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමා ඉන්නවා. එක පැත්තකින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කණ්ඩායම ඉන්නවා. තමන්ගේ රාජකාරිය දේවකාරියක් කර ගෙන පැය 24න් 16ක් වැඩ කරන මිනිස්සු. එක කථිකයෙකුටවත් පුළුවන් වුණාද කටක් ඇරලා මේ යෝජනාවල මෙන්න මේ වගන්තිය නොවෙයි, අඩු ගණනේ මෙන්න මේ වචනය රටට යහපත්, මේක ඉදිරියට යනවා නම් හොඳයි, මේ රටේ ආයෝජකයින්ට මේකෙන් යහපතක් වනවා කියලා කියන්න. මේ පැය ගණනාව තුළ එහෙම දෙයක් කියනවා මම දැක්කේ නැහැ. ඒ වාසනාව මේ රටේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කිසිම දවසක -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! The Hon. Deputy Chairman of Committes will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ගෙනාපු බදු පනත් කෙටුම්පත් අතරින් අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ එකතු කළ අගය මත බද්දෙන් ලබා දී තිබෙන සහන ගැන කථා කළොත් සිනමා කර්මාන්තයට සහන ලබා දී තිබෙන බව කියන්න ඕනෑ. විශේෂයෙන්ම දේශීය සිනමා කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය ඩිජිටල් තාක්ෂණික උපාංග එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කර තිබෙනවා. දේශීය ඖෂධ නිෂ්පාදනයටත් එහෙමයි. අපි හැමදාම කියනවා ඖෂධ ගෙන්වීම සඳහා අපේ රටින් දැවැන්ත මුදලක් පිට රටවලට ඇදී යන බව. ඒ සඳහා විකල්පයක් සොයන්න අපි සූදානම්. මේ රටේ ඖෂධ නිෂ්පාදකයින් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන්න මේ ගරු සභාවේ අපි කථා කරනවා. ඒ වාගේම කාබනික අප ද්‍රව්‍ය මඟින් ගල් අඟුරු

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

නිෂ්පාදනය කරන්නන් බද්දෙන් නිදහස් කර තිබෙනවා. ඉදිරි ගමනක් යන්න හදන ජාතියක් හැටියට අපි කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළව හරිතාගාර සඳහා බදු නිදහසක් ලබා දී තිබෙනවා.

මම අහන්නේ මේවා එකක්වත් ගැන කථා කරන්න විපක්ෂයට පුළුවන් වුණාද කියලායි. "මේ දෙය හොඳයි, මේකේ ප්‍රශ්නය තිබෙන්නේ මෙන්න මේකයි" කියලා එතුමන්ලා කිව්වාද? ඒ වාගේම බලශක්ති නිෂ්පාදනයට අවශ්‍ය දේ ගෙනෙන කොට අපි ඒ ගැන කථා කරනවා. සංචාරක හෝටල් සඳහා අවශ්‍ය නිෂ්පාදනවලට බදු නිදහසක් අප මේ යටතේ ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනික් කාරණය තමයි ටින් මාළු සැපයීම. මේකත් බලපු ගමන් මෙතුමන්ලා කියයි, "පිට රටින් ගේන ටින් මාළුවලට" කියලා. නැහැ, මේ රටේ ටින් මාළු නිෂ්පාදනය කරන්නන් ඉතා පැහැදිලිව අප එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කර තිබෙනවා. ඇයි ඒ? අප අර කියපු ඉදිරි ගමන යද්දි ඔවුන්ව දිරි ගන්වන්න අවශ්‍යයි. අප පිට රටින් ගේන ටින් මාළු ප්‍රමාණය අඩු කරන්න අවශ්‍යයි. ඒකයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ. රාජ්‍ය ආයතන ආනයනය කරන දේ දේශීයව නිෂ්පාදනය කරනවා නම් අප ඔවුන්ට බදු සහනයක් දෙන්න සූදානම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඊළඟට පර්යේෂණ කටයුතු දිරි ගැන්වීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන සේවා සැපයීම. මේක ඉදිරියට යන රටකට අත්‍යවශ්‍ය දෙයක්. ඕනෑම කර්මාන්තයක් ආපු සාම්ප්‍රදායික ක්‍රමත් එක්ක, අලුත් දේ මොනවාද, ලෝකය කරන්නේ මොනවාද, ඵලදායීතාව වැඩි කර ගැනීමට අප කරන්න අවශ්‍ය මොනවාද, පිරිවැය අඩු කර ගැනීමට කරන්න අවශ්‍ය මොනවාද කියලා අප අත්හදා බැලිය යුතුයි. තමන්ගේ ඒ කර්මාන්තය පිළිබඳ එවැනි සොයා බැලීමක් කරන්න, එවැනි පර්යේෂණයක් කරන්න, එවැනි අත්හදා බැලීමක් කරන්න යම් කිසි ආයතනයක් හෝ පුද්ගලයකු සූදානම් නම් අප කියනවා, ඔවුන් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන්න අප සූදානම් කියලා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඉතින් මේවා හොඳ නැද්ද?

අප හැම දාම ප්‍රවාහන වියදම ගැන කථා කරනවා. අප ඒ ගැන දොස් කියනවා. ඒ ගැන පෙළපාළි යන්න හදනවා. ඒ ගැන වර්ජන කරන්න හදනවා; වර්ජනය කරන්නන්ට උඩ ගෙඩි දෙනවා. හැබැයි මෙතැන තිබෙන දෙය අප කථා කරන්නේ නැහැ. මොකක්ද මේ කියන්නේ? අප කියනවා, අවුරුදු පහකට වඩා අඩුවෙන් පාවිච්චි කළ බස් රථ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන්න අප ලෑස්තියි කියලා. එම වාහන එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන්න කැමැතියි කියලා අතිගරු ජනාධිපතිතුමා ගෙනාපු යෝජනාව අද අප මේ ගරු සභාවේ සම්මත කරනවා. ඒ වාගේම අවුරුදු පහකට වඩා අඩුවෙන් පාවිච්චි කළ ලොරි සහ ට්‍රක් රථවලටත් අප ඒ සහනය ලබා දෙන්න සූදානම්. ඇයි මෙහෙම කරන්නේ? ප්‍රවාහන වියදම අඩු කරන්න. අප එළවලු මිල ගැන කථා කරනවා. අනික් දේවල් ගැන කථා කරනවා. මේවාට අවශ්‍ය සහන, ඒ පිළියම් තමයි මේ යොදන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අප කියනවා මේ රටේ හොඳ ක්‍රීඩකයින් බිහි කළ යුතුය කියලා. අප කියනවා ගම්බද ප්‍රදේශවල ක්‍රීඩාව ව්‍යාප්ත වෙලා නැහැ කියලා; අවශ්‍ය උපකරණ නැහැ කියලා. රජය මෙතෙක් අය කරගෙන ආපු ආදායම අඩු කර ගෙන, ක්‍රීඩා උපකරණ සඳහා වූ මෙතෙක් අය කළ එකතු කළ අගය මත බද්ද අඩු කරන්න සූදානම් කියලා මේ ගරු සභාවේ සම්මත කරන්න අද අප කථා කරනවා. මේවා හොඳ නැද්ද ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි?

රබර් නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍ර ගෙන්වීමේදීත් අප එලෙසම කටයුතු කරන්න සූදානම්. අප අද ජීවන වියදම ගැන පමණක් කථා කරනවා. ගම්බද ප්‍රදේශවල ජනතා නියෝජිතයෝ හැටියට අද අප සතුටු වෙනවා, අද අපේ ප්‍රදේශවල දුම් ගැසූ රබර් ෂීට් කිලෝ එකක් රුපියල් 450යි. මෙතුමන්ලා සමහර විට ඒ ගැන දන්නේ නැතිව ඇති. ඒක මේ රටේ ජනතාව විශාල ප්‍රමාණයක් ජීවත් වන ජීවනෝපායක්. මේවා නිකම්ම උත්පාදනය වෙච්ච දේවල් නොවෙයි. මේකට ප්‍රධානතම හේතුවක් වුණේ අද මේ රටේ රබර්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් අගය එකතු කළ රබර් හැටියට පිට රටට යවන්න මහින්ද චින්තනයත් එක්ක ආපු වැඩ පිළිවෙළට පුළුවන් වීම. ඒ ගැන අප සන්තෝෂ වෙනවා. ඒක තවත් ශක්තිමත් කරන්න අප සූදානම්.

රබර් ආශ්‍රිත නිෂ්පාදන කරන යන්ත්‍ර ගේනවා නම් ඒ යන්ත්‍රවලට වැට් බදු සහනයක් දෙන්න අප සූදානම් වෙලා ඉන්නවා. මේක මේ රටේ ජනතාව දැන ගත යුතුයි. දුම් ගැසූ රබර් ෂීට් කිලෝ එකක් රුපියල් 450ට ගියේ ඉබේම නොවෙයි. ඒවා මේ රටේ සමස්තයක් හැටියට ආපු වැඩ පිළිවෙළ තුළ අප ලබා ගන්නා වූ ජයග්‍රහණ. අප කියනවා ඉරු දැව ආනයනය කිරීම හෝ සැපයීම සඳහා වූ වැට් බද්ද අප ඉවත් කරන්න සූදානම් කියලා. ඇයි ඒ? අප නිතරම කියනවා, "පරිසරය ආරක්ෂා කරන්න අවශ්‍යයි, මේ රටේ ගස් කොළන් ආරක්ෂා කරන්න අවශ්‍යයි" කියලා. හැබැයි තවත් පැත්තකින් අප කියනවා, "නිවාස හදා ගන්න ඕනෑ, ගොඩනැඟිලි හදන්න ඕනෑ, මේ රටේ ඒ සංවර්ධනය වෙන්න ඕනෑ" කියලා. එහෙනම් මෙතැනට විකල්පයක් තිබෙන්න ඕනෑ; ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. විපක්ෂයට නම් හරි පහසුයි මෙහෙම දෙයක් කියන්න. එතුමන්ලා එක පැත්තකින් කියනවා, "පරිසරය ආරක්ෂා කරන්න ඕනෑ, ගස් කොළන් කපන්න බැහැ" කියලා. අනික් පැත්තෙන් කියනවා, "සංවර්ධනය මදි"කියලා. හැබැයි ආණ්ඩු පක්ෂයකට එහෙම කරන්න බැහැ. ඒ සඳහා වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. එහෙම නම් ඒ සඳහා පිට රටින් යම් අයෙක් දැව ගේන කොට ඒ සඳහා අය කරපු වැට් බද්දේ සහනයක් අප ලබා දෙනවා.

අපේ රටේ ගහ කොළ ආරක්ෂා කර ගෙන, තවත් පැත්තකින් මේ රටේ සංවර්ධනය, ගොඩනැඟිලි, පාසල්, නිවාස හදා ගන්න අවශ්‍ය පහසුකමක් රජය හැටියට අප ලබා දෙනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. වැට් බද්ද පැත්තෙන් ගත්තොත් මේ වාගේ සුවිශාල සහන ප්‍රමාණයක් අද මේ සම්මත කර ගන්නා යෝජනා තුළ අප මේ රටට, මේ රටේ ජනතාවට, ව්‍යාපාරිකයන්ට, ආයතනවලට ලබා දෙන්න සූදානම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අද අප සම්මත කරන දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත තුළිනුත් විශේෂයෙන්ම බදු විරාම දීලා තිබුණු අංශ වඩාත් පළල් කරන්න අප සූදානම්. මම දැන් ඒ එකින් එක කියන්න යන්නේ නැහැ. ගරු මන්ත්‍රීවරුන් මේ වන විට මෙය කියවා ඇති. මෙතෙක් බදු විරාම දීමට නිශ්චිතව තිබුණු අංශවලට අලුත් අංශ එකතු කර තිබෙනවා. අපි නිතරම කෑ ගහනවා, ආයෝජනය වර්ධනය කරන්න ඕනෑ; ආයෝජකයින් දිරි ගන්වන්න ඕනෑ කියා. මේවා තමයි කථා කරන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ තුළින් බදු විරාම කාල සීමාවන් වැඩි කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. වැඩි ආනයන වියදමක් යන ද්‍රව්‍ය නිපදවීම සඳහා වූ විශේෂ බදු සහන ලබා දී තිබෙනවා. ඒ කියන්නේ සිමෙන්ති, ඖෂධ, කිරි පිටි, රෙදි පිළි වාගේ භාණ්ඩ හා ද්‍රව්‍ය සඳහා යන ආනයන වියදම එහෙම නැත්නම් ප්‍රමාණය ඉතා දැවැන්තයි. අද අපේ වෙළෙඳ ශේෂ හිඟයෙන් වැඩි ප්‍රමාණයකට වග කියන්න අවශ්‍ය වන්නේ මේ වාගේ ද්‍රව්‍ය ආනයනය. ඒ ද්‍රව්‍යවලට වැඩි බදු සහන ලබා දීලා නිෂ්පාදකයින් දිරි ගන්වන්න මේ යෝජනා සම්මත කරන්න සූදානම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් බලශක්ති

අරපිරිමැසුම් සඳහා වූ යන්ත්‍ර ගෙන්වීමට බදු සහන දෙන්න අපි සූදානම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පතට ලබා දෙන සහන ගැනත් සඳහන් කරන්න අවශ්‍යයි. මගේ කථාව ආරම්භයේදී කිව්වා, උදව් කළ යුතු අයට උදව් කිරීමේ වග කීමක් රජයකට තිබෙනවාය කියා. අපි කියනවා, ජාතිය ගොඩනැඟීමේ බද්දෙන් දුබල පුද්ගලයින්ට සහන සැලසීම සඳහා කෘත්‍රිම පාද, කිහිලිකරු, රෝද පුටු, ශ්‍රවණාබාධ සහ දෘශ්‍යාබාධ සඳහා භාවිත කරන උපකරණ ආනයනය කිරීමේදී ඒ බද්දෙන් නිදහස් කරනවා. ජාතිය ගොඩනැඟීමේ බද්ද ගැන උදාහරණයක් විතරයි කිව්වේ. මේක හොඳ උදාහරණයක්. අද අපි මේ පාර්ලිමේන්තුවේදී කියන්නේ මෙතුමන්ලා කථා නොකරන විශේෂ මාතෘකා, මේ රජය ජනතාවට දෙන්න සූදානම් සහන ගැනයි. ලෝකයේ මහා ආර්ථික අවපාතයක් තියෙද්දී, රාජ්‍ය ආදායම උපයා ගැනීම පිළිබඳව අපට ලොකු වගකීමක් තියෙද්දී මේ රටේ ඉදිරි ගමනත් එක්ක රජය බද්ධ වීම ඉතා පැහැදිලිව පෙන්වන අවස්ථාවක් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ආර්ථික සේවා ගාස්තු (සංශෝධනය) පනත් කෙටුම්පත තුළිනුත් අපි බලාපොරොත්තු වන්නේ ආදායම් බදු ගෙවන්නන්ට තමන්ගේ පිරිවැටුම තුළින් ඒ කියන්නේ රඳවා ගැනීමේ බද්ද ඒ තුළට හිලව් කිරීම තුළින් ඔවුන්ට සහනයක් ලබා දීම. බදු සහන සහ බදු ක්‍රමය සරල කිරීම කියන රාමුව තුළට කිසි අපහසුවක් නැතිව අවංකව මේ දෙස බලන ඕනෑම කෙනෙකුට මේ හැම දෙයක්ම ගොනු කරන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මේ අවස්ථාවේදී මුදල් පනත් කෙටුම්පත තුළිනුත් කථා කරන්නේ සහන ලබා දීම ගැන පමණමයි. ඒකත් අපි පැහැදිලි කරන්න අවශ්‍යයි. කිසිම අවස්ථාවක නව බදු පැනවීමක් සිදු කරන්න සූදානම් නැහැ. අද අපි කථා කරන්නේ අපි ලබා දුන්න බදු සහන ටික වඩාත් ක්‍රමවත් කිරීම, නීත්‍යානුකූලව කිරීම පමණයි කියා සඳහන් කරන්න අවශ්‍යයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. කලින් කථා කළ මන්ත්‍රීතුමා විශේෂයෙන් සඳහන් කළා, අපේ රටේ වක්‍ර බදු සහ සෘජු බදු අතර තිබෙන ප්‍රතිශතය සහ සංයුතිය නිසා වැඩිපුර සෘජු බදු ගෙවන්න සිද්ධ වනවා කියා. ඔව්, ඇත්ත. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ සඳහා මේ කාල සීමාව තුළ විවිධ උත්සාහයන් දැරුවා. ආරම්භක අවස්ථාවේ ඉඳලා බැලුවොත් සෘජු බදු ලිපි ගොනු සංඛ්‍යාව වර්ෂයෙන් වර්ෂය වැඩි කර ගෙන එනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. හැබැයි, කලින් කථා කළ මන්ත්‍රීතුමා ඒ වන විට හිටියේ නැහැ. මේ රටේ බදු සංයුතිය සම්පූර්ණයෙන් ව්‍යාකූල කළ යුගයක් අපි අත් වින්දා. එතකොට මා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. බදු සමා පනත මට මතකයි. බදු ගෙවන්නන්ට බදු එපා කියපු පනතක් මේ පාර්ලිමේන්තුවේ සම්මත කළා. ඔබතුමා පාර්ලිමේන්තුවේ හිටියේ නැති වුණත් සමහර විට ඔබතුමා දන්නවා ඇති. බදු ගෙවන්නන්ට කිව්වා, බදු ගෙවන්න උනන්දු වන්න අවශ්‍ය නැහැ. කියා. බදු ගෙවපු මිනිසුන්ටත් කිව්වා, බදු ගෙවන්න එච්චර කලබල වන්න අවශ්‍ය නැහැ කියා. මිනිස්සු බැලුවා, ආණ්ඩුවෙන් ආණ්ඩුවට මේවා වෙනස් වනවා. සෘජු බදු පමණක් නොවෙයි. සෘජු බදු කියන්නේ කෙළින්ම තමන්ගේ සාක්කුවෙන් ගෙවන බදු.

වක්‍ර බදු කියන්නේ තමන් කවුරු හෝ ගනුදෙනුකරුවකුගෙන් අය කර ගෙන තමන්ගේ ලාච්චුවේ තියාගෙන ගෙවන බදු. වක්‍ර බදු ගෙවන්න එපා කියලා කියන්න පනතක් එක්සත් ජාතික පක්ෂය මේ පාර්ලිමේන්තුවේ සම්මත කළා. අද අපි කථා කරනවා, මේ රටේ බදු අය කිරීම හරි නැහැ; බදු අය කිරීම ව්‍යාකූලයි කියා. අද ඩිව් ගුණසේකර අමාත්‍යතුමා කිව්වා, අපි උපරිම ප්‍රමාණයට ගියත් ආදායම් බද්ද සියයට 24ක් තමයි ගන්නේ කියා. මේ ලෝකයෙන්ම අඩුම බදු ප්‍රමාණයක් අය කර ගන්නා තැනක්. අපේ දළ ජාතික නිෂ්පාදිතයත් එක්ක බැලුවාම යම්කිසි අඩු ප්‍රමාණයක් තිබෙනවා. ඒ කියන්නේ මේ රටේ නිෂ්පාදකයාට මේ රටේ පාරිභෝගිකයාට අපට දෙන්න පුළුවන් සහනය හැම විටම ලබා දී තිබෙනවා. හැබැයි, ඒ අතරේ වක්‍ර බදු ප්‍රමාණය සෘජු බද්දට අවතීර්ණ කරවන්න අපට කරන්න පුළුවන් සියලුම දේ කළා.

මේ රටේ සිදු වුණු ලොකුම වංචාව -වැට් බදු වංචාව- අමතක කරන්න එපා. වැට් බදු වංචාව සිදු වුණේ කොයි කාලයේද? අද අපි කියනවා, "හරියට බදු අය වෙන්නේ නැහැ, අකාර්යක්ෂමයි" කියලා. නමුත් ආණ්ඩුවට අය වන බද්ද ගෙඩිය පිටින් අරගෙන ගියා. කවුද අරගෙන ගියේ? එවකට ආණ්ඩු පක්ෂයේ හිටපු විධායක සභිකයෙක් ප්‍රධාන චූදිතයා. අපි මේවාත් එක්ක සංසන්දනාත්මකව මේ රට ගැන කථා කරන්න අවශ්‍යයි. අපට එක පාරට මැරිලා උපන්නා වාගේ යමක් කථා කරන්න බැහැ. අපි සාධාරණව යමක් දිහා බලන්න නම්, කථා කරන්න නම්, මේ ගැලරියේ ඉන්න පාසල් දරුවන්ට දැනුමක් ලබා දෙන්න නම්, මාධ්‍යවේදීන් හරහා යමක් රටට කියන්න නම් අපට එක පාරට අද උපන්නා වාගේ කථා කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ රට නිදහස ලබලා අවුරුදු 64ක් වෙනවා. ඒ කාල සීමාව තුළ විවිධ කණ්ඩායම් -විවිධ මුදල් අමාත්‍යවරු, විවිධ අමාත්‍යාංශ නිලධාරීන්, විවිධ වැඩ පිළිවෙළවල්- මේ රට පාලනය කළා. අපි මේවා දිහා සාපේක්ෂව බලන්න ඕනෑ. එතකොට අපට හරි පහසුයි කවුද හරි කියන එක තෝරා ගන්න. මම ආරාධනා කරන්නේ කවුද හරි කියන එක තෝරා ගන්න නම් සාපේක්ෂව බලන්න කියලායි. වැඩි ඈතක කාලයක් ගැන කථා කරන්න අවශ්‍ය වන්නේ නැහැ. ඉතා මෑත කාලවල මේ කියන කණ්ඩායම් මේ රට පාලනය කරලා තියෙනවා; බදු ප්‍රතිපත්ති හදලා තියෙනවා; බදු අය කරලා තියෙනවා. අද කියනවා, වක්‍ර බද්ද වැඩියි, සෘජු බද්ද අඩු නිසා අපට ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මට මතකයි, මේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව වක්‍ර බද්ද හඳුන්වා දුන් අවස්ථාව. මට මතක විදියට එය වැට් බද්ද විය යුතුයි. ශීතකරණ, රෙදි සෝදන මැෂින් ආදී වශයෙන් අත්‍යවශ්‍ය නොවන බඩු සඳහා වූ බදු පරිමාව සියයට 15ක් අය වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අත්‍යවශ්‍ය භාණ්ඩ වන සීනි, පරිප්පු වාගේ ඒවාට අය වුණේ සියයට 5යි. දෙවැනි වර්ෂය වන කොට, මේ බදු ක්‍රමය හරිම සංකීර්ණයි, මේක සරල කරන්න ඕනෑ කියා මෙතුමන්ලා කිව්වා. අත්‍යවශ්‍ය භාණ්ඩ වන සීනි කාලටට, පරිප්පු කිලෝවට අය කරපු සියයට 5ක් වූ, සියයට 6ක් වූ බද්ද සියයට 15ක් කරලා, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ - අපි කියන්නේ ඒවාත් අවශ්‍යයි කියලායි. නමුත් අපේ රටේ ආදායම් විෂමතාව අනුව අපි ඉස්සෙල්ලා පරිප්පු කාල අරගෙන තමයි අනික් ඒවා ගැන කථා කරන්නේ- වන රෙදි හෝදන මැෂිමෙයි, ශීතකරණයෙයි සියයට 20ක් වෙච්ච බදු ප්‍රමාණයත් සියයට 15ට බැස්සුවා. බදු ක්‍රමය සරල කරන්න නම් මේ දෙකම එකතු කරන්න ඕනෑ කිව්වා. එහෙම කථා කරපු යුගයක් අපි පසු කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister -

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாபிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ වෙලාව අවසානද?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

මට කථා කරන්න තව බොහෝ දේවල් තියෙනවා. ඒ දේවල් මම සටහන් කර ගෙන තිබෙනවා. ඒ සටහන මම **සභාගත*** කරනවා. එය හැන්සාඩ්ගත කරන්නය කියා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමා මට තව විනාඩියක් දෙන්න සූදානම්. අපි ඉතා පැහැදිලිව කියනවා, මුදල් අමාත්‍යාංශය හැටියට, මුදල් අමාත්‍යවරයා හැටියට මේ රටේ ඉදිරි ගමන ගැන බොහෝ දේ හිතලා අපි ආපු අභියෝගාත්මක ගමන තුළ ඒ අත් දැකීම් එකතු කරගෙන මේ මහා සැලසුමක් කරන්නේ කියලා. ඒ සැලසුම තුළින් අපට පුළුවන් වෙලා තියෙනවා හිටියාට වැඩිය හොඳ තැනකට යන්න. අපි ඒ ගැන සතුටු වනවා. මම කියන්නේ නැහැ සියල්ල සර්ව ප්‍රකාරයෙන් ඉටු වෙනවාය කියලා. මේක තව්තිසා දිව්‍ය ලෝකය නොවෙයි. හැබැයි, හිටිය තැනට වැඩිය අද අපි හොඳ තැනක ඉන්නවා. අපේ ගමට ගිහිල්ලා බලන්න. යාපනයට ගිහිල්ලා බලන්න. ගාල්ලට ගිහිල්ලා බලන්න. හැම තැනකම අපි හිටියාට වැඩිය වෙනසක් තියෙනවා. කලින් තිබුණාට වැඩි දෙයක් මිනිසුන්ට තියෙනවා. තිබුණාට වැඩිය ආදායමක් තියෙනවා. ඒ අතරේ තමුන්නාන්සේලා කථා කරන්න මාතෘකා කොහෙන් හෝ අහුලා ගන්නවා. ඒකෙත් ඇති ගැටලුවක් නැහැ. ඒක විපක්ෂයක් කරන්න අවශ්‍යයි.

දැන් මම මේ ආර්ථිකය ගැන කථා කරද්දී කාරණා කීපයක් ගැන විතරක් කථා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි සතුටු වනවා, වසර තුනක් තිස්සේ සියයට 10කට වඩා අඩු උද්ධමන වේගයක් පවත්වා ගෙන යන එක ගැන. එසේ පවත්වා ගෙන යන්නේ රටක යුද්ධයක් නිමා කරපු ගමන්. ලෝකයේ බොහෝ රටවල එහෙම වුණේ නැහැ. අපි කියනවා යුද්ධයක් නිමා වුණාම අහස උසට උද්ධමනය නඟිනවා කියලා. අපේ රටේ එහෙම වුණේ නැහැ. යුද්ධය නිමා වෙලා අපි තනි ඉලක්කමේ වර්ධන වේගයක් පවත්වා ගෙන යනවා. ජනවාරි මාසයේ උද්ධමන වේගය 3.8යි. පෙබරවාරි ටිකක් වැඩි වෙලා ඇති. ඒ තත්ත්වයනුත් අපි අවධාරණය කරන්න අවශ්‍යයි.

ලෝකයේ තෙල් මිලත් එක්ක ඇයි තෙල් මිල වැඩි වුණේ? ඒකත් අපි පැහැදිලි කර ගත යුතුයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි කියනවා, රුපියලේ අගය අවප්‍රමාණය වෙලා කියලා. සමහරු කථා නොකළාට, අද මේ ගෙනාපු පනත් සියල්ලේම තියෙන්නේ රුපියල අධි ප්‍රමාණය කරන්න, ඒවා ආරක්ෂා කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළවල්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතකොට දැන් අපේ රටේ රුපියල විතරක්ද අවප්‍රමාණය වුණේ? අපට ළඟම තියෙන රටවල් ටික ගන්න. 2011 වර්ෂය ගත්තොත් බංගලා දේශයේ ටකා එක සියයට 13.75කින් අවප්‍රමාණය වුණා. දැවැන්ත ඉන්දියාවේ 2011 වර්ෂයේදී රුපියල සියයට 15.3කින් අවප්‍රමාණය වුණා. කවුරුත් කෑ ගැහුවේ නැහැ. අපි පාකිස්තානය ගත්තොත් පාකිස්තානයේ රුපියල සියයට 4.64කින් අවප්‍රමාණය වුණා. 2011 සියයට 2.58කින් තමයි අපේ රුපියල අවප්‍රමාණය වුණේ. මේ වර්ෂයේ සියයට 12ක් වාගේ අවප්‍රමාණය වෙලා තියෙනවා. හැබැයි 130ට ගිය ඩොලර් එක ඊයේ වන කොට 128යි.

අපි බලාපොරොත්තු වනවා, ඉදිරි මාස දෙක තුන යන කොට මේ සියලු වැඩ පිළිවෙළවල් එක්ක නැවතත් ඩොලරයේ අගය රුපියල් 120න් පහළට ගෙනෙන්න අපට පුළුවන් වෙයි කියලා.

මම මේ කියන්න උත්සාහ කළේ, මෙය අපට විතරක් වෙච්ච දෙයක්, අපේ වරදක්, අපේ වැඩ පිළිවෙළේ ප්‍රශ්නයක්, ජාත්‍යන්තරව අපි කථා කරන්නේ නැහැයි කියලා සමහරු හිතන නිසායි. මේකයි ලෝකයේ තත්ත්වය. හැබැයි මේ ගැටලු සියල්ලත් එක්ක, මහින්ද චින්තනයක් එක්ක, කොහෙවත් වැඳ වැටෙන්නේ නැතුව අපි දෙපයින් ඉස්සරහට යනවා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ජී.එල්. පීරිස් අමාත්‍යතුමා ඉතා පැහැදිලිව මේ සභාවට කිව්වා, අපි කොහොමද ජිනීවා සිද්ධියේදී හැසිරුණේ, කොහොමද අපේ ජාතික අභිමානය ආරක්ෂා කළේ, මේ රටේ අනාගත පරපුරේ වගකීම, ඔවුන් වෙනුවෙන් කළ යුතු දෑ අපි කොහොමද රැක ගත්තේ කියලා. ඒ ගැන ඉතා පැහැදිලි විවරණයක් එතුමා කළා. මම හිතන්නේ ඉදිරි දවස් දෙකේ ඒ ගැන තවදුරටත් පැහැදිලි කර ගන්න අපට පුළුවන් වේවි.

ඒ වාගේම අපි කිව්වා, වෙළෙඳ ශේෂ හිඟය නිසා අපේ රුපියල අවප්‍රමාණය වුණු බව. ඔව්, එය පැහැදිලියි. මෙය යුද්ධයක් නිමා වුණු රටක්. ඔබතුමා දන්නවා, උතුරු නැඟෙනහිර ප්‍රදේශවල මිනිසුන් බැඳලා ආලා සිටියේ කියලා. ඒ මිනිසුනට කන බොන දේ ගැන විතරක් නොවෙයි, ජීවිතය ගැනත් ප්‍රශ්නයක් තිබුණා. එයින් නිදහස් වුණු රටට මිනිසුන් වාහන ටිකක් ගෙනාවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2011 දී මේ රටේ වාහන අලුතින් ලියා පදිංචි කරලා තිබෙනවා, 5,25,421ක්. ඊළඟට ආනයනය කරලා තිබෙන්නේ රත්තරන්. බැඳලා, හිරවෙලා, ජීවිත ආශාව අත හැරලා සිටිය මිනිස්සුත් තමන්ට අවශ්‍ය දේවල් ගෙනාවා. ආර්ථිකයක් හැටියට අපට ඒවා බැඳලා දමන්න පුළුවන්ද? අවුරුදු තිහක් දුක් වින්ද මිනිසුන්ට ඒවාට ඉඩක් දුන්නා. අපි කිව්වා, මේ රටේ සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් තිබෙනවායි කියලා. අපේ ආර්ථික වර්ධන වේගය රඳවා ගන්න බොහෝ දේ කළ යුතුයි. මහා මාර්ගවලට අදාළව තාර ටික වෙන්න පුළුවන්, ආනයන හැටියට ගෙනෙන්න වෙනවා. ඒවා අපි ළඟ නැහැ. ඉතින් ඒවාත් එක්ක බැඳුණු ප්‍රශ්න තිබෙනවා. ඒවාට අවශ්‍ය විසඳුම් ලබා දෙන්න රටක් හැටියට ප්‍රතිපත්තිමය තීරණ ගන්න අවශ්‍ය දේවල් තමයි අද අපි කථා කරන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අද අපි සතුටු වනවා, අපේ රටේ දරිද්‍රතාවය අඩු වීම ගැන. 2007 දී අපේ රටේ දරිද්‍රතාවය සියයට 15.2යි; අද සියයට7.6යි. උතුරු නැඟෙනහිර ගැනත් මම කියන්න අවශ්‍යයි. වී නිෂ්පාදනය ගත්තොත්, අද අපි වීවලින් ස්වයංපෝෂිත වී තිබෙනවා. 2008-2009 මහ කන්නයේ උතුරු නැඟෙනහිර වගා කළේ හෙක්ටයාර් 1,56,617යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි ඔබතුමා සතුටු විය යුතුයි, අද එය හෙක්ටයාර් 2,47,726ක් වනවා. 2009 දී උතුරු නැඟෙනහිර ධීවර නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 89,690යි; අද 1,25,840යි.

මම කියන්න හැදුවේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පැහැදිලිව හොඳ ගමනක් යන්න සූදානම් බවයි. ඒ ගමන තුළ අපට බාධක තිබෙනවා. ඒවා දේශීය වශයෙන් වෙන්න පුළුවන්, විදේශීය වශයෙන් වෙන්න පුළුවන්. හැබැයි මේ අවුරුදු දෙදහස තුළම මේවා අපට අලුත් දේවල් නොවෙයි. ඒ නිසා ඒ සියලු අත්දැකීම් එක්ක, මහින්ද චින්තනයත් එක්ක, ජාතියට ආදරය කරන මිනිස්සු මේ රට ගොඩ ගන්න මේ ගමන යන්න සූදානම් කියන ප්‍රකාශය ඉදිරිපත් කරමින් මට වෙලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

[பி.ப. 4.30]

**ගරු හුනෙයිස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இங்கு சமர்ப்பிக்கப்பட்டிருக்கின்ற ஆறு பிரதான சட்டமூலங்கள் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்று வதற்குச் சந்தர்ப்பம் கிடைத்தமையையிட்டு மகிழ்ச்சியடை கின்றேன். உண்மையில் கடந்த வரவு செலவுத் திட்டத்தில் முன்வைக்கப்பட்ட சில வேலைத்திட்டங்களை மிகவும் இலகுவாக முன்னெடுப்பதற்கு இந்தச் சட்டமூலங்கள் உதவியாக இருக்கும் என்பது எனது அபிப்பிராயமாகும். மேலும் கடந்த வரவு செலவுத் திட்டத்தில் கூறப்பட்ட பல விடயங்கள் இன்று நிறைவேற்றப்பட்டு வருகின்றன. வடக்கை எடுத்துக்கொண்டால், அங்கு அவை துரித கதியில் நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றன. இதில் குறிப்பாக 'திவிநெகும' திட்டத்தின்மூலம் மனைப் பொருளாதாரத்தை உயர்த்துவதற்கான 25 இலட்சம் வீட்டுத் தோட்டத் திட்டங்கள் நாடு முழுவதும் முன்னெடுக்கப்பட்டு வருகின்றன. அந்த வகையில் எமது வன்னி மாவட்டத்திலும் இந்தத் திட்டங்கள் நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றன. அதன்மூலம் அங்கு விவசாயத்துறையில் சிறந்த பெறுபேறுகளைக் காணக்கூடிய தாக இருக்கின்றது. எமது பிரதேசத்தைப் பொறுத்தமட்டில் அங்கு குறிப்பாக இந்த முறை மகா போகத்தில் சிறந்த விளைச்சல் பெறப்பட்டிருக்கின்றது. அந்த விளைச்சலின்மூலம் கிடைத்த நெல்லைக் கொள்வனவு செய்வதற்கான ஏற்பாடுகளை நாம் செய்திருந்தோம். அங்கு ஒரு கறுப்புச் சந்தை உருவாகக்கூடிய நிலைமை இருந்தபொழுதிலும் அரசாங்கத்தினால் நெல் கொள்வனவுக்காக ஒதுக்கப்பட்ட பணத்தினால் அந்த நெல்லை உகந்த விலைக்குக் கொள்வனவு செய்து அந்த நிலைமை ஏற்படாமல் பாதுகாத்து, விவசாயி களுக்குச் சிறந்த பெறுபேறு பெற்றுக்கொடுக்கப்பட்டது.

எமது வன்னி மாவட்டத்தைப் பொறுத்தமட்டில், கடந்த 23ஆந் திகதி முடிவடைந்த குடிசன மதிப்பீட்டின் தரவு களிலிருந்து, அங்கு எதிர்காலத்தில் ஓர் இக்கட்டான நிலை உருவாகலாம் என நாங்கள் அச்சப்படுகின்றோம். ஏனெனில், 1990ஆம் ஆண்டு இனச் சுத்திகரிப்புக்கு உள்ளாக்கப்பட்டு வடக்கிலிருந்து வெளியேற்றப்பட்ட முஸ்லிம் மக்களது மீள்குடியேற்றம் இன்னும் சரியாக முடிவடையாத நிலையில் அவர்கள் புத்தளம் மாவட்டத்தைச் சேர்ந்தவர்கள் எனக் கணக் கிடப்பட்டிருக்கின்றது. அதேநேரம் குடிசன மதிப்பீடானது, பத்து வருடங்களுக்கு ஒருமுறைதான் நடத்தப்படுகிறது. இதனால் உண்மையில் சம்பந்தப்பட்ட இரண்டு மாவட்டங்க ளுக்கும் பாரிய பாதிப்புக்கள் ஏற்படலாம். உதாரணமாக 1981ஆம் ஆண்டு புத்தளத்தில் 49 ஆயிரம் முஸ்லிம் மக்கள் வாழ்ந்தார்கள். இது அப்பிரதேசத்தின் மொத்தச் சனத்தொகை யில் 9.9 வீதமாகும். அதன் பின்னர் 2001ஆம் ஆண்டு 1,33,134 முஸ்லிம்கள் அங்கு இருப்பதாகக் கணக்கெடுக்கப்பட்டது. உண்மையில், வடக்கிலிருந்து வெளியேற்றப்பட்ட முஸ்லிம் களின் எண்ணிக்கையும் அதில் உள்ளடக்கப்பட்டிருந்தமையே 1981ஆம் ஆண்டிலிருந்து 2001ஆம் ஆண்டு வரை புத்தளத்தில் 100 வீத அதிகரிப்பு ஏற்பட்டமைக்கான காரணமாகும். இந்த நிலைமையானது, எதிர்காலத்தில் புத்தளத்தில் ethnic balance இல்லாத ஒரு நிலையை, அதாவது இன விகிதாசாரத்தில் ஒரு சமமின்மையை ஏற்படுத்தலாம்.

மன்னார் மாவட்டத்தை எடுத்துக்கொண்டால், இந்தக் கணக்கெடுப்பினால் அங்கு பத்தாண்டு வேலைத்திட்டம் மற்றும் அபிவிருத்தித் திட்டங்கள் மேற்கொள்ளப் படுகின்றவேளையிலும் அம்மாவட்டத்துக்கான வேலைவாய்ப் புக்கள் ஒதுக்கப்படுகின்றபோதும் அங்குள்ள மக்களுக்குப் பாதிப்பு ஏற்படும். உண்மையில் சனத்தொகை விகிதாசாரத் தைச் சரியான முறையில் கணக்கெடுக்கவில்லையென்றால் அவர்களுக்குப் பல பாதிப்புக்கள் ஏற்பட வாய்ப்புக்கள் இருக்கின்றன. எனவே, இவற்றைக் கவனத்திற்கொண்டு உண்மையாக அவர்கள் எந்த மாவட்டத்தைச் சேர்ந்தவர்களோ, அந்த மாவட்டத்தின் இன விகிதாசாரத்தில் அவர்களைச் சேர்த்துக்கொள்ளுமாறு சம்பந்தப்பட்டவர்களிடம் நான் இந்தச் சபையில் கேட்டுக்கொள்கின்றேன்.

இதேபோன்று இடம்பெயர்ந்து வாழ்கின்ற முஸ்லிம்களின் வாக்காளர் பதிவிலும் ஒரு துரதிருஷ்டமான நிலை காணப் படுகின்றது. இலங்கை அரசியலமைப்பின் 14வது உறுப்புரையின்படி இலங்கையைச் சேர்ந்த எந்தவொரு குடிமகனுக்கும் இலங்கையின் எந்த மாவட்டத்திலும் வசிப் பதற்கோ, தொழில் செய்வதற்கோ முடியுமாக இருக்கின்றது. யுத்தத்தின் நிமித்தம் தமது சொந்த இடங்களை விட்டு இடம்பெயர்ந்து 22 வருட காலமாகத் தற்காலிக வசிப் பிடங்களில் வாழ்ந்துவரும் மக்கள், அங்கு தொடர்ந்தும் வாழ முடியாத நிலையில் மீண்டும் தமது சொந்த இடங்களுக்குச் சென்று குடியேறுவதற்கான தங்களது விருப்பத்தைத் தெரிவித்திருக்கிறார்கள். இருந்தாலும், அவர்களுக்கான அந்த ஏற்பாடுகளை எம்மால் செய்து கொடுக்க முடியாத நிலை காணப்படுகின்றது. மன்னார், முல்லைத்தீவு, யாழ்ப்பாணம் போன்ற அவர்களது சொந்த மாவட்டங்களில் வாக்காளர் களாகத் தம்மைப் பதிவுசெய்துகொள்வதற்காக விண்ணப்பங் களைச் சமர்ப்பித்தும் உரிய முகவரியில் அவர்கள் இல்லை யென்ற காரணத்தினால் அவை நிராகரிக்கப்படுகின்றன. அவர்களால் தமது சொந்த இடங்களில் வாக்காளர்களாகப் பதிவுசெய்துகொள்ள முடியாத நிலை காணப்படுகின்றது. அதேநேரத்தில், தற்காலிகமாக இருக்கின்ற இடங்களில் அந்த மக்களைப் பலாத்காரமாக வாக்காளர்களாகப் பதியுமாறு வற்புறுத்துவது எந்தவகையிலும் பொருத்தமில்லையென்பது எங்களது கருத்தாகும். அந்த மக்கள் எங்கு தங்களை வாக்காளர்களாகப் பதிய விரும்புகின்றார்களோ, அங்குதான் அவர்களைப் பதிய வேண்டும். இலங்கையில் வாழ்கின்ற ஒரு குடிமகன் நாட்டின் ஏதாவது ஒரு பிரதேசத்தில் வாக்காளராக நிச்சயமாகப் பதியப்பட வேண்டும். ஆனால், 1990ஆம் ஆண்டு இனச் சுத்திகரிப்புக்குள்ளாக்கப்பட்ட இந்த முஸ்லிம்களுக்குத் தாங்கள் விரும்புகின்ற ஓர் இடத்தில் வாக்காளர்களாகப் பதியக்கூட முடியாத துர்ப்பாக்கிய நிலை காணப்படுகின்றது.

இதேபோன்று, குடிசன மதிப்பீட்டின்போதும் சொந்த முகவரியில் அவர்களது பெயர்கள் பதியப்படுவதில்லை. குடிசன மதிப்பீட்டுப் புள்ளிவிபரங்களை அடிப்படையாகக் கொண்டுதான் எதிர்கால அபிவிருத்தி வேலைத்திட்டங்கள் முன்னெடுக்கப்படுகின்றன. அந்த வகையில், எதிர்வரும் காலங்களில் இன விகிதாசாரத்திற்கேற்ப வேலைவாய்ப்புக்கள் வழங்கப்படும்பொழுதும் அவர்களுக்குப் பல பாதிப்புக்கள் ஏற்படலாம். எனவே, எதிர்காலத்தில் வடக்குக்கான அபிவிருத்தி வேலைத்திட்டங்கள் முன்னெடுக்கப்படுகின்ற போது இந்த நிலைமைகள் நிச்சயமாகக் கவனத்திலெடுக்கப் பட வேண்டும். புத்தளம் மாட்டத்தில் தற்காலிகமாகப் பதிவுகளை மேற்கொண்டிருக்கின்ற வடக்கு முஸ்லிம்களின் இன விகிதாசாரம் அவர்களது சொந்த மாவட்டங்களை அடிப்படையாக வைத்துக் கணிக்கப்பட வேண்டும். வடக்கிலிருந்து வெளியேற்றப்பட்ட 16,000 குடும்பங்கள் இன்று சுமார் 35,000 குடும்பங்களாகப் பெருகிக் காணப் படுகின்றன. அவற்றில் 30,000 குடும்பங்கள்வரை மீண்டும் சொந்த இடங்களுக்குப் போவதற்காகப் பதிவுகளை மேற்கொண்டிருக்கின்றன. இருந்தபொழுதிலும் துரதிருஷ்டம் என்னவென்றால், 20-25 சதவீதமான மக்களே அங்கு சென்று வாழக்கூடிய ஒரு சூழ்நிலை காணப்படுகின்றது. இதனை கௌரவ மீள்குடியேற்ற அமைச்சரின் மேலான கவனத்துக்கு நான் முன்வைக்கின்றேன்.

[ගරු හුනෛයිස් ෆාරුක් මහතා]

UNHCR யும் மீள்குடியேற்ற அமைச்சும் அன்று கைச்சாத்திட்டுக்கொண்ட ஒப்பந்தத்தின்படி, 1990ஆம் ஆண்டு வெளியேற்றப்பட்ட, இனச்சுத்திகரிப்புக்கு உள்ளாக்கப்பட்ட அந்த மக்கள் 'பழைய அகதிகள். முஸ்லிம் மக்களும் சிங்கள மக்களும்தான் அன்று கூடுதலாக வெளியேற்றப்பட்டார்கள். எனவே, அவர்களின் மீள்குடியேற்றத்துக்காக விசேட வேலைத்திட்டமொன்றைக் கௌரவ மீள்குடியேற்ற அமைச்சர் அவர்கள் முன்வைக்க வேண்டும். அவர்களது மீள்குடியேற் றத்தை இந்த வருட இறுதிக்குள்ளாவது பூர்த்திசெய்து கொடுப்பதற்கான திட்டங்களை வகுக்க வேண்டும். மீள்குடியேற்றத்துக்காகப் பதிவுசெய்தவர்கள் மன்னார், வவுனியா, முல்லைத்தீவு போன்ற அவர்களின் சொந்த மாவட்டங்களில் எதிர்வரும் பத்தாண்டுகளில் வகுக்கப் படுகின்ற ஒவ்வொரு அபிவிருத்தித் திட்டத்திலும் உள்வாங்கப் பட வேண்டும். அதேபோன்று குடிசன மதிப்பீட்டிலும் அவர்களின் எண்ணிக்கை அந்தந்த மாவட்டங்களில் உள்வாங்கப்படவேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்தில் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வஸ்ஸலாம்.

[අ. භා. 4.30]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )

(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙනුවෙන් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා 2012 සඳහා වූ අය වැය ලේඛනය ඉදිරිපත් කරමින් ඉදිරිපත් කළ එම යෝජනා යථාවත් කරන මෙම පනත් කෙටුම්පත් හය පිළිබඳව අද මේ සභාව තුළ විශාල විවාදයකට ලක් කරන්නට යෙදුණා. ඒ යෝජනා පිළිබඳව ඇති කරපු සංවාදයට එකතු වුණු අපේ ආණ්ඩු පක්ෂයේ සහ විරුද්ධ පක්ෂයේ සියලුම අමාත්‍යවරුන්ට සහ මන්ත්‍රීවරුන්ට පළමු කොට අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ. ඒ වාගේම පසු ගිය අවුරුදු කිහිපය තුළම මෙම අය වැය යෝජනාවල සඳහන් පනත් කෙටුම්පත්වල සංශෝධනයන්ට අදාළ කාර්යයන් මාර්තු මස 31 වන දින වන විට සම්පූර්ණ කරන්නට අපේ අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතා ඇතුළු කාර්ය මණ්ඩලය විසින් විශාල කැප වීමකින් විශාල මෙහෙවරක් කළා. මාස තුනක් වැනි කෙටි කාලයක් තුළ මෙම බදු සංශෝධන සහ එම අදාළ සංශෝධන පනත් කෙටුම්පත් වග කීමකින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ අපි සියලු දෙනාගේම ස්තුතිය පළ කරන්න ඕනෑ. අපේ අය වැය ලේඛනයේ සඳහන් යෝජනා සංශෝධන පනත් කෙටුම්පත් තුළින් විනිවිද පෙනෙන ආකාරයට ජනතාවටත්, රටටත්, ලෝකයාටත් ඉදිරිපත් කිරීමේ ගමන් මඟ එලෙසම මේ අවුරුද්දේත් සම්පූර්ණ කර ගන්නට අපට හැකි වීම පිළිබඳව ස්තුතිවන්ත වන්න ඕනෑ. ඒ සඳහා ලබා දුන් සහයෝගයට විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් සියලුම මන්ත්‍රීවරුන්ට අපේ ස්තුතිය පුද කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම කෙටියෙන් පැහැදිලි කළොත්, මේ රටේ ආර්ථික සංවර්ධනය සඳහා වන සංශෝධන ගණනාවක් ශ්‍රී ලංකා බදු ක්‍රමය තුළින් හඳුන්වා දුන් ශ්‍රී ලංකා රේගු ආඥා පනතට එකතු කරන්නට පුළුවන් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් දේශීය කර්මාන්තකරුවන්ට, දේශීය සිනමා කර්මාන්තයට, ඖෂධ නිෂ්පාදනයට, කාබනික අපද්‍රව්‍ය නිෂ්පාදන භාවිත කරන කර්මාන්තකරුවන්ට සහ දේශීය කෘෂි කර්මාන්තයට පහසුකම් සලස්වා තිබෙනවා. ඒ වාගේම බලශක්ති නිෂ්පාදනය සඳහා වූ පහසුකම් සැපයීමටත්, එලෙසම යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ගෙන්වීම පිළිබඳවත් විශාල දිරි ගැන්වීමක් මේ සංශෝධන මඟින් ලබා දීමට කටයුතු කරලා තිබෙනවාය කියන ටික අපි මතක් කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා බස් රථ ආනයනය කිරීම පිළිබඳව ලබා දුන් සහනය අපි මතක් කරන්නට ඕනෑ. ඒ වාගේම මෙවැනි දේශීය නිෂ්පාදන කර්මාන්ත දිරි ගැන්වීමට රබර්, ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ ඒ අදාළ උපකරණ ආනයනය සඳහා සහන ලබා දීලා තිබෙනවා. ඒ වාගේම දේශීය රෙදි පිළි කර්මාන්තය දිරි ගැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් සලස්වන්නට මේ පනත් කෙටුම්පත මඟින් සංශෝධන ඉදිරිපත් කිරීමට කටයුතු කරලා තිබෙනවා.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කියනවා නම්, විශේෂයෙන්ම අය වැය යෝජනාවේ අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු තාක්ෂණික සටහන් තුළ මේ සියල්ල එලෙසම අඩංගු වනවාය කියන එක ඉතාම ඕනෑකමින් නැවත වරක් අපි මතක් කරන්න ඕනෑ. ඉන් පිටත ගමන් කරමින් මේ යෝජනා වෙනත් යෝජනා බවට පත් කරන්නට හදපු උත්සාහය වැරැදියි කියන එකත් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. විපක්ෂයේ ඇතැම් කථික මන්ත්‍රීවරු මෙය වෙනත් යෝජනා හැටියට හඳුන්වන්නට හැදුවා.

නමුත් පසු ගිය නොවැම්බර් මාසයේ 21 වැනිදා ඉදිරිපත් කරලා, දෙසැම්බර් මාසයේ 21වැනිදා මේ යෝජනා සම්මත කරලා තිබෙනවා. ඇරලා බලපු දේ නැවත ඔබලා බලන්නට අවශ්‍ය නැහැයි කියන දේ තමයි අපට ඉතාම පැහැදිලිව කියන්නට පුළුවන් වන්නේ කියන ටික ඉතාම ඕනෑකමින් මතක් කරනවා.

ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් විශේෂයෙන්ම දේශීය කර්මාන්තකරුවන් දිරි ගැන්වීම සඳහා අපේ කර්මාන්තකරුවන්ට විශාල රුකුලක් ලබා දෙන්නට කටයුතු කර තිබෙනවා. අපේ ටී.බී. ඒකනායක ඇමතිතුමා සඳහන් කළ පරිදි දේශීය කලා කටයුතු සඳහාත් දිරිගැන්වීම් සහ සහන ලබා දීමට කටයුතු කරලා තිබෙනවා කියන ටික අපි මතක් කර දෙන්නට ඕනෑ.

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත තුළිනුත් කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසාය සඳහා සහන සැලසීමට ආර්ථික සේවා බද්දෙන් නිදහස් සීමාව කාර්තුවකට මිලියන 25 සිට 50 දක්වා වැඩි කර තිබෙනවා. එවැනි දිරි ගැන්වීම් ලබා දෙන්නට මේ පනත් කෙටුම්පත තුළින් කටයුතු කර තිබෙනවාය කියන ටිකත් ඉතාම ඕනෑකමින් මතක් කරනවා. ඒ වාගේම මුදල් පනත් කෙටුම්පතේ සංශෝධනය තුළිනුත් ඒ සඳහා වූ පහසුකම් සපයන්නට කටයුතු කර තිබෙනවා. අපේ ආනයන සඳහා වන යම් යම් සීමා තුළ, අපේ වෙළෙඳ ශේෂයේ ඇති වී තිබෙන පරතරය අඩු කර ගැනීම සඳහා මුල් පියවර කීපයකුත් මේ තුළින් තබා තිබෙනවාය කියන එකත් මතක් කරනවා.

කෘෂි කර්මාන්තය ඇතුළු අනෙකුත් දේශීය කර්මාන්තවලට අවශ්‍ය වාහන ආනයනය කිරීමේදී පනවන බදු සරල කිරීමටත් පියවර ගෙන තිබෙනවාය කියන ටික ඉතාම ඕනෑකමින් මතක් කරනවා.

විශේෂයෙන්ම මුදල් පනත් කෙටුම්පත තුළිනුත්, ඒ වාගේම වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත තුළිනුත් මේ රටේ දේශීය කර්මාන්ත දිරිමත් කිරීමට කටයුතු කර තිබෙනවා. ඒ කර්මාන්ත දිරිමත් කිරීමට සහ

ශක්තිමත් කිරීමට මේ බදු යෝජනා රාශිය තුළින් හැකි වෙලා තිබෙනවාය කියන ටික ඉතාම ඕනෑකමින් මතක් කරනවා. මේ පනත් කෙටුම්පත් කීපය අද දින සම්මත කිරීම තුළින් ඒ කාර්යට ඉටු කර ගන්නට අපට හැකි වෙනවාය කියන ටිකත් මතක් කරනවා.

මහින්ද චින්තනය තුළින් ශ්‍රී ලංකාව මේ කලාපයේ ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්නටත්, මේ කලාපයේ තිබෙන කේන්ද්‍රීය රටක් බවට පත් කරන්නටත් කටයුතු කර තිබෙනවා. අපේ දිවයිනේ පිහිටීම ඒ සඳහා යොදාගෙන නැඟෙනහිර, බටහිර අතර නාවික ගමන් මඟේ පිහිටි කේන්ද්‍රීය ආර්ථික මධ්‍යස්ථානයක් බවට පත් කරන්නටත් අවශ්‍ය තවත් පියවරක් තමයි මේ තුළ තබා තිබෙන්නේ කියන ටික මතක් කරමින්, මෙයට සහයෝගය දීම පිළිබඳව නැවත වරක් අපේ අමාත්‍යාංශය වෙනුවෙන් මගේ ස්තුතිය ඔබට පුදකරමින් මා නිහඬ වනවා. ඔබට සුබ අනාගතයක්.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය. පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது. அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to. Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு தினேஷ் குணவர்தன]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Dinesh Gunawardena.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී -***
***[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES in the Chair.]*

***1 වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 2.- (2002 ஆம் ஆண்டின் 14 ஆம் இலக்க, சேர்பெறுமதி வரிச் சட்டத்தின் 2 ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 2.- (*Amendment of section 2 of the Value Added Tax Act, No. 14 of 2002*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"1වන පිටුවේ, 30 සිට 36 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'තැනැත්තකු වෙත කරන ලද සැපයුම් සම්බන්ධයෙන්, එසේ වුව ද, එම සැපයුම්වල වටිනාකම එම භාණ්ඩ හෝ සේවා සපයනු ලබන ලියාපදිංචි තැනැත්තාගේ මුළු සැපයුම්වලින් සියයට පනහක ප්‍රතිශතයක් ඉක්මවනු ලබන බවට, කොමසාරිස් - ජනරාල්වරයා විසින් පවතින තොරතුරු මත සෑහීමට පත්වන්නේ නම් එසේ කරන ලද සැපයුම් සම්බන්ධයෙන්.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***2වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*2 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 2, as amended, ordered to stand part of the Bill.*

## 3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.)

### வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 22ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 3.- (*Amendment of section 22 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"4වන පිටුවේ, 7 සිට 17 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(4). ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ තුන්වන අතුරු විධානයේ "එසේම තවදුරටත්," යන වචනවල සිට "ඉදිරියට ගෙන යා යුතු ය." දක්වා සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-';"

"6 වන පිටුවේ, 21 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ගැනීමෙන් පසුව, පහත දැක්වෙන පරිදි හිලව් කළ හැකිය'; "

"7 වන පිටුවේ, 32 සිට 39 දක්වා පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කරන්න:"

"8 වන පිටුවේ, 35 සිට 39 දක්වා පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'මේ උපවගන්තිය ප්‍රකාරව, එක් එක් මාසය සඳහා ගෙවිය යුතු බද්දට එරෙහිව වන සම්පූර්ණ හිලව් කිරීම -

(i) එම හිලව් කිරීම, 2011 ජනවාරි මස 01 වන දින සිට 2011 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා වූ විට, 2010 දෙසැම්බර් මස 31 වන දිනට පවතින අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බදු බැර මුදලින් සියයට දහයක් හෝ අදාළ බදු බැඳියාවෙන් සියයට පහක් යන ඒවායින් අඩු ප්‍රමාණය නොඉක්මවිය යුතු ය;

(ii) එම හිලව් කිරීම, 2012 ජනවාරි මස 01 වන දින හෝ එදිනට පසු වන යම් බදු අයකළ හැකි කාලසීමාවක් සඳහා වන විට, 2010 දෙසැම්බර් මස 31 වන දිනට අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම්

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

> බදු බැර මුදලින් සියයට දහයක් හෝ 2010 දෙසැම්බර් මස 31 වන දිනට පවතින අන්තර්ග්‍රහණය නොකළ මුළු ශේෂයෙන් මාස 12 ක කාලය ඇතුළත ගෙවිය යුතු බදු මුදල හිලව් කිරීමෙන් පසු 2011 දෙසැම්බර් මස 31 වන දිනට පවතින ශුද්ධ අන්තර්ග්‍රහණය නොකළ ශේෂය යන දෙකෙන් වඩා අඩු ප්‍රමාණය නොඉක්මවිය යුතු ය.' "

"9 වන පිටුවේ, 1 සිට 5 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***3වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*3 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3, as amended, ordered to stand part of the Bill.*

***4 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*4 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 4 ordered to stand part of the Bill.*

## 5 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනය සංශෝධනය කිරීම.)

### வாசகம் 5.- (முதன்மைச் சட்டவாக்கத்துக்கான முதலாம் அட்டவணையைத் திருத்துதல்)

CLAUSE 5.- (*Amendment of the first schedule to the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"10 වන පිටුවේ, 32 සිට 35 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(i) (අ) අනුඡේදයේ (ii) වන අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:

(ii) ලොරි, ට්‍රැක්ටර් හෝ, 2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව. ' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***5වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*5 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 5, as amended, ordered to stand part of the Bill.*

***6 සහ 7 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*6ஆம், 7ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 6 and 7 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත

## உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்

## INLAND REVENUE (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [ மாண்புமிகு தினேஷ் குணவர்தன ]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Dinesh Gunawardena.]*

***කාරක සභාවේදී සලකා බලන ලදී.***
***[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES in the Chair.]*

## 1 වන වගන්තිය.- (ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.)
## வாசகம் 1.- (சுருக்கப் பெயரும் நடைமுறைக்கு வரும் தேதியும்.)
CLAUSE 1.- (*Short title and the date of operation*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 16 වන පේළිය හා 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ඇ) (i) මේ පනතේ 15 (1) වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (2) වන උපවගන්තියට (ඍ) අලුත් ඡේදය එකතු කිරීමෙන් ඒ උපවගන්තියට කරන ලද සංශෝධන; සහ

(ii) මේ පනතේ 15(2) වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදයට එකතු කරන ලද (x) අලුත් අනුඡේදයේ (අ) අයිතමය සහ (ආ) ඡේදයට එකතු කරන ලද (ix) අලුත් අනුඡේදයේ (අ) අයිතමය මගින් ඒ උපවගන්තියට කරන ලද සංශෝධන,

2011 අප්‍රේල් මස 1 වන දින සිට සියලු කාර්යයන් සඳහා බලාත්මක විය යුතු බවට සලකනු ලැබිය යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***1 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1, as amended, ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.)
## வாசகம் 2.- (முதன்மைச் சட்டவாக்கத்தின் 7ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 2.- (*Amendment of section 7 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 21 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:-

'(අ) (xxviii) වන අනුඡේදයේ " 1982 අංක 17 දරන සමාගම් පනතේ VIII වන කොටස" යන වචන සහ ඉලක්කම් වෙනුවට ' 2007 අංක 7 දරන සමාගම් පනතේ XI වන කොටස' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්'; "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

## 3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.)
## வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 9ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 3.- (*Amendment of section 9 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ, 25 වන පේළියේ සිට 27 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ ' දෙන ලද ණයක් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්' යන වචන වෙනුවට' :

"3 වන පිටුවේ, 5 වන පේළිය සහ 6 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළි ආදේශ කරන්න:-

'යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයේ " දෙන ලද ණයක් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්" යන වචන වෙනුවට,

" දෙන ලද ණයක් -

(i) 2012 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ප්‍රදානය කරනු ලැබ ඇත්නම් හා එය ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය සඳහා අත්‍යවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඇත්නම්; හෝ

(ii) 2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ප්‍රදානය කරනු ලැබ ඇත්නම්"

යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 3, as amended, ordered to stand part of the Bill.*

***4 සිට 8 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*4ஆம் வாசகத்திலிருந்து 8ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 4 to 8 ordered to stand part of the Bill.*

## 9 වන වගන්තිය .-(ප්‍රධාන ප්‍රඥප්තියේ 17අ වන වගන්තිය සංශෝධනය කිරීම.)

## வாசகம் 9.- (முதன்மைச் சட்டவாக்கத்தின் 17அ என்னும் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 9.- (*Amendment of section 17A of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධන මා ඉදිරිපත් කරනවා:

"9 වන පිටුවේ, (1) 17අ වගන්තියේ උපලේඛනයේ (i) වන තීරයට සහ (ii) වන තීරයට ඉක්බිතිවම පහතින් දැක්වෙන "ආයෝජනය ඇ.එ.ජ. ඩොලර් මිලියන වලින් සහ බද්දෙන් නිදහස් කාල සීමාව" යන වචන අතහැර ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කරන්න:-

' "(ආයෝජනය රුපියල් මිලියන වලින්) " (බද්දෙන් නිදහස් කාල සීමාව), ' "

(2) "13 වන පේළියේ සිට 17 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

' "(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා " අලුත් ව්‍යවසායක් යන්නෙන්-

(අ) පහත නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාකාරකමක -

(i) බෝට්ටු , ඖෂධ, ටයර් සහ ටියුබ් මෝටර්";' "

"11 වන පිටුවේ, 15 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

' "(xxvi) අධ්‍යාපන සේවා සැපයීම; හෝ

(xxvii) රටේ ජාතික ආර්ථිකයේ සංවර්ධනය පිළිබඳව සැලකිල්ල යොමු කරමින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රියාකාරකමක නිරතව සිටින; සහ

(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව වාණිජ කටයුතු ආරම්භ කරන,

යම් ව්‍යවසායක් අදහස් වේ.";' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*9ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 9, as amended, ordered to stand part of the Bill.*

***10 සහ 11 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*10ஆம், 11ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 10 and 11 ordered to stand part of the Bill.*

## 12 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.)

## வாசகம் 12.- (முதன்மைச் சட்டவாக்கத்தின் 25ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 12.- (*Amendment of section 25 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධන මා ඉදිරිපත් කරනවා:

"12 වන පිටුවේ, (1) 18 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:-

(3) ඒ වගන්තියේ (එ) ඡේදයේ "සියයට දෙසීයකට සමාන යම් ප්‍රමාණයක් " යන වචන වෙනුවට, පහත සඳහන් වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:-

"සියයට දෙසීයකට සමාන යම් ප්‍රමාණයක්:

එසේ වුව ද, ඒ පර්යේෂණ කරගෙන යනු ලබන්නේ යම් රාජ්‍ය ආයතනයක් හරහා නම්, 2012 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා වන අඩු කිරීම, ඒ තැනැත්තා විසින් දරන ලද ඒ වියදමෙන් සියයට තුන්සියයකට සමාන මුදලක් විය යුතුය;

මේ ඡේදයේ කාර්යය සඳහා -

(i) " රාජ්‍ය ආයතනය" යන්නට, රජය විසින් සියයට පනහක හෝ ඊට වැඩි ප්‍රමාණයක කොටස් දරන යම් සමාගමක් ඇතුළත් වේ"; සහ

(ii) " විද්‍යාත්මක, කාර්මික, කෘෂිකාර්මික හෝ වෙනත් යම් පර්යේෂණ" යන්නෙන්, නිෂ්පාදන හෝ නිෂ්පාදිත නවෝත්පාදනය සඳහා හෝ යම් නිෂ්පාදනයක, නිෂ්පාදිතයක හෝ සේවාවක ගුණාත්මකභාවය හෝ ස්වභාවය වැඩි දියුණු කිරීම සඳහා කර ගෙන යනු ලබන යම් පර්යේෂණ අදහස් වන අතර , ඊට යම් වෙළඳ පොළ පර්යේෂණ හෝ ශක්‍යතා අධ්‍යයන ඇතුළත් නොවේ." ' "

(2) "20 වන පේළියේ සිට 24 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළි ආදේශ කරන්න:-

'අනුඡේදයේ "මේ පනතේ XIV පරිච්ඡේදය" යන වචන වෙනුවට "මේ පනතේ 8 වන වගන්තියේ (1) වන

උපවගන්තියේ (ඝ) ඡේදය යටතේ නිදහස් කොට නොමැති අවස්ථාවක මේ පනතේ XIV පරිච්ඡේදය" යන වචන ආදේශ කිරීමෙන්;' "

(3) "25 වන පේළියේ සිට 27 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(4) එම උපවගන්තියේ (ඝ) ඡේදයේ "එම සමාගමේ මුල් මහජන කොටස් නිකුතුවේ අගයෙන් සියයට එකක් නොඉක්මවන තාක්දුරට එම තක්සේරු වර්ෂයේ දී සමාගම විසින් දරන ලද එකී කොටස් නිල ලැයිස්තුගත කිරීමේ වියදම්" යන වචන වෙනුවට "එම සමාගමේ මුල් මහජන කොටස් නිකුතුවේ අගයෙන් සියයට එකක් නොඉක්මවන තාක්දුරට එම තක්සේරු වර්ෂයේ දී සමාගම විසින් දරන ලද එකී කොටස් නිල ලැයිස්තුගත කිරීමේ වියදම්;" යන වචන ආදේශ කිරීමෙන්:'"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***12 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*12ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 12, as amended, ordered to stand part of the Bill.*

## 13 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.)

### வாசகம் 13.- (முதன்மைச் சட்டவாக்கத்தின் 26ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 13.- (*Amendment of section 26 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"13 වන පිටුවේ, 5 වන පේළියේ සිට 25 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළි ආදේශ කරන්න:'

"සේවාවන් සැපයීම,

සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන්වලදී" යන වචනවල සිට "අඩු කරනු ලැබිය යුතු ය:" යන වචන දක්වා ඇති සියලු වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:-

"සේවාවන් සැපයීම; හෝ

(iii) මෝස්තර සංවර්ධනය, නිෂ්පාදන සංවර්ධනය හෝ නිෂ්පාදන නවෝත්පාදනය හා සම්බන්ධ සේවාවන් සැපයීමෙහිම නිරතව සිටින යම් සමාගමක් විසින් ඒ සේවාවන් සැපයීම,

සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන්වල දී දරන ලද වියදම් නොවන, ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් සඳහා දරන ලද වියදම්:'

එසේ වුව ද, 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා -

(අ) ඒ තැනැත්තා විසින් -

(i) යම් භාණ්ඩයක හෝ ද්‍රව්‍යයක අපනයන වෙළෙඳාම නංවාලීම හෝ විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් කිරීම සඳහා යම් සේවාවන් සැපයීමේදී ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් යාමේ දී දරන ලද වියදම්;

(ii) (ඇ) ඡේදයේ සඳහන් පරිදි අනුමත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් යාමේ දී දරන ලද වියදම්; හෝ

(iii) 2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසු ඇරඹෙන යම් තක්සේරු වර්ෂයක් සඳහා මෝස්තර සංවර්ධනය, නිෂ්පාදන සංවර්ධනය හෝ නිෂ්පාදන නවෝත්පාදනය හා සම්බන්ධ සේවාවන් සැපයීමෙහි ම නිරතව සිටින යම් සමාගමක් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ගමන් බිමන් යාමේ දී දරන ලද වියදම්;' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*13ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 13, as amended, ordered to stand part of the Bill.*

***14 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*14ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 14 ordered to stand part of the Bill.*

## 15 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.)

### வாசகம் 15.- ( முதன்மைச் சட்டவாக்கத்தின் 34ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 15.- (*Amendment of section 34 of the principal enactment*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

"16 වන පිටුවේ, (1) 3 වන පේළියේ සිට 10 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(x) (2) වන උපවගන්තියේ -

(අ) ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් කරන ලද (ඝ) ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම් වෙනුවෙන් එම සුදුසුකම් ලැබීමේ ගෙවීමෙන් සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය.

එසේ වුව ද, එක් තක්සේරු වර්ෂයකට වඩා වැඩි තක්සේරු වර්ෂ ගණනක් තුළ කරනු ලබන ආයෝජන ප්‍රමාණය සුදුසුකම් ලැබීමේ ගෙවීම්

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

වශයෙන් අඩු කිරීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ආයෝජනයට ලඟාවීම සඳහා එකතු කරනු ලබන අවස්ථාවක දී, (2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන) යම් පෙර තක්සේරු වර්ෂයක දී කරන ලද එකී ආයෝජනය, රුපියල් මිලියන පනහක මුළු මුදල වෙත ලඟා වූයේ යම් තක්සේරු වර්ෂයකදී ද, එම තක්සේරු වර්ෂය තුළ කරනු ලබන ආයෝජනයක් ලෙස සලකනු ලැබිය යුතුය.

(ආ) ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් කරන ලද (ත) ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම් වෙනුවෙන් එම සුදුසුකම් ලැබීමේ ගෙවීමෙන් සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය.

එසේ වුව ද, එක් තක්සේරු වර්ෂයකට වඩා වැඩි තක්සේරු වර්ෂ ගණනක් තුළ කරනු ලබන ආයෝජන ප්‍රමාණය සුදුසුකම් ලැබීමේ ගෙවීම් වශයෙන් අඩු කිරීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ආයෝජනයට ලඟාවීම සඳහා එකතු කරනු ලබන අවස්ථාවක දී, (2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන) යම් පෙර තක්සේරු වර්ෂයක දී කරන ලද එකී ආයෝජනය, 59ඇ වගන්තියේ සඳහන් අදාළ අවම ආයෝජනය වෙත ලඟා වූයේ යම් තක්සේරු වර්ෂයකදී ද, එම තක්සේරු වර්ෂය තුළ කරනු ලබන ආයෝජනයක් ලෙස සලකනු ලැබිය යුතු ය." ; ' "

(2) "25 වන පේළියේ සිට 33 වන පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

(ix) ඒ සමාගම විසින් කරන ලද (2) වන උපවගන්තියේ -

(අ) ඒ තක්සේරු වර්ෂයේ දී සමාගම විසින් කරන ලද (ණ) ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම් වෙනුවෙන් එම සුදුසුකම් ලැබීමේ ගෙවීමෙන් සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය:

එසේ වුව ද, එක් තක්සේරු වර්ෂයකට වඩා වැඩි තක්සේරු වර්ෂ ගණනක් තුළ කරනු ලබන ආයෝජන ප්‍රමාණය සුදුසුකම් ලැබීමේ ගෙවීම් වශයෙන් අඩු කිරීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ආයෝජනයට ලඟාවීම සඳහා එකතු කරනු ලබන අවස්ථාවක දී, (2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන) යම් පෙර තක්සේරු වර්ෂයක දී කරන ලද එකී ආයෝජනය, රුපියල් මිලියන පනහක මුළු මුදල වෙත ලඟා වූයේ යම් තක්සේරු වර්ෂයක දී ද, එම තක්සේරු වර්ෂය තුළ කරනු ලබන අයෝජනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) ඒ තක්සේරු වර්ෂයේ දී සමාගම විසින් කරන ලද (ත) ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් ලැබීමේ ගෙවීම් වෙනුවෙන් එම සුදුසුකම් ලැබීමේ ගෙවීමෙන් සියයට විසිපහක් නොඉක්මවිය යුතු ය:

එසේ වුව ද, එක් තක්සේරු වර්ෂයකට වඩා වැඩි තක්සේරු වර්ෂ ගණනක් තුළ කරනු ලබන ආයෝජන ප්‍රමාණය සුදුසුකම් ලැබීමේ ගෙවීම් වශයෙන් අඩු කිරීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ආයෝජනයට ලඟාවීම සඳහා එකතු කරනු ලබන අවස්ථාවක දී, (2012 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් වන) යම් පෙර තක්සේරු වර්ෂයක දී කරන ලද එකී ආයෝජනය, 59ඇ වගන්තියේ සඳහන් අදාළ අවම ආයෝජනය වෙත ලඟා වූයේ යම් තක්සේරු වර්ෂයක දී ද, එම තක්සේරු වර්ෂය තුළ කරනු ලබන ආයෝජනයක් ලෙස සළකනු ලැබිය යුතුය.";

(3) 33 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් කොටස ඇතුළත් කරන්න:

"(3) එම වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(7අ) 4 වන උපවගන්තියේ (අ) ඡේදයේ (x) වන අනුඡේදයේ හෝ (ආ) ඡේදයේ (ix) වන අනුඡේදයේ සඳහන් යම් සුදුසුකම් ලබන ගෙවීමෙන් සියයට හැත්තෑපහක් එම තක්සේරු වර්ෂයට ඉක්බිතිවම අනුප්‍රාප්ත වන තක්සේරු වර්ෂ තුනක කාලසීමාවක් තුළ සමාන ප්‍රමාණ වලින් විභාජනය කරනු ලැබිය හැකි අතර එසේ විභාජනය කරනු ලැබූ මුදල ඒ එක් එක් තක්සේරු වර්ෂය තුළ එම තැනැත්තාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කරනු ලැබිය යුතු බවට සලකනු ලැබිය යුතු ය.".

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***15 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*15ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 15, as amended, ordered to stand part of the Bill.*

***16 සිට 18 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*16ஆம் வாசகத்திலிருந்து 18ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 16 to 18 ordered to stand part of the Bill.*

## 19 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 59ආ වගන්තිය සංශෝධනය කිරීම.)

## வாசகம் 19.- (முதன்மைச் சட்டவாக்கத்தின் 59ஆ என்னும் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 19.- (*Amendment of section 59B of the principal enactment.*)

### ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

(மாண்புமிகு தினேஷ் குணவர்தன)

(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"18 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

"(2) වන උපවගන්තියේ සඳහන් කර ඇති ව්‍යවසායකින් (පාලක සමාගමක්, පාලිත සමාගමක් හෝ සමාගම් සමූහයක ආශ්‍රිත " ;

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***19 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*19 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 19, as amended, ordered to stand part of the Bill.*

***20 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*20 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 20 ordered to stand part of the Bill.*

## 21 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය සංශෝධනය කිරීම.)
## வாசகம் 21.- (முதன்மைச் சட்டவாக்கத்தின் 107ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 21.- (*Amendment of section 107 of the principal enactment.*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"20 වන පිටුවේ, 4 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස අදේශ කරන්න:

> "වෙත දෙනු නොලැබූව ද, ඒ නිල ලැයිස්තුගත පොදු සමාගම, සමාගම් සමූහයේ වෙනත් සාමාජික සමාගම හෝ වෙනත් සමාගම විසින්" යන වචන ආදේශ කිරීමෙන්; "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***21 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*21ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 21, as amended, ordered to stand part of the Bill.*

***22 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*22 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 22 ordered to stand part of the Bill.*

## 23 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය සංශෝධනය කිරීම.)
## வாசகம் 23.- (முதன்மைச் சட்டவாக்கத்தின் 113ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 23.- (*Amendment of section 113 of the principal enactment.*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"20 වන පිටුවේ, 26 වන පේළිය සහ 27 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස අදේශ කරන්න:

> 'වාරික වලින් ආදායම් බදු කාර්ය සඳහා මේ වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන දිනවලදී හෝ ඒ දිනවලට පෙර කොමසාරිස් ජනරාල්වරයාගේ' " ;

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***23 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*23 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 23, as amended, ordered to stand part of the Bill.*

***24 සිට 29 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*24ஆம் வாசகத்திலிருந்து 29ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 24 to 29 ordered to stand part of the Bill.*

## 30 වන වගන්තිය.- ( ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.)
## வாசகம் 30.- (முதன்மைச் சட்டவாக்கத்தின் 5ஆம் அட்டவணையைத் திருத்துதல்)
CLAUSE 30.- (*Amendment of the Fifth Schedule to the principal enactment.*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"26 වන පිටුවේ, පස්වන උපලේඛනයේ 37 වන අයිතමය අතහැර ඒ වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන්:

| | |
|---|---|
| '25 වන වගන්තියේ පළමුවන උපවගන්තියේ (ඒ) ඡේදයේ සඳහන් අර්ථනිරූපනය ප්‍රකාරව, පර්යේෂණ කටයුතුවලින් යම් තැනැත්තෙකුට ලැබෙන ලාභ සහ ආදායම් සඳහා අදාළ ආදායම් බදු අනුප්‍රමාණය.' | 'පුද්ගලයෙකු සම්බන්ධයෙන් පළමුවන උපලේඛනය ප්‍රකාරව, සියයට 16 උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 20.' |

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***30 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*30ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 30, as amended, ordered to stand part of the Bill.*

***31 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*31ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 31 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත
## நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்
## NATION BUILDING TAX (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරියයුතු ය." -[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு தினேஷ் குணவர்தன]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Dinesh Gunawardena.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR.DEPUTY CHAIRMAN OF COMMITTEES in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

**2 වන වගන්තිය.-** (2009 අංක 9 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.)
**வாசகம் 2.-** (2009ஆம் ஆண்டின் 9ஆம் இலக்கச் சட்டத்தின் 3ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 2.- (*Amendment to the section 3 of Act No.9 of 2009.*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධනය මා ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 19 සිට 21 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> '(2) (3) උපඡේදයේ "ලැබීම මත කරනු ලැබුවේ නම්" යන වචන වෙනුවට "ලැබීම මත කරනු ලැබුවේ නම්;" යන වචන ආදේශ කිරීමෙන්; සහ' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 සිට 6 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகத்திலிருந்து 6ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 3 to 6 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது. சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill. Bill reported with Amendments.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත
## துறைமுக, விமானநிலைய அபிவிருத்தி அறவீடு (திருத்தம்) சட்டமூலம்
## PORTS AND AIRPORTS DEVELOPMENT LEVY (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [ மாண்புமிகு தினேஷ் குணவர்தன]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [ The Hon. Dinesh Gunawardena .]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

### 2 වන වගන්තිය.- (2011 අංක 18 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.)
### வாசகம் 2.- ( 2011ஆம் ஆண்டின் 18ஆம் இலக்கச் சட்டத்தின் 4ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 2.- (*Amendment to section 4 of Act, No. 18 of 2011.*)

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් සංශෝධනය මා ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 14 හා 15 වන පේළි ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(i) ජාතික ආර්ථිකයේ යහපත සැලකිල්ලට ගනිමින් මුදල් විෂයය' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill. Bill reported with Amendments.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත
## பொருளாதார சேவை விதிப்பனவு (திருத்தம்) சட்டமூலம்
## ECONOMIC SERVICE CHARGE (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு தினேஷ் குணவர்தன]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Dinesh Gunawardena .]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

### 2 වන වගන්තිය.- (2006 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.)
### வாசகம் 2.- ( 2006ஆம் ஆண்டின் 13ஆம் இலக்கச் சட்டத்தின் 2ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 2.- *(Amendment of section 2 of Act, No.13 of 2006)*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 18 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අදාළ කාර්තුව සඳහා රුපියල් මිලියන විසිපහක්';

(2) 21 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වන අදාළ කාර්තුව සඳහා රුපියල් මිලියන පනහක්';

(3) 2 වන පිටුවේ, 20 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ආ) (ආ) ඡේදයේ:-' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

***3 සිට 6 තෙක් වගන්ති, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகத்திலிருந்து 6ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 3 to 6 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පනත් කෙටුම්පතේ සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## මුදල් පනත් කෙටුම්පත
## நிதிச் சட்டமூலம்
## FINANCE BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]***

*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு தினேஷ் குணவர்தன]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Dinesh Gunawardena.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES in the Chair.]*

***1 සිට 18 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 18ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 18 ordered to stand part of the Bill.*

## 19 වන වගන්තිය.- (ව්‍යවසායයන් ආයෝජන මණ්ඩලය වෙත වාර්තා කළ යුතු බව.)
## வாசகம் 19.- ( முதலீட்டுச் சபைக்கு அறிக்கையிட தொழில்முயற்சிகள் தேவைப்படுத்தப்படல்.)
CLAUSE 19.- *(Enterprises are required to report to Board of Investment)*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"15 වන පිටුවේ 1 සිට 7 දක්වා පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

| | |
|---|---|
| ව්‍යවසායයන් නියත කාලීනව වාර්තා කළ යුතු බව. | 19. 16 වන, 17 වන සහ 18 වන වගන්ති ප්‍රකාරව නිදහස් කිරීම් ප්‍රදානය කරනු ලැබ ඇති ව්‍යවසායන් විසින්,- |

(අ) විදේශ විනිමය අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණය සහ වෙනත් ගනුදෙනු සම්බන්ධයෙන් නිසි පරිදි ලිපි ලේඛන පවත්වාගෙන යාමට වගබලා ගැනීම;

(ආ) වාර්ෂිකව හෝ අවස්ථාවෝචිත පරිදි රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ විනිමය පාලකවරයා විසින් හෝ ආනයන සහ අපනයන පාලකවරයා විසින් විධානය කරනු ලබන අවස්ථාවක දී, විදේශ විනිමය අභ්‍යන්තර සහ බාහිර ප්‍රේෂණය සම්බන්ධයෙන් තොරතුරු වාර්තා කිරීම;

(ඇ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා විමසා විනිමය පාලකවරයා විසින් සහ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් සියලු තොරතුරු එවැනි වාර්තාවකට ඇතුළත් කිරීම,

සිදු කරනු ලැබිය යුතු ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***19 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*19ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 19, as amended, ordered to stand part of the Bill.*

***20 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*20ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 20 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පනත් කෙටුම්පතේ සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන්දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## වෛකල්පික වෛද්‍ය ක්‍රමය සඳහා නීතිමය පිළිගැනීම
## மாற்று வைத்திய முறைக்குச் சட்ட அந்தஸ்து
## LEGAL RECOGNITION TO ALTERNATIVE SYSTEMS OF TREATMENT

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"ශ්‍රී ලංකාවේ වෛකල්පික වෛද්‍ය ක්‍රමය උපයෝගීකොට රෝගීන්ට සේවය සලසන වෛද්‍යවරුන් හාරදහසක් පමණ සිටිති. මෙම වෛද්‍ය ක්‍රමය මඟින් ඉතා කෙටි කලකින් රෝගීන්හට නිට්ටාවට සුවය ලැබෙන අවස්ථා ඇත.

ලෝකයේ විවිධ රටවල වෛකල්පික වෛද්‍ය සේවාව පිළිගෙන ඇති බැවින් චීනකටු චිකිත්සාව, මෝක්ෂා ප්‍රතිකාර සහ පීඩන ප්‍රතිකාර වැනි වෛද්‍ය ක්‍රමවලට ලබා දී ඇති නීතිමය තත්ත්වය වෛකල්පික වෛද්‍ය ක්‍රමයට ද ලබා දීමට කටයුතු කරන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ පමණක් නොවෙයි, ලෝකයේ විවිධ රටවල මේ වන කොට වෛකල්පික වෛද්‍ය සේවාව ආරම්භ කරලා තියෙනවා. විශේෂයෙන්ම මැලේසියාව ඒ වාගේම දකුණු අප්‍රිකානු රටවල මේ වෛකල්පික වෛද්‍ය සේවාව බොහොම ප්‍රචලිත වෛද්‍ය සේවාවක් බවට පත් වෙලා තිබෙනවා. ශ්‍රී ලංකාවේද වෛකල්පික වෛද්‍යවරු හාරදහසක් පමණ දැනට සිටින බව අනාවරණය වෙනවා. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය, චීන කටු වෛද්‍ය ක්‍රමය, මෝක්ෂා වෛද්‍ය ක්‍රමය මේ ආදී විවිධ වෛද්‍ය ක්‍රම ශ්‍රී ලංකාවේ මේ වන කොට නීත්‍යනුකූල-

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියා ගෙන ආවේ මේ විවිධ වෛද්‍ය ක්‍රම ලංකාවේ මේ වන කොට නීත්‍යනුකූල වෛද්‍ය ක්‍රම විධියට පිළිඅරගෙන, භාර අරගෙන අද වන කොට ලංකාවේ දසදහස් ගණන් රෝගීන්ට සේවාව ලබා දීලා තිබෙනවා කියන එකයි. ඒ වාගේම මේ වෛකල්පික වෛද්‍ය සේවාවද ලෝකයේ පිළි ගත්ත එකක්; ඒ වාගේම විවිධාකාර වූ සම්මාන පිරිනමන ලද වෛද්‍ය සේවාවක්. ඒ නිසා එම වෛද්‍ය සේවාවටත් ලංකාවේ නීත්‍යනුකූල පදනමක් ලබා දීලා, මේ පිළිබඳ හරි අධ්‍යයනයක් කරලා, ඒ වෛද්‍ය සේවාවද නිසි පිළි ගැනීමකට ලක් කරලා මේ තුළින් රටේ ජනතාවට සේවය සලසන්න වැඩ කටයුතු සලස්වා දෙන්නය කියන එකයි මා මේ ගරු සභාවෙන් ඉල්ලන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෛකල්පික වෛද්‍ය සේවාව පිළිබඳව කතා කරන කොට වෛද්‍ය එලියන්ත වයිට් පිළිබඳව අපට නිතැතින්ම කතා කරන්නට සිද්ධ වෙනවා. මේ එලියන්ත වයිට් මැතිතුමා වෛකල්පික වෛද්‍යවරයෙක් වශයෙන් සුවිශේෂී සේවාවක් මේ රටේත් ඒ වාගේම විදේශ රටවල උදව්යටත් කරලා තිබෙනවා. එලියන්ත වයිට් මැතිතුමා පිළිබඳව අවස්ථා ගණනාවකදී මේ ගරු සභාවේදී කථා කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අනුව 2012 පෙබරවාරි මාසයේ 8වැනි දා හැන්සාඩ් වාර්තාව මා සතුව තිබෙනවා. ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා යම් ප්‍රශ්න කිරීම් කරලා තිබෙනවා. ඒ අවස්ථාවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, එවැනි වෛද්‍යවරයෙක් නොමැති බවට මෙම ගරු සභාවේ පිළිතුරක් දීලා තිබෙනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2011 ජූනි මාසයේ 22වැනි දා හැන්සාඩ් වාර්තාව මා සතුව තිබෙනවා. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා යොමු කරන ලද ප්‍රශ්නයකදීත් එවැනි වෛද්‍යවරයකු නොමැති බවක් තමයි ආණ්ඩු පක්ෂය විසින් මේ ගරු සභාවට එදින හෙළිදරව් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කුමන ප්‍රකාශ කළත් මේ එලියන්ත වයිට් කියන වෛද්‍යවරයා සමඟ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඒ වාගේම විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඒ වාගේම නීතිපතිතුමා ආදී මේ රටේ විවිධ ක්ෂේත්‍රවල උදවිය බොහෝ දෙනකු ලිපි හුවමාරු කරලා තියෙනවා; ගනු දෙනු කරලා තිබෙනවා; එතුමාගෙන් ප්‍රතිකාර ලබා ගෙන තිබෙනවා. ඒ අනුව අමාත්‍ය ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමාගේ කොන්දේ ආබාධයක් සඳහා එලියන්ත වයිට් මැතිතුමාගෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා 2008.05.29 දිනෙන් යවා තිබෙන ලිපියක් මා සතුව තිබෙනවා. ඉන් අනතුරුව 2008.06.28වැනි දා එතුමා විසින්ම එලියන්ත වයිට් මැතිතුමාට ද ලිපියක් ලියා තිබෙනවා. ඒ ලිපියෙන්, " මගේ අවුරුදු 24ක කාල පරිච්ඡේදය තුළ තිබුණු කොන්දේ අසනීපය ඉතා කෙටි කාලයක් තුළ ඔබතුමා දිව්‍ය ඖෂධ ලබා දී සුවපත් කළා. ඒ වාගේම මාලනී ෆොන්සේකා මැතිනියගේ සහෝදරයා සුවපත් කළා. ඒ වාගේම ලතා වල්පොල මහත්මියගේ රෝගී තත්ත්වය සුවපත් කළා. ඇත්තටම ඔබ ජීවකයෙකු නොව විශ්ව කර්මයෙකි" කියලා අපේ ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න අමාත්‍යතුමා එතුමාගේ සේවාව පැසසුමට ලක් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ලිපි දෙකම හැන්සාඩ් වාර්තාගත කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් 2010.09.01වැනි දින මෙම වෛද්‍යවරයාගෙන් මහරගම ප්‍රදේශයේ රණසිංහ මාවතේ පදිංචි කල්දේරා කියන මහත්මයාට ප්‍රතිකාර ලබා ගැනීමට සහයෝගය පතා තිබෙනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අපේ බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමාත් 2010.09.27වැනි දින ඒ වාගේම ඉල්ලීමක් කරලා රෝගී තැනැත්තකු සුවපත් කරවා ගැනීමට කටයුතු කර තිබෙනවා. මේ ලිපි සියල්ලම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මා **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ එලියන්ත වයිට් මැතිතුමා වෛද්‍ය උපදේශකයකු නොවන බව මීට පෙර සඳහන් කළ දින දෙකේදීම පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කර තිබෙනවා. ඒ කොහොම ප්‍රකාශ කළත් මේ එලියන්ත වයිට් මහත්මයාට අරලියගහ මන්දිරයට යාම ඒම සඳහා බලපත්‍රයක් - entry pass එකක් - නිකුත් කර තිබෙනවා. ඒ බලපත්‍රයේ සඳහන් වන්නේ ඔහු ස්නායු රෝග පිළිබඳ වෛද්‍යවරයෙක් - neurologist කෙනෙක්-කියලායි. ඒ pass එක නිකුත් කර තිබෙන්නේ Deputy Inspector-General of Police, Presidential Security Division - ජනාධිපතිතුමාගේ ආරක්ෂක අංශය- විසින්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය අවස්ථාවේදී ලෝක කුසලාන ක්‍රිකට් කණ්ඩායමේ team doctor විධියට එතුමා සිටියා. ඒ අවස්ථාවේදී එතුමාගේ duty එක වශයෙන් සඳහන් කර තිබුණේ team doctor කියලායි. ඒ විධියට ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය අවස්ථාවේ දී එතුමාට පත්වීමක් දී තිබුණා. මේ ආදී වශයෙන් ඔහුට පිළිගැනීමක් කර තිබෙනවා. ඔහුගේ සේවාව අගය කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒක නරකයි කියනවා නොවෙයි. මේ රටේ වෛකල්පික වෛද්‍ය සේවාව කර ගෙන යන ප්‍රධාන පුද්ගලයෙක් වශයෙන්, වෛද්‍යවරයෙක් වශයෙන් එලියන්ත වයිට් මහතා යහපත් සේවයක් කළාය කියන එක මේ කාරණාත් එක්ක සනාථ වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාල වේලාව බොහොම ටිකයි තිබෙන්නේ. මෙම කල් තැබීමේ විවාදයට වැඩිම කථික මන්ත්‍රීවරුන් ප්‍රමාණයක් සහභාගි වනවා. මෙය වැඩිම මන්ත්‍රීවරු ප්‍රමාණයක් සහභාගි වන කල් තැබීමේ විවාදයක් ලෙස වාර්තාගත වනවා. කථිකයන් 12 දෙනෙක් විතර මෙම විවාදයට සහභාගි වන්නට නියමිතව තිබෙනවා. ඒ නිසා මට දීර්ඝ වශයෙන් කථා කරන්න කාලය නැහැ. නමුත් මම කෙටියෙන් කියන්නම්. හිටපු නීතිපති මොහාන් පීරිස් මැතිතුමාට කාලාන්තරයක් තිස්සේ තිබුණ රෝගයක් සුවපත් කළාය කියලා එතුමාට ස්තුති කරලා නීතිපති නිල මැදිරියේ ඉඳලා ලියපු ලිපියක් තිබෙනවා. අනාගතයේ සියලු දෙනාටම දැන ගන්න මම ඒ ලිපියත් හැන්සාඩ් ගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනි, එස්.එස්.කේ. අවිරුප්පොළ මැතිනිය විසින් එම විද්‍යාලයේ සිසු දැරිවියක් හදිසියේ රෝගාතුර වෙලා, දින තුනක් වැනි ඉතාමත්ම කෙටි කලකින් ආශ්චර්යවත් විධියට ඒ දියණිය රෝගී තත්ත්වයෙන් මුදා ගෙන යහපත් තත්ත්වයට ගෙන ඒම සම්බන්ධයෙන් ස්තුති කරලා 2010.11.22 දින යැවූ ලිපියත් මා **සභාගත*** කරනවා.

"සන්ඩේ ලීඩර්" පත්‍රයේ හිටපු කර්තෘ ලසන්ත වික්‍රමතුංග මැතිතුමාගේ සහෝදරයා වන ලාල් වික්‍රමතුංග මැතිතුමා, ඔහුගේ රෝගී තත්ත්වය ඉතා ඉක්මනින් සුවපත් කළාය කියලා ස්තුති කරමින් ලියා තිබෙන ඔහුගේ ලිපි ශීර්ෂය සහිත ලිපිය හැන්සාඩ් ගතකිරීම සඳහා මම **සභාගත*** කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ලිපියේ දිනය සඳහන් වෙලා නැහැ.

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කොහොම නමුත් අපිත් එක්ක හිටපු, ඝාතනයට ලක් වුණු "සන්ඩේ ලීඩර්" කර්තෘ ලසන්ත වික්‍රමතුංග මැතිතුමා තමන්ට තිබුණ භයානක රෝගී තත්ත්වයෙන් මුදා ගැනීම පිළිබඳව ස්තුති කරපු ලිපියත් මම **සභාගත*** කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රීඩකයන් හදිසි රෝගවලට ගොදුරු වුණාම ඔවුන් සුවපත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති ඩී.එස්. ද සිල්වා මැතිතුමා විසින් 2011 අප්‍රේල් මාසයේ 26වැනි දා මේ එලියන්ත වයිට් මැතිතුමාට ප්‍රශංසා කරලා ස්තුති කරලා යැවූ ලිපියත් ඉදිරියේදී දැන ගැනීම සඳහා මා **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කුමාර සංගක්කාර මැතිතුමා 2011පෙබරවාරි මාසයේ 15වැනි දා එලියන්ත වයිට් මැතිතුමාට ස්තුති කරපු ලියුමත්, තිලකරත්න ඩිල්ෂාන් මැතිතුමා ඔහුගේ රෝගී තත්ත්වයෙන් මුදා ගැනීම පිළිබඳව ජනාධිපතිතුමාටත්, එලියන්ත වයිට් මැතිතුමාටත් ස්තුති කරලා ප්‍රශංසා කරලා 2010 ඔක්තෝබර් මාසයේ 06වැනි දා ඉදිරිපත් කරපු ලිපි දෙකකුත් මේ අවස්ථාවේ **සභාගත*** කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වෛකල්පික වෛද්‍ය එලියන්ත වයිට් මැතිතුමා ප්‍රසිද්ධ වන්න, ප්‍රසිද්ධ වන්න ඔහුට විරුද්ධව මඩ ප්‍රහාර එල්ල වුණා. ඒ වාගේම ඔහු හානිදායක බෙහෙත් දෙනවා, තහනම් උත්තේජක දෙනවා කියලා විවිධාකාර කතන්දර ආවා. ක්‍රිකට් ක්‍රීඩකයකුට තහනම් උත්තේජක දුන්නා කියලා චෝදනාවක් එල්ල කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික තහනම් උත්තේජක ආයතනය විසින් නිකුත් කරන ලද වාර්තාව මම ඉදිරිපත් කරනවා. මේ එලියන්ත වයිට් මැතිතුමා විසින් ක්‍රිකට් ක්‍රීඩකයන් දහ දෙනකුට -සචින් තෙන්ඩුල්කාර්, ගෞතම ගාම්භීර්, යුවරාජ් සිං, මහේල ජයවර්ධන, මුත්තයියා මුරලිදරන්, චාමර සිල්වා, නුවන් කුලසේකර, අජන්ත මෙන්ඩිස්, ඇන්ජලෝ මැතිව්ස්, උපුල් තරංග- ප්‍රතිකාර කර තිබෙනවා. ආන්දෝලනාත්මක ප්‍රකාශයක් කරපු ක්‍රීඩකයෙක් මේ ලැයිස්තුවේ ඉන්නවා. මම නම කියන්නේ නැහැ. ඒ තුළින් මේ වෛද්‍යවරයාට දැවැන්ත හානියක් සිද්ධ වුණා. ඒ වෛද්‍යවරයාගේ ජීවිතයටත් අනතුරුදායක තත්ත්වයක් ඇති වුණා. ඒ ක්‍රීඩකයින්ට ප්‍රතිකාර කිරීම සඳහා භාවිතා කළ ඖෂධ තහනම් උත්තේජක ආයතනයටත්, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවටත් යවලා තිබුණා. මේ දස දෙනාටම ලබා දුන් ඖෂධ වර්ග රජයේ රස පරීක්ෂකවරයා විසින් පරීක්ෂණයට ලක් කරලා ඒවායේ කිසිදු තහනම් දෙයක් හෝ ශරීරයට අහිතකර දෙයක් හෝ නැහැයි කියලා වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ වෛද්‍යවරයාගේ සේවය ඇගැයීමක් වශයෙන් 2011.06.22 දිනැති මේ පරීක්ෂණ වාර්තාවත් - test report එක - මම **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 මාර්තු මස 19වැනි දා පළ වූ "දිනමිණ" පුවත් පතේ මෙසේ සඳහන් වනවා:

"ශ්‍රී ලංකාව මට කිසිදා අමතක වන්නේ නැහැ.

- ලොව ප්‍රථම ශතක සියයලාභී සචින් කියයි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සචින් තෙන්ඩුල්කාර් මහත්මයාගේ භාර්යාවත් වෛද්‍යවරියක්.

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

එම ප්‍රවෘත්තියේ තව දුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "සචින්ගේ බිරිඳ වෛද්‍ය අන්ජලිකා තෙන්ඩුල්කාර් ද සමඟ ශ්‍රී ලංකාවට පැමිණ වෛද්‍ය ඒලියන්ත වයිට් මහතාගේ ප්‍රතිකාර ලබා ආබාධය සඳහටම සුවකර ගත්තේය.
>
> 'වෛද්‍ය ඒලියන්ත මට උදවු කළා. එම ප්‍රතිකාරය ප්‍රාතිහාරයක් වාගෙයි. මම ශ්‍රී ලංකා ජනාධිපතිතුමාටයි, වෛද්‍ය ඒලියන්තටයි අවංකවම ස්තුති කරනවා'යි සචින් පැවසීය.

ඒ විධියට ඔහු ප්‍රකාශ කර තිබෙනවා. ඉදිරියේදී යම් කෙනෙකුගේ අවධානය යොමු වීම සඳහා "දිනමිණ" පුවත් පතේ ඒ කොටසත් මම හැන්සාඞ් වාර්තාවට ඇතුළු කිරීම සඳහා **සභාගත*** කරනවා. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මම අවසන් කරන්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ වෛකල්පික වෛද්‍ය සේවාවට ලංකාවේ දැනට ප්‍රසිද්ධ පුද්ගලයකු වශයෙන් ඉන්නේ වෛද්‍ය ඒලියන්ත වයිට් මහතායි. ඒලියන්ත වයිට් මහතාට මේ අනතුරුදායක තත්ත්වය මතු වුණේ, එහෙම නැත්නම් ඔහුව ද්වේෂ දර්ශනයට ලක් වුණේ, ඔහු මානසික වශයෙන් පීඩනයට ලක් වුණේ මෙන්න මේ නිසායි. ඇත්ත වශයෙන්ම එදා පාර්ලිමේන්තුවේදී එතුමා පිළිබඳව ප්‍රශ්න ඇහුවාම ඒ ප්‍රශ්නවලට නිවැරැදි පිළිතුරු සභාවන්නේ නැතිව ලබා දුන්නා නම් එතුමා මෙවැනි අපහසුතාවකට පත් වන්නේ නැහැ. එදා නිවැරැදි දේ නොකිරීමේ වැරැද්ද නිසා ඔහුට යම් හානියක් සිදු වුණා කියන එකයි අපේ මතය.

මගේ අවසාන ඉල්ලීම මේකයි. මේ වෛකල්පික වෛද්‍ය සේවාව තුළින් යම් සේවාවක් රටට වෙලා තිබෙනවා; රටේ ජනතාවට වෙලා තිබෙනවා. ලංකාවට ලෝකයේ ප්‍රසිද්ධියක් ලැබිලා තිබෙනවා. එහෙනම් ඒ වෛකල්පික වෛද්‍ය විද්‍යාව පිළිබඳ නිවැරදි විමර්ශනයක් කරලා, ලංකාවේ ස්ථාපිත කරලා, නීත්‍යනුකූල තත්ත්වය ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරලා, ඒ වෛකල්පික වෛද්‍ය විද්‍යාව ලංකාවේ ඉදිරියටත් කර ගෙන යෑමට සුදුසු පරිසරය සකස් කර දෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු ඒ.ඩී. චම්පික ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு ஏ.டி. சம்பிக பிரேமதாச )
(The Hon. A.D. Champika Premadasa )
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මිත්‍ර පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා අද මේ ගරු සභාවට ඉදිරිපත් කළ වෛකල්පික වෛද්‍ය ක්‍රමය පිළිබඳ යෝජනාව ස්ථිර කරමින් මා කථා කරනවා.

වර්තමාන ලෝකයේ බොහෝ රටවල් වෛකල්පික වෛද්‍ය විද්‍යාව පිළිගෙන කටයුතු කරන්නේ මේ ක්‍රමයෙන් නිදන්ගත රෝග තිබූ විශාල පිරිසක් සුවය ලබා සතුටින් ජීවත් වෙන නිසායි. එනිසා ලංකාවේ මෙම වෛද්‍ය ක්‍රමය පිළිගැනීම සුදුසු බව මා ප්‍රකාශ කරනවා.

මේ පිළිබඳව කථා කිරීමට කරුණු සහ උදාහරණ ගණනාවක් තිබුණත්, එක් නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමාගේ වෛද්‍ය උපදේශකයකු වන වෛකල්පිත වෛද්‍ය ඒලියන්ත වයිට් මහතා සඳහන් කරන්න බලාපොරොත්තු වෙනවා. මෙතුමා ශ්‍රී ලංකා මාතාවට මහත් සම්පතකි. එසේම එතුමා ශ්‍රී ලංකා වාසීන් වන අපට ආඩම්බරයකි. මෙතුමාගේ සේවය නිසා සුවපත් වූ රෝගීන් අසීමිතය. එසේම මේ ගරු සභාවේ සිටින මැති ඇමතිවරුන් එතුමාගෙන් ප්‍රතිකාර ලබා ගන්නා බව මා පෞද්ගලිකවම දන්නා කරුණකි. ඒ ගැන සිතා අපි සතුටු විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණු එසේ වුණත්, පසු ගිය දිනවල මෙතුමා පිළිබඳව මේ ගරු සභාවේදී විවිධ කථා බහ ඇති විය. ඒ පිළිබඳව මාධ්‍ය මඟින් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී. සත්‍ය කරුණු සොයා බැලීමකින් තොරව කළා වූ යම් යම් ප්‍රකාශ නිසා එතුමා අසහනකාරී වූවා පමණක් නොව, පවුලේ අයගේද මානසික තත්ත්වය පීඩාකාරී වී ඇත. එය එසේ වූයේ මා මුලින් සඳහන් කළ, මෙතුමාගෙන් ප්‍රතිකාර ලබා ගත්, මේ ගරු සභාව නියෝජනය කරන පාර්ලිමේන්තු මැති ඇමතිතුමන්ලා කිසිවෙකුත් මෙතුමා වෙනුවෙන් කථා නොකළ නිසායි. එය ගුණමකු ක්‍රියාවකි. විපක්ෂයේ මන්ත්‍රීවරයකු වුවත් කළ ගුණ දන්නා කෙනකු ලෙස එතුමා වෙනුවෙන් මා පෙනී සිටිනවා. මා එසේ කරන්නේ මේ නිසායි. මගේ එකම පුතුගේ බිරිඳට වැළඳී තිබුණු රෝගයට මාස 9ක් තිස්සේ ශ්‍රී ලංකාව පුරා සිටින වෛද්‍යවරුන් ගණනාවකගෙන් ප්‍රතිකාර ලබා ගත්තත් සුව වූයේ නැත. නමුත් වෛකල්පික වෛද්‍ය ඒලියන්ත වයිට් මහතා ඒ රෝගය බෙහෙත් කෝප්ප 9කින් සුවපත් කළා. ඒ ගැන මාත්, මගේ පවුලේ සියලු දෙනාත් එතුමාට ස්තුති කරනවා. මෙම කටයුත්තට අතිගරු ජනාධිපතිතුමාත් මට පෞද්ගලිකවම උදවු කළා. එයත් මේ ගරු සභාවට මතක් කළ යුතු කරුණක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාව ප්‍රමුඛ ආසියාතික රටවල් ගත්තොත්, වෛකල්පික වෛද්‍යවරුන් මෙන්ම ලෙඩ රෝග සුව කරන සෘෂිවරුන්ද ඒ රටවල රාජ්‍ය ගෞරවයට පාත්‍ර වෙනවා. ආසියාතික රටවල එය එසේ නම් අපේ රටට ද එය එසේ විය යුතුයයි මාගේ අදහසයි. පටු දේශපාලන පක්ෂ, පාට භේදවලින් තොරව ආණ්ඩු මාරු වුවත් සෑම දිනකම මෙවැනි පුද්ගලයන් ආරක්ෂා කර ඇගයීමට ලක් කර සමාජයේ නිසි ගෞරවය ලබා දීම මහජන නියෝජිතයන් වන අපගේ වගකීමකි.

එතුමා ගැන මා සඳහන් කළ කරුණුවලට අමතරව, එතුමාගේ ජීවිතයට තර්ජන හා ජීවිත ආරක්ෂාව පිළිබඳ ගැටලුව මතු වී තිබෙනවා. එම නිසා ඒ කරුණ අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කර එතුමාට ජීවිත ආරක්ෂාව ලබා දීම ඉතාම කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාවක් බව මාගේ අදහසයි. තවත් මෙවැනි වෛකල්පික වෛද්‍යවරුන් පිළිබඳව කථා කළ හැකි වුවත්, මේ ගරු සභාවේ වටිනා කාලය වැය කිරීමට මා අකැමැති බැවින් ගරු පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින් මා විසින් කළ අදහස් දැක්වීම මෙලෙස නිම කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෛකල්පික වෛද්‍ය ක්‍රම පිළිබඳව සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

මේ අවස්ථාවේදී මා පළමුවෙන්ම සඳහන් කරන්න කැමැතියි, ආණ්ඩු පක්ෂයේ ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා මේ පිළිබඳ යෝජනාවක් මීට කලින් ඉදිරිපත් කර තිබූ බව. නමුත් එදා පාර්ලිමේන්තුව ඉක්මනින් කල් තැබූ නිසා ඒ යෝජනාව සාකච්ඡාවට ගන්න බැරි වුණා. ඒ නිසා රජය මේ ගැන අවධානයක් යොමු කළේ නැහැ කියා විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා වැරදි මතයක් ප්‍රකාශ කිරීමට උත්සාහ දරන්නේ නම්, ඒ ගැන මා කනගාටු වනවා.

වෛකල්පික වෛද්‍ය ක්‍රම පිළිබඳ මහා පුනර්ජීවනයකට අපේ රට පරිවර්තනය කළේ බණ්ඩාරනායක මැතිතුමාගේ 1956 රජයයි. කිසි ලෙසකින් ඔබතුමන්ලාට අමතක කරන්න බැහැ, සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගය. බුලත් කොළයක් පමණක් අරගෙන වෙදකම් කළෙ ගමේ වෛද්‍යවරයා ලියාපදිංචිද නැද්ද කියලා හොයා බලන්නේ නැතුව, මේ රටේ උරුමය හැටියට, අපේ රටේ වෛද්‍ය ක්‍රමය හැටියට එදා ඒ වෛද්‍යවරයාට නිසි ගෞරවයක් දුන්නා. ඒ වාගේම මේ රටේ තවත් වෛද්‍ය ක්‍රම රාශියක් තිබෙනවා. ඒ ගැන විස්තර ගරු අමාත්‍යතුමා පැහැදිලි කරාවි.

වෛද්‍ය එලියන්ත වයිට් මහතාගේ වෛද්‍ය ක්‍රමවලින් උදව් ගත්ත, බෙහෙත් ගත්ත ගරු මන්ත්‍රීතුමන්ලා මේ ගරු සභාවේ ඇති. මම නම් එහෙම බෙහෙත් අරගෙන නැහැ.

ඔබතුමන්ලාගේ නායක-නායිකාවෝත් ඒ දවස්වල සායි බාබා බලන්න ගිහින් සායි බාබාගෙන් බෙහෙත් අරගෙන ආවා. එතුමා ලියාපදිංචි වෛද්‍යවරයෙක් නොවෙයි. නමුත් ඒ තුළින් යම් කිසි මානසික හෝ ශාරීරික සුවයක් ලැබුණා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහෝ අය ඒ වෛද්‍ය ක්‍රමයට ගියා. යම් කෙනකු මඟින් අපේ රටේ යමෙකුට හොඳක් වනවා නම්, ඒ හොඳ දේ ගැන අවිශ්වාසයක් නැත්නම් ඒ තැනැත්තාට ගෞරව කිරීමටත් ඒ තැනැත්තා කරන සේවාව අගය කිරීමටත් මේ රටේ රාජ්‍ය නායකයාගේ සිට සියලු දෙනා කටයුතු කරනවා.

මේ වෛද්‍යවරයා පිළිබඳව පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් ඇසූ දවසේද මා ඉතා පැහැදිලිව පිළිතුරු දුන්නා, "තෙන්ඩුල්කාර්ට ඕනෑ නම් වෛද්‍ය ඒලියන්ත වයිට් මහතාගෙන් බෙහෙත් කරන්න, ඒ ගැන ඇයි ඔබලා විරුද්ධ වන්නේ" කියලා. එයයි අපි දරපු මතය. අදත් අපි ඒ මතය ප්‍රකාශ කරනවා. නමුත් ලංකාවේ නීති පද්ධතිය තුළ අනුගමනය කළ යුතු යම් යම් පිළිවෙත් තිබෙන බවත් අප දැනගත යුතුයි. ඔබ- අප වගකියන ව්‍යවස්ථාදායක සභාව හැටියට අපි ඒ නීති හදලා තිබෙනවා. ඒ නිසා මතු වන ගැටලු නිරාකරණය කර ගනිමින් ගමන් කළ යුතුයි කියන දේ ඔබතුමන්ලා පිළිගනියි. වෛද්‍ය ඒලියන්ත වයිට් මහතා විවිධ ක්ෂේත්‍රවලට ඉටු කර තිබෙන සේවාව කොයි ආකාරද කියලා මේ අවස්ථාවේදී මා දීර්ඝ විස්තරයක් කරන්න අවශ්‍ය නැහැ. එතුමා කරන සේවාව, හොඳ, යහපත අගය කරන බව සඳහන් කරන අතර, එතුමාට ලබා දිය හැකි හැම පිළිගැනීමක්ම අප ලබා දුන්නා. එතුමාට හැම ආරක්ෂාවක්ම ලබා දීලා තිබෙනවා; හැම පහසුකමක්ම ලබා දීලා තිබෙනවා.

රටේ තිබෙන නීතිරීති පද්ධතිය තුළයි කාටත් කටයුතු කළ හැකි වන්නේ කියන එක මා අවසාන වශයෙන් සඳහන් කරන්න කැමැතියි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෛකල්පික වෛද්‍ය ක්‍රමය පිළිබඳව ඉදිරිපත් කර තිබෙන යෝජනාව ගැන මා යම් අදහස් දැක්වීමක් කරන්න කැමැතියි. හැබැයි, මා ඒ අදහස් දැක්වීම කරන්නේ වෛද්‍ය ඒලියන්ත වයිට් මහතාගෙන් බෙහෙත් ගත්ත කෙනකු හැටියට නම් නොවෙයි.

එතුමාගෙන් බෙහෙත් ගැනීම, මේ විෂයය ගැන සාකච්ඡා කරන්න බාධාවකුත් නොවෙයි කියලායි මා හිතන්නේ. මොකද අපි කවුරුත් දන්නවා, ශ්‍රී ලංකාව සිංහරාජ වනාන්තරයේ අනන්‍යතාව සහිත ආසියාවේ වෙද මැඳුර කියලා. අපේ රට ගත්තාම ලෝකයේ වෙනත් කිසිම රටක නැති විශේෂත්වයක් තියෙනවා. ඒක තමයි අපේ ගම්වල වෙද මහත්තයා කෙනෙකුගේ අතින් ඇල්ලුවත් ලෙඩ සනීප වෙනවා.

අපේ ගමක තියෙන මොනවා හෝ දෙයක් සතෙක් ආහාරයට ගත්තත් ලෙඩ සනීප වෙනවා. එහෙම විශේෂත්වයක් අපේ රටේ තියෙනවා. ඒ විශේෂත්වය නිසා තමයි වෛකල්පික වෛද්‍ය විද්‍යාව, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව පිළිබඳව ඉතිහාසයක් අපට තියෙන්නේ. ඒක නඟා සිටුවන්න අද පාර්ලිමේන්තුවේ අවධානය යොමු වීම ඇත්තටම වැදගත් දෙයක්. විශේෂයෙන් මම පෞද්ගලිකවත්, මේ වෛකල්පික වෛද්‍ය සංගමය - *Medicina Alternativa* - සංස්ථාගත කිරීමේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් -පනත් කෙටුම්පතක්- ඉදිරිපත් කරලා තියෙනවා.

අද මේ පිළිබඳව මුළු ලෝකයේම අවධානය යොමු වෙලා තිබෙනවා. ගරු අගමැතිතුමා, -දි.මු. ජයරත්න මැතිතුමා- ඒ වාගේම, ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා ඇතුළු මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුත් එක්ක එක්තරා අවස්ථාවකට මම සහභාගි වුණා. ඇත්තටම රජය අනුග්‍රහය දක්වලා ලංකාවට කැඳවිය යුතු තරමේ විදේශික පිරිසක් මේ අවස්ථාවට සහභාගි වුණා. මම හිතන්නේ දාහකට ආසන්න පිරිසක් සහභාගි වුණා. ඔවුන් පිළි ගන්නවා, ලංකාව මේ වෛද්‍ය ක්‍රමයේ පුරෝගාමී රට හැටියට. මම සිහිපත් කරන්න ඕනෑ, විශේෂයෙන්ම මේ වෛකල්පික වෛද්‍ය විද්‍යාවට විශාල සේවයක් කරපු කෙනෙක් තමයි, මහාචාර්ය ඇන්ටන් ජයසූරිය මැතිතුමා කියන එක. ඇන්ටන් ජයසූරිය මැතිතුමා මූලික වෙලා ශ්‍රී ලංකාවේ මේ වෛකල්පික වෛද්‍ය ක්‍රමය පිළිබඳව අනන්‍යතාව ලෝකයට ගෙනිච්චා. ඒ ඇති වෙච්ච දියුණුව ඇත්තටම අද ව්‍යාපාරික වශයෙන් වෙනත් පැතිවලට ගෙනිහිල්ලා තියෙනවා. ඒක තමයි මේකේ තියෙන හානිය.

අද වෛකල්පික වෛද්‍ය විද්‍යාව විතරක් නොවෙයි, ආයුර්වේද ක්‍රමය පවා ආයුර්වේද සම්බාහන තැනට ගිහිල්ලා තියෙනවා. ආයුර්වේද සම්බාහන අද වටලන බව ප්‍රවෘත්ති මාධ්‍යවල වාර්තා වෙනවා. එතකොට මෙන්න මෙවැනි වෛකල්පික වෛද්‍ය ක්‍රමය පිළිබඳව, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳව තියෙන විශ්වාසය නැති වෙනවා. සියල්ල මුදල් මතට සීමා වෙච්ච නිසා මේ පිළිබඳව සුදුසුකම් තියෙන, මේ පිළිබඳව දක්ෂතාව තිබෙන, මේ පිළිබඳව ඇත්තටම හැකියාව තිබෙන, වෛද්‍යවරු වෙනුවට අද ව්‍යාපාරික කොටසක් බිහි වෙලා තියෙනවා. ඉක්මනින් මිනිසුන් රවට්ටලා ඒ මිනිස්සු තව ලෙඩ කරනවා. ලෙඩ සනීප කරනවා වෙනුවට ලෙඩ කරලා මුදල් ගරා කන තත්ත්වයක් තියෙනවා.

ඇත්තටම ආණ්ඩුවේ එහෙම නැත්නම්, රජයේත්, පාර්ලිමේන්තුවේත් අවධානය මේ කෙරෙහි යොමු වෙද්දී නීත්‍යානුකූල පිළිගැනීමක්,ගෞරවයක් මේ වෛද්‍යවරුන්ට සහ මේ වෛද්‍ය ක්‍රමයට ලැබෙන කොට මෙන්න මේ වෛකල්පික වෛද්‍ය ක්‍රමය, ඒ වාගේම ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට මුවා වෙලා සිද්ධ වන මේ මහා දැවැන්ත ජාවාරමත් වළක්වන්න නීත්‍යානුකූල තත්ත්වයක් හැදෙන්න ඕනෑ. මොකද අපට පේනවා, මේ වෛද්‍ය ක්‍රමය නිසා සැබෑවට නිරෝගී වන මිනිසුන්ට වඩා මේ ව්‍යාපාරික ජාවාරමට අහු වෙලා රැවටෙන මිනිස්සු ගැන තමයි මාධ්‍යවල ප්‍රවෘත්ති පළ වෙන්නේ කියන එක. ඒක නිසා මේ ක්‍රමය පිළිබඳව තියෙන විශ්වාසය බිඳ වැටෙනවා. ඒක රටටත් අගෞරවයක්. අභ්‍යන්තර වාගේම ජාත්‍යන්තරවත් අපේ රටට වන අගෞරවයක්. අන්න ඒ තත්ත්වය වළක්වන්නත් පියවර ගත යුතු යැයි කියමින්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මේ යෝජනාව වැදගත් යෝජනාවක් හැටියට සලකමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මී ළඟට ගරු වසන්ත සේනානායක මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මිනිත්තු හතරක කාලයක් තිබෙනවා.

**ගරු වසන්ත සේනානායක මහතා**
(மாண்புமிகு வசந்த சேனாநாயக்க)
(The Hon. Vasantha Senanayake)

Mr. Presiding Member, it gives me great pleasure to speak a few words on the Adjournment Motion moved by the Hon. Palitha Range Bandara with regard to the system of alternative medicine. When speaking about alternative medicine, it is a known fact that prior to western medicines being accepted in countries like ours as the established code of medicine with stringent practices, with boards, certifications and so on, there were indigenous systems of medicine that existed not only in Sri Lanka but also in India. In Africa, they had their witch doctors and their own systems of medicine, which was also documented as having the effect of curing patients, illnesses and sicknesses. The American Indians had a system of medicine unique to them, which again contributed to curing the diseases. The Chinese today have acupuncture, acupressure and other systems of medicine, all alternative to the standard western practices. We are not going to compare and I think we should not compare one system with the other. But, if the desired effect, that is, the cure for the disease or the remedy for the disease is effected, then that is what we need to achieve.

Let us take the case of Dr. Eliyantha White whom I have known since childhood. I have not consulted him in a medical capacity, but I have seen him being able to cure people, whom I have known, suffering from ailments all their lives, maybe within a week. This is truly remarkable.

Sir, if you take cures from a religious perspective, we are not so afraid to accept them. For instance, some Buddhists will tell you that a dying patient or his relative was taken near a *Bodhi* Tree, a *Bodhi Pooja* was performed, he was given holy water or something to that effect or *Pirith Pan* as we call it in Sinhala and he was cured miraculously. You wilNow, t hear Catholics say that water from Lourdes was given to a dying patient and the dying patient immediately opened his eyes and recovered. That really depends on the faith of the person. That is called "faith healing". In these evangelical churches also, you can see a lot of faith healings. Sometimes, there are groups of patients who are brought and healed together by a certain preacher. When that is done, that is categorized by the believers as the work of the God or the work of the Divine. It is believed by others, perhaps as a hypnotic suggestion or a conditioning of the mind but some people altogether rubbish it by saying, "this is nonsense". Nevertheless, the desired effect is reached. That is, a person in a wheelchair started walking or something to that effect.

Now, we are aware that Dr. White has cured many distinguished people in this country. I will not elaborate the list. I think the Hon. Palitha Range Bandara gave us a comprehensive list of some of the people whom Dr. White has treated successfully and also distinguished people coming from other countries also. So, if the desired effect is reached, we have to come to the conclusion that alternative medicine and medicine from the natural confines or the confines of science, as we understand it, may not necessarily mean that the system itself is untrue. For instance, there are so many things we cannot prove in Science. Even the nefarious Rasputin was able to cure the son of the Czar of Russia from Leukaemia although western medicine had no cure for him. People like Uri Geller were able to bend metal with the projection of their minds. These parameters may not be known to Science. But, if it works and the result is seen, we cannot say that it is a farce or failure.

Therefore, Mr. Presiding Member, what I propose to say is that whilst we should recognize alternative medicine, we should also have some criteria for recognizing practitioners of alternative medicine. Dr. White has a proven track record; not everyone who goes under that label of being able to cure people of ailments has a good track record.

I think we have to be careful in admitting all those that go under the label of "alternative medicine" and about healers. We have to recognize the genuine cases and give them legitimacy.

I thank you, Mr. Presiding Member, for the time allotted to me and I thank the Hon. Member of the Opposition for bringing such a valuable Adjournment Motion.

Thank you very much.

**ගරු පාලිත තෙවරප්පෙරුම මහතා**
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාවට අදාළව වෛකල්පික වෛද්‍ය ක්‍රමය ගැනත් ඒ වාගේම එලියන්ත වයිට් වෛද්‍යවරයා ගැනත් මට කථා කරන්නට ලැබීම ගැන මම බොහොම සතුටු වනවා. මොකද, මම ඒ වෛද්‍යතුමාගේ දක්ෂතාව අත් දැකීමෙන්ම දැකපු පුද්ගලයෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වැඩිමහල් පුත්‍රයාට දැන් අවුරුදු 21ක් විතර වනවා. දැනට අවුරුදු අටකට විතර ඉහත සිට තිබුණු අසනීපයකට මේ රටේ ඉන්න දක්ෂ වෛද්‍යවරු පවා ප්‍රතිකාර කරලා අවසානයේදී ඒ රෝගය හොඳ කරන්න බැහැයි

කියලා කියා සිටි අවස්ථාවක මට අහම්බෙන් වාගේ අපේ ගරු චම්පික ප්‍රේමදාස මහතාගේ මාර්ගයෙන් අපේ අනෝමා ගමගේ මැතිනියගේ මැදිහත් වීමෙන් මේ වෛද්‍යවරයා ළඟට මගේ පුත්‍රයා අරගෙන යන්න අවස්ථාව ලැබුණා. අපි හිතුවේවත් නැති විධියට, ඒ කියන්නේ මේ රටේ ඉන්න දක්ෂ වෛද්‍යවරු හොඳ කරන්න බැහැයි කියලා ප්‍රතික්ෂේප කරපු හමේ රෝගයක් ඉතාමත්ම කෙටි කාලයකින් එතුමා සුව කළා. අපි මානසික පීඩා විඳි ලෙඩක්. ඒ රෝගය නිසා අපේ මුළු පවුලම බොහොම අසහනයෙන් සිටියේ. නමුත් එතුමා බොහොම සැහැල්ලුවෙන් එය හිතට අරගෙන ඒ අසනීපය අද වෙන කොට සුව කරලා තිබෙනවා. ඇත්තටම ඒ වාගේ දක්ෂ වෛද්‍යවරයකුව ආරක්ෂා කරන එක, එතුමා ගැන කථා කරන එක අපේ යුතුකමක්.

එතුමා අපේ රටට විශාල කීර්තියක් අත්කර දෙන වෛද්‍යවරයෙක්. අපේ රටේ විතරක් නොවෙයි ඉන්දියාවේ ඉන්න මහා ප්‍රබලයෝ, හොඳ ක්‍රිකට් ක්‍රීඩකයෝ, හොඳ ගායකයෝ ඇවිල්ලා එතුමාගෙන් ප්‍රතිකාර අරගෙන අපේ රටට කීර්තියක් ඇති වන ලෙසට රට ගැන කථා කරනවා අපි දැකලා තිබෙනවා; අපි අහලා තිබෙනවා. එවැනි වෛද්‍යවරයකු ආරක්ෂා කිරීම අපේ යුතුකමක්. ඒ නිසා එතුමාට අවශ්‍ය කරන ආරක්ෂාව ලබා දීලා එතුමා ආරක්ෂා කරලා දෙන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වනවා.

**ගරු අනෝමා ගමගේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ කෙනකු හැටියට නවීන වෛද්‍ය විද්‍යාවටත් ඒ වාගේම වෛද්‍ය ක්‍රමවලටත් මම ඉතාමත් ගරු කරනවා. ඒ වාගේම මේ වෛකල්පික වෛද්‍ය ක්‍රම ගැන පාර්ලිමේන්තුවේ අද ඉදිරිපත් කළ යෝජනාවට සහයෝගය දක්වන එක යුතුකමක් කියලා මම සලකනවා.

වෛකල්පික වෛද්‍ය ක්‍රමය ගැන කථා කරද්දී මේ දවස්වල ගොඩක් කථා බහට ලක් වුණා, අපේ ඩොක්ටර් එලියන්ත වයිට් ගැන. එතුමා ගැන ඇත්තටම මම දැන ගෙන සිටියේ නැති වුණත් අහම්බෙන් වාගේ මට එතුමා ගැන දැන ගන්නට ලැබුණා. අපේ ගරු පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමාගේ දරුවාගේ අසනීපය ගැන මට දැන ගන්නට ලැබිලා, මම ඒ දරුවාව ගෙනැල්ලා චර්ම රෝග වෛද්‍යවරයකු වෙත යොමු කළා. ඒ චර්ම රෝග වෛද්‍යවරයා කිව්වා, "මේ ලෙඩේ කොහොමවත් සනීප කරන්න බැහැ, අවුරුදු හයක් හතක් තිබුණු ලෙඩක් නිසා ජීවිත කාලයටම පවතියි" කියලා. නමුත් ඒ පුතාව දැකපු වේලාවේදී මම තේරුම් ගත්තා, තව දුරටත් මේ රෝගය තිබුණොත් සුමාන දෙක තුනක් ඇතුළත මේ ළමයාගේ ජීවිතය පවා නැති කර ගන්න තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ කියලා. ඒ ගැන මම අපේ මන්ත්‍රීතුමාට කිව්වා,"ඔබතුමන්ලා මේ දරුවාට ලොකු අසාධාරණයක් කරන්නේ, අපි මේ දරුවාව පිටරටකට යවලා හෝ කොයි ක්‍රමයකින් හෝ සනීප කරමු" කියලා. ඒ වේලාවේදී තමයි මට අහම්බෙන් වාගේ මේ එලියන්ත වයිට් දොස්තර මහත්මයා ගැන දැන ගන්නට ලැබුණේ. ඇත්තටම මම හිතුවේ එතුමා බ්‍රිතාන්‍ය ජාතිකයෙක් කියලා. ඒ එතුමාගේ නම නිසා. මම විස්තර දැන ගෙන සිටියෙත් නැහැ.

චම්පික ප්‍රේමදාස මන්ත්‍රීතුමාත්, පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමාත්, මමත් මේ පුතාව අරගෙන මේ දොස්තර මහත්මයා ළඟට ගියාම එතුමා පුතාව වැඩිය පරීක්ෂා කළෙත් නැහැ. ඇත්තටම මට ඒ වෙලාවේදී ලොකු භයකුත් දැනුණා. මොකද, අවුරුදු ගණනක් පැරණි මේ වාගේ ලෙඩක් බැලුවේ නැති එක ගැන. නමුත් එක පාරටම එතුමා කිව්වා, "මට මේ රෝගය සනීප කරන්න පුළුවන්, මට දවස් තුනක් කල් දෙන්න" කියලා. ඒ වෙලාවේදී බෙහෙතක් බොන්න දුන්නා. මමත් වෛද්‍ය වෘත්තියට සම්බන්ධ කෙනෙක් නිසා මගේ හිතට ඇත්තටම ලොකු භයක් දැනුණා. මම ඒ වෙලාවේදී එතුමාගෙන් ඇහුවා, "ඔබතුමා දුන්න බෙහෙතේ මොනවාද තිබෙන්නේ?" කියලා. ඒ වෙලාවේදී මට බෙහෙත්වල තිබෙන දේවල් ගැන සියලුම පරීක්ෂණ වාර්තා පෙන්නුවා. නමුත් ඇත්තටම මම හිතේ ලොකු දෙගිඩියාවකින් සිටියා, ප්‍රශ්නයක් වුණොත් මමත් මේකට සම්බන්ධ වුණා නේද කියලා. එදින සවස් වන කල්ම මම මන්ත්‍රීතුමාටත්, දරුවාටත් පැයෙන් පැයට වාගේ දුරකථනයෙන් කථා කර කර ලෙඩේ ගැන අහන්න පටන් ගත්තා. නමුත් රෑ හත අට වෙද්දී ලෙඩේ සියයට 70ක් විතර හොඳයි කියලා කිව්වා. පහු වෙනි දා උදේ කිව්වා, සියයට 90ක්ම හොඳයි කියලා. තුන්වන දවස වෙද්දී මේ ළමයාට සියයට 100ක්ම සනීප වුණායි කියලා කිව්වා. ඒත් මම විශ්වාස කළේ නැහැ. මම මේ ළමයාව මාගේ කාර්යාලයට ගෙන්වා ගෙන බැලුවා. ඒ වෙද්දිත් තුවාල සම්පූර්ණයෙන්ම සනීප වෙලා තිබුණා. ඒ නිසා ඒ වෛද්‍යවරයා ගැන මට ලොකු විශ්වාසයක් ඇති වුණා.

නවීන වෛද්‍ය ක්‍රමවලින් සනීප කරන්න බැරි සමහර දේවල් - දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් කිව්වා වාගේ- සායි බාබා වැනි අය ළඟට ගිහින්, දේවාලවලට ගිහිල්ලා අපට හිතා ගන්න බැරි විධියට අපි සනීප කර ගන්නවා. නමුත් එහෙම සනීප වන්න හේතුව අප කාටවත් හොයන්න බැහැ. ඒකට හේතුව කියන්න අපට තේරෙන්නෙත් නැහැ.

එලියන්ත වයිට් වෛද්‍යතුමා ගැන මේ අවස්ථාවේදී රටේ නොයෙක් විධියට කථා බහ කරනවා. නමුත් අප කාටත් වැරදෙන අවස්ථාත් තිබෙනවා. වෛද්‍යවරුන්ටත් වැරදෙනවා. ඒ නිසා ඉදිරියේදී එතුමාව අවඥාවට ලක් නොකර, එතුමාව ආරක්ෂා කරලා, එතුමා ගැන ප්‍රශංසා මුඛයෙන් කථා කරලා, රටට මේ පණිවුඩය දීම අපේ යුතුකමක්.

මේ වෛද්‍යවරයා ගැන අපේ පාර්ලිමේන්තුවේ නොයෙක් මැති -ඇමතිවරු කථා කළා. ඒ එතුමා ගැන නිවැරදි දැනුමක් නැතුව. මම වුණත් එතුමා ගැන මුලින් දැන ගෙන සිටියේ නැහැ.

අද දිනයේ මේ සියලු දෙනාම මේ පිළිබඳව කථා කරපු එකෙන් හැම දෙනාටම මේ පණිවුඩය ව්‍යාප්ත වෙයි කියා මා හිතනවා. එතුමා ඇත්තටම මානසික පීඩනයකට ලක් වෙලායි ඉන්නේ. මා ඇහුවාම එතුමා මට කිව්වේ, "මගේ මානසික තත්ත්වය විතරක් හරිගස්සා දෙන්න. මාව අපහාසයට ලක් කරන්න එපාය කියන්න. එච්චරයි මට ඕනෑ. මා කිසිම කෙනකුගෙන් වෙනත් දෙයක් බලාපොරොත්තු වන්නේ නැහැ"යි කියලායි. එම නිසා මා ඉල්ලා සිටිනවා, අපි සියලු දෙනාම ඉදිරියේදී ඒ තත්ත්වය ඇති කරමුයි කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඊළඟට, ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දන්නා තරමට කල්තැබීමේ යෝජනාවකට මේ තරම් විශාල මන්ත්‍රීවරුන් සංඛ්‍යාවක් කථා කරලා නැහැ. අද අපට පෙනුණා, හැම මන්ත්‍රීවරයාම තමන්ගේ අත් දැකීම අනුව මේ පිළිබඳව කථා කළ ආකාරය. විශේෂයෙන්ම වෛකල්පික වෛද්‍ය ක්‍රමය අලුත් දෙයක් නොවෙයි.

1961 දී බණ්ඩාරනායක මැතිනිය අගමැති වශයෙන් සිටි කාලයේ මගේ ඥාතියකු වන මහාචාර්ය ඇන්ටන් ජයසූරිය

[ගරු ජෝන් අමරතුංග මහතා]

මැතිතුමා චීනයෙන් චීන කටු වෛද්‍ය ක්‍රමය ඉගෙන ගෙන ඇවිත් එය මේ රටේ ක්‍රියාත්මක කළා. ඔහුට අගමැතිනියගේ අනුග්‍රහය ලැබුණා පමණක් නොවෙයි, එවකට හිටපු සෞඛ්‍ය ඇමතිනි ශිවා ඔබේසේකර මැතිනිය ඔහුට අවස්ථාව දුන්නා, දකුණු කොළඹ ආරෝග්‍ය ශාලාවේ "ක්ලිනික්" එකක් පවත්වා ගෙන යන්නත්. එතුමාගේ අභාවය දක්වාම වෛකල්පික වෛද්‍ය ක්‍රමයේ චීන කටු ක්‍රමය සඳහා දවසකට 300ක, 400ක පමණ පිරිසක් ආරෝග්‍ය ශාලාවට පැමිණියා. එයින් අපට පෙනුණේ සුපුරුදු බටහිර වෛද්‍ය ක්‍රමයටත්, ශ්‍රී ලංකා ආයුර්වේද ක්‍රමයටත් කැමැති නැති මේ රටේ ජනතාව විකල්ප වෛද්‍ය ක්‍රමවලට නැඹුරු වුණු බවයි. මේ වෛද්‍ය ක්‍රමයට පවා මහත් පෙරළියක් ඇති කරපු වෛද්‍යවරයෙක් තමයි එලියන්ත වයිට් මැතිතුමා.

අද මේ සභාවේ කථා කරපු මන්ත්‍රීවරු බොහෝ දෙනෙක්ම කථා කළේ එතුමාගෙන් සුවය ලබා ගත්ත, එහෙම නැත්නම් දන්නා හඳුනන අයට සුවය ලබා දුන්නු වැඩ පිළිවෙළක් ගැනයි. නමුත් ඇති වුණු ප්‍රශ්නය වුණේ, ඇතැම් වෛද්‍ය ක්ෂේත්‍රවල නිරත වී සිටි වෛද්‍යවරුන්ට මෙතුමාගේ මේ වැඩ පිළිවෙළ ගැන ඊර්ෂ්‍යාවක් ඇති වුණු එකයි. ඔවුන්ට විශාල ඊර්ෂ්‍යාවක් ඇති වුණා. එක අතකින් මේ එලියන්ත වයිට් මැතිතුමා ජනාධිපතිතුමාට සමීප වීම පිළිබඳවත්, එතුමාගේ සුවයට කටයුතු කිරීම පිළිබඳවත් මහා ප්‍රහේළිකාවක් ඇති වුණා. ඒ වෛරය නිසාම ඔහුගේ නාමය කෙලෙසීම සඳහා විවිධාකාර උපක්‍රම යෙදුවා. මෙතැනදී අපට තිබෙන්නේ, මේ ක්ෂේත්‍රය තුළින් මේ රටට යම් කිසි සේවයක් කරනවා නම්, ඔහුගේ වෛද්‍ය සේවාව තුළින් මේ රටේ අහිංසක ජනතාවට, එහෙම නැත්නම් දුක් විඳින ජනතාවට සහනයක් ලබා දෙනවා නම් අපි එවැනි පුද්ගලයන්ව පුළුවන් තරම් ආරක්ෂා කිරීමයි. එලියන්ත වයිට් මැතිතුමාගේ ජීවිතයට පවා තර්ජනයක් තිබෙන බව ඔහු මා එක්ක සඳහන් කළා. මා එතුමාව හොඳට හඳුනනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ වැඩ පිළිවෙළ ගැනත් මා කථා කරලා බැලුවා. එතුමාට අවශ්‍ය ඇතැම් ඖෂධ ගෙනෙන්නේ ඉන්දියාවෙන්. ඒ සඳහා විශාල මුදලක් වැය වෙනවා. මා හිතන හැටියට ජනාධිපතිතුමා ඒ මුදල් ලබා දෙනවා ඇති. කෙසේ වෙතත් ඒ බෙහෙත් උපයෝගි කර ගෙන ප්‍රතිකාර ලබන අයගෙන් ශත 05ක්වත් එතුමා අය කරන්නේ නැහැ. ඒකයි මෙතැන තිබෙන වටිනාම දේ. මෙවැනි ඉමහත් සේවයක් කරන පුද්ගලයකුගේ නාමය කෙලෙසන්න කවුරුන් හෝ කටයුතු කරනවා නම් ඒක මහා අපරාධයක්. අද අපේ රටේ ජනතාව පුහුණු වෙලා තිබෙනවා, ඉංග්‍රීසි බෙහෙත් ගන්නේ නැත්නම්, සිංහල වෙදකම් කරන්නේ නැත්නම් වෙනත් ප්‍රතිකාරවලට යන්න.

විශේෂයෙන්ම වෛකල්පික සුවය ලබන මාර්ග කිහිපයක් තිබෙනවා. එයින් එකක් තමයි එලියන්ත වයිට් මැතිතුමා අද ක්‍රියාත්මක කරන්නේ. ඒකට අද බොහෝ දෙනෙක් පැහැදිලා තිබෙනවා. නමුත් වෙලා තිබෙන්නේ එතුමාට අද වෛරකාරයෝ වැඩි වෙලා තිබෙන එකයි. මේ සභාවේ රජයේ මැති ඇමතිවරුන් කිහිප දෙනෙක් ඉන්නවා. එතුමාගේ ජීවිතයට තිබෙන තර්ජන නිසා එතුමාට ආරක්ෂාවක් ලබා දෙන්නය කියලා මා ඉල්ලීමක් කරනවා. මීට පෙර එතුමාට ආරක්ෂාව ලබා දීලා තිබුණා. මා හිතන හැටියට ජනාධිපතිතුමාගේ ආරක්ෂක නිලධාරින් කිහිප දෙනෙක් එතුමාගේ ආරක්ෂාවට දීලා, පසුව එය ඉවත් කරලා තිබෙනවා, ප්‍රශ්න කිහිපයක් ඇති වී තිබෙන නිසා. මා හිතනවා, ටික කාලයක් යන කල්වත් එතුමාට ආරක්ෂාව ලබා දීම සාධාරණයි කියලා. ඒක තමයි පළමුවන ඉල්ලීම.

දෙවැනි ඉල්ලීම වන්නේ, වෛකල්පික වෛද්‍ය සභාවක් මේ රටේ ඇති කරන්නය කියන එකයි. දැන් අපි දන්නවා, බටහිර බෙහෙත් සඳහා Medical Council එකක් තිබෙනවා; ආයුර්වේද බෙහෙත් සඳහා Ayurvedic Medical Council එකක් තිබෙනවා. නමුත් මේ වෛකල්පික වෛද්‍ය ක්‍රමය සඳහා එවැනි Council එකක් නැහැ. ඒක නිසා තමයි අද licence නැතිව මේ 4,000ක් විතර වෛද්‍යවරුන් විවිධ ක්ෂේත්‍රවල යෙදී සිටිනවාය කියන එක අපට අහන්නට ලැබෙන්නේ. ඉතින් ඒක නිසා ඒ ගැනත් රජයේ අවධානය යොමු කොට එවැනි සභාවක් පිහිටුවා, ඒ අයට අවශ්‍ය බලපත්‍ර ලබා දීලා, ඒ අයගේ කාර්ය නීත්‍යානුකූල කිරීම සාධාරණයි කියන එකයි මගේ අදහස.

විශේෂයෙන්ම වයිට් මැතිතුමා ගැන කථා කරන්නේ, ඔහුගේ වැඩ පිළිවෙළ අනුව ඔහු නොමිලේ එම සේවය ලබා දෙන නිසායි. එතුමා කරන්නේ සල්ලි අය කරන්නේ නැතිව ඒ සේවය ලබා දෙනවා. එතුමා කරන ඒ වැඩ පිළිවෙළට ශක්තියක්, ධෛර්යක් ලබා දෙන්න කියලාත් මම ඉල්ලීමක් කරනවා. එතුමා පෞද්ගලිකව මට කථා කරලා කිව්වා, එතුමාගේ ජීවිතයට තර්ජන, ගර්ජන තිබෙනවා කියලා. ඒ නිසා පුළුවන් නම් රජයෙන් ඉල්ලීමක් කරන්න කියලා කිව්වා, එතුමාට කලින් දීලා තිබුණු ආරක්ෂාව ඒ හැටියටම ලබා දෙන්න කියලා. එම ආයාචනයත් කරමින් මා නිහඬ වනවා, ස්තූතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මීළඟට ගරු දයාශ්‍රිත තිසේරා ඇමතිතුමා. ඊට ප්‍රථම ගරු හුනෛයිස් ෆාරුක් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු සාලින්ද දිසානායක මහතා (දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க - சுதேச மருத்துவத்துறை அமைச்சர்)
(The Hon. Salinda Dissanayake - Minister of Indigenous Medicine)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හුනෛයිස් ෆාරුක් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හුනෛයිස් ෆාරුක් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹுனைஸ் பாறூக் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* THE HON. HUNAIS FAROOK *took the Chair.*

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில் முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෛකල්පික වෛද්‍ය සේවය ගැන අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන විපක්ෂයේ ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව විවාදයේ දී මගේත් අදහස් දක්වන්නට කැමැතියි. මා හිතන්නේ මේ වෛකල්පික වෛද්‍ය ක්‍රමය ආරක්ෂා කිරීමට ඉතිහාසයේ සිටම යම් යම් ක්‍රමවේදයන් අපේ රට තුළ ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ වාගේම මෙම වෛද්‍ය ක්‍රමය ගැන මේ අවස්ථාවේ දී අපි කථා කරද්දී,

විශේෂයෙන්ම අවධානයට ලක් වූයේ මෑත කාලයේ දී මහත් පෙරළියක් ඇති කරපු වෛද්‍යවරයෙක් වන එලියන්ත වයිට් මැතිතුමා සම්බන්ධවයි. එතුමා නිදන්ගත රෝග සුව කිරීමේ හැකියාව, ශක්තිය තිබෙන දක්ෂ වෛද්‍යවරයෙක්. එතුමාව ඇගයීම වාගේම, එතුමා හා සමාන හැකියාවන් ඇති, අවංක සේවාවක් කරන්නට පුළුවන් තවත් වෛද්‍යවරුන් සිටී නම් වෛකල්පික වෛද්‍ය සේවාව තුළ ඒ සියලු දෙනාවම ආරක්ෂා කිරීම, ඒ අය වෙනුවෙන් යම් ශක්තියක්, බලයක් ලබා දීම සඳහා පාර්ලිමේන්තුවේ පක්ෂ, විපක්ෂ අප සියලු දෙනාම අත්වැල් බැඳ ගෙන මෙවන් අවස්ථාවක කථා කිරීම, ඔවුන් ඇගයීම අපේ යුතුකමක් වෙලා තිබෙනවා.

මෙතෙක් වේලා කථා කළ අපේ ගරු ඇමතිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළ ආකාරයට මෙතුමා කිසිදු මුදලක් අය කරන්නේ නැතිව අහිංසක රෝගීන්ට විශාල සේවාවක් කරනවා. ඒ වාගේම අපේ අසල්වාසී රටවල්වලින් වෛද්‍ය සේවාවන් ලබා ගැනීම සඳහා මෙහි පැමිණෙන උදවිය අපේ රට වෙනුවෙන් විශාල ගෞරවයක් ඇති වන ආකාරයට මේ ගැන කථා කරනවා.

අතිගරු ජනාධිපතිතුමා ලොකු ශක්තියක් මෙතුමාට ලබා දීලා තිබෙනවා. එම නිසා ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් අද එකට එකතු වෙලා මේ ගරු සභාවේ කථා කරන මාතෘකාවක් බවට මේ යෝජනාව පත් වෙලා තිබෙනවා. මේ කථා කරන මමත් එතුමාගෙන් වෛද්‍ය උපදෙස් ලබා ගන්නා කෙනෙක්. එම නිසා එතුමා වෙනුවෙන් ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් අප සියලු දෙනාගේම සහයෝගය, ශක්තිය ලබා දිය යුතුයි. එතුමාවත්, වෛකල්පික වෛද්‍ය සේවාවන් අවංකව මෙරටට සපයන අනෙකුත් වෛද්‍යවරුන්වත් ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ඉදිරියට ගෙන ඒම සඳහා අපි අත්වැල් බැඳගෙන ක්‍රියා කළොත් හොඳයි කියන යෝජනාව මේ ගරු සභාව ඉදිරියේ තබමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෛකල්පික වෛද්‍ය ක්‍රමය ගැන ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා ගෙනාපු කල් තැබීමේ යෝජනාව සම්බන්ධව විවාදයේ දී මගේත් අදහස් දක්වන්නට කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි වෛද්‍යවරුන් ලෝකයේ රටවල විවිධ අවස්ථාවල, විවිධ තැන්වලින් මතු වෙලා තිබෙනවා. අපි උදාහරණ වශයෙන් ගත්තොත් එඩ්ගා කේසි, 1505 දී ප්‍රංශයේ සිටි නොස්ට්‍රඩාමුස්, හැරී හුඩිනි, ජීනි ඩික්සන්, අපේ අල්ලපු රටින් බැලුවොත් සායිබාබා වැනි මුණිවරුන් - healersලා - මතු වෙලා තිබෙනවා. කුණ්ඩලිනී යෝගය අධ්‍යයනය කරපු එවැනි අධිමානසික ශක්තීන් තිබෙන යෝගිවරුන්, වෛද්‍යවරුන් මේ ගණයට අයිති වෙනවා. බොහෝ රටවල එවැනි ශක්තීන් - talents - තිබෙන අය පහළ වුණාම, ඒ අයව හඳුනා ගෙන රාජ්‍ය අනුග්‍රහය දක්වලා, ගෞරව පුද සත්කාර කරලා, ඔවුන්ගේ වෘත්තියෙන් ඒ රටේ පුරවැසියන්ට සේවය කරන්න අවස්ථාව සලසා දෙනවා. නමුත් අභාග්‍යයකට අපේ රටේ ඔවුන්ට හිංසා පීඩා කරමින්, අවඥාවට ලක් කරමින්, මැර තර්ජන එල්ල කරමින් ඔවුන්ව අධෛර්යට පත් කරනවා.

ගරු රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා ගෙනා මේ යෝජනාව සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ වාගේම, විපක්ෂයේ මන්ත්‍රීවරුත් කථා කරමින් කිව්වා එවැනි සුවිශේෂ තලෙන්තු තිබෙන වෛද්‍යවරු ආරක්ෂා කළ යුතුයි කියලා.

එලියන්ත වයිට් වෛද්‍යවරයා පසු ගිය ඉතිහාසයේ කළ කී දෑ ගැන අධ්‍යයනය කිරීමේදී කලාකාරයෙක් හැටියට මම හිතනවා එතුමාගේ වෛකල්පික වෛද්‍ය ක්‍රමය තුළින් අපේ රටට විශාල කීර්තියක් ඇති වුණා කියලා. එතුමාව හම්බ වෙන්න සචින් තෙන්ඩුල්කාර් වැනි ලෝ සුපතල ක්‍රීඩකයෙකු කටුනායක ගුවන් තොටුපොළට ඇවිල්ලා බෙහෙත් බීලා ගියා. ෂාරුක් ඛාන්, සල්මන් ඛාන් වැනි කලා ක්ෂේත්‍රයේ හොඳ නමක් තිබෙන කලාකරුවෝ ලංකාවට ඇවිල්ලා ඒ පුද්ගලයාගෙන් බෙහෙත් අරගෙන ගිහිල්ලා තිබෙනවා. මම හිතනවා අපි එතුමාව විවේචනය කරනවාට වඩා එතුමාට උදවු කරලා මේ තත්ත්වය නිරාකරණය කර ගැනීමට කටයුතු කරන එක හොඳයි කියලා. ගරු ජෝන් අමරතුංග මැතිතුමා කිව්වා වාගේ එතුමාට ලබා දීලා තිබුණු ආරක්ෂාව අද නැති කරලා එතුමාව ඉතාම අවඥාවට ලක් කරලා තිබෙනවා.

අද වෛකල්පික වෛද්‍ය ක්‍රමයේ පුරෝගාමියෙකු හැටියට නමක් රඳවා ගෙන සිටින එලියන්ත වයිට් වෛද්‍යවරයාට නිසි තැන ලබා දෙන්නය කියා මමත් යෝජනා කරනවා. එතුමාව ඕනෑ කෙනෙකුට පරීක්ෂාවට ලක් කරන්න පුළුවන්; කිසි බාධාවක් නැහැ. එතුමාට නරකක්, හිංසාවක් හෝ පීඩාවක් වෙන්න නොදී බලා ගැනීම අපේ අරමුණ නිසා, අපේ ප්‍රයත්නය නිසා එතුමාට නිසි තැන ලබා දීලා, අවශ්‍ය ආරක්ෂාව ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා. පෞද්ගලිකව මම දරන මතය තමයි එවැනි වෛද්‍යවරු, එවැනි වෛද්‍ය ක්‍රම ලංකාව තුළ ආරක්ෂා කළ යුතුයි කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් කියන්න ඕනෑ එලියන්ත වයිට් නමැත්තා ලංකාවේ පුරවැසියෙක්; ලංකාවේ වෛද්‍යවරයෙක් බව. එතුමාව ලංකාවේ පුරවැසියෙකු හැටියට, ලංකාවේ වෛද්‍යවරයෙකු හැටියට සලකා, පොදු පෙරමුණේ වෛද්‍යවරයෙකු කර නොගෙන පක්ෂ විපක්ෂ සියලු දෙනාට එතුමාගේ සේවය ලබා ගත හැකි විධියට ක්‍රියා කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Then, the Hon. Alhaj A. H. M. Azwer. You have four minutes.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, it is very rarely that we witness an Adjournment Motion acceptable to all Members of both sides of the House. This is one such rare moment - a Motion moved by the Hon. Palitha Range Bandara.

Sir, if the "Wonder Boy of India" or the "Little Master" has scored a century of centuries, that maybe because of the healing science that Dr. Eliyantha White practised on him. Dr. Eliyantha White might have been very much responsible for that because today, Sachin Tendulkar is one of the persons who has earned the goodwill and appreciation of not only the cricket lovers in India, but of people in all countries. Likewise, Dr. Eliyantha White, no doubt, has done his work very well by curing so many people.

Sir, apart from that science of medicine Dr. Eliyantha White practises, there are also, as the Hon. Palitha Range Bandara said, alternative systems of treatment. One is,

[ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා]

acupuncture treatment, which was practised very well by Dr. Jayasuriya at the Colombo South General Hospital. Dr. M.A. Latiff, you know, Sir, was the President of Homeopathic Medical Association of Sri Lanka and he wanted it to be practised by as many people as possible because even Her Majesty Queen Elizabeth takes homeopathy medicine.

Then, there is also Ayurveda and Unani medicines. The Government must pay attention to those two sciences of medicine. I think Unani medicine must receive more attention. The Hon. Deputy Minister of Health is here and I bring it to his notice. Sir, there were Motions moved in this House by great men like Sir Razik Fareed and Mr. M.E.H. Mohamed Ali of Muttur urging the governments to develop Unani medicine. I myself also moved a similar Motion earlier. The attention paid to Unani treatment is not enough. There are a lot of Unani students passing out. Once upon a time, I remember, we opened Unani Centres in Muslim villages like Pangaragammana in the remote Mahiyangana Electorate. I think more people are practising Unani medicine and therefore, you must pay more attention to that faculty.

Sir, medicine is a sacred thing in Islam. The first-known medical personality was Avicenna. Avicenna's mode of medicine is followed by even the western and eastern physicians. Even today, if you go to western medicine hospitals here, you will find Avicenna's photograph hung on the walls there. Even major operations were done in ancient days without the modern techniques that we follow today.

One of the persons who adorned this House as Speaker, Deshamanya Alhaj Bakeer Markar, came from a Hakeem family. "Hakeem" means a doctor in Arabic. When they were practising this medicine in Arab Road in Beruwela, Princes and Princesses came by boat from the Maldives to take medicine. This medicinal method was so well developed that the whole of Asia knew it well. It was only the other day - I must express my condolences in this House - that the Hon. Alhaj Bakeer Markar's sister, Mrs. Durrathul Yatheema Maimoona Mohamed, who practised medicine, passed away at the "Hakeem Villa". She was the aunt of the Hon. Imthiaz Bakeer Markar as well. A large number of people from all over the country visited the funeral house to pay their respects at Maradana, Beruwela.

All in all, the Sinhala medicine is practised in the villages without possessing, as some Member mentioned, any form of certificates.

இதனைத் தமிழிலே "கைமருந்து செய்வது" என்று கூறுவார்கள். எங்களுடைய குடும்பத்திலும் அந்தக் கைமருந்து செய்யக்கூடிய ஒரு மாமா இருந்தார்; ஒரு பெரியப்பா இருந்தார். அந்தப் பெரியப்பாவை நாங்கள் "பரிகாரி மாமா" என்று அழைப்போம். அவர் வைத்திருந்த புத்தகத்தில் எல்லா விதமான நோய்களையும் குணமாக்கக்கூடிய மூலிகைகள் மற்றும் மருந்து வகைகள் பற்றிக் குறிப்பிடப்பட்டிருந்தார்.

Then, Sir, during my small days, my mother used to take me to an ayurvedic doctor or වෙදහාමිනේ. එතුමා අරළු, බුළු, නෙල්ලි, පත්පාඩගම්, රසකිඳ, බෙලි මුල්, බෙලි මල්, පොතු මේ ආදිය සියලු දෙයක්ම අරගෙන වතුර පත අට එකට සිඳුවා, අනුපාන දමා තේ හැන්ද, හැන්ද බැගින් උදේ-සවස බොන්නය කියනවා. එතකොට ඔක්කොම ලෙඩ සුව වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කළොත් අද ඖෂධ සඳහා පිටරටට යවන සල්ලි ඔක්කොම අපට නවත්වා ගන්නට පුළුවන් වෙනවා. අපේම ක්ෂේත්‍රයේ තිබෙන්නා වූ, අපේ රටේම කරන්නට පුළුවන් වෛද්‍ය ක්‍රම අපේ රටේ යහපත වෙනුවෙන් ප්‍රයෝජනයට ගන්නට පුළුවන් වෙනවා.

There is also, as some Member mentioned, Pentecostal medicinal system. The Pentecostal medicinal system is curing diseases by giving water to drink. That is also a type of medicine.

Sir, the last thing I want to say is that Dr. Eliyantha White has cured so many Members in this House and also great cricketers. But, I am sorry to say that even though I referred Ms. Ranjani Jayamanne, Editor of Hansard, - who was complaining of a hip ailment - to him, he has not been able to give an appointment even to me for the last six months and she has not got an appointment yet. I hope, in the spirit of goodwill and in keeping with the spirit of medicine, Dr. Eliyantha White will attend to Ms. Ranjani Jayamanne also.

I thank you, Sir.

**ගරු දිලිප් වෙදආරච්-චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෛකල්පික වෛද්‍ය ක්‍රමය ගැන ගරු රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා ගෙන එන ලද සභාව කල්තැබීමේ යෝජනාව මා ද අනුමත කරමින් වචන ස්වල්පයක් කථා කරන්නට කැමතියි. මේ වෛකල්පික වෛද්‍ය ක්‍රමය ඉතිහාසයේ -රජ කාලයේ- සිට පැවැති වෛද්‍ය ක්‍රමයක්. ඒ වෛද්‍ය ක්‍රමය ගැන කථා කරන විට වෛද්‍ය එලියන්ත වයිට් මහත්මයා ගැනත් මම වචන ස්වල්පයක් කථා කරන්නට ඕනෑ. අපේ පක්ෂයේ හිටපු සභාපති රුක්මන් සේනානායක මහත්මයා තමයි ප්‍රථමයෙන්ම එතුමා හමු වෙලා තිබෙන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Will an Hon. Member propose that the Hon. Alhaj A.H.M. Azwer do take the Chair.

**ගරු සාලින්ද දිසානායක මහතා**
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේදී ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හුනෙයිස් ෆාරුක් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு ஹுனைஸ் பாறூக் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. HUNAIS FAROOK *left the Chair and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**ගරු දිලිප් වෙදආරච්-චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පක්ෂයේ හිටපු සභාපති ගරු රුක්මන් සේනානායක මැතිතුමා, එතුමාගෙන් රටට ප්‍රයෝජනයක් ගන්න ඕනෑ නිසා එතුමාව ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ළඟට එක්ක ගෙන ගිහින් ජනාධිපතිතුමාට යොමු කර, කරුණු පහදා දී තිබෙනවා. අපේ ගරු ජනාධිපතිතුමාත් ඔය වාගේ දක්ෂ කෙනෙක් හමු වුණාම කවදාවත් අත හරින්නේ නැහැ. මාත් එතුමාත් එක ගමේ ජීවත් වුණු පුද්ගලයින් නිසා ඒක මම හොඳට දන්නා කාරණයක්. ජනාධිපතිතුමා ඒ වෛද්‍යවරයාත් එක්ක සාකච්ඡා කර, අවශ්‍ය බේත්හේත් සපයා ගැනීමට ඉන්දියාවේ ඖෂධ ව්‍යාපාරිකයෝ ලංකාවට ගෙන්වා, ඒ අයත් එක්ක සාකච්ඡා කර, ඔවුන්ගෙන් ඒ බේත්හේත් ආධාර වශයෙන් ඉල්ලා ගෙන, අරලියගහ මන්දිරයේ ඉඳගෙන තමයි බෙහෙත් හදා තිබෙන්නේ. හිමාලය වනාන්තරයෙන් තමයි බෙහෙත් ගෙනැවිත් තිබෙන්නේ. ජනාධිපතිතුමාගේ නිර්දේශය මත ලැබෙන ලිපි අනුව තමයි නොමිලේ ප්‍රතිකාර කරන්න එතුමාට උපදෙස් දී තිබුණේ. එතුමා නොමිලේ වෛද්‍ය උපකාර කළා. ඒ කරන අතරේ ආණ්ඩු පක්ෂයේ මැති- ඇමතිවරුන් බෙහෙත් ගන්න මෙම වෛද්‍යවරයා හමුවෙන්න යනවා. මේ වෛද්‍යවරයා කියනවා, ජනාධිපතිතුමාගෙන් අනුමතිය අරගෙන එන්න කියා. එම නිසා එතුමාට මඩ ගහන්න ගත්තා.

මම උදාහරණයක් කියන්නම්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බෙහෙත් ගන්න ගිහින් තිබෙනවා. එතුමා කියා තිබෙනවා, ජනාධිපතිතුමාගෙන් අනුමතියක් නැතිව මට බෙහෙත් දෙන්න බැහැ කියා. ඒ වෙලාවේදී එතුමාට කැත විධියට, කැත වචනයෙන් බැනලා ගිහින් තිබෙනවා. මට එතුමා ඒ ගැන කිව්වා. ඒ ආකාරයෙන් [බාධා කිරීමක්] වෙච්ච සිද්ධිය මම කිව්වේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
You can expunge the name, but -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ කාරණය හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි.

**ගරු දිලිප් වෙදආරච්-චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ඒ වාගේ මැති ඇමතිවරු එතුමාට දැන් මඩ ගහනවා. ඒ කියන්නේ, අනුමතිය ගන්න බැරි නිසා, හමු වන්න බැරි නිසා. යම් ඇමතිවරු, මන්ත්‍රීවරු එතුමා පිස්සෙක්, එතුමා හොරෙක්, එතුමා සල්ලි ගන්නවා, එතුමා හොර වෙදකම් කරනවාය කියා ප්‍රචාරය කරලා දැන් එතුමා අරලියගහ මන්දිරයෙන් ගිහිල්ලා. දැන් එතුමා වෙනම ඉන්නේ.

ඇත්තටම පසු ගිය දවසක අතිගරු ජනාධිපතිතුමා, මගේ පියාගේ අවමඟුලට සහභාගි වෙච්ච අවස්ථාවේදී මගේ නෝනා ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කළා, වෛද්‍යවරයා හමු වන්න අවස්ථාව ලබා දෙන්නටය කියා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට නියමිත කාලය නම් අවසානයි.

**ගරු දිලිප් වෙදආරච්-චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

මට විනාඩියක් දෙන්න. ඒ අවස්ථාවේදී ගරු ජනාධිපතිතුමා, අපේ බිරිඳට කිව්වා, දැන් මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් වෙදකම් කරන්න අවස්ථාව ලබා දී තිබෙන්නේ. ගිහින් හමු වන්න කියා. ඊට පස්සේ මම පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමාත් එක්ක එතුමා හමු වන්න ගියා. එතුමා හමු වෙන්න ගියාම තමයි මේ කථාව මට කිව්වේ. ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන්ගේ ප්‍රශ්නය මට ඕනෑ නැහැ. ගරු ජනාධිපතිතුමා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඒ අවස්ථාව ලබා දුන් නිසා අප එතුමාගෙන් ඒ ප්‍රතිකාර ලබා ගත්තා.

ඉතින් මම ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේකයි. මේ වෛද්‍යවරයා අපේ රටට සම්පතක්. ඒ සම්පත රැක ගන්න ඕනෑ. ඒ සම්පතට ආරක්ෂාව දෙන්න ඕනෑ. විදේශීය, දේශීය ඉහළ පෙළේ අයට විතරක් නොවෙයි, වැඩිපුර බේත් හේත් ගෙන්වලා දීලා, මේ රටේ ඉන්න දුප්පත් අහිංසක ජනතාවටත් සේවය කරන්න එතුමාට අවස්ථාව ලබා දෙන්න. ඒ වාගේම එතුමාට අවශ්‍ය රැකවරණය ආරක්ෂාව ලබා දීලා එතුමාව රැක ගන්න කටයුතු කරන්න කියලා ආණ්ඩු පක්ෂයේත් විපක්ෂයේත් ගරු මන්ත්‍රීවරු සියලු දෙනාගෙන්ම මා ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලා හැම කෙනෙක්ම ඒකමතිකව ඒ යුතුකම ඉෂ්ට කරන්න කියා ඉල්ලන අතර, කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ජයන්ත කැටගොඩ මහතා**
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෛකල්පික වෛද්‍ය ක්‍රමය පිළිබඳව ගරු පාලිත රංගෙ බණ්ඩාර මැතිතුමා ගෙනාපු යෝජනාව පිළිබඳ සාකච්ඡාවේදී මතු වූ ප්‍රධාන කාරණය තමයි, ජනාධිපති වෛද්‍ය උපදේශක ඒලියන්ත වයිට් මැතිතුමා පිළිබඳ තත්ත්වය. මේ ගරු සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරු එතුමා සම්බන්ධයෙන් අසන ලද යම් යම් ප්‍රශ්නවලට නිවැරදි ආකාරයෙන් උත්තර නොලැබුණ නිසා, එතුමා සම්බන්ධයෙන් විවිධාකාර ගැටලු මතු වුණා. ඒවා මාධ්‍ය හරහාත් ප්‍රචාරය වුණා.

එතුමා ජනාධිපති වෛද්‍ය උපදේශකවරයෙක්ද කියන ප්‍රශ්නය අහපු අවස්ථාවේ, එතුමා එවැනි කෙනෙක් නොවන බව මේ ගරු සභාවේදී ප්‍රකාශයට පත් වුණා. ඒ අවස්ථාවේදී අපට ඒ ගැන විශාල ගැටලුවක් ඇති වුණා. මොකද, එක පැත්තකින් ප්‍රචාරය වුණා එතුමා ජනාධිපති අරමුදලින් මුදල් ගරනවාය එහෙම නැත්නම් විශාල වශයෙන් මුදල් ලබා ගන්නවා කියලා. මේ සියලු කරුණු අතරේ මට අවස්ථාව ලැබුණා අපේ පාලිත තෙවරප්පෙරුම මන්ත්‍රීතුමාගේ පුතණුවන්ගේ අසනීපය සුව කරන අවස්ථාවේදී ඒ වෛද්‍යවරයා මුණ ගැහෙන්නට. ඒ අවස්ථාවේ මේ සියලුම කාරණා මා එතුමාගෙන් අසා සිටියා. "ඔබ ජනාධිපති අරමුදලින්

[ගරු ජයන්ත කැටගොඩ මහතා]

මුදල් ගන්නවාද, ඔබතුමා හොරෙක් කියනවා, ඒවායේ සත්‍ය තත්ත්වය මොකක්ද?" කියලා. මම ඒ අවස්ථාවේදී ඒ කරුණු පැහැදිලි කර ගත්තා. විශේෂයෙන්ම වෛකල්පික වෛද්‍යවරයකු හැටියට එතුමා කරපු සේවාව පිළිබඳව ඒ අවස්ථාවේදී මට දැන ගන්න ලැබුණා. වෛකල්පික වෛද්‍යවරයකු හැටියට ලෝකයේ රන් සම්මාන තුනක් මැලේසියාවේදී එතුමා ලබා ගැනීම පිළිබඳ ඒ දර්ශන මම දැක්කා. වේගයෙන් ලෙඩක් හඳුනා ගැනීම, එය සනීප කිරීම වැනි කාරණා සඳහා වෛකල්පික වෛද්‍යවරුන් අතර ඉතාම ප්‍රබලයකු හැටියට එතුමා ලංකාවට ඉමහත් කීර්තියක් ගෙන දුන්නා.

විශේෂයෙන්ම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ කාලය මනුස්ස ජීවිත ගැන විශාල බියක් තිබෙන අවස්ථාවක්. මෑතකදී කරන්දෙණියේ වෛද්‍යවරයෙක් ඝාතනය කළා. මුළු පවුලක්ම විනාශ කරන්න සෙවනගල වෛද්‍යවරයකුගේ නිවසක වතුර ටැංකියට වහ දැම්මා. මෙවැනි කාරණා නිසා මේ වෛද්‍යවරයාත් විශාල භීතියකට පත් වෙලා ඉන්නවා. එතුමාත්, එතුමාගේ දරුවන් සහ පවුලේ අයත් මානසික අසහනයකට පත් වෙලා ඉන්නවා. ඒ නිසා ගරු ජෝන් අමරතුංග මැතිතුමා කිව්වා වාගේ යුතුකමක් හැටියට අපට කරන්න තිබෙන්නේ, එතුමාගේ ආරක්ෂාව තහවුරු කිරීමයි. එය රජයේ සහ ජනාධිපතිතුමාගේ වගකීමක් බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු සාලින්ද දිසානායක මහතා (දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க - சுதேச மருத்துவத்துறை அமைச்சர்)
(The Hon. Salinda Dissanayake - Minister of Indigenous Medicine)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා වෛකල්පික වෛද්‍ය ක්‍රමවලට නීතිමය තත්ත්වයක් ලබා දෙන්න තමයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. අප දන්නවා මේ ඒලියන්ත වයිට් වෛද්‍යවරයා මුලදී ඊයම්පෝරුව පන්සලේ වෛද්‍යකර්මයේ යෙදී සිටි බව. දින හතක් පහන් පත්තු කළාට පස්සේ තමයි මේ වෛද්‍යාචාර්යතුමා හමු වන්නට පුළුවන්කම තිබුණේ. මේ වෛකල්පික වෛද්‍ය ක්‍රම පිළිබඳව කථා කරන කොට මා කියන්න ඕනෑ, මෙවැනි තවත් වෛද්‍යවරු විශාල සංඛ්‍යාවක් මේ රටේ ඉන්න බව. ඉන්දියාවේ සායි බාබා මේ විධියේ වෛද්‍ය ක්‍රමයක් මඟින් ජනතාවට සහන සලසා දීපු කෙනෙක්. ඒ වාගේම බෝධි පූජා පැවැත්වීම තුළින්, පිරිත් පැන් ලබා දීම තුළින් ආදි ක්‍රමවලින් රෝගීන් සුව කරන, විශේෂ බලවේග තිබෙන වෛද්‍යවරු ඉන්නවා. ඒවා අදෘශ්‍යමාන බලවේග හැටියට අපි දකිනවා. ඒ වාගේම ශාන්තිකර්ම තිබෙනවා. බෙර පාවිච්චි කර බලි තොවිල් පවත්වා ශබ්ද තරංග හරහා රෝග සුව කරන වෛකල්පික ක්‍රම තිබෙනවා. භූත බලවේග හරහා රෝග සුව කරන ක්‍රම තිබෙනවා. මෙන්න මේවා නීතියකට සම්බන්ධ කරන්න කියන එක තමයි අපේ ගරු පාලිත රංගෙ බණ්ඩාර මන්ත්‍රීතුමා කියන්නේ.

ආයුර්වේදය පිළිබඳව හෝ දැනට අපේ රටේ නීත්‍යනුකූලව තිබෙන වෛද්‍ය ක්‍රම පිළිබඳව සොයා බලනකොට අප දන්නවා, ශ්‍රී ලංකාව ගණන් ගන්නේ බහු වාර්ගික, බහු ආගමික රටක් හැටියට බව.

මෙවැනි රටක ඒ ඒ ජාතීන්ට හා ඒ ඒආගමික විශ්වාසවලට අනුව සංස්කෘති ගණනාවක් පවතිනවා. ජනතාවගේ සෞඛ්‍ය සංරක්ෂණය සම්බන්ධයෙන් ද විවිධ වෛද්‍ය ක්‍රම අපේ රටේ පවතිනවා. මෙම වෛද්‍ය ක්‍රමවලට, ඒ සංස්කෘතිවලට සේම දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. එම ඉතිහාසය තුළ ගොඩ නැඟුණ වෛද්‍ය ඥානයද, ප්‍රතිකාර විධිද තිබෙනවා.

ඉන්දු ගංගා මහා තැනිතලාවේ බිහි වුණු ආර්ය සංස්කෘතිය හරහා අපට ආයුර්වේදය ලැබිලා තිබෙනවා. ඒ තමයි උත්තර භාරතයෙන් අපි ලබා ගත්ත ආයුර්වේද වෛද්‍ය ක්‍රමය. දක්ෂිණ භාරතයෙන් අපට සිද්ධ වෙදකම ලැබුණා. අරාබිකරයෙන් අපට යුනානි වෙදකම ලැබුණා. ඒ වාගේම ජර්මනියෙන් අපට හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ලැබුණා. මේ වෛද්‍ය ක්‍රම තමයි අපේ රටේ නීත්‍යනුකූල තත්ත්වයෙන් පවතින්නේ. ඉහත සඳහන් වෛද්‍ය ක්‍රම නීතිමය රාමුවකින් ආවරණය කොට තිබෙනවා. ඒ සඳහා පනත් තුනක් ඉදිරිපත් කොට තිබෙනවා. ඒ අනුව ඒ වෛද්‍ය ක්‍රම සහ ඒවායේ ප්‍රතිකාර ක්‍රම නීතිගත කොට ඇති අතර, මෙයට පරිබාහිර වූ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ බලවේග වැනි කිසිදු විකල්ප වෛද්‍ය ක්‍රමයක් මෙරට තුළ දකින්නට නැහැ. කටු චිකිත්සාව වැනි ප්‍රතිකාර ක්‍රම චීන, ජපන්, කොරියන් වෛද්‍ය ක්‍රමවල අඩංගු ප්‍රතිකාර ක්‍රමයක් වන්නා සේම, අපේ ආයුර්වේදයේද එයට සමාන ප්‍රතිකාර ක්‍රම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා රජය නීතිමය වශයෙන් පිළිගත් වෛද්‍ය ක්‍රම තුනක් පවතිනවා. 1972 අංක 26 දරන වෛද්‍ය ආඥාපනතට අනුව තිබෙන වෛද්‍ය ක්‍රමය. මෙයට බටහිර නොහොත් ඇලපති වෛද්‍ය ක්‍රමය කියලා කියනවා. 1961 අංක 31 දරන ආයුර්වේද පනතට අනුව ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තිබෙනවා. මේ පනතේ 89 වන වගන්තියේ ආයුර්වේදය යන්න මෙසේ නිර්වචනය කරනවා. "ආයුර්වේද, පාරම්පරික, සිද්ධ, යුනානි යන වෛද්‍ය ක්‍රම ආයුර්වේද යන්න ලෙස නිර්වචනය වේ." එම වෛද්‍ය ක්‍රම සියල්ල මෙහි අඩංගු වෙලා තිබෙනවා.

1970 අංක 7 දරන හෝමියෝපති පනත තිබෙනවා. මෙය ජර්මනියේ ආරම්භ කොට විකාශනය වී සමපෙත නොහොත් හෝමියෝපති යන වෛද්‍ය ක්‍රමය හැටියට ප්‍රචලිතව තිබෙනවා. නීත්‍යනුකූල තත්ත්වයේ වෛද්‍ය ක්‍රම ලෙස සැලකෙන්නේ මෙම පනත්වලින් පිළිගෙන ඇති ඒවා පමණයි.

සාමාන්‍යයෙන් මෙම පනත්වලට පරිබාහිරව ලංකාවේ වෛකල්පික කියා වෛද්‍ය ක්‍රමයක් නැහැ. පෙර සඳහන් කළ අදෘශ්‍යමාන බලවේග, බෝධි පූජා, පිරිත් පැන්, විශේෂ බලවේග, ශාන්තිකර්ම, බලි තොවිල්, භූත බලවේග වාගේ දේවලින් ලෙඩ සුව කරන ක්‍රමවේද පිළිබඳව අපට අහන්නට දකින්නට තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ලේඛනයේ යුනානි වෛද්‍ය ක්‍රමයත් අඩංගුද?

**ගරු සාලින්ද දිසානායක මහතා**
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)

නීත්‍යනුකූල තත්ත්වයට යුනානි වෛද්‍ය ක්‍රමයත් අඩංගුයි. ඒක අරාබිකරයෙන් ආපු වෛද්‍ය ක්‍රමයක්. ඒකට නීත්‍යනුකූල තත්ත්වයක් තිබෙනවා.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්ණායකවලට අනුව නවීන වෛද්‍ය විද්‍යාව හැර අනෙක් සියල්ල විකල්ප නොහොත් වෛකල්පික වෛද්‍ය ක්‍රම ලෙස සැලකෙනවා. බෙහෙත් කරන්න කියලා ලියාපදිංචි නැති වෛද්‍යවරයෙකුට කියන්න අපට බැහැ. මොකද, යම් සිද්ධියක් ඇති වුණොත් ඔබතුමන්ලා අපෙන් මේ වාගේම ප්‍රශ්නයක් අහයි, ලියාපදිංචි නැති වෛද්‍යවරයෙකුට වෙදකම් කරන්න දුන්නේ ඇයි කියලා. ඒ වාගේ කාරණා තිබෙනවා.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව වෛකල්පික යනුවෙන් හඳුන්වා තිබෙන්නේ හෝමියෝපති, සිද්ධ, යුනානි, පාරම්පරික, ආයුර්වේද ආදී වෛද්‍ය ක්‍රමයි. මෙහි දක්වා ඇති චීන කටු

චිකිත්සාව වෛද්‍ය ක්‍රමයක් නොවෙයි. එය චීන වෛද්‍ය ක්‍රමයේ එක් ප්‍රතිකාර විධියක් පමණයි. ඒ වාගේම මෝක්ෂ ප්‍රතිකාර, පීඩන, තෙරපි ක්‍රම තිබෙනවා. මෝක්ෂ කියන්නේ මෝහන ක්‍රම. ඒවා ප්‍රතිකාර ක්‍රම විනා වෛද්‍ය ක්‍රම නොවෙයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ බොහෝ ප්‍රතිකාර විධි සඳහන් අතර, ඒවාද ප්‍රතිකාර විධි පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ පවතින එවැනි වෛද්‍ය ක්‍රම නීතියෙන් පිළිගෙන ඇති නිසා නැවත අමුතුවෙන් පිළිගැනීමක් අවශ්‍ය වන්නේ නැහැ. මෙම ප්‍රතිකාර විධි ඉහත නීතිවලින් පිළිගත් වෛද්‍ය ක්‍රමවලට අන්තර්ගත හෙයින් ඒවාද නීතියෙන් පිළිගෙන තිබෙනවා. ඒ නිසා ප්‍රතිකාර විධියක් යනු කුමක්ද, වෛද්‍ය ක්‍රමයක් යනු කුමක්ද යන්න අපි තේරුම් ගත යුතුව තිබෙනවා. ප්‍රතිකාර විධිය අඩංගු වෛද්‍ය ක්‍රමය පිළිගත් නීති රාමුවකින් ආවරණය වී ඇති හෙයින් ප්‍රතිකාර විධියද එම නීති රාමුවෙන් ආවරණය වෙලා තිබෙනවා.

අපට මේ සඳහන් කරන ප්‍රතිකාර ක්‍රමය පිළිබඳ වෛකල්පික වෛද්‍ය සභාවක් හෝ එවැනි ලියාපදිංචියක් අවශ්‍ය වෙනවා නම්, අදෘශ්‍යමාන බලවේග සහ විශේෂ ශාන්තිකර්ම වැනි ක්‍රමවේද පර්යේෂණවලට ලක් කරන්නට සිදු වෙනවා. වෛද්‍ය සභාවක් හෝ එවැනි ලියාපදිංචියක් ඇති කළ හැක්කේ ඒ පර්යේෂණවලින් ලබා ගන්නා දත්ත හරහා එහි තිබෙන නියම තත්ත්වය තේරුම් ගැනීමෙන් පසුවයි. නමුත් මෙවැනි වෛද්‍යවරු -Dr. Eliyantha White වාගේ වෛද්‍යවරු, සායි බාබා වාගේ අය- අපේ රටේ විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඒ කට්ටිය නීත්‍යානුකූල රාමුවකට ඇතුළු කර ගන්නට තරම් අවශ්‍ය සාධකයන් විද්‍යානුකූලව අපි ඔප්පු කරගෙන නැහැ. ඒ නිසා අපට මේ කියන කාරණයේදීත් ඒ අයට ඒ විධියට කටයුතු කරන්න ඉඩ ලැබෙනවා. ඒ පිළිබඳව ගැටලුවක් නැහැ. නමුත් මෙවැනි නීති රාමුවකට ඇතුළු කරන්න නම් අපි අනිවාර්යයෙන්ම මේවායේ තිබෙන විද්‍යානුකූල තත්ත්වයන් මොනවාද කියා සොයා බැලිය යුතුව තිබෙනවා.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව ගැන කථා කිරීමේදී එක පැත්තකින් අපි සතුටු වෙනවා. රාජ්‍ය නායකයා හැටියට අතිගරු ජනාධිපතිතුමාගේ නමත් සඳහන් කරමින්, සමහර අවස්ථාවල විපක්ෂයේම සමහර මන්ත්‍රීවරුන් -ආණ්ඩු පක්ෂයෙන් නොවෙයි.- විවිධ චෝදනාවන් එතුමාට එල්ල කළා, මේ වෛද්‍යවරයා ලියාපදිංචි වෛද්‍යවරයෙක්ද, මේ පහසුකම් ලබා දීම කොයි ආකාරයෙන්ද සිදු වන්නේ කියන එක සම්බන්ධයෙන්. නමුත් විපක්ෂයේ අපේ දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපේ නායකතුමා දක්ෂ ඒ වාගේම අත් දැකීම් තිබෙන නායකයෙකු හැටියට එතුමාගේ තේරීම නිවැරදියි කියන එක අද විපක්ෂයේ මේ යෝජනාවෙන්ම එළිදරවු වෙනවා. ඒ වාගේම අපේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාත් කිව්වා, එතුමාට ආරක්ෂාවක් දෙන්න කියලා.

අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉතා ඕනෑකමකින්, සද්භාවයෙන් කළ කාර්යය නිවැරදියි කියන එක අද මේ සභාවට ඒත්තු ගිහින් තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා මිනිසුන්ට ආදරය කරන මනුස්සයෙක් හැටියට, තමන්ගේ දරුවන්ට වාගේම අනෙක් දරුවන්ටත් ආදරය කරන කෙනෙකු හැටියට මොන විවේචන එල්ල වුණත් එතුමා තුළ තිබුණු මානුෂික ගුණය අවසානයේදී නිවැරදියි කියන එක කල් ගිහිල්ලා හරි විපක්ෂයට තේරිලා තිබෙනවා.

නිවැරදි දේ නිවැරදියි කියන එක පහු වෙලා හරි එළිවෙනවා කියන එක අද මේ සභාව තුළම ඔප්පු වුණා. සමහර මන්ත්‍රීවරුන් මෙම ගරු සභාවේදීම ඇහුවා, ඇයි මේ වෛද්‍යවරයා වෙත ක්‍රිකට් ක්‍රීඩකයන් යොමු කරන්නේ, මේ අයට මොනවා හරි දෙයක් වුණොත් කවුද වග කියන්නේ කියලා. අතිගරු ජනාධිපතිතුමා මෙයට වග කියන්න ඕනෑ කියන චෝදනාව එල්ල කරමින් විපක්ෂයේ මන්ත්‍රීවරු යෝජනා කරන කොට මම මේ සභාවේ හිටියා. ඉතින් මේ යෝජනාව ගැන කථා කරන කොට මට කියන්න දෙයක් තිබෙනවා. අපේ වම්පික ප්‍රේමදාස මන්ත්‍රීතුමා දවසක් පාර්ලිමේන්තුවෙන් පිටතදී මාව හමු වුණු වෙලාවකදී කිව්වා, "එලියන්ත වයිට් වෛද්‍යවරයා ගැන මගේ අත් දැකීමක් තිබෙනවා. මගේ දරුවාට ලෙඩක් හැදිලා එතුමා සනීප කළා. මම ඕනෑම වෙලාවක මේ ගැන කියනවා." කියලා. පසු ගිය දවසක විවාදයකදී මෙතුමාගේ නම සඳහන් කරලා මම ඒ කාරණය කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බටහිර ක්‍රමයට අනුව අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයට මේ වෛද්‍ය ක්‍රම පිළිගැනීමේ ක්‍රම කිහිපයක් තිබෙනවා. දැනට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් ලෙස පිළිගනු ලබන්නේ පහත සඳහන් අයයි.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරු -SLMC ලියාපදිංචි වෛද්‍යවරු-, ශ්‍රී ලංකා වෛද්‍ය පීඨවල උපාධිධාරීන් සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගන්නා විදේශ වෛද්‍ය පීඨ උපාධිධාරීන් සීමාවාසික පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසු ඉහත ලියපදිංචිය සඳහා සුදුසුකම් ලබනවා. ඊ ළඟට මෙන්න මේ කාරණය වැදගත් වෙනවා. ගරු ජොන් අමරතුංග මන්ත්‍රීතුමනි, ඔබතුමා යන්න කලින් මා ඔබතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරනවා. මේ යෝජනාව එන්නේ මේ වෛද්‍ය ක්‍රමයට තවත් වෛද්‍ය ක්‍රමයක් එකතු කරන්නයි. මම බොහොම සතුටු වෙනවා. මොකද මේ නව වෛද්‍ය ක්‍රමය ආ යුතුයි. මොකද හේතුව දේශීය වෛද්‍ය ක්‍රමය තුළ විවිධ වෛද්‍ය ක්‍රම තිබෙනවා. මේ රටට අලුත් ක්‍රමයක් හඳුන්වා දීම අවශ්‍යයි. මම තමුන්නාන්සේට එක දෙයක් කියනවා. මේවාත් එක්ක, තවත් තිබෙන වෛද්‍ය ක්‍රම මැරෙන්න දෙන්නත් බැහැ. මේ කාරණයටත් තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරන්න. මෙය අද අප රට තුළ මරාගෙන තිබෙන වෛද්‍ය ක්‍රමයක්. සහකාර වෛද්‍යවරුන් - AMO - වසර අටකට පස්සේ ලියාපදිංචි වෛද්‍යවරුන් -RMO- ලෙස සුදුසුකම් ලබනවා. මෙය අද නැති කරලා තිබෙනවා. මෙය dying profession එකක් හැටියට ගිහිල්ලා තිබෙනවා. මම දකින හැටියට එහෙම වෙන්න දෙන්නත් බැහැ. ඒක නිසා මෙයට නව ක්‍රමයක් එකතු කරන මොහොතකදී යම් කෙනෙකුගේ යම් වෘත්තියක අයිතිවාසිකම් ආරක්ෂා කරන කොට තවත් වෘත්තියක් ඝාතනය වෙන්න ඉඩ දෙන්න එපාය කියන කාරණයත් මා මේ අවස්ථාවේදී තමුන්නාන්සේලාට මතක් කරනවා. ඒ සම්බන්ධයෙනුත් කටයුතු කරන්න ඕනෑ.

දෙවැනි කාරණය, ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්. ආයුර්වේද, සිද්ධ හෝ යුනානි යන ප්‍රතිකාර ක්‍රම යටතේ උපාධිධාරීන් හෝ ඩිප්ලෝමාධාරීන් සහ පාරම්පරික දේශීය වෛද්‍යවරුන් බවට පත් කළ හැකි දේශීය වෛද්‍යවරුන් ඉහත ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලබනවා.

තුන්වැනි කාරණය, ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරු. ඉහත සඳහන් කර ඇති පරිදි ලියාපදිංචි නොවූ විවිධ වූ ප්‍රතිකාර ක්‍රමවල යෙදෙන අය වෛකල්පිත වෛද්‍යවරු ලෙස සැලකිය හැකි අතර මොවුන් සඳහා ලියාපදිංචි ක්‍රමවේදයක් දැනට නොමැත. කෙසේ වෙතත් මෙම වෛකල්පිත වෛද්‍ය ක්‍රමයන් සාක්ෂි මත පදනම් වූ විද්‍යානුකූල ක්‍රමවේදයක් ලෙස ඔප්පු කර නොමැති බැවින් මේවාට නීතිමය තත්ත්වයක්

[ගරු ලලිත් දිසානායක මහතා]

ලැබී නැත. ඒලියන්ත වයිට් වෛද්‍යතුමා හරහා නොවෙයි, පොදුවේ ගත්තාම ඔහු නියෝජනය කරන යම් කිසි සභාවක් හෝ යම් ආයතනයක් මේ ක්‍රමය ඔප්පු කිරීම තුළින් නීතිමය තත්ත්වයක් ලබා ගත හැකියි. අද විමධ්‍යගත පළාත් සභා ක්‍රමයකුත් තිබෙන නිසා ඒ හරහාත් යෝජනා අනුමත කරලා මේ ප්‍රශ්නය ජාතික තලයට ආවොත් මම හිතන්නේ හොඳ දෙයක්ය කියායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉස්සර අපි පුංචි කාලයේ අපට ප්‍රතිකාර කරන්න දෙමව්පියන් විවිධ වෛද්‍ය ක්‍රම භාවිතා කළා. අපේ සීයලා, අත්තලා කළ ප්‍රතිකාර තමයි අපට ලැබුණේ. ඒ ආරක්ෂාව අපට තිබුණා. ඒ නිසා මෙයට යම් කිසි ක්‍රමවේදයක් අවශ්‍ය වෙනවා. මොකද, විවිධ අය විවිධ පැතිකඩ දකිනවා. එක්තරා අවස්ථාවක මේ වෛද්‍යවරයා ගැන යම් ගුවන් විදුලි නාලිකාවක පැයක විවාදයක් ගෙන ගියා. එතැනදී මේ ගැන දෙපැත්තක් දැක්කා. හොඳ පැත්තත් දැක්කා, අනිත් පැත්තත් දැක්කා. අපේ ගරු දේශීය වෛද්‍ය අමාත්‍යතුමා කිව්ව ආකාරයට මෙතැනදී තමයි ඒකේ නීත්‍යානුකූල තත්ත්වය අවශ්‍ය වන්නේ. ඒ නිසා අපි ඒ ගැන බැලුවා. සමහර අය ද්වේශයෙන් බලන්න පුළුවන්. නමුත්, ප්‍රතිකාර සඳහා යොමු වෙන්නේ කැමැත්තෙන්. ඒ නිසා කැමැත්තෙන් ප්‍රතිකාර සඳහා යොමු වන පුද්ගලයාට ඒ ප්‍රතිකාර ලබාගත හැකියි. මොකද, ඕනෑම වෛද්‍යවරයෙක් සියලු අසනීප සුව කරන්න පුළුවන් ඉසිවරු නොවෙයි. සමහර අසනීප සුව කරන්න බැරි අයත් ඉන්නවා. ඒ නිසා මේ යෝජනාව මත මේ ක්‍රමවේදය ගෙන ඒම හොඳයි.

ඊ ළඟට, 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 20 වැනි වගන්තියේ අර්ථ නිරූපණය යටතේ අපට පරීක්ෂා කරන්න බැරි ආයතන, ඒ කියන්නේ විශේෂයෙන්ම පිළිගත් ආයතන හැටියට තිබෙන්නේ මොනවාද?

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 20 වැනි වගන්තිය යටතේ -අර්ථ නිරූපණය යටතේ- මෙසේ සඳහන් වනවා:

> ".... 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ සහ 1970 අංක 7 දරන හෝමියෝපති පනතේ විධිවිධාන යටතේ වූ යම් කාර්යයක් සඳහා ලියාපදිංචි කරන ලද යම් ආයතනයක් හෝ පරිශ්‍රයක් ...."

එම ඡේදයට මේ ක්‍රමවේදයත් ඇතුළත් කරලා නව ක්‍රමවේදයක් සකස් කරන්නට ඕනෑ. මොකද, මේ පාර්ලිමේන්තුව කියලා කියන්නේ, ප්‍රතිපත්ති සකස් කරන ආයතනය. ඒකට පක්ෂ භේදය බලපානවා වැඩියි. ඒ නිසා රටේ ජනතාවගේ අවශ්‍යතාව වෙනුවෙන් ඒලියන්ත වයිට් වෛද්‍යවරයා නියෝජනය කරන වෛකල්පික වෛද්‍ය ක්‍රමය මේ රටේ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හා සමානවම ලියාපදිංචි කිරීමට ක්‍රමවේදයක් සකස් කරලා එම ක්‍රමය භාවිතා කිරීම යෝග්‍යයි කියන අතර, අපේ අතිගරු ජනාධිපතිතුමන් මේ සඳහා දැක්වූ දායකත්වයත් සමඟ ඔබතුමන්ලාත් එම වෛද්‍යවරයාගේ ආරක්ෂාව නැවත ලබා දෙන්නැයි කියනවා. සමහර විපක්ෂ මන්ත්‍රීවරු විවිධ පටු අදහස් මත, ජනාධිපති අරමුදලින් වියදම් කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව ජනාධිපතිතුමාට චෝදනා කළා. නමුත්, එතුමා වියදම් කරලා තිබෙන්නේ මොකටද කියන එක අද මේ යෝජනාව තුළින් හෙළිදරව් වුණා. එහෙම නම් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.37 ට, 2012 අප්‍රේල් 03 වන අඟහරුවාදා අ. භා. 1. 00 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 6.37மணிக்கு பாராளுமன்றம், 2012 ஏப்பிரல் 03, செவ்வாய்க்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Adjourned accordingly at 6.37 p.m. until 1.00 p. m. on Tuesday, 03rd April, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල්** : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா** ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.